315 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 315 - இல. 5
Volume 315 - No. 5

2024 දෙසැම්බර් 06වන සිකුරාදා
2024 டிசம்பர் 06, வெள்ளிக்கிழமை
Friday, 06th December, 2024

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා** [තීරුව 741]

**ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව** [තීරුව 743]

**පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව** [තීරුව 743]

**ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව** [තීරුව 755]

**ගෘහ්‍ය කාරක සභාව** [තීරුව 756]

**ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව** [තීරුව 756]

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව** [තීරුව 756]

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව** [තීරුව 757]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාව** [තීරුව 757]

**ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව** [තීරුව 757]

**මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව** [තීරුව 758]

**උසස් නිලතල පිළිබඳ කාරක සභාව** [තීරුව 758]

**පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව** [තීරුව 758]

**පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව:**

සාමාජිකයන් නම් කිරීම [තීරුව 759]

**අතුරු සම්මත ගිණුම (2025):**

සම්මත විය [තීරු 759 – 1018]

**පරිපූරක මුදල:**

ශීර්ෂය 241 - වැඩසටහන 01 [තීරුව 1018]

**පරිපූරක මුදල:**

ශීර්ෂය 249 - වැඩසටහන 01 [තීරුව - 1019]

**පරිපූරක මුදල:**

ශීර්ෂය 243 - වැඩසටහන 01 [තීරුව - 1019]

**පරිපූරක මුදල:**

ශීර්ෂය 126 - වැඩසටහන 01 [තීරුව - 1020]

**පරිපූරක මුදල:**

ශීර්ෂය 224 - වැඩසටහන 01 [තීරුව - 1021]

**පරිපූරක මුදල:**

ශීර්ෂය 253 - වැඩසටහන 01 [තීරුව - 1021]

**පරිපූරක මුදල:**

ශීර්ෂය 102 - වැඩසටහන 01 [තීරුව - 1022]

**පරිපූරක මුදල:**

ශීර්ෂය 151 - වැඩසටහන 02 [තීරුව - 1023]

**පරිපූරක මුදල:**

ශීර්ෂය 111 - වැඩසටහන 01 [තීරුව - 1023]

**පරිපූරක මුදල:**

ශීර්ෂය 126 - වැඩසටහන 01 [තීරුව - 1024]

**පරිපූරක මුදල:**

ශීර්ෂය 103 - වැඩසටහන 02 [තීරුව - 1025]

**පරිපූරක මුදල:**

ශීර්ෂය 232 - වැඩසටහන 01 [තීරුව - 1025]


---

# பிரதான உள்ளடக்கம்


**அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்** [ப: 741]

**சட்டவாக்க நிலையியற் குழு** [ப: 743]

**பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு** [ப: 743]

**நிலையியற் கட்டளைகள் பற்றிய குழு** [ப: 755]

**சபைக் குழு** [ப: 756]

**ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழு** [ப: 756]

**அரசாங்கக் கணக்குகள் பற்றிய குழு** [ப: 756]

**அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழு** [ப: 757]

**அரசாங்க நிதி பற்றிய குழு** [ப: 757]

**வழிவகைகள் பற்றிய குழு** [ப: 757]

**பொது மனுக்கள் பற்றிய குழு** [ப: 758]

**உயர் பதவிகள் பற்றிய குழு** [ப: 758]

**பின்வரிசை உறுப்பினர் குழு** [ப: 758]

**பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு:**

உறுப்பினர்கள் நியமனம் [ப: 759]

**கணக்கு வாக்குப் பணம் (2025):**

நிறைவேற்றப்பட்டது [ப: 759 - 1018 ]

**குறைநிரப்புத் தொகை:**

செலவினத் தலைப்பு 241 - நிகழ்ச்சித்திட்டம் 01 [ப: 1018]

**குறைநிரப்புத் தொகை:**

செலவினத் தலைப்பு 249 - நிகழ்ச்சித்திட்டம் 01 [ப:1019]

**குறைநிரப்புத் தொகை:**

செலவினத் தலைப்பு 243 - நிகழ்ச்சித்திட்டம் 01 [ப:1019]

**குறைநிரப்புத் தொகை:**

செலவினத் தலைப்பு 126 - நிகழ்ச்சித்திட்டம் 01 [ப:1020]

**குறைநிரப்புத் தொகை:**

செலவினத் தலைப்பு 224 - நிகழ்ச்சித்திட்டம் 01 [ப:1021]

**குறைநிரப்புத் தொகை:**

செலவினத் தலைப்பு 253 - நிகழ்ச்சித்திட்டம் 01 [ப:1021]

**குறைநிரப்புத் தொகை:**

செலவினத் தலைப்பு 102 - நிகழ்ச்சித்திட்டம் 01 [ப:1022]

**குறைநிரப்புத் தொகை:**

செலவினத் தலைப்பு 151 - நிகழ்ச்சித்திட்டம் 02 [ப:1023]

**குறைநிரப்புத் தொகை:**

செலவினத் தலைப்பு 111 - நிகழ்ச்சித்திட்டம் 01 [ப:1023]

**குறைநிரப்புத் தொகை:**

செலவினத் தலைப்பு 126 - நிகழ்ச்சித்திட்டம் 01 [ப:1024]

**குறைநிரப்புத் தொகை:**

செலவினத் தலைப்பு 103 - நிகழ்ச்சித்திட்டம் 02 [ப:1025]

**குறைநிரப்புத் தொகை:**

செலவினத் தலைப்பு 232 - நிகழ்ச்சித்திட்டம் 01 [ப:1025]

# PRINCIPAL CONTENTS


MINISTERIAL CONSULTATIVE COMMITTEES [Col. 741]

LEGISLATIVE STANDING COMMITTEE [Col. 743]

COMMITTEE ON PARLIAMENTARY BUSINESS [Col. 743]

COMMITTEE ON STANDING ORDERS [Col. 755]

HOUSE COMMITTEE [Col. 756]

COMMITTEE ON ETHICS AND PRIVILEGES [Col. 756]

COMMITTEE ON PUBLIC ACCOUNTS [Col. 756]

COMMITTEE ON PUBLIC ENTERPRISES [Col. 757]

COMMITTEE ON PUBLIC FINANCE [Col. 757]

COMMITTEE ON WAYS AND MEANS [Col. 757]

COMMITTEE ON PUBLIC PETITIONS [Col. 758]

COMMITTEE ON HIGH POSTS [Col. 758]

BACKBENCHER COMMITTEE [Col. 758]

COMMITTEE ON PARLIAMENTARY BUSINESS:
Nomination of Members [Col. 759]

VOTE ON ACCOUNT (2025):
Passed [Cols. 759 – 1018]

SUPPLEMENTARY SUM:
Head 241 - Programme 01 [Col. 1018]

SUPPLEMENTARY SUM:
Head 249 - Programme 01 [Col.1019]

SUPPLEMENTARY SUM:
Head 243 - Programme 01 [Col.1019]

SUPPLEMENTARY SUM:
Head 126 - Programme 01 [Col.1020]

SUPPLEMENTARY SUM:
Head 224 - Programme 01 [Col.1021]

SUPPLEMENTARY SUM:
Head 253 - Programme 01 [Col. 1021]

SUPPLEMENTARY SUM:
Head 102 - Programme 01 [Col.1022]

SUPPLEMENTARY SUM:
Head 151 - Programme 02 [Col.1023]

SUPPLEMENTARY SUM:
Head 111- Programme 01 [Col.1023]

SUPPLEMENTARY SUM:
Head 126 - Programme 01 [Col.1024]

SUPPLEMENTARY SUM:
Head 103 - Programme 02 [Col. 1025]

SUPPLEMENTARY SUM:
Head 232 - Programme 01 [Col. 1025]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2024 දෙසැම්බර් 06වන සිකුරාදා***
*2024 டிசம்பர் 06, வெள்ளிக்கிழமை*
*Friday, 06th December, 2024*

---

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු අසෝක සපුමල් රන්වල මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அசோக சபுமல் ரன்வல] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. ASOKA SAPUMAL RANWALA] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present Supplementary Estimate No.15 of 2024.

I move that this Supplementary Estimate be referred to the Committee on Public Finance.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)

Sir, I present the Annual Performance Report of the Judicial Service Commission Secretariat for the year 2022.

I move that this Report be referred to the relevant Committee.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

The Hon. Prime Minister referred the first Report she presented to the Committee on Public Finance. Sir, I would like to find out from you when that Committee is going to be established?

Thank you.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා මතු කරපු ප්‍රශ්නය අපි පළමු දවසේදී විසඳාගෙන තිබෙන්නේ, ගරු කථානායකතුමනි. අපි ජනවාරි මස 31වන දා වෙන කල් කාලය අරගෙන තිබෙනවා, ආංශික අධීක්ෂණ කාරක සභා පිළිබඳව තීරණය කරන්න. ඒ වාගේම අපි පත් කළාට පස්සේ තමයි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව පිළිබඳව අද දිනයේදී තීන්දු කරන්න වෙන්නේ. ඉන් පසුවයි දිනය තීන්දු කරන්න වෙන්නේ. පාර්ලිමේන්තුව විධියට අපි ඒවා පිහිටුවනවා. ගරු විපක්ෂ නායකතුමාගේ එකඟතාවෙන් Parliamentary Business Committee එක අද හවස 2.00ට පවත්වන්න අපි යෝජනා කරලා තිබෙනවා. එතැනදී අපට පුළුවන් Committees පත් කරන දිනය තීන්දු කරන්න. ඒක නිසා කිසිම ගැටලුවක් වෙන්නේ නැහැ.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற அலுவல்கள் பற்றிய விடயம் எடுத்துக்கொள்ளப்படுகின்ற இந்த நேரத்தில் நான் முக்கியமானதொரு விடயத்தை இங்கு பதிவுசெய்ய விரும்புகின்றேன். அதாவது, 24 வயதுடைய அதிஷ்டராஜ் கோமஸ் மிதுசன், யாழ்ப்பாணம் கச்சேரியடி; 21 வயதுடைய சுஜனிகாந் பகீரதன், சண்டில் வீதி, மத்தொனி, கரவெட்டி; 46 வயதுடைய சுந்தரலிங்கம் பாலச்சந்திரன், 1ஆம் வட்டாரம், முள்ளியவளை, முல்லைத்தீவு; 37 வயதுடைய கீதபொன்கலன் பிரதாப், கடற்கரை வீதி, குருநகர், யாழ்ப்பாணம்; 31 வயதுடைய ஸ்டீபன் சிவேஸ், குருநகர், யாழ்ப்பாணம் ஆகியோர் முகவர்களால் ஏமாற்றப்பட்ட

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

நிலையில் ரஷ்யா இராணுவத்தில் இணைக்கப்பட்டுள்ளதாக அறிகின்றோம். அவர்கள் தங்களுடைய புகைப்படங்களையும் அங்கிருந்து அனுப்பியிருக்கிறார்கள். அதிலொன்று என்னிடமும் இருக்கின்றது. அதில் இடமிருந்து வலமாக சுந்தரலிங்கம் பாலச்சந்திரன், அதிஷ்டராஜ் கோமஸ் மிதுசன், சுஜனிகாந் பகீரதன் ஆகியோர் காணப்படுகின்றனர். தயவுசெய்து, இவர்களை இந்த நாட்டுக்குக் கொண்டுவருவதற் கான வழிமுறைகளை மேற்கொள்ளுமாறு நான் இந்த இடத்தில் சம்பந்தப்பட்ட அமைச்சர் அவர்களை விநயமாகக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා මතු කළේ රීති ප්‍රශ්නයක් නොවෙයි. නමුත්, එතුමා ප්‍රශ්නයක් මතු කළා. ගරු විදේශ කටයුතු, විදේශ රැකියා ඇමතිතුමාට හෝ නියෝජ්‍ය ඇමතිතුමාට ඒ ප්‍රශ්නය යොමු කරන්න. අපි ඒ පිළිබඳව සොයා බලන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒ සම්බන්ධව තමයි මමත් කථා කරන්නේ. *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

මේ සම්බන්ධව උතුරේ විතරක් නොවෙයි,- *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමනි, පොඩ්ඩක් ඉන්න. මට මේක කියන්න දෙන්නකෝ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මට අවස්ථාව ඉල්ලා සිටිනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, උතුරේ විතරක් නොවෙයි, මේ ප්‍රශ්නය හැම තැනම තිබෙනවා. මේ ගැන පසුගිය ආණ්ඩුවේදීත් අපි කථා කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා ඒකට උත්තර දුන්නා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

සමස්තයක් වශයෙන් ගත්තාම මේක හැම තැනම තිබෙන ප්‍රශ්නයක්, ගරු කථානායකතුමනි. අපි ආණ්ඩුවෙන් ඉල්ලන්නේ කරුණාකර මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා ඒ සම්බන්ධව පිළිතුරු ලබා දුන්නා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය රීති ප්‍රශ්නයක් නොවෙයි. නමුත් අපිට ඒ කාරණය තේරුණාට පස්සේ අපි එහි මානුෂීය වැදගත්කම සලකා ඒක අදාළ ඇමතිතුමාට යොමු කළා. ඒ නිසා එය නැවත විවාදයක් කර ගැනීම සදාචාරසම්පන්න නැහැ. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. *[බාධා කිරීම්]* අපි කවුරුත් සමාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. කවුරුත් මෙතැන ලොකු නැහැ. කවුරු හරි එහෙම හිතාගෙන ඉන්නවා නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට සමාන තත්ත්වයට පත් වෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ලිපිලේඛනාදිය පිළිගැන්වීම යටතේ, ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමා.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, 2021ஆம் ஆண்டுக்கான இலங்கை கடற்றொழில் துறைமுகங்கள் கூட்டுத்தாபனத்தின் ஆண்டறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன்.

இவ்வறிக்கை உரிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமென நான் பிரேரிக்கின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர குருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2019 සහ 2021 වර්ෂ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2023 වර්ෂය සඳහා ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා අදාළ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින ආණ්ඩුවේ වැඩකටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා
## அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEES

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මතු දැක්වෙන පරිදි අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා විසි හතරක් (24) පත් කළ යුතු ය:-

1. ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
2. මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
3. ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
4. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
5. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
6. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
7. ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
8. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
9. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
10. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
11. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
12. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
13. කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
14. නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
15. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
16. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
17. විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
18. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
19. බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
20. තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
21. කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
22. පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
23. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව
24. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව වෙත යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වාර්තා කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂයභාර අමාත්‍යවරයා සභාපතිවරයා වූ ද, රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් විසිඑක් දෙනෙකුගෙන් (21) සමන්විත විය යුතු ය.

එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් තිදෙනෙකුගෙන් (03) සංයුක්ත විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව
## சட்டவாக்க நிலையியற் குழு
## LEGISLATIVE STANDING COMMITTEE

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113 ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව නියෝජ්‍ය කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් මන්ත්‍රීවරයන් දස දෙනෙකුගෙන් (10) සමන්විත විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව
## பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு
## COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුගෙන් (12) සමන්විත විය යුතු ය."

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව යම් පැහැදිලි කිරීමක් කිරීමට මම කැමැතියි. ඔබතුමා අපට දැනුම් දුන් පරිදි, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගේ පැත්තෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා, - ඔබතුමාව දැනුවත් කරලා තිබුණා - Parliamentary Business Committee එකට එතුමන්ලාට තවත් නියෝජිතයන් පත් කිරීමට අවශ්‍යයි කියලා. ඒ අනුව අපි ස්ථාවර නියෝග අනුව ඒ කමිටුවට තිබුණු විපක්ෂයේ නියෝජිත ප්‍රමාණය එකකින් වැඩි කරනු ලැබුවා, විපක්ෂ නායකතුමාත් සහභාගි වූ මුල්ම සාකච්ඡාවේදී; පක්ෂ නායකයන් මුණ ගැහුණු පළමු අවස්ථාවේදී.

ඉන් පසුව තමයි දැන් මෙම ඉල්ලීම විපක්ෂයේ පක්ෂ විසින් නැවත වතාවක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. අප දන්නා පරිදි, මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ වැඩිම මන්ත්‍රීවරුන් සිටින පක්ෂය, සමගි ජන බලවේගයයි. ඊළඟට, වැඩිම මන්ත්‍රීවරුන් සිටින පක්ෂය, ඉලංකෛයි තමිල් අරසු කච්චි. මට මතක විදියට, ඊට පසුව තිබෙන්නේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා නියෝජනය කරන, "ගෑස් සිලින්ඩරය" ලකුණ දරන පක්ෂය.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔව්, නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ. ඊළඟ එක, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ. ඊට පසුව, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය තිබෙනවා, ගරු රිසාඩ් බදියුදීන් මැතිතුමා නායකත්වය දරන පක්ෂය වන අහිල ඉලංකෛයි මහජන කොංග්‍රසය තිබෙනවා. ඊට පසුව, තනි මන්ත්‍රීවරයකු බැගින් සිටින පක්ෂ සහ ස්වාධීන කණ්ඩායමක් අපේ පාර්ලිමේන්තුවේ සිටිනවා. විපක්ෂයේ - විපක්ෂයේ පක්ෂ නියෝජනය කරමින් - මන්ත්‍රීවරු 12දෙනෙක් ඉන්නවා. ආණ්ඩු පක්ෂයේ එක පක්ෂයයි තිබෙන්නේ. එම නිසා අප විසින් - ගරු ආණ්ඩුව පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාත්, මමත් - තීරණයක් ගනු ලැබුවා. මොකද, ගරු කථානායකතුමාගේ පැත්තෙන් කෙටි වෙලාවක් ලැබී තිබුණු නිසා අපි තීරණයක් ගනු ලැබුවා. දැනට තිබෙන නියෝජනය අනුව විපක්ෂයේ පක්ෂ එකතු කර ගැනීමේ වගකීම තිබෙන්නේ ගරු විපක්ෂ නායකතුමාට. ඒ ගරු මන්ත්‍රීවරුන්ට ඒ තනතුරු, අවස්ථා ලබා දීමේ වගකීම තිබෙන්නේ ගරු විපක්ෂ නායකතුමාට. එය ආණ්ඩු පක්ෂය සතු කාර්යභාරයක් නොවෙයි. නමුත්, අප ඉහත කී වැඩි කිරීමෙන් බලාපොරොත්තු වූ දේ තමයි විපක්ෂයේ පක්ෂ හැකි ප්‍රමාණයක්; උපරිම ප්‍රමාණයක් එයට include කර ගැනීම. නමුත් ඔබතුමන්ලා කාටත් වැටහෙනවා, විපක්ෂය තුළ පක්ෂ 12ක් තිබෙන නිසා ඒ 12ටම එම කමිටුවට සහභාගි වෙන්න බැහැ කියන කාරණය. ඒ බවට පාර්ලිමේන්තුවේ ඕනෑ තරම් පූර්වාදර්ශ තිබෙනවා. ඒ වුණත් විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට -තමන්ට ඉඩ කඩක් නොලැබෙන අයට - අපි කියන්න කැමැතියි, ගරු විපක්ෂ නායකතුමාගෙන් ඒ අවස්ථාව ඉල්ලන්න පුළුවන් බව.

ඒත් accommodate කරන්න අමාරු තැන්වලදී, විවිධ යෝජනා, Adjournment Motions වාගේ අවස්ථාවලදී ඔබතුමන්ලාට පුළුවන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් මුණගැහිලා ඉල්ලීමක් **කරන්න.** ඒ, ඔබතුමන්ලා ආණ්ඩුවට සම්බන්ධ කර ගැනීමේ මොකක් හෝ කුරුමානමක් ලෙස නොවෙයි. ඔබතුමන්ලාගේ අයිතිවාසිකම් වෙනුවෙන් ආණ්ඩු පක්ෂය පැත්තෙනුත් යම් යම් අවස්ථාවලදී ඒ ඉඩ කඩ ලබා දෙන්න අපි කටයුතු කරන්නම්. ගරු කථානායකතුමනි, අපේ තීරණය තමයි, ඒ හැර අප සියලුදෙනාට එම කාරක සභාව නියෝජනය කරන්න අවස්ථාව ගන්න බැරි වෙනවා කියන එක. නැවතත් විපක්ෂය පැත්තෙන් මේ ගැන ඉල්ලීමක් ඉදිරිපත් කරපු නිසා අපි තීන්දු කළා ආණ්ඩු පක්ෂය පැත්තෙන්, Parliamentary Business Committee එකට තවත් එක ධුරයක් විපක්ෂය පැත්තට ලබා දෙන්න. ඒ සඳහා කෙනෙකු පත් කිරීම ගරු විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ ඔබතුමන්ලාගේ වගකීම. නමුත්, එකී වැඩි කිරීමේ අරමුණ වී තිබෙන්නේම වැඩි ප්‍රමාණයක් මේකට include කර ගැනීමයි.

මොකද, දැනට පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තමයි මන්ත්‍රීවරුන් තුන්දෙනෙකු ඉන්න පක්ෂය. ඊට උඩ පක්ෂ සියල්ලට මේක නියෝජනය කරන්න පුළුවන්, දැනට තිබෙන සංයුතිය ඇතුළේත්. නමුත්, ඒක තීරණය කරන එක ඔබතුමන්ලාගේ අයිතිය. ඒක ඔබතුමන්ලාගේ අයිතිය වුණත්, වැඩිපුර ධුරයක් ලබා දීමේ අරමුණ වී තිබෙන්නේම වැඩි ප්‍රමාණයක් include කර ගැනීමයි. එම නිසා අපි විශ්වාස කරනවා, වැඩි මන්ත්‍රී ධුර ප්‍රමාණයක් නියෝජනය වන තවත් පක්ෂයකට එම තනතුර ලබා දෙයි කියලා. මා හිතන විදියට, ඊළඟට තිබෙන්නේ මන්ත්‍රී ධුර දෙක දෙක වාගේ තිබෙන පක්ෂයි. ඊළඟට තිබෙන්නේ මන්ත්‍රී ධුර එක එක වාගේ තිබෙන පක්ෂයි. ඉහත කී ආකාරයට එය ලබා දෙයි කියලා අපි විශ්වාස කරනවා. එම නිසා සංශෝධනයක් ඉදිරිපත් කරමින්මයි මා මෙම යෝජනාව ඉදිරිපත් කරන්නේ, ගරු කථානායකතුමනි. ඒ අනුව Parliamentary Business Committee

එකේ සාමාජික මන්ත්‍රීවරුන් සංඛ්‍යාව විපක්ෂයට එකක් වැඩි වනකොට, ආණ්ඩු පක්ෂයටත් ඊට අනුපාතිකව වැඩි වෙනවා. එම නිසා එම ප්‍රමාණය 16ක් වෙනවා.

අවසාන වශයෙන් මා යෝජනා කරන්න කැමැතියි, මෙම කමිටුව සාමාජික මන්ත්‍රීවරයන් 16 දෙනෙකුගෙන් සමන්විය යුතුයි කියන එක. එතකොට *ex officio* Membersලාත් එක්ක එකතුව තීරණය වෙනවා. ඒක තමයි අපේ තිබෙන යෝජනාව.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා, විපක්ෂයේ සෙසු පක්ෂවල සාමාජිකයන් ඇතුළු අපි අද ඔබතුමා මුණ ගැහිලා ඉල්ලීමක් කළේත්, කරුණු පෙන්වා දුන්නේත් සියලු දෙනාට බැරි වුණත් යම් සාධාරණ පිරිසකට පක්ෂ නායක රැස්වීමට සහභාගි වීමේ අවස්ථාව දෙන්න කියලායි. විශේෂයෙන්ම පසුගිය කාලයේ විරුද්ධ පක්ෂයට තිබුණේ දේශපාලන පක්ෂ 6ක් වාගේ ප්‍රමාණයක්. නමුත්, 10දෙනෙකු නියෝජනය කිරීමේ අවස්ථාව දුන්නා. අද විපක්ෂයේ පක්ෂ 12ක් විතර තිබියදීත් හතරක නියෝජනයකින් මෙය කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ නිසා තවදුරටත් මේ සම්බන්ධව සාධාරණව බලා විසඳුමක් දෙන්න කියා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Speaker, I am representing the Jaffna District. If you take the Jaffna District, there are three Members from the NPP and three from the other parties. Unfortunately, the Hon. Leader of the Opposition and his team are not willing to allot time for me, even two minutes per debate. Therefore, I need justification that you will make sure that my voice is also heard because I cannot go to the Office of the Leader of the Opposition now. I need at least 30 seconds to speak at every debate, to bring out my voice in Parliament. Otherwise, it would be an injustice to the people I represent.

Thank you.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayathissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, මම හිතනවා අප මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවත් යම්කිසි ආකාරයකට පිළිවෙළක් කර ගත යුතුයි කියලා. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල යම් යම් කරුණු කාරණා සඳහන් කරලා තිබෙන්නේ පාර්ලිමේන්තු ක්‍රියාවලිය විධිමත් කර ගැනීම සඳහායි.

පාර්ලිමේන්තුවේ තිබෙන කාරක සභා අතරින් වැදගත්ම කාරක සභාව තමයි පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව කථානායකතුමා ඇතුළු නිල බලයෙන් පත් වන 7දෙනෙකුගෙන් සහ තවත් මන්ත්‍රීවරු 12දෙනෙකුගෙන් තමයි එම කාරක සභාව සමන්විත වෙලා තිබුණේ. නමුත් මේ තත්ත්වය සැලකිල්ලට අරගෙන ඒ ගණන 16 දක්වා වැඩි කරන්න එකඟතාවක් තිබෙනවා. එහෙම වුණත් සම්පූර්ණ ප්‍රමාණය 23ක් වෙනවා. පාර්ලිමේන්තුව යම් පිළිවෙළකට, සංවිධානාත්මකව ඉස්සරහට අරගෙන යන්න නම්, මේ ප්‍රමාණය අපි සීමා කර ගනිමු කියලා මම යෝජනා කරනවා. මොකද, ඉදිරියේදී එක් එක් මැතිවරණවලින් එන පක්ෂ ප්‍රමාණය වැඩි වෙන්නට පුළුවන්. ඊළඟ වතාවේ පක්ෂ 12ක් නොවෙයි, 15ක්, 20ක් වෙන්නත් පුළුවන්. එහෙම accommodate කරන්න ගියොත් අපට මේ කාරක සභාව පවත්වාගෙන යන්න බැරි වෙයි කියලා මම හිතනවා. අපි අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවලට යනකොට, ඒ යෝජනාවලට එකඟතාව පළ කරලා මේ ප්‍රමාණය මීට වඩා වැඩි කරලා තිබෙනවා. ඒක ප්‍රශ්නයක් නැහැ, අපි එහෙම කරමු. නමුත් මේ තිබෙන ප්‍රධානතම, වැදගත්ම සහ මුඛ්‍යතම කාරක සභාව වන Parliamentary Business Committee එකේ සංයුතිය යම් කිසි ආකාරයකට විධිමත්ව, එක number එකකින් පවත්වාගෙන යන එක වැදගත්. ඒ නිසා තමයි මේ සියලු කරුණු සලකා බලා ඒ සාමාජිකයන් ප්‍රමාණය 16 දක්වා වැඩි කරන්න එකඟ වුණේ. 16ක් දක්වා වැඩි වුණත් සම්පූර්ණ ප්‍රමාණය 23ක් වෙනවා. ඔබතුමන්ලාගේ පක්ෂවලට එක් අවස්ථාව බැගින් දෙන්න ගියොත්, ඊට සාපේක්ෂව ආණ්ඩුවටත් විශාල ප්‍රමාණයකින් වැඩි කරන්න වෙනවා. සාමාජිකයන් 50ක්, 60ක් එකතු කරගෙන Parliamentary Business Committee එකේ වැඩ කරන්න බැහැ, ගරු කථානායකතුමනි. එම නිසා සාධාරණව කල්පනා කරලා, පාර්ලිමේන්තුවේ ගරුත්වය ආරක්ෂා වන විධියට, පක්ෂවල නියෝජනයත් සම්පූර්ණ වන විධියට මේ number එක සීමා කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම විරුද්ධ පක්ෂයේ නායකවරයාට සහ විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයාට - සමගි ජන බලවේගයට - නිල බලයෙන්ම මෙහි නියෝජනයක් තිබෙනවා.

අර හත්දෙනා ඇතුළේ මේ දෙදෙනාත් ඉන්නවා. එතකොට තවත් හතර දෙනෙක් ගන්න තමයි මේ යෝජනාව තිබෙන්නේ. මේ හයදෙනා බෙදා ගන්න එක විපක්ෂය සාධාරණව කර ගන්න. සමගි ජන බලවේගය හැටියට විපක්ෂ නායකවරයාට සහ විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයාට අවස්ථාව ලැබිලා තිබෙන නිසා, ඉතිරි හතරදෙනාගේ ගැටලුව කථා බහ කරලා සාධාරණව බෙදා ගන්න ඔබතුමන්ලාට පුළුවන්. ඒ වාගේම, අනෙක් කාරක සභාවලදී ඒ මන්ත්‍රීවරුන්ට සාධාරණ නියෝජනයක් ලබා දෙන්න. එතැනිනුත් එහාට ගිහිල්ලා කාලය සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

නම් විටින්විට සාකච්ඡා කරමින් අවස්ථාව ලබා දෙන්න ආණ්ඩු පක්ෂය හැටියට අපි ලෑස්තියි. ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලන්නේ පාර්ලිමේන්තුවේ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යෑම සඳහා Parliamentary Business Committee එකේ සාමාජිකයන් ප්‍රමාණය මෙතැනින් එහාට වැඩි කරන්න එපා කියන එකයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, කාලය ගන්නට නොවෙයි මම මේ මාතෘකාව ගැන කථා කරන්නේ. ඇත්ත වශයෙන් පසුගිය පාර්ලිමේන්තුවේ විපක්ෂය නියෝජනය කරන්නට වැඩි ප්‍රමාණයක් ලැබුණා. ඒ වෙනුවෙන් සටන් කළ පුද්ගලයෙක් තමයි වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා. එතුමා විශ්වාස කළා, විපක්ෂයේ පාර්ශ්ව වැඩි ප්‍රමාණයකට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ නියෝජනය ලබා දීම වැදගත් කියලා. එතුමා ම කිව්වා, විපක්ෂය කොච්චර නියෝජනය කරනවා කිව්වාත් එක එක පාර්ශ්ව අනුගමනය කරන දර්ශන, වැඩ පිළිවෙළ, න්‍යාය එකිනෙකට වෙනස් කියලා. ඇත්ත වශයෙන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත්, සභානායකතුමාටත් මම අවධාරණය කරන්න කැමතියි, සාධාරණත්වයේ නාමයෙන් අපට එකක් වැඩිපුර දීලා, ඒක තව හත අටක් එක්ක බෙදා ගන්න කියන එක ප්‍රායෝගික නැති නැති දෙයක් බව.

ඇත්ත වශයෙන්ම මේ සාමාජිකයන් ප්‍රමාණය වැඩි කිරීම තුළින් ස්ථාවර නියෝග කිසිවක් උල්ලංඝනය වෙනවාය කියලා මම හිතන්නේ නැහැ. මේක සම්ප්‍රදායක්; එකඟතාවක්; අවබෝධතාවකින් යන ගමනක්. මේ සාමාජිකයන් ප්‍රමාණය වැඩි කළාය කියලා පාර්ලිමේන්තුවේ වියදම වැඩි වෙන්නෙත් නැහැ, මූල්‍යමය හෝ වෙනත් ගැටලුවකට අපි ප්‍රවේශ වෙන්නෙත් නැහැ. මේ ප්‍රමාණය සාධාරණ විධියට වැඩි කරන්නය කියලා මම ඉල්ලීමක් කළා. මම විතරක් නොවෙයි, මා ඇතුළු විපක්ෂයේ අනෙකුත් නායකයන් බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, මේ ප්‍රමාණය මීට වඩා වැඩි කරන්නය කියලා. මෙතැනදී සිද්ධ වෙන්නේ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට ඇවිල්ලා ගාලගෝට්ටි ඇති කරගන්න එක නොවෙයි. ඒක මම ඔබතුමාට වගකීමෙන් කියනවා. ඒ තුළින් ඒ අදහස් ඉදිරිපත් කරලා මේ වැඩකටයුතු ක්‍රියාත්මක කරන්නට අවබෝධතාවෙන් කටයුතු කරන්නට අපට හැකියාව ලැබෙනවා. ඒ නිසා ඒ සාමාජිකයන් ප්‍රමාණය වැඩි කරන්නට ඔබතුමන්ලාගේ එකඟතාව ලබා දෙන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

ස්තුතියි.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Speaker, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Thank you, Sir.

Sir, I just want to make the point that whilst we might be seated in the Opposition, our party, being a party which has only one Member, does not agree with the main Opposition on most issues. So, we do not have a working relationship with the main Opposition and lot of us, this time, are single-member parties or independent groups. If we take the Committee on Parliamentary Business as opposed to any other Committee, we need to know what the functioning of Parliament is because we are totally independent. With regard to the other Committees, maybe, we cannot be accommodated entirely, but at least with regard to the Committee on Parliamentary Business, my mumble request, Sir, is that you must be flexible with regard to the numbers because these numbers that have been included in the Standing Orders are from an era where there was a two-party system. These numbers do not reflect the reality of today's Parliament. So, the practice, in previous Parliaments, has been to be flexible with regard to the numbers in the Committee on Parliamentary Business so that you can accommodate the reality of the present Parliament.

Therefore, in that respect, I think the Parliamentary Business Committee, more than any other Committee, must be flexible with its numbers so that, at least, every single constituent party which represents its own constituency knows what the functioning of Parliament is. We have been acting very responsibly in the previous Parliament; we had a very hostile Government, but we never unnecessarily went and fought with them. I think everybody will admit to the fact that even the small-party Representatives in the Committee on Parliamentary Business acted extremely responsibly. So, this is not a question of us going in there to fight, but we need to know what the functioning of Parliament is. Otherwise, we will be kept completely in the dark. I do not think that is a fair thing to happen with regard to our franchise or mandate.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ ගැන විවිධ පැතිවලින් සාකච්ඡා කරන්න පුළුවන්. නමුත්, දැනට තිබෙන ස්ථාවර නියෝග මත පදනම් වී තමයි අපට වැඩකටයුතු කරන්න තිබෙන්නේ. මෙම පාර්ලිමේන්තුව, Parliamentary Business Committee එක පිළිබඳව වෙනත් විධියකට කල්පනා කරනවා නම් ඉදිරි කාලයක

දී, ඒ අනුව කටයුතු කරමු. මේක Party Leaders' Meeting එක නොවෙයි, Parliamentary Business Committee එක. පාර්ලිමේන්තුවේ තිබෙන එකම Committee එක මේක නොවෙයි. පාර්ලිමේන්තුවේ සිටින සෑම මන්ත්‍රීවරයකුම දන්නවා, පාර්ලිමේන්තුවේ ගොඩක් කටයුතු මේ කමිටුව මත තීන්දු වෙන්නේ නැහැ කියලා. එය ප්‍රධාන කමිටුවක් බව ඇත්ත. පාර්ලිමේන්තුව ඉදිරියේ දී තීරණය කරනවා නම්, පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ අනුව Parliamentary Business Committee එක හැදෙන්න ඕනෑ කියලා, ඒක පාර්ලිමේන්තුවේ තීරණයක්. නමුත්, දැනට එහෙම තීරණයක් නැහැ. දැනට පක්ෂ නායක රැස්වීම කියලා *ad hoc* committee එකක් තිබෙනවා, අපට ආරම්භ කර ගන්න.

ඊළඟට, Parliamentary Business Committee එක. ඔබතුමන්ලා කවුරුත් පිළිගන්නවා ඇති, පක්ෂයක් ගත්තත්, කොම්පැනියක් ගත්තත්, එහි සිටින ඔක්කෝටම representation දෙන්නේ නැහැ කියන එක. එතකොට තීරණ ගන්න බැහැ. ඒ නිසා අපි දන්නවා, ඕනෑම major board එකක් යම්කිසි නිශ්චිත experienced and responsible අයට තමයි සීමිත කරලා තිබෙන්නේ කියලා. මා දන්නා තරමින් director boardsවල 100ක් නැහැ; 50ක් නැහැ. එම නිසා අපේ යෝජනාව මේකයි. අපි ගජේන්තිරකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමාත්, විපක්ෂයේ මන්ත්‍රීවරුත් මතු කරන ප්‍රශ්නය තේරුම් අරගෙන, - මොකද, Parliamentary Business Committee එක යම්කිසි නිශ්චිත කාලයකට පටන් අරගෙන නිශ්චිත වේලාවකදී අවසන් කරන්න ඕනෑ. ඒක පැය ගණනක් කරන්න බැහැ. ඔබතුමා පුළුවන් කිව්වාට, ඒක වෙනම කථාවක්; අපි දන්නා දේ. ඒ නිසා අපි පැහැදිලිව කියන්නේ Parliamentary Business Committee එක සීමිත විය යුතුයි කියන එකයි. එය, දැන් තිබෙන තත්ත්වය අනුව සියලු මන්ත්‍රී පක්ෂවලට accommodate කරන්න බැහැ. ඒකයි යථාර්ථය. එය පිළිගෙන වැඩ කරමු කියන ඉල්ලීම අපි කරුණාවෙන් කරනවා.

හැබැයි, දැනට අපි විපක්ෂයට වැඩිපුර නියෝජන දෙකක් ලබා දීමට එකඟවීම හරහා, - මා නැවත කියන්න කැමැතියි, පාර්ලිමේන්තුවේ සමගි ජන බලවේගයේ මෙතැන *ex officio* Membersලා දෙන්නෙක් එනවා, ගරු විපක්ෂනායකතුමා සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා; සමගි ජන බලවේගය පක්ෂයේ ප්‍රධාන නායකයන් දෙන්නෙකුගෙන් මේක නියෝජනය වෙනවා. ඊට පසුව පාර්ලිමේන්තුවේ වැඩිම ආසන හිමි පක්ෂය තමයි ඉලංගෙයි තමිල් අරසු කච්චි. ඔවුන්ට අවස්ථාවක් ලබාදිය හැකියි. ඊට පසුව වැඩිම ආසන තිබෙන පක්ෂය වන්නේ රවි කරුණානායක මැතිතුමා සිටින නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ. එම පක්ෂයට අවස්ථාවක් ලබාදිය හැකියි, representation එකට ගරු කරමින්. ඊට පසුව වැඩිම පක්ෂය ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ. අපි ඇත්තටම කල්පනා කළා, නියෝජනය එකක් වැඩි කරන්න. මොකද, පොදු ජන පෙරමුණ මෙතැන represent වෙන්න ඕනෑ කියලා හිතලා තමයි අපි ඒක යෝජනා කළේ. ඔබතුමන්ලා කියන්න කලින්ම ගරු විපක්ෂයේ සංවිධායකතුමනි, අපි Committee එකට ආවේම එක නියෝජනයක් වැඩි කරන්න හිතාගෙන. අපි හිතුවා, පොදු ජන පෙරමුණ කියන්නේ මේ රට පාලනය කරපු පක්ෂයක්. අද එතුමන්ලාගේ නියෝජනය අඩු වෙලා තිබෙන්න පුළුවන්. *[බාධා කිරීමක්]*

ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීවරු කී දෙනෙක් ඉන්නවාද?

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
තුන් දෙනෙක්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉන්නවාද? එහෙම නම්, *[බාධා කිරීමක්]* හොඳයි. ඔබතුමන්ලාගේ අලුත් මන්ත්‍රීතුමා පත් වුණේ ළඟදී ද? *[බාධා කිරීමක්]* අන්න, ඒකයි. මට සාමාන්‍යයෙන් වැටිටක් ගණන් පුළුවන්. Committee of Selection දවසේ ඔබතුමන්ලාගේ හිටියේ මන්ත්‍රීවරු දෙදෙනායි. Committee of Selection දවසේ හිටියේ මන්ත්‍රීවරු දෙදෙනායි. *[බාධා කිරීමක්]* ඔව්, මම දැන් පිළිගන්නවා, මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉන්නවා කියලා. මම කිව්වේ, අපි අවංකව හිතපු විදිය. දේශපාලන වශයෙන් අපේ ලොකු ගැටුම් තිබෙන්න පුළුවන්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සමඟ. අපි representation එක ගැන කල්පනා කරලා තමයි තව නියෝජනයක් යෝජනා කළේ. අපි හිතනවා, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා වාගේ කෙනෙක් ඒකේ සිටිය යුතුයි කියලා, එතුමාගේ දේශපාලනය ගැන අපට වෙනස් දේශපාලන අදහස් තිබුණාට. දැන් මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉන්න එක වෙනම,- *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමාට ඔබතුමන්ලා කරපු ඉල්ලීම අනුව දැන් තව එක නියෝජනයක් වැඩි කරලා තිබෙනවා. ඒ නිසා දැන් එක්කෝ තුන්දෙනා ඉන්න පක්ෂයට දෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් තව, දෙදෙනා ඉන්න පක්ෂත් තිබෙනවා. තව වෙන පක්ෂ තිබෙනවා. පාර්ලිමේන්තුවේ යම් කිසි ඉස්පාසුවක් ලැබුණු අවස්ථාවකදී, අපේ ස්ථාවර නියෝග නූතන තත්ත්වයට ගැළපෙන ලෙස වෙනස් කරන අවස්ථාවකදී, අපි ඒක consider කරන්න ලැස්තියි, ගරු විපක්ෂ නායකතුමනි.

Parliamentary Business Committee එක නම්, ඒක Parliamentary Business Committee එකක් වෙන්න ඕනෑ; ඒක AGM එකක් වෙන්න බැහැ. දෙවෙනි කාරණය විදියට අපි බැලුවා, ඔබතුමන්ලාට opportunities වැඩි කරන්න. ඒ නිසා අපි කරපු දේ මුලින් කියන්නම්. එක තමයි, Parliamentary Business Committee එකට දෙදෙනෙක් අපි වැඩි කර තිබෙනවා. ඊට පස්සේ විශේෂයෙන්ම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජික සංඛ්‍යාව අපි වැඩි කර තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ වාගේම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරය විපක්ෂයට ලබා දීමට අප තීන්දු කර තිබෙනවා.

ඒක ඔබතුමන්ලා ඉල්ලපු දෙයක් නොවෙයි. ගරු කථානායකතුමනි, ඒක එතුමන්ලාට ලැබෙනවා පමණක් නොවෙයි, ස්ථාවර නියෝගවල තිබෙනවාට වැඩියෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජික සංඛ්‍යාවත් අපි වැඩි කරලා තිබෙනවා. Parliamentary Business Committee එකට එන්න බැරි විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට පුළුවන් -විපක්ෂයේ තීරණය අනුව ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මැතිතුමා ඇතුළු තවත් මන්ත්‍රීවරුන්ට ඒකට එන්න ලැබෙන්නේ නැත්නම් එතුමන්ලාට පුළුවන්- COPE, COPA දෙකටම සහභාගි වෙන්න. COPA එකේ Chairmanකම අපි ඔබතුමන්ලාට දෙනවා විතරක් නොවෙයි, එහි Membersලා සංඛ්‍යාවත් වැඩි කරලා තිබෙනවා. මොකද අපි හිතනවා, oversight එක වැඩි වෙන්න ඕනෑය කියලා. ඒක නිසා අපි හිතනවා, ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මැතිතුමා වාගේ ඉතා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ට එවැනි අවස්ථා ලබා දිය යුතුයි කියලා. COPE එකටත් එහෙමයි. අපි කිව්වා, COPE එකේ සභාපතිකම ආණ්ඩු පක්ෂයට අවශ්‍යයි කියලා. මොකද, මුල් කාලයේදී පරීක්ෂා කරන්න වෙන්නේ පසුගිය ආණ්ඩුවේ දේවල්. අපි කැමැති නැහැ, ඒ කාලයේ හිටපු ඇමතිවරයෙක් දැන් ඇවිල්ලා COPE එක chair කරනවාට. ඒක සදාචාර සම්පන්න නැහැ. එතැනදී ඉටු කරන්නේ සාමූහික වගකීමක් නේ. තමන් හිටපු අමාත්‍යාංශ ගැන කථා කරන කොට නැඟිටලා ගියාට හරියන්නේ නැහැ. මම මේ වැඩිපුරයි මේ පැහැදිලි කිරීම කරන්නේ.

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ 13වන යෝජනාව තිබෙන්නේ මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ගැන. ස්ථාවර නියෝගවලට අනුව එහි සාමාජිකයන් 15දෙනායි හිටියේ. අපි ඒක 19 වෙනකල් වැඩි කළා. ඒක නිසා එයට සහභාගි වෙන්න ගරු මන්ත්‍රීතුමන්ලා වැඩි ප්‍රමාණයකට අවස්ථාවක් ලැබෙනවා. ගරු කථානායකතුමනි, especially අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල සාමාජිකයන් සංඛ්‍යාව ගත්තොත්, එය තිබුණේ විපක්ෂයට එකයි, ආණ්ඩු පක්ෂයට හතරයි විධියට. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ ඉල්ලීම මත අපි එකඟ වුණා, ඒක තව හතරකින් වැඩි කරන්න. ඒක නිසා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවකට විපක්ෂයෙන් පහක් එනවා. ඒකෙන් මොකක්ද වෙන්නේ, ගරු කථානායකතුමනි? අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවලට විතරක් opportunities 120ක් තිබෙනවා. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ලා 120කට opportunities හැදෙනවා. ඔබතුමන්ලාට ඉන්නේ මන්ත්‍රීවරුන් 66දෙනායි. ඒ විතරක් නොවෙයි. අපි ඒ අවස්ථාව දුන් නිසා අලුතින් opportunities 96කුත් හැදෙනවා, four into twenty four විධියට. අපි accommodate කරන්න පුළුවන් උපරිම විධියට accommodate කරනවා. ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවේදී අපට මඟ පෙන්වන්න; අපේ අඩුපාඩු ගැන කියන්න. ඒක අපට අවශ්‍යයි. ඊයේ අපේ යම්කිසි මන්ත්‍රීවරයෙකුගෙන් එහෙම අවශ්‍ය නැහැ වාගේ අදහස් ඉදිරිපත් වුණා වාගේ කියලා කවුරු හරි මන්ත්‍රීතුමෙක් මට කිව්වා. නමුත් එහෙම නැහැ. අපට ඔබතුමන්ලාගේ උපදෙස්, මඟ පෙන්වීම් අවශ්‍යයි.

කාලය ගතවන නිසා අවසාන වශයෙන් මම මේ දේ කියන්න ඕනෑ. අපි විපක්ෂයෙන් Parliamentary Business Committee එකට සහභාගි වෙන්න තව කෙනෙකුට අවස්ථාව ලබා දෙනවා. ඒක තමයි අපේ තීරණය. ඒ අනුව *ex officio* මන්ත්‍රීවරු දෙන්නා එක්ක විපක්ෂයේ මන්ත්‍රීවරුන් හයකට අවස්ථාව ලැබෙනවා. මේක තමයි අපේ තීරණය. ඒ ගැන අපි තවදුරටත් විවාද කරන්න කැමැති නැහැ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, විශේෂයෙන්ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ගැනත් අවධානය යොමු කිරීම පිළිබඳව. හැබැයි අද ප්‍රායෝගික ගැටලුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. විපක්ෂයේ බොහෝ දේශපාලන පක්ෂ නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් ඉන්නවා. Parliamentary Business Committee එකට ඒ පක්ෂවල නායකයින්ට යම් සාධාරණ නියෝජනයක් ලැබුණේ නැත්නම් එහිදී එකඟ වන කාරණාවලට පාර්ලිමේන්තුවේදී මේ අය නැවත විරුද්ධ වෙන්න පුළුවන්. ඒ වාගේම Parliamentary Business Committee එකේදි අපි එකඟ වුණත්, අනෙක් පක්ෂ ඒ කාරණා පිළිබඳව පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කරන්න පුළුවන්.

එතකොට උදේ පාන්දර නැවත වතාවක් පරණ විධියටම කාලය ගතවීමක් සිද්ධ වෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, මේ පිළිබඳව සාධාරණව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා. මෙහිදී සියලු පක්ෂ - පක්ෂ 13ම - නියෝජනය කරන්න බැරි වෙයි කියලා අපි දන්නවා. හැබැයි, යම් නියෝජනයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා අපි කියනවා. (3rd Start)

**ගරු නීතිඥ රවූෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවූෆ් හකීම් මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ රවූෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අපේ ගරු සභානායකතුමා ඉතාම පරිත්‍යාගශීලී වෙනවා වාගේ කථා කළාට, මේ පිළිබඳව සම්ප්‍රදායයන් තිබෙනවා. ඒ ගැන මට ගොඩක් දේවල් කියන්න පුළුවන්. නමුත්, මම දැන් ඒ දේවල් කියන්න යන්නේ නැහැ, කාලය ගතවන නිසා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා, මේ සම්බන්ධව යම් සාධාරණයක් කරන්න කියලා. ඒ සම්බන්ධයෙන් අපි ඉල්ලීමක් කරලා තිබෙනවා. ඒ ගැන ටිකක් කල්පනා කරලා සාධාරණයක් කරන්න.

ඒකට ඉඩදී, මම තව කාරණාවක් මතු කරන්න අදහස් කරනවා. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව අද පෙර වරු 11.00ට නියම වෙලා තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ. (1) (ඉ) අනුව්‍යවස්ථාවට අනුකූලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට මන්ත්‍රීවරයෙකු තෝරා පත් කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීම අද පෙර වරු 11.00ට පවත්වන්න කටයුතු කර තිබෙනවා. නමුත්, ඒ පිළිබඳව යම් ගැටලුවක් මතුවී තිබෙනවා. ඒ සම්බන්ධව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ.(1)(ඊ)(4) වන අනුව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

> "...විරුද්ධ පක්ෂයේ නායකවරයා හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් වෘත්තිය සහ සමාජයීය විවිධත්වය ඇතුළුව ශ්‍රී ලාංකිය සමාජයේ බහුත්ත්ව ලක්ෂණය සභාවෙන් පිළිබිඹු වන බව සහතික කරනු ලැබිය යුත්තේ ය."

ගරු කථානායකතුමනි, අපට මේ සම්බන්ධයෙන් ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ඒකයි අපි මේ ප්‍රශ්නය මතු කරන්නේ. අපි ඔබතුමාගෙනුත්, ගරු අග්‍රාමාත්‍යතුමියගෙනුත්, ගරු සභානායකතුමාගෙනුත්, මේ සම්බන්ධව ඉල්ලීමක් කරනවා. මොකද, මේ සංයුතිය පිළිබඳව ගැටලුවක් තිබෙනවා. අපි දන්නේ නැහැ, ජනාධිපතිතුමා කවුද පත් කරන්නේ කියලා. විපක්ෂ නායකතුමා දැනටමත් සිංහල මන්ත්‍රීවරයෙකු පත් කරලා තිබෙනවා. කලින් පත් කරලා තිබුණා, මුස්ලිම් මන්ත්‍රීවරයෙක්. දැන් මුස්ලිම් ජාතිකයෙකු පත් වීම පිළිබඳව ගැටලුවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මම ඉල්ලනවා, කරුණාකරලා මේ ඡන්ද,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමනි, කථානායකතුමා විධියට මම ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නම්.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ඒක අපි විසඳලා තිබෙනවා. අම්පාර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු අබූබකර් අතම්බාවා මන්ත්‍රීතුමාව ආණ්ඩු පක්ෂයේ නියෝජිතයෙකු හැටියට අපි ඒකට නම් කරලා තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා කලබල වෙනවා නේ, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, දැන් අපේ ගරු සභානායකතුමා කිව්වා, ඕනෑම මහ පෙන්වීමක්, යමක් තිබෙනවා නම් ඒක භාරගන්න ලැහැස්තියි, ඒක පෙන්වා දෙන්න කියලා. ගරු සභානායකතුමනි, මම ඔබතුමාට මේ කාරණය මතක් කරන්න කැමැතියි. ස්ථාවර නියෝග 111 යටතේ අපේ මේ සභාව අවසානයටම පිහිටුවපු කාරක සභාව තමයි, ආංශික අධීක්ෂණ කාරක සභා.

ස්ථාවර නියෝග 111(10)හි මෙසේ සඳහන් වෙනවා:

> "තේරීම් කාරක සභාව විසින්, ආංශික අධීක්ෂණ කාරක සභාවට සභික මන්ත්‍රීවරයන් නම් කිරීමේ දී පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල නායකයන් විසින් කරනු ලබන නාමයෝජනාවලට අනුකූලව එම දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට නිසි සැලකිල්ල දක්වමින් කටයුතු කරනු ලැබිය යුත්තේ ය."

එම නිසා අපි කාරුණිකව ඉල්ලනවා, Parliamentary Business Committee එක ගැනත් මේ විධියට බලන්න කියලා. විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා එදා දරපු මතයට ගරු කරලා අදත් කටයුතු කරන්න කියලා මම ඉල්ලනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 111(1) කියවා බැලුවේ නැහැ නේ. ඔබතුමා ස්ථාවර නියෝග 111(1) කියවන්නකෝ. ආංශික අධීක්ෂණ කාරක සභා ගැන නේ ඔබතුමා කිව්වේ.

ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මම ඔබතුමාට හැමවිටම ගරු කරනවා. ස්ථාවර නියෝග 111(1)හි මෙසේ සඳහන් වෙනවා:

> "තේරීම් කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන විෂයයන් සහ කාර්යයන් පැවරෙන ආංශික අධීක්ෂණ කාරක සභා විස්සකට නො වැඩි සංඛ්‍යාවක් තිබිය යුත්තේය."

ආංශික අධීක්ෂණ කාරක සභා පිළිබඳව එහි සම්පූර්ණයෙන් පැහැදිලිව සඳහන් වෙනවා. ඒ නිසා, මේක ආංශික අධීක්ෂණ කාරක සභා සම්බන්ධව තමයි තිබෙන්නේ. මේක Parliamentary Business Committee එක සම්බන්ධව නොවෙයි තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, අපට එක එක මූලධර්ම ගන්න පුළුවන්. අපි 71:29 කියන ජන වරම තමයි මේ හැම තැනටම වෙන් කරලා තිබෙන්නේ. නමුත් අපි 71:29 හැම තැනම රකින්නේ නැහැ. අපගේ පෞද්ගලික දේපළක් නොවෙයි, ජන වරම. ඒක මෙහෙම විය යුතුයි කියලා මිනිස්සු කල්පනා කරලා තිබෙනවා. මම හෝ නලින්ද ජයතිස්ස මැතිතුමා කවුද, ඒ ජන වරම බෙදලා දෙන්න? ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමන්ලාගේ අදහස්වලට ගරු කරනවා. අපේ තීරණය අනුව ඔබතුමන්ලාගේ විපක්ෂයට තව එක සාමාජික ධුරයක් වැඩිපුර ලබා දෙනවා. ඒක සාධාරණව බෙදාගෙන කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මා ඉල්ලා සිටිනවා, එම යෝජනාව අනුව ඉදිරියට කටයුතු කරන්න කියලා. Parliamentary Business Committee එකේ මන්ත්‍රීවරු සංඛ්‍යාව 16ක් විය යුතුයි කියන යෝජනාවත් මම මේ සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පස්වැනි යෝජනාවේ සංශෝධිත යෝජනාවට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Jeevan Thondaman.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Thank you, Hon. Speaker.

I would like to remind the Leader of the House - they have come on a mandate which is historic and with a single-party majority - that what we are requesting for right now as the Opposition is exactly what the Hon. President Anura Kumara Dissanayake used to fight for on the Floor. All I want to say in short is, please do not become the very thing you have opposed so far, and we are not asking for any favours as such, but we are just asking for equity.

Thank you.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා, මෙතැන, එක පැත්තකින් unique. ඒ නිසා ඔබතුමාගේ නියෝජනය ගැන අපි සලකනවා. අපි ඒකයි කිව්වේ ඔබතුමාට යම්කිසි නියෝජනයක් අවශ්‍ය වෙනවා නම් අපිට ඒක ඉදිරිපත් කරන්න කියලා. නමුත් නාමල් රාජපක්ෂ මැතිතුමාම කිව්වා, ඔක්කෝම accommodate කරන්න වෙන්නේ නැහැ කියලා. ඒක තමයි reality එක.

ඒ නිසා මම මේ කාරණය කියන්න කැමැතියි. ගරු කථානායකතුමනි, පොඩ්ඩක් ඉතිහාසයට ගියොත් පෙනෙයි, - අපේ ගරු අගමැතිතුමිය මේකට සාක්ෂි දරනවා - අපිත් මේ පීඩාව භුක්ති විඳපු පක්ෂයක් බව. ඒ පීඩාව අපි ඔබතුමන්ලාට දෙනවා නොවෙයි, මේ. හැබැයි මේවාට මුහුණ දෙන්න ක්‍රම තිබෙනවා. ඒ කාලයේ අපි මොකක්ද කළේ? අපිට දුක හිතුණා, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්; ITAK එකේ මන්ත්‍රීවරයෙක් විනාඩි 5ක් කථා කරනකොට තව මන්ත්‍රීවරයෙක් විනාඩි 3ක් කථා කරනවා. ඒකෙන් අපට hurt වුණා. අපි මොකක්ද කළේ? අද වනකොට ජනාධිපතිව සිටින අනුර දිසානායක සහෝදරයාත්, අගමැතිනියත්, අපිත් මොකක්ද කළේ? ගරු කථානායකතුමනි, එතකොට අපිට විනාඩි 9යි දවසකට හම්බ වුණේ. අපි එක දෙයක් කළා. අපේ පක්ෂයෙන් කථා කළේ එක්කෙනායි.

අපේ අටදෙනෙක්, දහදෙනෙක් හිටියත් වෙලාව අඩු නිසා එක්කෙනායි කථා කළේ. එක්කෙනෙකුට කථාවක් කරන්න පුළුවන්. අපට හම්බ වුණේ, විනාඩි නවයයි. ඒ විනාඩි නවය අපි තුන්දෙනෙක් අතර බෙදා ගත්තාම කාටවත් කථාවක් කරන්න බැහැ. එම නිසා අපි ඒ උපක්‍රමය අනුගමනය කළා.

දෙවනුව මොකක්ද කළේ? මේකට අගමැතිතුමිය සාක්ෂි දරනවා. අපට පක්ෂයෙනුත් pressure එකක් තිබුණා, මෙච්චර ප්‍රශ්න තිබෙනවා කථා කරන්න කියලා. හැබැයි, කථා කරන්න අපට ඉඩක් නැහැ. කිසිම කථාවක් පිළිවෙළකට කරන්න බැහැ. ඇයි? කෙටි වෙලාවයි ලැබෙන්නේ. ඒ නිසා මොකක්ද දන්නවාද අපි කළේ? අපි කරපු දේ මේකයි, ගරු කථානායකතුමනි. අපි දවස් තුනක් කථා නොකර -අද කථා කරන්නේත් නැහැ, හෙට කථා කරන්නේත් නැහැ - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඉල්ලා ගත්තා, විනාඩි නවයේ ඒවා තුනක් එකතු කරලා විනාඩි විසි හතක් දෙන්න කියලා. එහෙම තමයි මේ ගමන අපි ඇවිල්ලා තිබෙන්නේ. අපට කවුරුවත් royal road එකක් දුන්නේ නැහැ. අනුර දිසානායක මැතිතුමා, හරිනි අමරසූරිය මැතිතුමිය බොහොම capable කියලා එච්චර දුන්නේ නැහැ. මේක තමයි මිනිස්සුන්ගේ කැමැත්ත. අපි පුළුවන් තරම් ඔබතුමන්ලා include කරනවා. ඒක අපට කියන්න. විපක්ෂයෙන් ඒක කරගන්න බැරි තැන්වලදී අපි උත්සාහ කරන්නම් ඒක දෙන්න. අපට ඔබතුමන්ලා අවශ්‍යයි. ඒ නිසා තමයි අපි මේ යෝජනාව ඉදිරිපත් කළේ.

## ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව
## நிலையியற் கட்டளைகள் பற்றிய குழு
## COMMITTEE ON STANDING ORDERS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 116 ප්‍රකාරව ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපති වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් මන්ත්‍රීවරයන් හය දෙනෙකුගෙන් (06) සමන්විත විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ගෘහ්‍ය කාරක සභාව
## சபைக் குழு
## HOUSE COMMITTEE

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 117 ප්‍රකාරව ගෘහ්‍ය කාරක සභාව, කථානායකවරයාගේ සභාපතිත්වයෙන් සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් නව දෙනෙකුගෙන් (09) සමන්විත විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව
## ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழு
## COMMITTEE ON ETHICS AND PRIVILEGES

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරයන් දස දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් (10) සමන්විත විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව
## அரசாங்கக் கணக்குகள் பற்றிய குழு
## COMMITTEE ON PUBLIC ACCOUNTS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

| **162** | **Department of Government Factories** | **31003** | **Government Factory Work Done Advance Account** | **100,000,000** | **100,000,000** | **60,000,000** | **-** |

| | | | I | II | III | IV | V |
|---|---|---|---|---|---|---|---|
| SRL No | Ministries / Departments | Item No. | Activities of the Government | Maximum Limits of Expenditure of Activities of the Government Rs. | Minimum Limits of receipts to be credited to the Accounts of Activities of the Government Rs. | Maximum Limits of Debit Balance of Activities of the Government Rs. | Maximum Limits of Liabilities of Activities of the Government Rs. |
| 163 | Department of National Physical Planning | 31101 | Advances to Public Officers | 2,200,000 | 1,000,000 | 20,000,000 | - |
| 164 | Department of Civil Security | 32001 | Advances to Public Officers | 250,000,000 | 127,000,000 | 300,000,000 | - |
| 165 | Department of National Botanical Gardens | 32201 | Advances to Public Officers | 11,500,000 | 4,800,000 | 40,000,000 | - |
| 166 | Department of Legal Affairs | 32301 | Advances to Public Officers | 300,000 | 100,000 | 1,500,000 | - |
| 167 | Department of Management Auditing | 32401 | Advances to Public Officers | 600,000 | 200,000 | 3,500,000 | - |
| 168 | Department of Community Based Corrections | 32601 | Advances to Public Officers | 10,900,000 | 4,500,000 | 50,000,000 | - |
| 169 | Department of Land Use Policy Planning | 32701 | Advances to Public Officers | 8,700,000 | 3,600,000 | 25,000,000 | - |
| 170 | Department of Manpower and Employment | 32801 | Advances to Public Officers | 8,900,000 | 3,700,000 | 35,000,000 | - |
| 171 | Department of Information Technology Management | 32901 | Advances to Public Officers | 800,000 | 300,000 | 4,000,000 | - |
| 172 | Department of Samurdhi Development | 33101 | Advances to Public Officers | 200,000,000 | 50,000,000 | 120,000,000 | - |
| 173 | Department of National Community Water Supply | 33201 | Advances to Public Officers | 6,300,000 | 2,600,000 | 50,000,000 | - |
| 174 | Office of the Comptroller General | 33301 | Advances to Public Officers | 600,000 | 200,000 | 3,000,000 | - |
| 175 | National Education Commission | 33501 | Advances to Public Officers | 400,000 | 150,000 | 1,500,000 | - |
| 176 | Merchant Shipping Secretariat | 33601 | Advances to Public Officers | 1,100,000 | 400,000 | 5,000,000 | - |
| 177 | Department of Cinnamon Industry Development | 33701 | Advances to Public Officers | 1,000,000 | 400,000 | 5,000,000 | - |
| 178 | Public Debt Management Office | 33801 | Advances to Public Officers | 200,000 | 100,000 | 800,000 | - |
| | **Total** | | | **18,105,000,000** | **13,105,000,000** | **27,625,600,000** | **4,125,000,000** |

"

- [The Hon. Bimal Rathnayake]

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විවාදය ආරම්භ කිරීම, ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු කථානායකතුමනි, රටේ ජනතාවට බලපාන ප්‍රශ්නයක් ගැන කියන්න මිනිත්තුවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට තත්පර කිහිපයක් දෙන්න. ඔබතුමා ඊට පසුව අවස්ථාව ගන්න.

ගරු කථානායකතුමනි, අපි ගරු විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, Parliamentary Business Committee එකට අපි 16දෙනෙකු අනුමත කරලා තිබෙන නිසා, ඔබතුමන්ලාගේ නාම ලේඛනය ලබා දෙන්න කියලා. අද හවස 2.00ට Parliamentary Business Committee එක රැස් වෙන්න තිබෙනවා, ඊළඟ පාර්ලිමේන්තු සතියේ වැඩකටයුතු තීරණය කිරීම සඳහා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, අද දින උදේ වරුවේ ඔබතුමාව හමුවෙලා ඒ ඉදිරිපත් කළ කරුණු කාරණා සම්බන්ධව ඔබතුමාගේ තීන්දුව අපි බලාපොරොත්තු වෙනවා. එතෙක් අපට ඒ නම් කිරීම කරන්න අපහසුයි. මොකද, අපි බොහොම පැහැදිලිව, පූර්වාදර්ශ සහිතව, සම්ප්‍රදාය සහිතව ඔබතුමාට කරුණු කාරණා ඉදිරිපත් කළා. ඒ පිළිබඳ පැහැදිලි තීන්දුවක් ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සභාවේ සිටින වෙලාවේ එතුමාගේ අමාත්‍යාංශයට සම්බන්ධ ප්‍රවෘත්තියක් ගැන පැහැදිලි කිරීමක් කර ගන්න කැමැතියි. ඊයේ ප්‍රධාන ජාතික පුවත් පතක සඳහන් කර - තිබුණා,

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

"බාල බෙහෙත් 500ක් රට පුරා රෝහල්වල" කියලා. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය නැතුව ප්‍රමිතියෙන් තොර ඖෂධ වර්ග 500කට ආසන්න සංඛ්‍යාවක් රටේ සංසරණය වීම හේතුවෙන් රෝගී ජීවිත දැඩි අවදානමකට ලක් වෙලා තිබෙනවා කියා රෝහල් ආරංචි මාර්ග සඳහන් කරනවා කියලා එහි තිබුණා.

අපිට මෑත කාලයේ තිබෙන අත්දැකීම් එක්ක ගත්තාම, මේක භයානක ප්‍රවෘත්තියක්. අපි දැක්කා, විශාල සංකූලතාවලට අපේ අහිංසක රෝගීන් පත් වුණු හැටි, ජීවිත අවදානම් තත්ත්වයන් ඇති වුණු හැටි. ඒ වාගේම අමාත්‍යාංශය දරපු ඇමතිවරයා සහ අනෙක් ඇමතිවරුන්ටත් අධිකරණ ක්‍රියාවලියකට යන්න සිදු වුණු හැටි. මේකේ ඇත්තක් තිබෙනවාද, එහෙම තිබෙනවා නම් ඒ පිළිබඳව ඔබතුමන්ලා යම් පියවරක් ගෙන තිබෙනවාද කියන එක ජනතාව වෙනුවෙන් අපි අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි ඖෂධ තමයි රජයේ රෝහල් සහ ඒ ආයතන හරහා බෙදා හැරීම සිදු කරන්නේ. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රමාදයක් තිබෙනවා. අපි කවුරුත් ඒක පිළිගන්න ඕනෑ. ඒක ඇතුළේ බරපතළ අක්‍රමිකතා, වංචා, දූෂණ වාගේම අකාර්යක්ෂමතාවකුත් තිබෙනවා. අපි ඒවා නිවැරදි කරගෙන යනවා. දැන් විශාල ප්‍රමාණයකින් තාවකාලික සහ ස්ථිර ලියාපදිංචි කිරීමේ කටයුතු කඩිනම් කරගෙන යනවා. ඔය ප්‍රවෘත්තිය සම්බන්ධව වාර්තාවක් කැඳවා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මම ඒ ගැන පාර්ලිමේන්තුවට සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරනවා. නමුත් මම කියන්න කැමැතියි, ඔය කියන විධියේ බාල බෙහෙත් ප්‍රමාණයක් රජයේ රෝහල්වලට ඖෂධ නියාමන අධිකාරිය හෝ රජයේ රෝහල් පද්ධතිය හරහා ගිහින් නැති බව. එහෙම යන්න විධියක් නැහැ. සමහර ඖෂධවල ගුණාත්මක තත්ත්වයේ ප්‍රශ්න තිබෙනවා නම්, එය වාර්තා කරනවා. ඒ හැරුණාම NMRA එක නොසලකා යමින් රජයේ රෝහල්වලට ඖෂධ බෙදා හරින්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, මම මේ පිළිබඳව ඔබතුමාට සවිස්තරව දැනුම් දෙන්නම්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු ඇමතිතුමනි, මෙහි සඳහන් කර තිබෙනවා, මේ සම්බන්ධයෙන් ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගෙන් විමසුවාම, එවැනි තත්ත්වයක් පවතින බවක් කිව්වාය කියලාත්. පුවත් පතේ තිබෙන එක මම කිව්වේ. "මේ සම්බන්ධයෙන් කොළඹ ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතාගෙන් කළ විමසීමකදී ඔහු පැවසුවේ මෙවැනි තත්ත්වයක් පවතින බවයි" කියා මේකේ සඳහන් කර තිබෙනවා. මම දන්නේ නැහැ, මේ ප්‍රවෘත්තිය මොකක්ද කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මම කලින් කිව්වා වාගේම ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් මම පාර්ලිමේන්තුව හමුවේ තබනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද දින විවාදය ආරම්භ කිරීම, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා.

[පූ.භා. 10.22]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු කථානායකතුමනි, අද දවසේ මෙම අතුරු සම්මත ගිණුම පිළිබඳ විවාදය ආරම්භ කිරීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම මේ අතුරු සම්මත ගිණුම සම්මත වීමට නියමිත අද දවසේ, ඊයේ දවසේ මේ පිළිබඳ විවාදයට සම්බන්ධ වෙමින් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු ඉදිරිපත් කරපු සමහර කරුණුත්, ඒ වාගේම ජනතාවට දැන ගන්න ඕනෑ සමහර කරුණුත් සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කළොත් හොඳයි කියා මා විශ්වාස කරනවා. මොකද, සමහර අය කරුණු කියන කොට ඒවා ඉදිරිපත් කළේ, ඒ ගොල්ලෝ මේ පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ වාගෙයි. ඒ වාගේම මේ මතු වෙලා තිබෙන සමහර තත්ත්ව පිළිබඳව වැරදි අර්ථකථන දෙන්නත් උත්සාහ කළා. සමහර අය කථා කරලා ගිහිල්ලා තිබුණු නිසා, අවධානය කළ යුතු කරුණු ටිකක් තිබෙනවා. ඒ ගැන කියන්න ඕනෑ.

හොරු අල්ලන කථාව ගැන කියන කොට සමහරු කිව්වා, "අල්ලන්නකෝ" කියලා. ඒ වාගේම SriLankan Airlines එක ගැන කථා කළා. SriLankan Airlines එකට වෙලා තිබෙන දේ ගැන මොකද කරන්නේ කියලා ඇහුවා. සහල් සහ වෙළෙඳ පොළ තුළ තිබෙන හිඟය කථා කළා. බාර් වැඩි වෙලා තිබෙන්නේ ඇයි, කියලා කථා කළේ නැහැ. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා කිව්වා, ඒවා දීලා තිබෙන්නේ කාටද කියලා ඒ ලැයිස්තුව කියන්න කියලා. ඊළඟට, IMF එකේ ණය ගිවිසුම් සහ එකඟතා පිළිබඳව, ඒ වාගේම ගං වතුර සහ ඒ ආපදාවලට ලක් වූ ජනතාවට සහන ලබා දීම පිළිබඳව, රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ සහ වතු කම්කරුවන්ගේ වැටුප් පිළිබඳව, බඩු මිල පිළිබඳව, ජනාධිපතිවරයා සහ මුදල් වෙන් කිරීම් පිළිබඳව ඇතුළු කරුණු කාරණා ගණනාවක් පිළිබඳව එතුමන්ලා කරුණු කියන්න උත්සාහ කළා.

ගරු කථානායකතුමනි, මේ දින දෙක තුළ සිද්ධ වෙච්ච කථා බහ ඇතුළේ විශේෂ අවධානය යොමු කළ යුතු කරුණක් වශයෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ක බැඳුණු කථාව නිවැරදි කළොත් හොඳයි කියලා මා විශ්වාස කරනවා. මොකද, අර හිඟන්නාගේ තුවාලය වාගේ මේක හැමදාම පටලවමින් යන්න තමයි විපක්ෂය එක පැත්තකින් උත්සාහ කරන්නේ. ජාතික ජන බලවේගය ලෙස අපි මේ සම්බන්ධයෙන් පැහැදිලි ස්ථාවරයක හිටියා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ අපි ජනාධිපතිවරණයෙන් පසුව සාකච්ඡා කළා. ජනාධිපතිවරණයට පෙරත් නිල නොවන ලෙස ඔවුන් අප සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වූවා.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ගිවිසුම් ගහලා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ පැමිණි එකඟතා එක්ක රට මෙතැනට ගෙන ආවේ කවුද කියන කාරණය සාකච්ඡා නොකර යන්නේ. අපේ රට 2022 අප්‍රේල් මාසයේ 10වැනි දා බංකොලොත් -බ්‍රූන් වත්- රටක් බවට ප්‍රකාශයට පත් කරලා, රට ඒ තැනට වට්ටපු අය අද අපෙන් ප්‍රශ්න කරනවා. ඒ නිසා අපිට වුවමනායි, මේ රට ස්ථාවර රටක් ලෙස පත් කරගෙන, මේ රට සංවර්ධනය කරා ගෙන යන අපේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න.

ඒ යන ගමනට බාධා කරන බොහෝ දේවල් ජනාධිපතිවරණයට පෙරත්, ජනාධිපතිවරණයට පසුවත් කරන්න උත්සාහ කළා. හැබැයි, ජනාධිපතිවරණයෙන් පසුව තුන්දෙනෙකුගෙන් යුත් අපේ කැබිනට් මණ්ඩලය - කුඩාම කැබිනට් මණ්ඩලය - මහ මැතිවරණය අවසන් වනතෙක් මේ රට අල්ලා ගෙන සිටියා. මේ ලැබිච්ච ජනවරමත් එක්ක දැන් අපට පැවරී තිබෙනවා, මේ රට මෙතැනින් එහාට ගෙන යන කාර්යභාරය කිරීමේ වගකීම. අප ඒ කාර්යභාරය කරගෙන යද්දී විපක්ෂය දැන් අපෙන් අහනවා, "ඇයි අරක කළේ, ඇයි මේක කළේ?" කියලා. අපටත් අහන්න තිබෙනවා ප්‍රශ්නයක්. IMF එකත් එක්ක ගිවිසුමක් ගහලා, රට බංකොලොත් කියන කාරණය කියලා, ඒ ගිවිසුම ඇතුළේ අවුරුදු දෙකහමාරක් තිස්සේ සාකච්ඡා කරමින් ඇවිල්ලා කරපු වැඩ ටිකක් තිබුණා. ඒ වැඩ අස්සේ රට නොදන්නා සහ රටට නොකියපු කථා ටිකක් තිබෙනවා. ඒ රටට නොකියපු කථා ටික ඇතුළේ තිබෙන කාරණා ටික මොනවාද? ඒ සාකච්ඡා වට ඔක්කෝම වාගේ ඉවර කරලා. මොකද, මෙතුමන්ලා අවුරුදු දෙකකට අසන්න කාලයක් සාකච්ඡා කරමින් හිටියා, ගරු කථානායකතුමනි. ඒ සාකච්ඡා ඇතුළේ, ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ කළ සාකච්ඡා, බහු පාර්ශ්වීය සාකච්ඡා, ද්විපාර්ශ්වීය සාකච්ඡා වාගේම ස්වෛරී බැඳුම්කර පිළිබඳ සාකච්ඡා ආදි ඔක්කෝම කෙරුණා. ඒ ඔක්කොම එකක් මත එකක් depend වෙනවා. ඒ නිසා අරගොල්ලන්ට කියන කථාව මේගොල්ලන්ට බලපානවා.

දේශීය වෙළෙඳ පොළෙන් ගත්තු ණයවලින් සියයට 30කට ආසන්න ප්‍රමාණයක් කප්පාදු කළා. විශේෂයෙන් EPF, ETFවලට තමයි ඒ බලපෑම ආවේ. ඒ සියල්ල එක පෙළට බැඳුණු කරුණු හැටියටයි තිබෙන්නේ. කරුණු හැටියට කීපයක් මා කියන්නම්. අප ණය ගත්තු රටවල් 17ක් එක්ක ද්විපාර්ශ්වීය ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කරමිනුයි තිබුණේ; ඒ එකඟතාවලට ඇවිල්ලායි තිබුණේ. ඒ එකඟතාවලට ඇවිල්ලා ගන්නා ඉදිරි ක්‍රියා මාර්ග ස්වෛරී බැඳුම්කර වෙළෙඳ පොළටත් බලපානවා. ඒ බලපෑම නිසා ඒ අයටත් අදාළව තමයි ජනාධිපතිවරණයට හරියටම දින දෙකකට කලින් මේගොල්ලෝ ගිවිසුම අත්සන් කළේ. අපේ ගරු කම්කරු ඇමතිතුමා ඊයේ මේ ගැන කරුණු කිව්වා, මේ පාර්ලිමේන්තුවට. ජනාධිපතිවරණයට හරියටම දින දෙකකට කලින් මේ ගිවිසුම අත්සන් කළා. එසේ අත්සන් කළාට පස්සේ දැන් මෙහි කරුණු අවසන් වෙන්න ඕනෑ. එසේ අවසන් වුණාට පස්සේ දැන් අපට වුවමනාව තිබෙනවා මේ ගනුදෙනුව අවසන් කරන්න. අප ණය ගත්තු රටවල් 17ක් සමඟ තිබෙන ද්විපාර්ශ්වීය ගිවිසුමට අදාළව තිබෙන මේ ගනුදෙනුව අවසන් කළාම මොකද වෙන්නේ? ස්වෛරී බැඳුම්කරවල තිබෙනවා, ඩොලර් මිලියන 12,500ක්. ඒ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව 2015-2019 කාලයේ ගත්තු ණය, එනම් ස්වෛරී බැඳුම්කර වෙළෙඳ පොළට නිකුත් කරලා ගත්තු ණය. එහි පොලී අනුපාතයේ average එක ගත්තොත්, සියයට 6.98යි. ඩොලර් මිලියන 2,500ක කල් පිරුණු බැඳුම්කර තිබුණා. ඒවාට පොලී ගෙවන්නේ නැතිවයි හිටියේ. නොගෙවපු පොලියත් එක්ක තවත් ඩොලර් මිලියන 1,700ක් පොලී එකතු වුණා. ඒ අනුව ගත්තාම, ඩොලර් මිලියන 14,200ක් සම්පූර්ණයෙන් බැඳුම්කර සඳහා ගෙවන්න අපට ඉතිරි වුණා. මේ ඩොලර් මිලියන 14,200 ම ගෙවා නිම කිරීම සඳහා වෙච්ච කාර්යභාරයක් තමයි ඉටු කරන්න, අවසන් කරන්න අපට දැන් සිදු වුණේ. ගරු මුදල් ඇමතිතුමාගේ ප්‍රකාශයත් එක්ක මෙතැන හිටපු සමහර මන්ත්‍රීවරු අපෙන් ප්‍රශ්න කළා, ඉදිරි මාස හතර සඳහා වන ණය සීමාව මෙහි සඳහන් පරිදි රුපියල් මිලියන 3,000ක් දක්වා වැඩි කරලා තිබෙන්නේ ඇයි කියලා. හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා මුදල් ඇමතිවරයා ලෙස 2024 අය වැය සම්මත කරද්දී ණය සීමාව වැඩි කරලා තිබුණා. ගණන හරියටම කිව්වොත්, රුපියල් බිලියන 7,350යි. ඒ, 2024 අවුරුද්දේ ස්වෛරී බැඳුම්කර වෙළෙඳ පොළේ ස්වෛරී බැඳුම්කර reissuance එකක් සඳහා වන මුදල් අවශ්‍යතාවක් සඳහායි. අන්න ඒ කටයුත්ත වෙනුවෙන් -ඒ නිකුත් කිරීම වෙනුවෙන්- මුදල් වෙන් කිරීම කරලා තිබුණා. මේ ගොල්ලෝ මේ ගනුදෙනුවේ අවසානයට -කෙළවරට- ඇවිල්ලායි සිටියේ. තවදුරටත් මේ පැටලිලිල්ලේ යන්න අපට වුවමනා නැහැ. මෙය අවසන් කරලා ආණ්ඩුව ලෙස අපේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යෑම සඳහා වන ප්‍රවේශයක් අපට වුවමනායි.

ජාත්‍යන්තර සංවිධාන අත් හැරලා ගනුදෙනු කරන ආණ්ඩුවක් නොවෙයි, අපේ ආණ්ඩුව. අපි ජාත්‍යන්තර සංවිධානත් එක්ක ගනුදෙනු කරනවා. රටක් හැටියට ඉස්සරහට යන අපේ වැඩ පිළිවෙළ ගැන, "Clean Sri Lanka" වැඩ පිළිවෙළ ගැන ජනාධිපතිවරයා රටට කියා තිබෙනවා. එම වැඩ පිළිවෙළත්, මේ රට පොහොසත් රටක් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළත් එක්ක ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කරගෙන, මේ සියල්ල නිවැරදි කරගෙන, පිළිවෙළක් කරගෙන ඉස්සරහට යන්න අපට ඕනෑ. එහෙම යන කොට මේ සියලු ආයතන පිළිවෙළක් කරගෙන යන්න අපට ඕනෑ. එම නිසා මේ වැඩ ටික ඉවර කර ගන්න අපට ඕනෑ. සියයට 99ක් අවසන් කරලා තිබුණු ඒ සාකච්ඡා තවත් ඇදගෙන යන්න අපට වුවමනා නැහැ. ඒ නිසා තමයි අප ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟත් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළේ. මේ ස්වෛරී බැඳුම්කරවලට අදාළව නැවත නිකුතුවක් සිදු කරන්න කරපු සාකච්ඡාවේ එකඟතා අනුව තමයි; රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයා අත්සන් කරපු ගිවිසුමේ එකඟතා අනුව තමයි, ස්වෛරී බැඳුම්කර නැවත නිකුත් කිරීම සඳහා එකඟ වෙලා තිබෙන්නේ. Haircut එක සියයට 27යි. එහිදී ඇති වූ එකඟතා අනුව ඇමෙරිකානු ඩොලර් මිලියන 14,200ට සියයට 27ක haircut එකක් ආවාම සාමාන්‍යයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 10,000ක පමණ reissuance එකක් කරන්න ඕනෑ. රුපියල් බිලියනවලින් ගත්තොත්, බිලියන 3,000ක ණය ගැනීමක් අවශ්‍ය වන්නේ ඒ නිසායි. අපි මේ ණය ගැනීමේ අවශ්‍යතාව පෙන්වා තිබෙන්නේ, මෙන්න මේ ස්වෛරී බැඳුම්කර ඩොලර් මිලියන 10,000 වෙනුවෙන් රුපියල් බිලියන 3,000ක reissuance එකක් කරන්නයි; ඒ ඩොලර් බිලියන 10ට අදාළව ප්‍රතිණය නිකුතුවක් සිදු කරන්නයි.

ඒ ස්වෛරී බැඳුම්කර වෙනුවෙන් මේ කියන රුපියල් බිලියන 3,000 නිකුත් කරලා අපි මේ වැඩේ අවසන් කරන්නයි යන්නේ. පූර්ව එකඟතාවකට පැමිණි ගිවිසුමේම කොන්දේසි අනුවයි අපි යන්නේ.

ඊයේ කබීර් හෂීම් මන්ත්‍රීවරයා මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කරන්න යෙදුණා, "ඇයි මේක සියයට 17 දක්වා අඩු වෙනවා නේ?" කියලා. මොකක්ද කාරණය? මේ තමයි ගහලා තිබෙන ගිවිසුමේ කොන්දේසි; මේ තමයි ඇවිත් තිබෙන එකඟතාවේ කොන්දේසි. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඒ කොන්දේසි අනුව ඒගොල්ලන් එකඟ වෙලා තිබෙන්නේ මොකක්ද? සංවර්ධනය අනුව ගෙවන්න තිබෙන ගෙවීමේ ප්‍රමාණය අඩු කර ගන්නවා. ඒකට අපි නොවෙයි එකඟ වුණේ. එකඟ වෙලා තිබෙන්නේ ඒගොල්ලන්.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු ඇමතිතුමනි, ඒක තමයි අපි කිව්වේ ඒ ගිවිසුම තවම අත්සන් කරලා නැහැ කියලා. ඉතින්, ඒක cancel කර ගන්න පුළුවන්. මේ ආණ්ඩුවට කොන්දක් තිබෙනවා නම්, ඒක අවලංගු කරන්න. ඒ ගැන ඇයි මෙච්චර කථා කරන්නේ? කථා කරන්න දෙයක් නැහැ. ඒ කාරණය මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ඒ සම්බන්ධයෙන් විවාදයක් ගන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා දැන් අහගෙන ඉන්න. දැන් මම කියන්නම්.

ජනාධිපතිවරණයට දින දෙකකට කලින් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා ඒ පූර්ව කොන්දේසි සහිතව, එකඟතාව සහිතව තමයි මේ ගිවිසුම අත්සන් කරලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
නැහැ, නැහැ, අත්සන් කරලා නැහැ. ඒක අසත්‍යයක්.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔන්න ඕක තේ කියන්නේ.

ගරු කථානායකතුමනි, ඒ පූර්ව කොන්දේසි සහිතව ඇවිත් තිබෙන එකඟතාව තමයි මේ ක්‍රියාත්මක කරන්නේ. එකඟතාවට ඇවිත් තිබෙන වැඩේ තමයි මේ කරන්නේ.

දැන් මෙතුමන්ලා බලාගෙන ඉන්නවා, ජාතික ජන බලවේගය ආණ්ඩුවත් කඩාගෙන පැනගෙන ගිහින්, ආණ්ඩුව අවුල් කරගෙන, ලෝකය ඉදිරියේ රට අවුල් කර ගන්නා වැඩකට පනියි කියලා. මේ රට පිළිවෙළක් කරගෙන ඉදිරියට යන්නයි අප මේ ලෑස්ති වෙන්නේ.

රට බංකොලොත් කළේ මේගොල්ලන්. අවුරුදු 76ක් මේ රට පාලනය කළ අයගේ පැටිකිරිය කියන්න මේ විනාඩි 20 මදි, ගරු කථානායකතුමනි. අවුරුදු 76ක් රට පාලනය කරලා, මේ රට ට්‍රිලියන 30ක් ණය කරලා ණය ගෙවා ගන්න බැරි තැනට මේ රට වට්ටපු අය අද මැජික් කරන්න කියනවා. මේ රට හදන සංවර්ධන වැඩ පිළිවෙළ අපි රටට ඉදිරිපත් කළාම, ඒක විශ්වාස කරපු රටේ ජනතාව තමයි තුනෙන් දෙකකට වැඩි බහුතර බලයක් අපට දුන්නේ. ඒ මහ ජනතාවගේ විශ්වාසය, බලාපොරොත්තුව ඉටු කරන්න තමයි අපි අපේ වැඩ පිළිවෙළ මේ රටේ ක්‍රියාත්මක කරන්න හදන්නේ. ඒ සඳහා තිබෙන බාධක ටික ඉවත් කරගෙන අපි අපේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අපි මොහොතකට මෙහෙම කල්පනා කරමු. මේ රට බංකොලොත් නොවූ රටක් වුණා නම් අපට කොහොමත් ඉදිරියට යන්න වෙනවා; ණය ගෙවන්න වෙනවා; ණය ගෙවාගෙන ඉදිරියට යන්න වෙනවා. එහෙම වුණා නම් ඒ රටවල් එක්ක මීට වඩා හොඳට සාකච්ඡා කරන්න අපට පුළුවන්. අප ලෝකයේ ණය ගත්තු රටවල් එක්ක වඩා හොඳින් සාකච්ඡා කරගෙන මේ වැඩේ කරගෙන යන්න පුළුවන්. නමුත්, සාකච්ඡා වෙනුවට ඩීල් දාලායි තිබුණේ; ඩීල් එක්කයි වැඩ කරලා තිබුණේ. ඒ නිසා තමයි, සමහර සාකච්ඡාවල කාරණා තවමත් හෙළිදරව් වෙමින් තිබෙන්නේ. ගත්ත සමහර ණයවල මුදල් ලංකාවට ඇවිත් නැහැ. දැන් අපි ඒවා ගැන forensic auditsවලට ගිහිල්ලා තිබෙනවා. ඒ සමහර ආයතනවලට ගත්ත ණය දැන් forensic audits හරහා හොයන්න වෙලා තිබෙනවා. මොකද, එ් ගත්ත ණය මුදලින් රට ඇතුළට ඇවිල්ලා තිබෙන්නේ සියයට 40යි, 50යි, 55යි. IMF එක පිළිබඳ කථාව මම මෙතැනින් අවසන් කරනවා.

ගරු කථානායකතුමනි, මේ රට ගොඩනඟන වැඩ පිළිවෙළ තුළ ඉස්සරහට යනකොට මේ සංවාද, සාකච්ඡා අවසන් කරලා, "Clean Sri Lanka" වැඩ පිළිවෙළ හරහා මේ රටම clean කරන්න තමයි අපි උත්සාහ කරන්නේ. ඒ ගමන යනකොට කියන්න ඕනෑ කථා ටිකක් අපට තිබෙනවා, ගරු කථානායකතුමනි. මාස 4කට මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරලා මේ යන ගමනේදී ලබන අවුරුද්ද සඳහාත් අපට අය වැයක් ඉදිරිපත් කරන්න වෙනවා.

ගරු කථානායකතුමනි, අපේ රටේ මේ මොහොතේ පවතින බඩු මිල ගැන අපෙන් ඇහුවා. බඩු මිල ගැන අපෙන් අහනකොට හාල් ප්‍රශ්නය ගැන, පොල් ප්‍රශ්නය ගැන ඇහුවා. ඊයේත් බඩු මිල ගැන විවිධ ප්‍රශ්න ඇහුවා. ඇත්තටම සහල් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. මොකක්ද ප්‍රශ්නය? අපේ රටේ ජනතාව දිනකට සහල් මෙට්‍රික්ටොන් 6,500ක් පමණ පරිභෝජනය කරනවා. මාසයකට සහල් මෙට්‍රික්ටොන් 200,000ක් පමණ වුවමනා වෙනවා. හැබැයි, අපේ රටේ පාරිභෝගික අවශ්‍යතාවට වඩා ගොවියාගේ නිෂ්පාදනය වැඩියි. ඒ වාගේම විවිධ කර්මාන්තවලටත් සහල් මිලදී ගැනීම කරනවා. බිත්තර කර්මාන්තයට, කුකුළු මස් කර්මාන්තයට, විසිතුරු මත්ස්‍ය කර්මාන්තයට ආදී විවිධ ක්ෂේත්‍රවලට සහල් අවශ්‍ය වෙනවා. බිත්තර දමන කිකිළියන් එක්කෝටි විසිපන් ලක්ෂයකට කෑම දෙනවා, දිනකට. ඒ වාගේම, ඒ ගොල්ලන්ගේ පැටවුන්ට තවත් ලක්ෂ 80කට කෑම දෙනවා. කුකුළු මස් කර්මාන්තය ගත්තොත්, සාමාන්‍යයෙන් කුකුළු මස් කර්මාන්තයෙන් දිනකට මිලියන එකහමාරක් පමණ මස් හැටියට market එකට එනවා. මේ ප්‍රමාණය එක්ක බැලුවාම මේ කර්මාන්තයට අතිවිශාල ලෙස සහල් අවශ්‍ය වෙනවා.

ඒ විතරක් නොවෙයි, අස්වැන්න පිළිබඳ විවිධ තැන්වල තිබෙන දත්ත - data - අරගෙන බැලුවාම අපේ රටේ විවිධ කර්මාන්තවලට, මනුෂ්‍ය පරිභෝජනයට අවශ්‍ය වන සහල් ප්‍රමාණය සැලකුවාම තිබෙන ප්‍රමාණාත්මක සාධකය ගැන ගැටලුවක් තිබෙනවා. බඩ ඉරිඟු නිෂ්පාදනය ගත්තත්, අපි දැනටමත් පිට රටින් ගෙනෙන්න අවසරය දීලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. බඩ ඉරිඟුවලින් එතනෝල් නිෂ්පාදනය කරනවා. ඒ නිසා සෙවනගල, පැල්වත්ත කර්මාන්තශාලාවල සීනි නිෂ්පාදනයේ අතුරු නිෂ්පාදනයක් හැටියට එන එතනෝල් ටික - ස්ප්‍රීතු ටික - අද ගොඩගැහිලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. අපි ආනයනික සීනි සඳහා VAT අය කරන්නේ නැහැ. හැබැයි, අපේ රටේ නිෂ්පාදනය කරලා විකුණන සීනිවලට VAT අය කරනවා. මේ තත්ත්වය නිසා අද ඒ කර්මාන්ත දෙකත් අර්බුදයට ගිහිල්ලා තිබෙනවා. ඒවා වෙනස් කරන්න අපි ඉදිරියේදී කටයුතු කරනවා. අද මේ කර්මාන්තවල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා වෙළඳ පොළ තුළ අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ ගිහින් තිබෙනවා. ඉදිරියට එමින් තිබෙන්නේ උත්සව සමය. අල, ලූනු, පරිප්පු, සීනි, පිටි, බිත්තර හා හාල් කියන පාරිභෝගික භාණ්ඩ පිළිබඳ ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙනවා. හාල් ප්‍රශ්නය ගැන මම කියන්නම්. හාල් ප්‍රශ්නය ගැන අපි දිගටම හොයාගෙන ගියා, ගරු කථානායකතුමනි. මම ඊයේ තොරතුරු හොයා ගත්තා. සමහර මෝල් හිමියන්ට අපේ රටේ ප්‍රධාන රාජ්‍ය බැංකු රුපියල් බිලියන 15ක් පමණ ණය දීලා තිබෙනවා, ගරු කථානායකතුමනි. හැබැයි, බැංකුවෙන් ණය ගත්තාට ඒගොල්ලෝ වෙළඳ පොළට හාල් නිකුත් කරන්නේ නැහැ. ඒකයි ප්‍රශ්නය. අපි ඒ හාල් මෝල් හිමියන් ගෙන්වලා කථා කළා. අපි ඒගොල්ලන්ට කිව්වා,-

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂණ රාජකරුණා මහතා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කෙටියෙන් ප්‍රශ්නය ඇහුවොත් මට ලේසියි.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
හොඳයි.

ගරු ඇමැතිතුමනි, ඉදිරියේදී නත්තල් සහ උත්සව සමය එන්නේ. දැන් ප්‍රධාන ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා, හාල් හිඟය වාගේම ඒ මිල ගණන්. හාල් හිඟය පිළිබඳව ඔබතුමන්ලා දිගින් දිගටම කිව්වා, මහා පරිමාණ හාල් මෝල් හිමියන් සමඟ සාකච්ඡා කරනවා කියලා මේ ප්‍රශ්නය විසඳන්න. නමුත් තවමත් - අදටත් - ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ. අපි කියන්නේ හාල් හංගාගෙන ඉන්නවා නම් ඒකට අවශ්‍ය පියවර ගන්න. දැන් අමාත්‍යවරයෙක් කිව්වා, වී නිෂ්පාදනය කරලා තිබෙනවා, හාල් නිෂ්පාදනය කරලා තිබෙනවා, නමුත්, market එකට ඇවිල්ලා නැහැ ඒවා හංගාගෙන ඉන්නේ කියලා. ඒ හංගාගෙන ඉඳීම පිළිබඳ නීතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම තමුන්නාන්සේලා සතුව තිබෙන්නේ. මේවා කොට්ටේ යට හංගාගෙන ඉන්න විධියක් නැහැ නේ. එම නිසා කරුණාකරලා ඔබතුමන්ලා සතු අධිකාරි බලය පාවිච්චි කරන්න. ඒ හාල් ටික මේ ලංකාවේ කොහේ හරි නේ හංගාගෙන ඉන්න ඕනෑ. ඒ හාල් ටික හොයලා market එකට දාලා මේ ප්‍රශ්නය විසඳීමට කටයුතු කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරපු ප්‍රශ්නය ඉතා වැදගත්. අපි මේ පිළිබඳව මහා පරිමාණ හාල් මෝල් හිමියන් සමඟ සාකච්ඡා කළා. කුඩා මෝල් හිමියන් සමඟ සාකච්ඡා කළා. කුඩා හාල් මෝල් හිමියන් ළඟ හාල් නැහැ. ඔබතුමා කිව්වා වාගේම මහා පරිමාණ මෝල් හිමියන් ළඟ හාල් තිබෙනවා. අපි ඒ ගොල්ලන්ටත් බැංකුවලටත් නිශ්චිතව මේ තොරතුරු දැනුම් දුන්නා. බැංකුවලින් ණය ගත් අය සහ ඔවුන් ගෙවිය යුතු ණය ප්‍රමාණයත් එක්කම අපි විස්තර අරගෙන තිබෙනවා. ඒ ගොල්ලන්ට ඒක දැනුම් දීලා තිබෙනවා. ඊයේ ඉඳන් මෝල් හිමියන් ගණනාවක් සතොසට සහල් දෙන්න පටන් අරගෙන තිබෙනවා. ඔබතුමා ගියොත්, අදත් -මේ වෙනකොට- මම මේ උත්තර දෙන්න නැඟිටින්න කලිනුත් සහල් කිලෝ ලක්ෂයක් සතොසට දීලා තිබෙනවා. ඊයේත් සහල් කිලෝ ලක්ෂයක් ගෙනාවා. අද හවස් වෙනකොට තව සහල් කිලෝ 50,000ක් එනවා. ඒ නිසා දෛනිකව සතොස හරහා සහල් බෙදීමට අපි කටයුතු කරලා තිබෙනවා, ඒ රුපියල් 220 ගණනේ.*[බාධා කිරීමක්]* නැහැ, මම මේ කියන්නේ සතොසට. අපි ඒ ගොල්ලන්ට කියලා තිබෙනවා වෙළඳපොළටත් දෙන්න කියලා. අපේ යෝජනාව,- *[බාධා කිරීමක්]* මන්ත්‍රීතුමා, අහගෙන ඉන්න. ඔබතුමා අහගෙන ඉන්නේ නැහැ නේ. අපි ඒ ගොල්ලන්ට දැනුම් දීලා තිබෙනවා, උපරිම සිල්ලර මිල - MRP - ගහලා තිබෙන්නේ නාඩුවලට රුපියල් 220යි. කැකුළු සහල් රුපියල් 210යි. සහල් රුපියල් 230යි සම්බා. උපරිම සිල්ලර මිලක් දාලා තිබෙනවා. අපි ඒ ගොල්ලන්ට දැනුම් දීලා තිබෙනවා, වෙළඳපොළට සහල් නිකුත් කරන්න කියලා. ඒ වාගේම අපි සතොසට සහල් දෙන්න කියලා තිබෙන්නේ වෙන මොකුත් නිසා නොවෙයි, රජයේ බැංකුවලින් ණය දීලා තිබෙන නිසා. රජයේ බැංකුවලින් ණය දීලා තිබෙනවා, නමුත් ඒ ගොල්ලන් සහල් දෙනවාද, නැද්ද කියන එක monitor කරන්න විධියක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තමයි ඉතුරු වෙලා තිබෙන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මගේ විනාඩි 20 ඉවරයිද? *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා බාධා කරනකොට මගේ වේලාව ඉවර වෙනවා. ඔබතුමාගේ ප්‍රශ්නයටයි මම උත්තර දුන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, මට දෙන්න පොඩි වේලාවක්.

ඔබතුමන්ලා මේ කියන්නේ, මහා පරිමාණ හාල් හිමියන් පිළිබඳව මේ ගැටලුව තිබෙනවා කියලා. නමුත් ඔබතුමන්ලා මීට වඩා දැඩි තීන්දුවක් ගනියි කියලා මේ රටේ ජනතාව බලාගෙන ඉන්නවා. පසුගිය කාලයේ ඔබතුමන්ලා කිව්වේ, මේ මෝල් හිමියන් ඇමතිවරුන්ගේ සාක්කුවේ ඉන්නේ කියලා. හැබැයි, දැන් අපි දකින්නේ නැහැ. දැන් ඔබතුමන්ලා, "අනේ අපි ඉල්ලීමක් කරනවා, අපි මේ අයට කථා කරලා බලාගෙන ඉන්නවා, සහල් එවනකම්" කියනවා. එහෙම බැහැ නේ. මේ ගොල්ලන්ගෙන් ඉල්ලීමක් කරන්න නොවෙයි, නීතිය ක්‍රියාත්මක කරන්න, වහාම. *[බාධා කිරීම්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාට මම සාක්කුවේ ඉන්න අය ගැනත් කියන්නයි යන්නේ. ඔබතුමන්ලාගේ ජාතික ලැයිස්තුවේත් ඉන්නවා එහෙම එක්කෙනෙක්. ජාතික ලැයිස්තුවේ ඉන්න එක්කෙනා ගැනත් කියන්නයි යන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, බිලියන තුනහමාරක් අරගෙන තිබෙනවා. එක ණයක් ඉස්ලමික් බැංකුවෙන් අරගෙන තිබෙන්නේ. ඉස්ලමික් බැංකුවෙන් ණය ලංකා බැංකුව හරහා දීලා තිබෙනවා. එහෙම දෙන්න බැහැ. *[බාධා කිරීමක්]* පොලී නැතුව දීලා තිබෙන්නේ. ඒ නිසා,- *[බාධා කිරීමක්]* ඔබතුමා කලබල වෙනවා නේ. ඔය දැක්කා නේ. ඇත්ත කිව්වාම කලබල වෙනවා. ඇත්ත කිව්වාම කලබල වෙන්න එපා, හර්ෂණ මන්ත්‍රීතුමා. *[බාධා*

[ගරු වසන්ත සමරසිංහ මහතා]

*කිරීමක්]* හර්ෂණ මන්ත්‍රීතුමා ඇයි කලබල වෙන්නේ? අර බලන්න, ඇත්ත කිව්වාම කලබල වෙනවා. *[බාධා කිරීමක්]* ඇත්ත කිව්වාම ඇයි කලබල වෙන්නේ? බිලියන තුනහමාරක් දීලාත් හාල් කිලෝ එකක් දෙන්නේ නැතුව ඉන්නවා. ඉතින් ඇයි කලබල වෙන්නේ? ඇයි ඔබතුමා කලබල වෙන්නේ? ඔබතුමා ඇහුවා ඒ අය කවුද කියලා. ඔබතුමා ඇහුවා නේ ඒ කවුද කියලා.*[බාධා කිරීමක්]* හර්ෂණ මන්ත්‍රීතුමා ඇහුවා කවුද කියලා. දැන් මම කිව්වා ණය ගත්ත කට්ටිය. රත්න හාල් මෝලට දීලා තිබෙනවා බිලියන තුනහමාරක්.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
එයා විතරද? [බාධා කිරීම්]

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
එයා විතරක් නොවෙයි. ඒක තමයි කිව්වේ. *[බාධා කිරීමක්]* කලබල වෙන්නේ ඇයි? කලබල වෙන්නේ ඇයි? ඇයි කලබල වෙන්නේ ඔබතුමා?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඒ නම් ටික කියන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒ නම් ටික කියන්නේ ඒක තමයි. ගරු කථානායකතුමනි, මම මේ කියමින් ආවේ මේකයි. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දෙබරෙට ගල් ගහන්න ලෑස්ති වෙන්න එපා. ගල් ගැහුවාම වදිනවා කියලා මතක තබා ගන්න. එතකොට අනිනවා හැම තැනින්ම. අපේ රටේ ලංකා බැංකුව, මහජන බැංකුව,-

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, මෙතුමා එක නමක් කියනවා. මෙතුමන්ලාගේ ජාතික ලැයිස්තුවේ හිටපු අය මේ රටට බෝම්බ ගහපු අයගේ ලැයිස්තුවෙත් ඉන්නවා. *[බාධා කිරීමක්]* මම අහන්නේ මේකයි. එක නමක් කියන්න ඕනෑ නැහැ. එක මෝල් හිමියෙකුගේ නමක් විතරක් නොවෙයි, තමුන්නාන්සේලා ඒ නම් ටික ඔක්කොම කියන්න. ජාතික ලැයිස්තුවේ තිබෙන එක නමක් අල්ලාගෙන කථා කරන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ලංකාවේ බැංකුවලින් සල්ලි අරගෙන එක හාල් ඇටයක් වෙළෙඳ පොළට නිකුත් කරන්නේ නැහැ. එක හාල් ඇටයක් වෙළෙඳ පොළට නිකුත් කරන්නේ නැහැ. ඒ නිසා අපි මෝල් හිමියන් ගෙන්වලා කථා කළා. එ් අය දැන් හාල් දෙනවා. එහෙම නොදෙන අය ඉන්නවා. එහෙම නොදෙන අයගෙන් එක්කෙනෙකුගේ නමක් තමයි දැන් කිව්වේ. *[බාධා කිරීමක්]* දෙන අය ගැන කියන්න ඕනෑ නැහැ. නොදෙන අය ගැන කිව්වේ. දෙන අය දැන් සතොසට ගෙනැල්ලා දෙනවා. ඒ නිසා නොදෙන අය ගැන තමයි මේ කියන්නේ. දෙන අය සහල් සතොසට ගෙනැත් දෙනවා. ඒ වාගේම ඒ ගොල්ලන් වෙළෙඳ පොළටත් දෙනවා. සහල් වෙළෙඳ පොළේ මාෆියාවක් හදපු අය පිළිබඳව ආණ්ඩුව ඊළඟ පාර ණය දෙද්දී තීරණයකුත් ගන්නවා. ඒක මතක තබා ගන්න. මේ පාර ආණ්ඩුව ගත්ත තීරණයත් එක්ක ඉන්නේ නැති නම් ඊළඟ පාර ණය දෙද්දී තීරණයකුත් ගන්නවා. රුපියල් 220ට හාල් දෙන්න පුළුවන්කම තිබෙද්දී, ජනතාව පීඩාවට පත් කරමින්, රුපියල් 235ට, රුපියල් 240ට හාල් දීලා අමතර ලාභ ලබන්න කටයුතු කළා, රටේ ජනතාවගේ සල්ලිවලින්ම බැංකුවලින් ණය අරගෙන ඒවා ගෙවන්නේ නැතිව.

ඒ විතරක් නොවෙයි, පොල්වලටත් මේකම කරන්න හැදුවා. වෙළෙඳ පොළ තුළ අතිරික්ත ලාභ ලබන්න, අමතර ලාභ ලබන්න මාෆියාවක් හදන්න හැදුවා, සමහර අය. ඒවාට අපි ඉඩ දුන්නේ නැහැ. ආණ්ඩුව මැදිහත් වුණා, වෙළෙඳ පොළ තුළ මේ තත්ත්වය පාලනය කරන්න. ගරු කථානායකතුමනි, ජනතාව විශ්වාසයක් තියලා ආණ්ඩුවත් එක්ක ආපු ගමනේ මේ කෙටි කාලය තුළ - ආණ්ඩුව හදලා සති දෙකක් යනකොට- මහ දැවැන්ත කුණාටු හදන්න හැදුවා. හැබැයි, මේ රටේ ජනතාව තියපු ඒ විශ්වාසය ආරක්ෂා කරමින්, ජනාධිපති අනුර දිසානායක සහෝදරයා එක්ක කැබිනට් මණ්ඩලයේ අපි තීරණ අරගෙන තිබෙනවා, මේ රටේ ජනතාව පීඩාවට පත් වෙන්න ඉඩ නොතබා - සහල් වෙළෙඳ පොළේ මාෆියා හදන්න හදපු අයට ඉඩ නොදී- වෙළෙඳ පොළ තුළ සහල් සුලබ කරන්න. ඒ වාගේම, වෙළෙඳ පොළ තුළ පොල්වලින් අමතර ලාභ ලබන්න හදපු ප්‍රශ්නයටත් අපි උත්තර හොයලා තිබෙනවා. උත්සව සමයේ වෙළෙඳ පොළ තුළ බඩු මිල ඉහළ දමන්න සමහර අය උත්සාහ කරද්දී, ඒවාටත් උත්තර හොයන්න අපි දැන් කටයුතු කරමින් ඉන්නවා.

ජනතාවට වඩා හොඳින් ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක් ගොඩනැඟීම වෙනුවෙන් කටයුතු කරන්න තීරණ අරගෙන තමයි අපි ආණ්ඩුවක් හැටියට ඉස්සරහට යමින් තිබෙන්නේ. ඒක නිසා මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරලා තිබෙන්නේ කෙටි කාලයක් ඉස්සරහට යන්න. ඒ කෙටි කාලයෙන් පස්සේ ඊළඟට එනවා, අපේ අය වැය. ඒ අය වැයත් එක්ක රාජ්‍ය සේවකයා, පෞද්ගලික අංශයේ සේවකයා, වතු සේවකයා විතරක් නොවෙයි මේ රටේ නිෂ්පාදකයා, කර්මාන්තකරුවාත්, එළඹෙන රට ගොඩනැඟෙන දිශාව අනුව "Clean Sri Lanka" වැඩ පිළිවෙළත්, මේ රට ගොඩනඟන වැඩ පිළිවෙළත් එක්ක මේ රටේ සියලු ජනතාවටත් වඩා හොඳ රටක ජීවත් වෙන්න පුළුවන් අනාගතයක් ගොඩනඟන්න අපි වැඩ කරනවා. ඒ වෙනුවෙන් අත්වැල් බැඳ ගන්න කියලා අපි මේ රටේ ජනතාවට ආරාධනා කරනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඒ සඳහා එකතු වෙන්න පුළුවන් නම් හිතේ කැතක් නැතුව ඒකට එකතු වෙන්න කියන ආරාධනය කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා.

[පූ.භා. 10.47]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට එකතු වෙන්න කියලා ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා කිව්වා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට යෝජනාවක් කරන්න කැමැතියි. ඔබතුමා ගරු සභාවේ පොඩ්ඩක් රැඳී සිටියොත් හොඳයි.

ගරු කථානායකතුමනි, අද අපි මේ සභාවට එනකොට කාන්තා ප්‍රචණ්ඩත්වයට එරෙහිව "Orange the World" කියලා හැමෝටම අතේ බැඳගන්න පටියක් බෙදලා දුන්නා. ගරු

කථානායකතුමනි, 2019 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වාර්තාවේ තිබෙනවා, වයස අවුරුදු 15ට වැඩි, ලංකාවේ කාන්තාවන් හතර දෙනෙකුගෙන් එක් කෙනෙකුට ලිංගික හෝ ශාරීරික ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා කියලා. ඒක ඉතා බේදජනක කථාවක්. අගමැතිතුමිය ඇතුළු කාන්තා සංසදයේ අනෙකුත් මන්ත්‍රීවරියන් අද තැඹිලි පාටින් ඇඳගෙන ඉන්නවා. අපටත් තැඹිලි පාට පටියක් දුන්නා. අපිත් ඒක අතේ දාගෙන ඉන්නවා. අද විතරක් නොවෙයි, හැම දාම අපි කාන්තා ප්‍රචණ්ඩත්වයට එරෙහිව නැඟී සිටින්න ඕනෑ. ඒක මම මෙතැන කියන්නේ මෙතැන ඉන්න කාන්තාවන්ට නොවෙයි, පුරුෂයන්ට. අපි තමයි ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

කොළඹ දිස්ත්‍රික්කයේ මට ඡන්දය ලබා දීපු 81,479දෙනාට මේ අවස්ථාවේ මගේ ස්තුතිය පුද කරන්න මම කැමැතියි. මේ ජයග්‍රහණය විශාල වගකීමක් හැටියට මම නිහතමානීව භාර ගන්නවා. පටු දේශපාලනයෙන් ඔබ්බට ගිහිල්ලා රට වෙනුවෙන් මගේ දායකත්වය දෙන්න මම බලාපොරොත්තු වෙනවා. වසර 15ක් පමණ කාලයක් අපේ මිත්‍රයකු හැටියට හිටපු අනුර දිසානායක අපේ මිත්‍රයා අද ජනාධිපතිවරයා වෙලා ඉන්නවා. එතුමාට මගේ ශුභාශිංසන එකතු කරන්න කැමැතියි. ඒ වාගේම අපි කාලයක් තිස්සේ - පසුගිය පාර්ලිමේන්තුවේ - හරිනි අමරසූරිය මැතිනියත් එක්ක වැඩ කළා. එතුමියටත් අපේ සුබ පැතුම් එකතු කරන්න කැමැතියි. අපිත් එක්ක ඉස්සර හිටපු බිමල් රත්නායක මැතිතුමා, වසන්ත සමරසිංහ මැතිතුමා, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා, ලාල් කාන්ත මැතිතුමා, නලින්ද ජයතිස්ස මැතිතුමා වැනි අය නැවතත් අපිත් එක්ක එකතු වෙලා තිබෙනවා. ඔවුන්ට ලොකු වගකීමක් භාර දීලා තිබෙනවා. ඒ සියලුදෙනාට මම සුබ පතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்திய கலாநிதி) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු සම්මත ගිණුම සම්බන්ධයෙන් රජයේ ප්‍රධානීන්ගේ ඉදිරිපත් කිරීම මම ඊයේ දිනයේදී අහගෙන සිටියා. එක තැනකදී කිව්වා, මන්ත්‍රීවරුන් කථාවල් අහගෙන ඉන්නේ නැහැ වාගේ කථාවක්. නමුත් මම පැහැදිලිව මේ කාරණය කියන්න කැමැතියි. මේ පාර්ලිමේන්තුවේ හැම තැනම - Library එක වාගේ තැන්වල - මේ කථා අහන්න පුළුවන්. ඒක නිසා Chamber එකේ හිටපු නැති පමණින්ම කථාව අහගෙන සිටියේ නැහැ කියලා කියන්න බැහැ. ඒ වාගේම ඒ සියලු කථාවල තිබුණේ රජයේ ඉදිරි වැඩ පිළිවෙළ ගැන විග්‍රහයක්. කොහොමද ඔබතුමන්ලාගේ පුනරුදය නිර්මාණය කරන්නේ කියන එක ගැනයි කියැවුණේ. විවාදය ආරම්භ කරමින් අපේ මිත්‍ර මහාචාර්ය අනිල් ජයන්ත මැතිතුමා කිව්වා, 2025 අය වැය හරහා කරන්න යන දැවැන්ත වෙනස්කම් ගැන. අනෙක් මන්ත්‍රීතුමන්ලාත් තමන්ගේ මතය ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කළා. ඒත් මේ විවාදය ඊයේත්, අදත් තිබෙන්නේ ඒ සම්බන්ධයෙන් නොවෙයි. මේ විවාදය තිබෙන්නේ, එන අවුරුද්දේ මැයි මාසයේ 1වැනි දා වෙනකල් ක්‍රියාත්මක වෙන Vote on Account එක සම්බන්ධව. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන්න නෛතික අවස්ථාව ලැබෙනවා. අපි ඒක මෙතැන තර්ක කළා. අපි ඒක පිළිගෙන තමයි මේ විවාදය ඉදිරියට අරගෙන යන්නේ. ඔබතුමන්ලාගේ ඉල්ලීම වන්නේ, පසුගිය රජය IMF එකත් එක්ක එකඟ වෙච්ච 2024 අය වැය යෝජනා ඒ පරාමිතීන්වලට අනුකූලව ඉදිරියට අරගෙන යන්න, ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පාර්ලිමේන්තුවේ අනුමැතිය ඒකට ලබා දෙන්න කියන එකයි.

ජනාධිපතිතුමාගේ කථාවේදී එතුමා කිව්වා, අවදානමක් තිබෙනවා කියලා. එතුමා කිව්වා, IMF වැඩ පිළිවෙළත් සමඟ පොඩ්ඩක් හෙළවුණොත් වැටෙනවා; එම නිසා ඒක ඒ විධියට ඉස්සරහට අරගෙන යන්න ඕනෑ කියලා. ඒක තමයි ඇත්ත කථාව. අපි දිගින් දිගටම මේ උදවියට මේක පෙන්වා දුන්නා. IMF එක අවශ්‍යයි. හරිද? නමුත්, එහි තිබෙන යම් කොන්දේසි පිළිබඳව අපේ ලොකු තර්කයක් අපි ඉදිරිපත් කළා. මේ වෙනස්වීම් විය යුතුයි කියලා දේශපාලන වේදිකාවේදී අපේ අදහස් අපි ඉදිරිපත් කළා. සමාජ සාධාරණය පිළිබඳව අපේ අවධානය මීට වඩා යොමු වෙන්න ඕනෑ කියලා අපි කිව්වා. නමුත්, ඔබතුමන්ලා දේශපාලන වේදිකාවේදී එදා යම් වෙනස් කථාවක් කිව්වා. නමුත්, මේ ඉදිරිපත් කරලා තිබෙන වැඩ පිළිවෙළින් කිසිම විධියකට ප්‍රතිපත්තීන්ගේ වෙනසක් ඉදිරිපත් වෙලා නැහැ. අපි වෙනසක් බලාපොරොත්තු වෙන්නේත් නැහැ. වෙනස බලාපොරොත්තු වන්නේ 2025 අය වැයෙන් පමණයි.

නමුත්, ඊට කලින් අපි කල්පනා කරන්න ඕනෑ, මේ අනුමැතිය ඉල්ලා තිබෙන Vote on Account එකෙන් මොනවාද ඉල්ලන්නේ කියලා. සංක්ෂිප්තයක් හැටියට පුනරාවර්තන වියදම රුපියල් බිලියන 976යි; මූලධන වියදම රුපියල් බිලියන 427යි. ඔක්කෝම රුපියල් බිලියන 1,403යි. ඒක තමයි ප්‍රාථමික වියදම. ඊට පස්සේ ණය සේවාකරණයට - මොකද, හැමදේම අපි අත් හිටෙව්වේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමා. World Bank, IMF, ADB, ඒවායේ ණය ඔක්කෝම අපි ගෙව්වා. ඒ අත් හිටවපු නැති ණය ගෙවන්න රුපියල් බිලියන 898කුත්, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රුපියල් බිලියන 3,275කුත් සහිතව මුළු ණය සඳහා ණය සේවාකරණයට රුපියල් බිලියන 4,172ක් ඉල්ලා තිබෙනවා. තවත් සුළු වියදමක් තිබෙනවා රුපියල් බිලියන 25ක. උපලේඛනවලට අනුව මුළු වියදම රුපියල් බිලියන 4,197යි. එහෙම නම් සම්පූර්ණ වියදම රුපියල් බිලියන 5,600යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ ඉල්ලීම තමයි ගෙවීම සඳහා ණය ගන්න ඉල්ලා තිබෙනවා, රුපියල් බිලියන 4,000ක්. ඒ පළමුවැනි මාස 4ට. ඒක දේශීයව හෝ විදේශීය වෙන්න පුළුවන් කියලා කියා තිබෙනවා. එහෙම නම් මේකෙන් ඇඟයුම් වෙන්නේ මාස 4ක ආදායම රුපියල් බිලියන 1,600යි. 2025 අවුරුද්දේ රාජ්‍ය ආදායම බලාපොරොත්තු වෙන්නේ රුපියල් බිලියන 4,800ක වාගේ ප්‍රමාණයක්. ආසන්න වශයෙන් රුපියල් බිලියන 5,000ක් කියලා අපට බලාපොරොත්තුවක් තියා ගන්න පුළුවන්. යම් විශාල වෙනස්කම් කරලා මේක වැඩි කර ගන්න හැකියාවක් තිබෙනවා ද කියලා අපි දන්නේ නැහැ; Budget එකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ මේ මුදල තමයි. නමුත්, ඕක තමයි අපි බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එක කාරණාවක් පිළිබඳව පමණයි මෙතැන කථා කරන්න බලාපොරොත්තු වන්නේ. ඒ තමයි, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කරපු ඉල්ලීම. ගරු වසන්ත සමරසිංහ මැතිතුමාත් මේ අවස්ථාවේ දී ඒක කථා

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

කළා. මොකද, ඒක තමයි විශාලම item එක. ඒ item එකේ ප්‍රමාණය රුපියල් බිලියන 3,275යි. එහෙම නැත්නම්, රුපියල් ට්‍රිලියන 3.275යි. අපේ ගරු වසන්ත සමරසිංහ මැතිතුමා කිව්වා, ඇමෙරිකානු ඩොලර් බිලියන 12.5ක haircut එකක් ලැබෙනවා කියලා. එතුමා කිව්වා, ඒ haircut එක සියයට 27ක් ලැබුණාම 9යි ගාණක් වෙනවා, ඊට පස්සේ ඒකට 1.7ක් එකතු කරන්න තිබෙනවා, past due interest එක, එතකොට 10යි ගණනක් එනවා; ඒක 300න් වැඩි කළාම තමයි මේ රුපියල් බිලියන 3,275ක් කියන ගණන හැදෙන්නේ කියලා. හැබැයි, එක දෙයක් කියන්න මම කැමැතියි. සියයට 27ක haircut එක නාමිකව විතරයි. ඔය haircut එක ලැබෙන්නේ MLB එකත් එක්ක පස්සේ, 2028 ජනවාරි මාසයේ. 2024 ඉඳලා 2027 වෙනකම් අපේ රටේ දළ දේශීය නිෂ්පාදනයේ අගය ඇමෙරිකානු ඩොලර්වලින් ගණනය කළාට පස්සේ, ඒකට අනුව තමයි haircut එක තීරණය වෙන්නේ. ඔබතුමන්ලාත් දන්නවා; අපිත් දන්නවා; Treasury එකත් දන්නවා; ISB holdersලාත් දන්නවා; Central Bank එකත් දන්නවා, අවසාන වශයෙන් මේ haircut එක සියයට 14.96ක වාගේ ප්‍රමාණයකට අඩු වෙනවා කියලා.

ගරු ඇමතිතුමනි, එතැනදී අපි බලාපොරොත්තු වුණා අවම වශයෙන්, - ඔබතුමා EPF එක සම්බන්ධයෙන් කථා කළා. මට මතකයි, අවුරුදු 15ක් තිස්සේ මේ සම්බන්ධයෙන් අපි මහ පාරේ වුණත් තර්ක කළා; සටන් කළා කියන එක. EPF එකට තමයි දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය අසාධාරණ විධියට වැදුණේ. - ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් හඬක් නඟයි කියලා. අවාසනාවකට ඒ දේ සිද්ධ වුණේ නැහැ. ගරු කථානායකතුමනි, අපි පිළිගන්නවා මේක book entry එකක් විතරයි කියලා. මේක 2023 අවුරුද්දේත් තිබුණා; 2024 අවුරුද්දේත් තිබුණා. එම නිසා අපි බොරුවට මේකට කෑකෝ ගහන්න අවශ්‍යතාවක් නැහැ. හැබැයි, ඒක නොවෙයි තර්කය. තර්කය තමයි, ඔබතුමන්ලා දේශපාලන වේදිකාවේ කියපු දේ සහ අද මෙතැනට ඇවිල්ලා කරන ඉල්ලීම. සියයට 99ක් විතර එකඟ වෙලා තිබුණා; අපට කරන්න දෙයක් නැහැ වාගේ කථාවක් මෙතුමා කියනවා. හැබැයි, කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වා, තවම මේක අත්සන් කරලා නැහැ කියලා. අත්සන් කරලා නැහැ තමයි. ඒකට දෙසැම්බර් මාසයේ 12වැනි දා වෙනකම් දින තිබෙනවා. ඒ කියන්නේ තව සතියක් තිබෙනවා. ඔබතුමන්ලා බලාපොරොත්තු වෙනවා, මේ international sovereign bondholdersලාගෙන් සියයට 90ක්වත් අවම වශයෙන් මේකට එකඟ වෙයි කියලා. හරි, මේකට තවම කල් තිබෙනවා. මොකද, මේක අත්සන් කරලා තිබෙනවා නම් මම අභියෝග කරනවා, ඒ අත්සන් කරපු එක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. මේක අත්සන් කරලා නැහැ. ඒක තමයි ඇත්ත කථාව. ඔබතුමන්ලාට කාලය තිබෙනවා. ඔබතුමන්ලා ඒ කාලය ප්‍රයෝජනයට ගන්නේ නැහැ. අපි මෙතැන ඇත්ත කථා කරමු. මම වැරදි නම් ඔබතුමන්ලාගේ පිළිතුරු කථාවේදී මේවා කියන්න.

JVP/NPP එකේ මතය වුණේ, මේ ණය හොරකම් කරලා කියන එක. එතුමන්ලාම කිව්වා, සමහර අවස්ථාවලදී ඒ ණය මුදල්වලින් ලංකාවට සියයට 53යි ඇවිල්ලා තිබෙන්නේ, සියයට 47ක් ඇවිල්ලා නැහැ කියලා. Liabilities ට්‍රිලියන 8ක් තිබෙනවා, හැබැයි assets තිබෙන්නේ ට්‍රිලියන 2යි. ට්‍රිලියන 6ක් හොරකම් කරලා වාගේ කථාවකුත් කිව්වා. ඒකට උගන්ඩාව වාගේ රටවලුත් පටලවා ගත්තා. හැබැයි අපි දිගින් දිගටම පැහැදිලි කළා, මේ liabilities තිබෙන්නේ Treasury එකේ, හැබැයි assets තිබෙන්නේ වෙන වෙන ආයතනවල කියලා. උදාහරණයක් හැටියට ගත්තොත්, RDA එකේ assets තිබෙනවා, UDA එකේ assets තිබෙනවා. හැබැයි, මහවැලි assets Treasury එකේ mark කරලා නැහැ. එතකොට මෙතැන තිබෙන්නේ accounting issue එකක්. ට්‍රිලියන 6ක් කවුරුවත් හොරකම් කරලා නැහැ. හොරකම් කරපු දේවල් ඇති; අපි නැහැ කියන්නේ නැහැ. ඔවුන්ව අල්ලන්න ඕනෑ, හිරේ දාන්න ඕනෑ. අපි අත් දෙකම උස්සලා ඒකට අපේ සම්පූර්ණ - සියයට 100ක - සහයෝගය දෙනවා, ගරු ඇමතිතුමනි.

නමුත්, මෙතැනදී ජනගත කළේ වෙන දෙයක්. අතිවිශාල ලෙස මුදල් හොරකම් කරලා කිව්වා. දැන් මෙතුමාම කිව්වා, සමහර අවස්ථාවල ණයවලින් සියයට 47ක් ලංකාවට ආවෙත් නැහැ, වෙන accountsවලට ගිහිල්ලා වාගේ කථාවක්. ඒ නිසා මේ ප්‍රශ්නයට විසඳුමක් තිබෙන්න ඕනෑ. මොකද, ඔබතුමන්ලාම කිව්වා, forensic audit එකක් කරනවා කියලා. ඒක කරන්න. හැබැයි, ඔබතුමන්ලා එතැනදී මොකක්ද කිව්වේ? ඔබතුමන්ලා කිව්වා, මේ ණය odious debt කියන එක. Odious debt is a concept which means that you take the loan for one thing and use it for something else. Essentially, in countries where dictators ruled, they had taken money and put them into their personal accounts and whether it was in Uganda or wherever, it does not matter. මේවා odious debts, ඒ නිසා මේක විගණනය කරනවා, විගණනය කරලා පස්සේ තමයි මේ ණය ගෙවන්නේ වාගේ කථාවක් ඔබතුමන්ලා කිව්වා. හැබැයි, දැන් මෙහෙම දෙයක් කිසිසේත්ම සිද්ධ වෙලා නැහැ. ණය හොරකම් කළා, අවුරුදු 76ක් තිස්සේ මේ රටේ කිසිම ධනාත්මක දෙයක් වුණේ නැහැ වාගේ කථාවකුත් කිව්වා.

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා ඊයේ ඉදිරිපත් කරපු තර්කයෙන් අපි හැමෝටම තේරුම් ගියා, අවුරුදු 76ක් තිස්සේ මේ රටේ ගොඩක් දේවල් සිද්ධ වුණු බව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම වුණේ නැහැ කියලා කියන්නේ කොහොමද? අපේ රට කුණු බක්කියක්ද, අද? නැහැ. එහෙම නොවෙයි, බොහෝ දේ සිද්ධ වුණා. මම ඒ ගැන මේ වෙලාවේ කථා කරන්න යන්නේ නැහැ. නමුත්, කනගාටුවට කාරණාවක් තිබෙනවා. මේ ණය අවුරුදු 76ක් තිස්සේ හොරකම් කළා. මේවා හොයන්න ඕනෑ. මේවා ගැන විගණනය කරන්න ඕනෑ. කබීර් හෂීම් මැතිතුමා මේ ගැන එක වචනයක් කියනකම් කිසිම කෙනෙක් මේ සම්බන්ධයෙන් කථා කළේ නැහැ. ණය හොරකම් කරන්න නම් ඒකේ දෙපැත්තක් තිබෙන්න ඕනෑ. ණය දෙන කෙනා දන්නවා, මේ ණය රටට අවශ්‍ය නැහැ කියලා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔහු දන්නවා, මේ projects overestimate කරලා කියලා. ණය ගන්න කෙනාත් ඒක දන්නවා. ඒ බව ණය දෙන කෙනාත් දන්නවා, ගන්න කෙනාත් දන්නවා. ඔය කාරණා නිසා තමයි ඔය "debt trap" කියන වචනෙත් හැදුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට දින 10කට පමණ පෙර චීන තානාපතිතුමා අදහස් ඉදිරිපත් කරලා කිව්වා, මෙම ව්‍යාපෘතිවලට "සුදු අලි" කියලා සමහරු කියනවා, එහෙම එකක් නැහැ, ඒවා සුදු අලි නොවෙයි, මේ ගත්ත ණය ගෙවන්න ඕනෑ කියලා. මේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම හරහා සමහර projectsවලට ගත් ණයෙන් සියයට 47ක් හොරකම් කළා කියලා මෙතුමන්ලා කිව්වාට, දැන් ඒවා ගෙවන්නත් එකඟ වෙලා තිබෙනවා. එහෙමනම් ඇයි රටට කිව්වේ, මේ හොරකම් කරපුවා එතුමන්ලා ගෙවන්නේ නැහැ වාගේ කථාවක්? මෙතැනදී ලොකු පරස්පරයක් තිබෙන බව මම කියන්න කැමතියි. මේ වෙලාවේ රැවුලයි, කැඳයි දෙකම බේරගන්න බැහැ. චීන තානාපතිතුමා සියයට 100ක් හරි. එතුමා කියන දේ අපි පිළිගන්නවා. මේ ණය ගෙවන්න ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා. නමුත් ජනතාව තේරුම් ගන්න ඕනෑ, මැතිවරණ කාලයේදී ජනතාව දැවැන්ත මුළා කිරීමකට ලක් වුණා කියන එක. මොකද ඔවුන් හිතුවා, ඇත්ත වශයෙන්ම අපි මේ ණය ගෙවන්න ඕනෑ නැහැ කියලා. එහෙම තමයි කිව්වේ. මේවා හොරකම් කරපුවා, මේවා නැවත ගේනවා,

එතුමන්ලා ඒවා ගෙවන්නේ නැහැ වාගේ කථාවක් තමයි කිව්වේ. නමුත්, දැන් ඒවා ගැන වචනයක්වත් කථා කෙරෙන්නේ නැහැ. ISBsත් ඒ විධියමයි. ඔබතුමන්ලා දිගින් දිගටම කිව්වා, DSA - Debt Sustainability Analysis - එක වෙනස් කරනවා කියලා, IMF එකේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සංශෝධනය කරනවා කියලා.

Hon. Deputy Speaker, I recall a debate at the Ceylon Chamber of Commerce. The Hon. Harshana Suriyapperuma and others participated with me. That was about two weeks before the Presidential Election. He, referring to and waving the JVP/NPP policy document said, "We will do our own DSA. We have almost completed it. The basis for discussion on the debt restructuring shall be our DSA." The verbatim of that debate is there and anybody can download it. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නය තිබෙන්නේ, these gentlemen are now denying it, saying that they never said it. I do not plan to waste my time on this anymore, but I say that it was pure deception. Our people fell for it and you all did it knowingly. That is my point, you all did it knowingly. So, you all did not change a single word in the Agreement that President Ranil Wickremesinghe's Government had almost agreed on. As I said, it is only up to the 12th of December for them to agree. Not only that, you never even sought to discuss debt restructuring based on your DSA or anybody else's DSA, as promised. ඔන්න ඕක තමයි ඇත්ත. 2024දී රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ඉල්ලපු රුපියල් බිලියන 3,275 අවසාන රුපියලටම ඔබතුමන්ලාත් අද ඉල්ලනවා.

Be that as it may. We will give you time; we will allow you to propose, in the 2025 Budget, your revolutionary plans to overhaul the economy. Since you say that we had been going completely on a wrong path, ඔබලාගේ අලුත් වැඩ පිළිවෙළ ඉදිරිපත් කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Harsha de Silva, you have two more minutes.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, I had 20 minutes.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Here, it was noted 17 minutes.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, I had 20 minutes and I will get a little bit more time.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

Give him two more minutes, Sir.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

So, with the three minutes left out of the 20 minutes and plus the two minutes I got now, I have five more minutes.

අපි බලමු, 2025 Budget එකෙන් රුපියල් ලක්ෂයේ ඉඳලා රුපියල් ලක්ෂ 2 වෙනකල් මාසික ආදායම් ලබන අයට කිසිම බද්දක් ගහන්නේ නැත්තේ කොහොමද කියලා. අපි ඒ සඳහා කාලය දෙනවා. අද ඒ ගැන කථා කරන්නේ නැහැ. මොකද, ලක්ෂ ගණනකට දීපු පොරොන්දුව තමයි, රුපියල් ලක්ෂ 2 දක්වා මාසික ආදායම් ලබන වැඩ කරන මිනිස්සු රජයට සතයක්වත් බදු ගෙවන්න ඕනෑ නැහැ කියන එක. අපි බලමු, කොහොමද ඒක කරන්නේ කියලා. ඒ පිළිබඳව වෘත්තියවේදීන්, ව්‍යවසායකයන් බලාගෙන ඉන්නවා. අපිත් බලාගෙන ඉඳිමු.

අපේ ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා කිව්වා, ආනයනික සීනිවලට බදු ගහන්නේ නැහැ, ලංකාවේ නිෂ්පාදනය කරන සීනිවලට බදු ගහනවා කියලා. ඒ වාගේම දෙසැම්බර් මාසයේ 31වැනිදායින් පස්සේ Special Commodity Levy එක අයින් කරලා ආනයනික ආහාරවලට සියයට 18ක VAT එකක් ගහන්න එකඟ වෙලා තිබෙනවා. එතකොට සියයට 18ක VAT එක ගහනවාද, නැද්ද? ආහාරවලට VAT එක ගහන්නේ නැහැ කියලා ඔබතුමන්ලා පොරොන්දු වුණා. ආනයනික ආහාරවලට සියයට 18ක VAT එක ගහන්න දැන් පොරොන්දු වෙලා තිබෙනවා. මම මේ විවේචනය කරනවා නොවෙයි, ගරු ඇමතිතුමනි. අපි බලාගෙන ඉන්නවා, ඔබතුමන්ලා මොකක්ද කරන්නේ කියලා. අපි බලමු Digital Services Tax එකට මොකද වෙන්නේ කියලා. ඒ වාගේම IT servicesවලට අදාළව බදු ගහනවාද කියලා බලමු. වාහන import කරනකොට ඒකට තව additional බද්දක් ගහනවාද කියලා බලමු. විදුලියටයි, ඉන්ධනවලටයි price formula එක පාවිච්චි කරනවාද නැද්ද කියලා බලමු. අපි ඔබතුමන්ලාට කාලය දෙනවා, system change එක කරලා පෙන්වන්න කියලා. මේ සම්බන්ධයෙන් මීට වඩා ලොකු විවේචනයක් අපි කරන්නේ නැතුව ඉන්නම්. නමුත්, මම වසන්ත සමරසිංහ ඇමතිතුමාට උත්තරයක් දෙන්න ඕනෑ සහල් සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට කලින් මම මොනවා කිව්වත්, මේක අලුත් පාර්ලිමේන්තුවක්. අලුත් බලාපොරොත්තු ගොඩක්. මගේ දේශපාලන මතවාදය මොකක් වුණත්, ජනතාව දැවැන්ත ජන වරමක් ඔබතුමන්ලාට දීලා තිබෙනවා. ඒක උපයෝගී කරගෙන රට සංවර්ධනය කරන්න පුළුවන් නම් අපි ඔක්කොම කැමැතියි. කවුරු කළත් මොකද? චීනයේ ඩෙන්ග් ෂියාඕපිංග් කියලා තිබෙනවා, "It does not matter the colour of a cat, if it catches mice" කියලා. අපි ඔක්කොටම අවශ්‍ය වෙලා තිබෙන්නේ, මේ රට දියුණු කරන්න. ඒකට තමයි අපි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. ඔබතුමන්ලා කිව්වා, විපක්ෂයේ අදහස් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න කියලා. ඒක තමයි මම මේ කරන්න උත්සාහ කරන්නේ. මොකද, ජනතාවගේ දැවැන්ත බලාපොරොත්තු තිබෙනවා, ඔබතුමන්ලා පිළිබඳව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බත් කන රටක්. අපි කවුරුත් ඒක දන්නවා. ඒ කියන්නේ, සහල් අපේ ජීවිතවලට ඉතාම වැදගත්. හැබැයි, දැන් සහල් පිළිබඳව දැවැන්ත ප්‍රශ්නයක් තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා විසින් 2022දී සහල්වලට පාලන මිලක් දැම්මා. ඒ, 13වෙනි ගැසට් එක. එතුමා 12වතාවක් ගැසට් reverse කළා. 13වෙනි ගැසට් එකෙන් තමයි කැකුළු සහල් කිලෝව රුපියල් 210යි, නාඩු කිලෝව රුපියල් 220යි, සම්බා කිලෝව රුපියල් 230යි කියලා මිල දාලා

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

තිබෙන්නේ. හැබැයි, ප්‍රශ්නය මෙයයි. රුපියල් 210ට, රුපියල් 220ට මිලක් දැම්මත්, අද රුපියල් 250ට, රුපියල් 255ට කඩවලින් නාඩු ගන්න පුළුවන්. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ. සතොසෙන් සහල් කිලෝ 5ක් දෙනවා, පොල් ගෙඩි 3කුත් එක්ක. එහෙම නොවෙයි මම කියන්නේ. මේක නිදහස් ආර්ථිකයක්. ඒ නිසා අපට ඕනෑ ප්‍රමාණයට ගන්න පුළුවන් වෙන්න ඕනෑ. නමුත්, එහෙම නැහැ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, මම ඔබතුමාට උත්තර දෙන්නම්. ඇත්ත කථාව මෙයයි. දැන් සුපිරි වෙළෙඳ සැල්වල හාල් බක්කි හිස්. ඔබතුමන්ලා කිව්වා, හාල් ඇටයක්වත් පිටරටින් ගේන්නේ නැහැ කියලා. ඒක තමයි කිව්වේ. හැබැයි, ඊයේ - පෙරේදා ගැසට් එකක් ගහලා තිබෙනවා, ඕනෑම කෙනෙකුට සහල් ගේන්න පුළුවන් දෙසැම්බර් මාසයේ 20වැනි දා වෙනකල් කියලා. මම හිතන්නේ සහල් මෙට්‍රික් ටොන් ලක්ෂ 3ක් පමණ ගේන්න නියමිතයි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Wasantha Samarasinghe?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඒ කටයුත්ත අපි දෙසැම්බර් 20 වෙනකල් open කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා මේ වෙනකොට ගේන්න පුළුවන් උපරිම ප්‍රමාණය ගේන්න. අපි ආනයනකරුවන් එක්ක සාකච්ඡා කරලා තමයි මේ වැඩේ කළේ. මොකද, ගංවතුර නිසා නැඟෙනහිර පළාතේ තිබෙන කුඹුරුවලට විශාල damage එකක් වුණා. කුඹුරු අක්කර 70,000කට වඩා නැවත වපුරන්න සිද්ධ වුණා. ඒකත් එක්ක තමයි මේ ප්‍රශ්නය ආවේ. ටොන් 50,000ක් පමණ තමයි ගේන්න පුළුවන් කියන අදහස ඔවුන්ට දැනටත් තිබෙන්නේ. LCs open වෙලා තිබෙන ප්‍රමාණය සම්බන්ධයෙනුත් දැන් ප්‍රශ්නයක් තිබෙනවා. අපි ටෙන්ඩර් එකක් දාලා තිබෙනවා, ටොන් 52,000කට. ගොවියාටත් හානියක් නොවෙන්න, වෙළෙඳ පොළත් පාලනය කරන්න පුළුවන් ප්‍රමාණයක් තමයි ගරු හර්ෂ මන්ත්‍රීතුමනි, අපි ගේන්න සූදානම් වෙලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හරි. ඔබතුමා කිව්වා, බියර්වලට මෙට්‍රික් ටොන් 25,000ක් විතර යනවා, එතනෝල්වලට මෙට්‍රික් ටොන් 30,000ක් විතර යනවා, කුකුළු ගොවි පොළවලට මෙට්‍රික් ටොන් 250,000ක් විතර යනවා, කොහොමත් හාල් -වී නොවෙයි- මෙට්‍රික් ටොන් ලක්ෂ 8ක් විතර දැනටත් ඉතුරු වෙලා තිබෙනවාය කියලා. අපි ඕනෑ නම් ඒ ගැන පසුව එළියේදී කථා කරමු. ලොකු මෝල් හිමියන් එක්ක කථා කළා. පොඩි මෝල් හිමියන් එක්ක කථා කළා. ඊට පස්සේ අපි දැක්කා, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මාධ්‍ය කණ්ඩායමක් එක්ක ගිහිල්ලා මෝල්වලට පනිනවා; වාර්තා හදනවා. ඒ ඔක්කෝම කරලා, ගැසට් එක ප්‍රකාරව රුපියල් 210ට-220ට විකුණන්න කිව්වත් දැන් ඒ මිලට විකුණන්න බැහැ; සතොසේ ඒ මිලට පොඩ්ඩක් දෙනවා ඇති. ආනයනය හරහා අද - හෙට වනකොට ඒ ප්‍රශ්නය විසඳෙයි. දැන් ඔබතුමා කිව්වා, බැංකුවලින් ණය දීලා තිබෙනවා, ඒ නිසා දීපු ණය ප්‍රකාරව ඔවුන්ට සහල් release කරන්න කියා force කරනවාය කියලා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔව්.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒක වෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. ඒවා ඔක්කෝම temporary solutions. Temporary solutionsවලින් අද - හෙට දක්වා මේ ප්‍රශ්නය balance කර ගන්න පුළුවන් වෙයි. ඒක නොවෙයි මම මේ කියන්න යන්නේ. ඇත්ත වශයෙන්ම හාල් import කිරීමෙන් මොකද වෙන්නේ? ලොකු මෝල් හිමියන්ට ලොකු ලාභයක් ලැබෙනවා. පොඩි මෝල් වැහෙනවා. ඒක තමයි ලොකු මෝල් හිමියෝත් ඉතා ඕනෑකමින් කියන්නේ, හාල් import කරන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැටලුව,- *[බාධා කිරීමක්]* වසන්ත සමරසිංහ ඇමතිතුමා, මේ කාරණය කියන්න මට විනාඩියක් දෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමා කියපු ඒ කාරණය වැරදියි. ලොකු මෝල් හිමියන්ට වුවමනා නිසා හාල් ආනයනය කරන්නේ නැහැ. ඔබතුමාම දැන් කිව්වා, අපි වැඩිපුර කන්නේ බත්, ඒ නිසා ජනතාවට හාල් ඕනෑ, නමුත් හාල් හිඟයක් තිබෙනවාය කියලා. එතකොට ඒක ලොකු මෝල් හිමියන්ගේ වුවමනාවක් නොවෙයි. ලොකු මෝල් හිමියන්ට ණය දීලා, නමුත් වෙළෙඳ පොළට හාල් එන්නේ නැති නිසා හාල් නිදහස් කරන්න ඒ අයටත් යම් ප්‍රමාණයකට බලපෑමක් කරන ගමන් වෙළෙඳ පොළේ ඇති හාල් හිඟය සමනය කිරීම ඉලක්ක කරගෙන, ගොවියාත් ආරක්ෂා කරගෙන තමයි සීමාවක් සහිතව හාල් ගෙන්වන්නේ. එහෙම නැතුව පොඩි මෝල් හිමියා නැත්තට නැති කරලා ලොකු මෝල් හිමියා පොහොසත් කරන්න අපි හාල් ගෙන්වන්නේ නැහැ, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි. ඊළඟට ඔබතුමා කිව්වා, කෙටි කාලීනව තමයි අපි මේ උත්තරය දෙන්නේ කියලා. නමුත් මතක තබා ගන්න, ජනාධිපතිවරයාත් මේ පිළිබඳව දැඩි අවධානයෙන් ඉන්න බව. මැදි කාලීන සහ දිගු කාලීන උත්තරත් හොයලා නැවත ලංකාවේ මෙවැනි ප්‍රශ්නයක් ඇති නොවන විධියට අපි කටයුතු කරනවා; ලබන අවුරුද්දේ මේ ප්‍රශ්නය ඇති වෙන්න දෙන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ලොකු මෝල් හිමියන් කැමැතියි, හාල් ගෙනෙනවා නම්. මොකද, වී නොවෙයි නේ, හාල් නේ ගෙනෙන්නේ. එතකොට පොඩි මෝල් හිමියන්ට අඹරන්න වී නැහැ; හාල් ගෙනෑල්ලා. ඉතින් ඒකෙන් වෙන්නේ මොකක්ද? Brand එකක් තිබෙන කට්ටිය ඒ brands පවත්වාගෙන යනවා. පොඩි මෝල් හිමියන්ට ඒකෙන් පහරක් වදිනවා. [බාධා කිරීමක්] Could you please reply later? - *[Interruption.]* Sir, let him reply later.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැටලුව අද - ඊයේ ඇති වෙච්ච ගැටලුවක් නොවෙයි. අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපති වුණු නිසා ඇති වුණු එකක් නොවෙයි. ඒ නිසා මේ ප්‍රශ්නය ගැසට් ගහලා විසඳන්න බැහැ; මිලිටරිය දාලා විසඳන්නත් බැහැ; මගේ මිත්‍රයා වුණත් වසන්ත සමරසිංහ ඇමතිතුමනි, ඔබතුමාට ඔබතුමාගේ බලය පාවිච්චි කරලා විසඳන්නත් බැහැ. මේ ගැටලුවට විසඳුම තිබෙන්නේ වෙළෙඳ පොළ ඇතුළේමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. *[බාධා කිරීමක්]* මම මේ කාරණය කියලා මගේ කථාව නවත්වනවා.

ඔබතුමා අපෙන් අදහස් ඉල්ලුවා නේ. ඒ නිසා අදහසක් දෙන්නම්. 2018දී මේ ප්‍රශ්නය ලොකුවට පැන නැඟුණා. පරාටේ නීතිය හරහා පොඩි මෝල් හිමියන්ගේ දේපළ auction කරන්න ගියා. එතකොට අපි මේ ප්‍රශ්නය ගැන ගැඹුරින් අධ්‍යයනය කළා. ඊට පසුව තමයි ගරු ඇමතිතුමනි, "ශක්ති සහල්" කියන ව්‍යාපාරය අපි පටන් ගත්තේ. වී වගා කරන දිස්ත්‍රික්ක අටක් එකතු කරලා, කුඩා මෝල් හිමියන් - SMEs - 250කට වඩා, ගොවි මහත්වරු 10,000කට වඩා එකතු කරලා, අපි ශක්ති සහල් සමුපකාර ක්‍රමය හැදුවා. එදා වී කිලෝව මිලදී ගත්තේ රුපියල් 38ට සහ 41ට. ඒ හරහා 2019 නොවැම්බර් මාසයේ මැතිවරණයට කලින් දවසේ අපට පුළුවන් වුණා, නාඩු කිලෝව රුපියල් 85ටත්, සම්බා කිලෝව රුපියල් 90ටත් විකුණන්න. එතකොට මාර්කට් එකේ සම්බා කිලෝව රුපියල් 114ට ඉහළ ගිහිල්ලා තිබුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, your time is up.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I am going to finish up, Sir.

හැබැයි, ඒ සමුපකාර ක්‍රමය හරහා අපි ලොකු මෝල් හිමියන්ට එහෙම නැත්නම් කතිපයාධිකාරයට challenge කළ නිසා ඔවුන්ට සිදු වුණා, රුපියල් 114 ඉඳලා රුපියල් 95ට හාල් මිල පහළට ගෙන යන්න. ඒ නිසා අපට වෙළෙඳ පොළේ සියයට තුන හතරක විතර ප්‍රමාණයක් ලබා ගන්න පුළුවන් වුණා. ගරු ඇමතිතුමනි, ඔබතුමා statistics අරගෙන බලන්න. 2019 වර්ෂයේදී යම් එක මිලකට, සාධාරණ හා ස්ථාවර මිලකට මේ රටේ හාල් විකුණා ගන්න හැකියාවක් තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, "ශක්ති සහල්" ව්‍යාපාරය නැවතත් පටන් ගන්න කියලා. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා ඒක කරන්න. ඔබතුමන්ලා හිතනවා නම් ඒකෙන් අපට ලකුණු වැටෙයි, අපට credit එක වැටෙයි, ඒ නිසා "ශක්ති" නමින් කරගෙන යන්න බැහැ කියලා, "ශක්ති" නැතුව වෙන නමකින් හරි පටන් ගන්න.

අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කරනවාය කියලා ඔබතුමන්ලා කියනවා. මේක තමයි අලුත් දේශපාලන සංස්කෘතිය, වසන්ත සමරසිංහ ඇමතිතුමනි. ඔබතුමන්ලා ඉදිරිපත් කරනවා, රට වෙනුවෙන් අපි සහයෝගය ලබා දෙනවා. ඉතින් ඒ නිසා ඔබතුමන්ලා කමිටුවක් පත් කරන්න. අපිත් ඒ සඳහා එකතු වෙන්නම්. කිසිම කුහක බවක් නැහැ. මේ ප්‍රශ්නය විසඳන්න ආණ්ඩුවත්, විපක්ෂයත් එකතු වෙමු.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමා, පොඩි පැහැදිලි කිරීමක්. දැන් ඔබතුමා කියන්නකෝ, ඔබතුමා කියපු "ශක්ති සහල්" හරි මොකක් හරි එක ඇයි continue නොවුණේ කියලා. ඔබතුමන්ලා අවුරුදු 5ක් හිටියානේ. අවුරුදු 5ක් හිටියා. *[බාධා කිරීමක්]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගෝඨාභය රාජපක්ෂ මහත්තයා,- *[බාධා කිරීමක්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
No, no. I just want to clarify this. You have to answer my question, Hon. Member. Then, why could you not continue that system?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (continue Dr.) Harsha de Silva)
හරි, ඒක කරගෙන ගියා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඇයි කරගෙන ගියේ නැත්තේ?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා සම්පූර්ණයෙන්ම ඒක දේශපාලනීකරණය කළා; ඒකට directorsලා පත් කළා; ඒකට නොයෙකුත් හොර වැඩ කළා; ඒක විගණනය කළා. ඊට පස්සේ ඒක නවත්වලා දැම්මා. ඒ විධියට ඒක දේශපාලනීකරණය කළා. කවදාවත් ඒක දේශපාලනීකරණය කරන්න එපා. මේ රටේ සමුපකාර ව්‍යාපාරය වැටුණේ සමුපකාරය දේශපාලනීකරණය කළ නිසායි.

නවසීලන්තයේ, ඇමෙරිකාවේ සමුපකාර ව්‍යාපාරය කඩාගෙන වැටෙන්නේ නැතිව යන්නේ ඒක නිර්දේශපාලනය කළ නිසා. "ශක්ති" කියන්නේ නිර්දේශපාලන සමුපකාරයක්. අපි ඕනෑ වෙලාවක සූදානම්, ඔබතුමන්ලාට අපේ පොත දිග හැරලා පෙන්වන්න, කොයි විධියටද නිර්දේශපාලන සමුපකාරයක් හරහා මේ රටේ සහල් වෙළෙඳ පොළට ස්ථාවර මිලක් ලබාගෙන අපේ රටේ බත් කන මිනිස්සුන්ට සාධාරණ මිලකට සහල් ලබා දෙන්නේත්, ගොවි මහත්තයාට හොඳ ආදායමක් ලබා දෙන්නේත් කියන එක. බොහොම ස්තුතියි.

**ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Prof.) Anil Jayantha.

**ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඇත්තටම මේ විවාදයේදී පැන නැඟුණු කරුණු එක්ක, මේ විවාදයේ යහපත වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම සඳහායි මම මේ අවස්ථාව ගන්නේ. විශේෂයෙන්ම ණය ප්‍රතිව්‍යුහගතකරණය, ණය සීමාව දික් කිරීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ක කටයුතු කිරීම වාගේම ණය පිළිබඳව ඉදිරිපත් කළ කරුණුවලදී අදහසක් පැන නැඟුණා, සැප්තැම්බර් 19වෙනි දා, - ජනාධිපතිවරණයට දවස් දෙකකට කලින් - එකඟතාවකට ආවේ නැහැයි කියලා. අවසාන ගිවිසුමට අත්සන් කළේ නැතත්, මම කැමැතියි මා සතුව තිබෙන පුවත්පත් නිවේදනයක් සහ නිවේදනයක් **සභාගත*** කරන්න.

පළමුව තිබෙන්නේ ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද පුවත් පත් නිවේදනය. එහි මෙසේ සඳහන් වෙනවා:

> "Sri Lanka reaches debt restructuring agreements in principle with external creditors on approximately USD 17.5 bn of sovereign debt"

ඒ නිසා තමයි අපි නිරන්තරයෙන් කිව්වේ අවසාන තැනකට ඇවිල්ලා තිබෙන්නේ කියලා. අපට ඕනෑ කළේ ප්‍රායෝගික ප්‍රවේශයක් මිස ඉන් එහාට ගිය ගැටුම්කාරී තැනකට යන්න නොවෙයි. මේක වෙනස් කරගෙන තව අවුරුද්දක් ඇදගෙන ගියොත් මේ රටේ ප්‍රශ්නයක් නිර්මාණය වෙනවා, තව පිරිවැයක් එනවා. අපි ජනතාවට පොරොන්දුවක් දුන්නේ මේ වැටිලා තිබෙන තැනින්, වට්ටලා තිබෙන තැනින් රට ඉදිරියට අරගෙන යනවා කියලා. ඒ නිසා අපේ ආර්ථික සංවර්ධන සැලැස්ම තුළ අපි යනවා. එහෙම නැතිව විපක්ෂය ඉදිරිපත් කරන agenda එකේ අපි යනවා කියලා කිසිම තැනක කියලා නැහැ. ඔබතුමන්ලාට ඕනෑ agenda එකේ අපි යන්නේ නැහැ. ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක වැඩ කටයුතු කිරීමත් කියන්නේ අපේ සංවර්ධන සැලැස්මේ කාරණා කිහිපයක් පමණයි, එය සමස්ත ආර්ථිකය ගොඩ ගැනීමේ එකම කාරණය නොවෙයි. ඒ, එක document එකක්.

දෙවෙනි document එකත් නිවේදනයක්. සිංගප්පූරුවේ තිබෙනවා, Singapore Exchange Securities Trading Limited එක. එතැන තමයි මේ බැඳුම්කර ද්විතීයික වෙළෙඳ පොළ විධියට විකිණෙන්නේ. ඒ ගොල්ලනුත් මේ නිවේදනය පදනම් කරගෙන ඒ ගොල්ලන්ගේ Singapore Stock Exchange එකට announcement එකක් කරලා තිබෙනවා. ඒක අයින් කරගෙන, කඩා බිඳ දාගෙන යනවා වෙනුවට තමයි අපි ප්‍රායෝගික ප්‍රවේශයක් ගත්තේ. ඒ document එකත් මම ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ කියන්නේ, agreement එකක මේක තිබෙනවා. අවසානයට අත්සන් කරනවාද නැද්ද කියන එක අපි තීරණය කරන්නේ දැන් විපක්ෂය කියන විධියට නොවෙයි. Lazard and Clifford Chance තමයි අපි වෙනුවෙන් පෙනී ඉන්නේ. ඒ ගොල්ලන් අපට සහතිකයක් දීලා තිබෙනවා. මේ වෙනකොට ඒ සියලු එකඟතා අවසාන අදියරේ තිබෙන්නේ; අත්සන් කරන්න පුළුවන්. ඒක තමයි පිරිවැය අවම කර ගැනීමේ උත්සාහය.

ඊළඟට, odious debt සම්බන්ධයෙන් අපි කිසිම තැනක කිව්වේ නැහැ, ණය ගෙවන්නේ නැහැයි කියලා. හැබැයි, අපි කළ ප්‍රකාශවලින් ණය ගෙවන්නේ නැහැයි කියලා හැඟී යනවාය කියනවා නම්, ඒක විපක්ෂයේ අර්ථ කථනයක්. ඒකට අපට කරන්න දෙයක් නැහැ. අපි පැහැදිලිවම යන්නේ අපට දුන්නු ජන වරමට අනුව මිසක් විපක්ෂයේ agenda එකට නොවෙයි කියන කාරණයත් මතක් කරන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
On a technical matter, Sir, I have to raise a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Harsha de Silva?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Minister, may I ask you what "in principle" means? What does "in principle" mean? You said "agreements in principle".

**ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
Yes.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
So, what does "in principle" mean?

**ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
"In principle" means, yes, that is the final agreement. - *[Interruption.]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
No, it is not the final agreement.

**ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
It is up to us to -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
It is not the final agreement.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)

Yes, that is true, it is not the final agreement. It is up to us to take into account both the costs and benefits. We have already seen all the costs that have accrued, as a result of dragging this unnecessarily for over a period of two years. Therefore, it is our duty and responsibility to do the best thing. So, we are taking appropriate steps on behalf of the general public. That is the truth.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මන්ත්‍රීතුමන්ලාගේ උනන්දුව අපි අගය කරනවා; මේ lively බව ඕනෑ. නමුත් අපිට අද සවස 5.30ට සභාවේ කටයුතු කල්තබන්න තිබෙනවා. ඒ වාගේම අවසානයේ කථා කිරීමට කථික ලැයිස්තුවේ මන්ත්‍රීවරු, ඇමතිවරු ඉන්නවා, විපක්ෂය පැත්තේ සිටින ඔබතුමන්ලාගේ ජ්‍යෙෂ්ඨ නායකයෝත් ඉන්නවා. ඒ ඔක්කෝටම ලබා දී තිබෙන වේලාව අඩු වෙනවා, මෙහෙම කළොත්. ඒ නිසා හර්ෂ මන්ත්‍රීතුමනි, කරුණාකර ඔබතුමා කරුණු කාරණා ලියාගෙන කථා කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කථිකයාට අවස්ථාව ලබා දෙන්න කියන ඉල්ලීම මම කරනවා. *[බාධා කිරීමක්]* මොකද, දන්නවාද? මෙහෙම ගියොත් අපිට වෙලාවට මේ කටයුතු අවසන් කරන්න බැරි වෙනවා. එහෙම වුණොත් අපිට දුකයි, ඔබතුමන්ලාගේ පැත්තේ අවසාන කථිකයන්ට විනාඩි 2ක්, 3ක් වාගේ තමයි හම්බ වෙන්නේ.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කිරීමකට විනාඩියක් ලබා දෙන්න. විනාඩියයි මම ගන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, Hon. Kabir Hashim.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු අනිල් ජයන්ත ඇමතිතුමනි, ඔබතුමා "in principle" කියන එකෙන් අදහස් කළේ, රනිල් වික්‍රමසිංහ මැතිතුමා එකඟ වුණු ඒ ආපසු ගෙවීමේ ක්‍රමවේදයට, in principle, ඔබතුමන්ලා එකඟ වෙලා තිබෙනවා කියන එක නේද? ඒක නේද, ඔබතුමා කිව්වේ? ඔබතුමා, in principle, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ මොඩලයට එකඟයි. ඒක නේද, ඔබතුමා කිව්වේ? So, it is very clear. බොහොම ස්තුතියි, ඒක කිව්වාට. බොහොම ස්තුතියි.

**ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த )
(The Hon. (Prof.) Anil Jayantha )

ගරු මන්ත්‍රීතුමා, මේ තිබෙන්නේ අපි අත්සන් කළ එකක් නොවෙයි. In principle, කලින් ආණ්ඩුව අත්සන් කළ එක. ඒ කියන්නේ සැප්තැම්බර් 19- *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. ඒ අනුව තමයි අපිට තීන්දුවක් තිබෙන්නේ - *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉවසන්න, මේ කාරණය තේරුම් ගන්න. ඒ නිසා තමයි අපි තීන්දුව ගන්නේ, ඒක අයින් කරලා නැවත එකකට ගිහින් අනවශ්‍ය පිරිවැයක් දරා, ඔයගොල්ලන් කැමැති විධියට රටේ ප්‍රශ්නයක් හදනවාද -*[බාධා කිරීම්]* මොකද, ඔයගොල්ලන් කැමැතියි, රටේ ප්‍රශ්නයක් හදලා මේ ආර්ථිකය බිඳ වට්ටන්න. නමුත් මහජනතාවට පීඩාකාරී තත්ත්වයක් තවදුරටත් අත්කර දෙනවා වෙනුවට අපි ගත්තේ ඉතාම ප්‍රායෝගික approach එකක්. ඒක නිසා තමයි සියයට 99ක් ඉවර වෙලා තිබෙන -*[බාධා කිරීම්]* දැන් පත් කර තිබෙන උපදේශකයන් අපට තහවුරුවක් දීලා තිබෙනවා, මේක දෙසැම්බර් මාසය වෙනකොට ඉවර කරන්න පුළුවන් කියලා. ඒ අනුව තමයි පිරිවැය අවම කිරීමේ උත්තරයක් විධියටත්, මේ පීඩනය මහජනතාව මතට තවදුරටත් එන්න ඕනෑ නැති විධියටත් මෙම තීරණය ගත්තේ. දැනටමත් ඩොලර් බිලියන 1.7ක accrued interest එක ඇවිල්ලා තිබෙනවා. අපිට අවශ්‍ය කරන්නේ ඔයගොල්ලන්ගේ න්‍යාය පත්‍රයට අනුව රට ඉදිරියට ගෙන යන්න නොවෙයි. මේ ආර්ථිකය වට්ටලා තිබෙන තැනින් ගොඩ ගන්නයි අපට වුවමනා වෙලා තිබෙන්නේ. ඒ අනුව තමයි මේ කාරණා අපි ඉදිරිපත් කරන්නේ. -*[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne. You have 17 minutes. - *[Interruption]* - Hon. Member, you may commence your speech now.

[පූ.භා. 11.21]

**ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කාලය නොගන්නා ලෙසට ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින ලෙස මම ඔබතුමාගෙන් අයැද සිටිනවා. බොහොම ස්තුතියි. මම මුලින්ම කියන්න ඕනෑ, මාව මේ පාර්ලිමේන්තුවට පත් කර එවපු කඩුවෙල ආසනයේ සහ කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවට ස්තුතිවන්ත වෙන බව. ඒ වාගේම මම මෙය අවස්ථාවක් කරගන්නවා, යහපත් සමාජයක් වෙනුවෙන් මේ රටේ ඉතිහාසය පුරා දිවි පිදූ සියලු තරුණ-තරුණියන් ගෞරවයෙන් සිහිපත් කරන්න. ඒ වාගේම මම මේ මොහොත අවස්ථාවක් කරගන්නවා, තනතුරු, ප්‍රතිලාභ කිසිවක් නොලබා අපේ කොට්ඨාස සභා, කාන්තා සභා සහ එබඳු කිසිම තනතුරක් නොලබා බිමේ වැඩ කරන ලක්ෂ ගණනක් වන සහෝදර-සහෝදරියන්ට ස්තුතිය පුද කරන්න. ඒ සහෝදර-සහෝදරියන්ටත් මේ ජයග්‍රහණය අයිතියි. ඒකත් මතක් කරමින්, ඔවුන්ට මගේ ගෞරවය පුද කරමින් මගේ කථාව පටන් ගන්න මම ලැහැස්තියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කලින් කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "Orange the World" දින 16 ක්‍රියාකාරීත්ව වැඩසටහන පවතින දවසක මගේ මංගල කථාව කරන්න ලැබීම එක පැත්තකින් මට භාග්‍යයක්. ඒ වාගේම මට වේදනාවකුත් තිබෙනවා. මට මෙය භාග්‍යයක් වෙන්නේ මොකද? මම පාර්ලිමේන්තුවෙන් පිට ඉඳිමින් දශකයක් විතර හඬ නැඟූ යම් කාරණයක් මට අද පාර්ලිමේන්තුව ඇතුළේදී වෙනස් කරන්න හැකියාවක් තිබෙන තැනක ඉඳිමින් කථා කරන්න ලැබීම නිසායි. මට වේදනාවක් වෙන්නේ, මේ තත්ත්වයට අපේ රටේ කාන්තාවන් සහ දරුවන් ඇද දමපු පාලනයන්ට විවිධ වශයෙන් හවුල් වුණු අද විපක්ෂයේ වාඩි වෙලා ඉන්නා මන්ත්‍රීවරුන් ඉස්සරහා මේ ගැන කථා කරන්න වීමයි.

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

මම කැමැතියි, ඊයේ දිනයේදී 2025 අතුරු සම්මත ගිණුමට අදාළව විවාදය ආරම්භ කරමින් අපේ ගරු අනිල් ජයන්ත ඇමතිතුමා සඳහන් කළ කාරණයකින් මගේ කථාව පටන් ගන්න. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව ලංකාවේ සිටින වැටුප් ලබන කාන්තා ශ්‍රමිකයන් සංඛ්‍යාව සියයට 39.2ක්. එතුමා සඳහන් කළා, ජාතික ජන බලවේගයේ ආර්ථික ප්‍රතිපත්තිය තුළ ස්ත්‍රී ශ්‍රමය සහ විශේෂයෙන්ම වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමය ජාතික ආර්ථිකය ඇතුළත වැදගත් කොට සලකනවාය යන වැදගත් කේන්ද්‍රීය අදහස. ලංකාවේ ආර්ථිකය ඔසවා ගෙන යන්නේ ගැහැනු කියලා අපි කියනවා. ඇයි අප එහෙම කියන්නේ? අප එහෙම කියන්නේ ලංකාවේ ගැහැනු සියයට 52ක් වීම නිසා නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලංකාවේ විදේශ විනිමය උපයන ප්‍රධාන ක්‍රමවේද, ඒ කියන්නේ ඇඟලුම් ක්ෂේත්‍රයේ, වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ සහ සංක්‍රමණික සේවකයින්ගෙන් අති බහුතරය කාන්තාවන්. හැබැයි, විදේශ විනිමය උපයන මේ අතිබහුතරයක් වන කාන්තාවන්ට නිදහසින් පස්සේ ලංකාවේ පත් වූ රජයන් අත් කර දී තිබෙන උරුමය කුමක්ද? ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවලට අනුව 2024 වර්ෂයේ පළමු කාර්තුවේ විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබුණු මුළු ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 1,536.1යි. ඉහළම ආදායම ගෙනැවිත් දීලා තිබෙන්නේ, කුවේට් සහ සවුදි අරාබිය යන රටවලින්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, කුවේට් සහ සවුදි අරාබිය කියන්නේ නුපුහුණු ශ්‍රමික කාන්තාවන් අතිබහුතරයක් යන රටවල් දෙකක් බව. ඒ රටවල් දෙකේ වැඩ කරන්නේ ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවලින් යන දුගී දුප්පත් කාන්තාවන්. මේ ඡන්ද ව්‍යාපාරය පටන් ගත්තු දවසේ ඉඳලා මාස දෙකක් තිස්සේ අඩුම තරමින් මට දුරකථන ඇමතුම් 10ක්වත් එන්න ඇති, ලංකාවෙන් ගිය ගැහැනු ළමයින්ට සහ කාන්තාවන් මුහුණ දෙන ප්‍රශ්න සම්බන්ධයෙන්. එක්කෝ තමන්ගේ රැකියාව අහිමි වෙලා, එහෙම නැත්නම් හාම්පුතාගේ දුෂ්කරතා විඳලා ගෙවල්වලින් පැනලා ගිහිල්ලා. හැබැයි, ඒ අය අපේ විදේශ සේවාවන්හි සහයෝගය නොලැබුණු අයයි.

ඒ වාගේම මම මතක් කරන්න කැමැතියි, අපට දැන් රට හදන්න උපදෙස් දෙන, මෙතැන ඉන්න විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්, ඒ කියන්නේ පසුගිය ආණ්ඩුවල විදේශ රැකියා විෂය භාරව හිටපු ඇමතිවරුන්, ඇමතිවරියන් සහ ඔවුන්ගේ ගජ මිතුරන් තමන්ගේ රටින් යන ශ්‍රමික කාන්තාවන්ගේ සහ කොරියාවට යන සහෝදර තරුණ ප්‍රජාවගේ air ticket එකෙන් ගහපු හැටි.

දෙවනුව ගත්තොත්, ලංකාවේ තේ අපනයනයෙන් පමණක් 2023 අවුරුද්දේ රජය ලබපු ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 1.31ක් වනවා. තේ කර්මාන්තයේ නියැළෙන ශ්‍රමිකයන්ගෙන් සියයට 65ක් කාන්තාවන්. අපි දන්නවා, අවුරුදු 200ක් තිස්සේ දවසට වේල් දෙකක් රොටී කාලා තමයි, ඔවුන් තේ කර්මාන්තය පවත්වා ගෙන ආවේ කියන එක. අපි බොන්නේ තේ නොවෙයි ලේ.

ඊයේ දවසේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් ඉතාම උද්‍යෝගයෙන් කිව්වා, අපි විපක්ෂයේ ඉඳන් කොච්චර කෑගැහුවත්, ආණ්ඩුවට ආවාම ඔය කියන විධියට වැටුප් වැඩි කරන්නත් බැහැ, ගෙවල් දෙන්නත් බැහැ කියලා. ඒ ප්‍රකාශය ගැන මම කනගාටු වෙනවා. එතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. එතුමා නියෝජනය කරන පක්ෂය, වතු කම්කරු ජනතාව වෙනුවෙන් වැඩ කරන පක්ෂයක්. තුන්වැනි පරම්පරාවේ කෙනෙක් එතුමා. එම පක්ෂයේ එතුමාගේ තාත්තාත් හිටියා, සීයාත් හිටියා. එතුමා කනගාටු වෙන්න ඕනෑ ඒ කථාව පාර්ලිමේන්තුවට ඇවිත් කියන්න සිදු වීම ගැන.

මම එතුමාට කාරණා දෙකක් කියනවා. පළමුවැනි කාරණාව මේකයි. වතු කම්කරු ජනතාව නියෝජනය කරමින් මෙච්චර කල් පාර්ලිමේන්තු ආපු ප්‍රභූ දේශපාලනඥයන් වෙනුවට, අපි මෙවර පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙනවා, නියම වතු කම්කරු වැඩ කරන ජනතාවගේ නියෝජිතයන්. ඔබතුමා ඇත්තටම වතු කම්කරු ජනතාව ගැන සොයනවා නම්, ඔබතුමා ඒ ගැන උනන්දු නම්, ඉදිරියේදී අප කරන වෙනස්කම්වලට, ප්‍රතිසංස්කරණවලට, යෝජනාවලට සහයෝගය දක්වමින් අත ඔසවන්න කියලා මම එතුමාට ආරාධනා කරනවා.

ඒ වාගේම මම කියන්න කැමැතියි, ගියවර අපේ මන්ත්‍රීවරුන් තුන්දෙනෙකු හිටපු පාර්ලිමේන්තුවට මෙවර අපේ මන්ත්‍රීවරු 159දෙනෙක් ආ බව. හැමෝම කිව්වා, අපට දේවල් කරන්න බැහැ කියලා. කරන්න බැහැ කියපු දේවල් කරලා පෙන්වපු ජනතා ව්‍යාපාරයක්, අපි.

තුන්වනුව, ලංකාවේ ඇඟලුම් කර්මාන්තය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7කට දායකත්වය දෙනවා. ඒ වාගේම, ඇඟලුම් කර්මාන්තයේ නියැළෙන ශ්‍රමිකයන්ගෙන් සියයට 78ක් කාන්තාවෝ. හැබැයි, ඒ අය උදේ ඉඳලා සමහර වෙලාවට පැය 16ක්, 17ක් වැඩ කරන්න ඕනෑ. මූලික වැටුප රුපියල් 16,000යි. අතිකාල දීමනා වෙනුවෙන් අමතර වැඩ කරන්නත් සිද්ධ වෙනවා; සෙනසුරාදා, ඉරිදා වැඩ කරන්නත් සිද්ධ වෙනවා. දවසේම හිටගෙන. හැබැයි, හාම්පුතුන්ගෙන් කිසිම සේවා සුරක්ෂිතාවක් නැහැ. ලිංගික හිරිහැරවලට පවා ඒ අය ලක් වෙනවා. හැබැයි, අපි දන්නවා, කොවිඩ් වසංගතය කාලයේ අත්‍යවශ්‍ය සේවාවක් කරලා, ඒ කාන්තාවන් වැඩට ගෙන්වූ බව. අන්තිමට ඒ කාන්තාවන්ට උරුම වෙලා තිබෙන ජීවිතය මොන වාගේ ද?

එක්සත් ජාතීන්ගේ සංවිධානය 2023 වර්ෂයේ වාර්තාවක කියනවා, ලෝකය පුරා දවසකට කාන්තාවන් සහ ගැහැනු දරුවන් දළ වශයෙන් 140ක් පමණ තමන්ගේ සමීප සහකරු හෝ පවුලේ සාමාජිකයෙකු අතින් මිය යනවා කියලා. ඒ කියන්නේ, එම සංඛ්‍යාව 2023 වර්ෂයට 51,100ක්. ලංකාවේත් ඒ තත්ත්වය වෙනස් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ආඩම්බරයෙන් කියනවා, අපි ලෝකයේ පළමුවැනි අගමැතිතුමිය හැදුවා; අපේ ගැහැනු දරුවන්ගේ සාක්ෂරතාව ඉහළයි කියලා. හැබැයි, Gender Inequality Index එකේ, ඒ කියන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අසමානතා දර්ශකයේ අගය 0.383යි. ඒ කියන්නේ ලංකාව ඉන්නේ රටවල් 170කින් 92වැනි ස්ථානයේ. අපි ලජ්ජා වෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි දන්නවා කොවිඩ් වසංගතය සහ ඉන් අනතුරුව ශ්‍රී ලංකාව මුහුණ දුන් දරුණු ආර්ථික බංකොලොත්භාවය ඇතුළේ සිද්ධ වුණේ මොකක්ද කියලා. මා 2023 Westminster Foundation for Democracy සඳහා ලියපු වාර්තාවක සඳහන් කර තිබෙනවා, ස්ත්‍රී-පුරුෂ සමාජභාවී අනන්‍යතා සහ ලිංගික දිශානතීන් සහිත තැනැත්තන් අසමානුපාතික ලෙස සහ බරපතළ හිංසනයන්ට, අසාධාරණයන්ට සහ වෙනස් කොට සැලකීම්වලට බඳුන් වෙනවා කියලා.

ලංකාවේ පොලිසිය වාර්තා කරනවා 2023 වර්ෂයේ ගෘහස්ථ හිංසන 25,000කට අධික ප්‍රමාණයක් වාර්තා වෙලා තිබෙනවා කියලා. ස්ත්‍රී දූෂණ සිදුවීම්, 1,865යි. 2024 ඔක්තෝබර් දක්වා -මේ අවුරුද්දේ ඔක්තෝබර් දක්වා- ස්ත්‍රී දූෂණ 1,588ක් වාර්තා වෙලා තිබෙනවා. මේවා වාර්තා වන ඒවා පමණක් බව මතක තබා ගන්න. අපි දන්නවා වාර්තා නොවන මෙවැනි සිදුවීම් ඕනෑ තරම් තිබෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මන්ත්‍රීතුමියන් අතර විශේෂයෙන් නීතිඥවරියෝ ඉන්නවා. ඒ අයට දවස ගණනේ

දුරකථන ඇමතුම් එනවා, කාන්තාවන්ට සිදු වන හිංසනයන් සම්බන්ධයෙන්; විශේෂයෙන් තමන්ගේ ස්වාමි පුරුෂයාගෙන් බැට කන කාන්තාවන් සම්බන්ධයෙන්; දූෂණයට ලක් වන කාන්තාවන් සම්බන්ධයෙන්. ලංකාවේ ඒකටවත් නීතියක් නැහැ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව ලංකාවේ සමස්ත ජනගහනයෙන් සියයට 3.2ක් ජීවත් වන්නේ දරිද්‍රතා රේඛාවට වඩා පහළින්. ඒ කියන්නේ, ඒ අය මාසික ආදායම රුපියල් 4,830කට අඩුවෙන් ලබන්නේ. අපි ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ පැහැදිලිවම කියා තිබෙනවා, ලංකාවේ ස්ත්‍රීන්ගේ ප්‍රශ්නය සමස්ත සමාජ දේශපාලනික සහ ආර්ථික අර්බුදයේම එක් පිළිබිඹුවක් පමණයි කියලා. එය රටේ පවතින සියලු ආර්ථික කඩා වැටීමේ සන්දර්භයෙන් එළියට ගන්න බැහැ. ඒ වාගේම මේ ගැටලු අන්තර්ඡේදනීයයි. ඒ කියන්නේ ස්ත්‍රීන්ගේ ප්‍රශ්නය හුදු ගැහැනුන්ගේ ප්‍රශ්නයක් නොවෙයි. සමාජ පන්තිය, කුලය, ජාතිය, ආගම, ආබාධ සහිත බව සහ ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාව ආදි මේ ඔක්කොම එකකට එකක් බැඳිලායි තිබෙන්නේ. ඒ නිසා අපේ ස්ත්‍රී ප්‍රතිපත්තිය, සමස්ත ප්‍රතිපත්තිය පදනම් වෙලා තිබෙන්නේ මේ සියලු කණ්ඩායම්වල විමුක්තිය සහ සමානාත්මතාව වෙනුවෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ කිසිදු අනන්‍යතාවක් නිසා කිසිදු පුද්ගලයෙකු හිංසාවට, පීඩාවට හෝ අවමන් සහගත සැලකිල්ලට ලක් නොවන අන්දමට නීති සකස් කරනවා කියලා අපි මේ මොහොතේ පොරොන්දුවක් දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දශක තුනකට වඩා වැඩි කාලයක් ලංකාවේ මුස්ලිම් කාන්තාවන් තමන්ගේ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටියා. හැබැයි, පැවැති ආණ්ඩු එය කනකටවත් ගත්තේ නැහැ.

බැට කන ආර්ථිකයෙන් ගොඩ එන්න ගිය කාන්තාවෝ නොනවතින ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලක හිර වෙලා. 150 දෙනෙකුට වඩා සිවි දිවි නසා ගත්තා. හැබැයි, පසුගිය රජයන් මොකක්ද කළේ? ගෙනාවා නීතියක්. ඒ, කාන්තාවන් ආරක්ෂා කරන්න නොවෙයි, මූල්‍ය සමාගම් ආරක්ෂා කරන්නයි. සමහර කාලවල ඒ කාන්තාවෝ සියයට 220ක පොලියක් ගෙව්වා. අපි දන්නවා, විශේෂයෙන් ලාභය පමණක් අරමුණු කර ගත්තු නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති නිසා කාන්තාවන්ට සහ මුළු මහත් වැඩ කරන ජනතාවට ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වුණු බව.

රනිල් වික්‍රමසිංහ මහතා එකඟ වෙච්ච IMF එකේ කොන්දේසි හේතුවෙන් විශේෂයෙන් කාන්තාවන්ට සහ අනෙකුත් ආන්තික සමාජ කණ්ඩායම්වල අයිතිවාසිකම්වලට බලපෑවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඒ නිසා තමයි යෝජනා කරලා තිබෙන්නේ, ඊළඟ අය වැය ගෙනෙන කොට මේ වන විට යම් යම් භාණ්ඩ සඳහා රනිල් වික්‍රමසිංහ මහතා ගහලා තිබෙන සියයට 18 වැට් බද්ද නැති කරනවා කියලා. ඒ යෝජනාව එකක් විතරයි. ඒ වාගේම අපේ ප්‍රතිපත්තියේ කේන්ද්‍රීය වන්නේ කාන්තාවන්ගේ ආර්ථික සවිබලගැන්වීමයි. අපි විශ්වාස කරනවා ආර්ථික යුක්තියෙන් තොරව කිසිදු සමානාත්මතාවක් හෝ අයිතිවාසිකමක් අත්පත් කර ගන්න බැහැ කියලා. අපට මීටත් වඩා එහා ගිය සංශෝධන ගොඩක් කරන්න තිබෙනවා. මට තිබෙන්නේ සීමිත කාලයක් වන නිසා ඒ ඔක්කොම කියන්න බැරි වෙයි.

දණ්ඩ නීති සංග්‍රහයත් ඇතුළුව විශාල ප්‍රමාණයක සංශෝධන සිදු කරන්න තිබෙනවා. ඒ වාගේම අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අලුතින් හඳුන්වා දෙන කොට එහි මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය පැහැදිලි ලෙසම පුළුල් කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. මේ ඔක්කෝම අපේ ප්‍රතිපත්තියේ සඳහන් වෙලා තිබෙනවා. මේ මන්ත්‍රීවරුන් දිගින් දිගටම ඇහුවා අපේ ප්‍රතිපත්තිය මොන වගේද කියලා. මම ආරාධනා කරනවා අපේ ප්‍රතිපත්තිය කියවන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ මොහොතේ නොකියාම බැරි කාරණයක් තිබෙනවා. මෙය මේ පාර්ලිමේන්තු සතියේ හතරවෙනි දවස. අපි පළමුවන වතාවටයි කාන්තාවන් 22ක් මන්ත්‍රීවරියන් ලෙස පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන්නේ. ඒ මන්ත්‍රීවරියන් විසිදෙදෙනාගෙන් මන්ත්‍රීවරියන් 20 දෙනෙක් අපේ පක්ෂය නියෝජනය කරනවා. ඒ එක කාන්තාවක් හෝ තමන්ගේ පවුල් බලයෙන් දේශපාලනයට ආපු අය නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

2018 දී මම දැක්කා මහත් කලකෝලාහල තිබෙන, කලබගෑනි තිබෙන, මිරිස් කුඩු ගහන පාර්ලිමේන්තුවක්. ඒ වෙලාවේ මම සඟරාවකට ලියපු ලිපියකින් කොටසක් උපුටා ගෙන මේ අවස්ථාවේ ගරු පාර්ලිමේන්තුවේදී කියවන්න මට හිතුණා. මොකද, මේ පාර්ලිමේන්තුව දැක්කාම මට හිතෙනවා, ඒක අදටත් එලෙසම අදාළයි කියලා. සමාවෙන්න, මට මේ උපුටා දැක්වීමේ සිංහල පරිවර්තනයක් කර ගන්න බැරි වීම ගැන. ඉංග්‍රීසි භාෂාවෙන් ලියා ඇති එම ලිපියේ පොඩි ඡේදයක් මා කියවන්නම්.

It states, I quote:

> "When so-called senior members of parliament resort to fight and disruptions instead of engaging in meaningful political arguments, they tarnish the dignity of parliament. This supreme political space, meant to symbolize democracy and aspirations of the people, has long been dominated by a masculine ethos rooted in aggression and physical strength. While it is supposed to represent the working class and the diverse voices of the public, the Sri Lankan parliament often reflects the deep-seated systemic patriarchy that defines post-colonial Sri Lankan political culture.
>
> Such scenes are not just embarrassing; they are a stark reminder of how power in this space continues to be wielded through force and intimidation rather than intellect or dialogue. They betray the trust of the people who look to parliament for leadership and justice, exposing a culture that prioritizes ego and dominance over the well-being of the public. It is a painful reflection of how much further we need to go to create a feminist, inclusive and egalitarian political culture."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ත්‍රී දේශපාලනය කියන්නේ පාර්ලිමේන්තුව ඇතුළට කාන්තාවන් ශාරීරිකව 20ක් හෝ 22ක් ගෙන ඒම පමණක් නොවෙයි. පාර්ලිමේන්තුව ඇතුළේ සංඛ්‍යාත්මක නියෝජනය වැදගත් කියලා අපි දන්නවා. හැබැයි, අපේ ස්ත්‍රී දේශපාලනය කියන්නේ, එතැනින් එහාට ගිහිල්ලා පාර්ලිමේන්තුව ඇතුළතත්, පාර්ලිමේන්තුවෙන් පිට දේශපාලන අවකාශය තුළත් කාන්තා දේශපාලනඥයන්ගේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීමයි.

අපි පසුගිය දවස් හතරේ කරපු කථා ගත්තොත්, අපට විපක්ෂයෙන් ආපු චෝදනාවලින් සියයට 40ක් සහල් ගැන, තවත් සියයට 40ක් පොල් ගැන සහ ඉතිරි සියයට 20 අපි වාමාංශිකද, නැද්ද කියන එක ගැන. මට හිතන හැටියට අපි ඊට වඩා එහාට ගිහිල්ලා හිතන්න අවශ්‍යයි.

අපි දැන් අතුරු සම්මත ගිණුම මේ ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා.

විපක්ෂයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කියනවා, හොඳ දේශපාලන සංස්කෘතියක් වෙනුවෙන් තමයි අපි මේ සටන ගෙනියන්නේ කියන කාරණය. ඔබතුමන්ලා මෙච්චර කාලයක් පවත්වාගෙන ආපු දේශපාලන සංස්කෘතිය මහජනතාව විසින් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. ඒ නිසා තමයි අලුත් මුහුණු 162ක් පාර්ලිමේන්තුවට එවලා තිබෙන්නේ. ඉතින්, මම ගරු පාර්ලිමේන්තුවේ විපක්ෂයේ සියලුදෙනාගෙන්ම ඉල්ලීමක් කරන්න කැමතියි. ඉතාම සංයමයෙන් යුතුව තමන්ගේ කරුණු

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

ඉදිරිපත් කරන කිහිපදෙනෙක් ඉන්නවා. උගත්කම කියන්නේ පොතේ දැනුම සහ අධ්‍යාපන සහතික විතරක් නොවෙයි. විනය කියන්නේ, පළපුරුද්ද කියන්නේ වැඩිපුර පාර්ලිමේන්තුවේ හිටපු කාලයත් නොවෙයි. තමන්ගේ දැනුමෙන් වාගේම, විනයෙන්, සංයමයෙන් හා පරිණතභාවයෙන් යුතුව කටයුතු කරනවා මිස, පාර්ලිමේන්තුව වාද මඩුවක් කර ගන්න එපා කියන ඉල්ලීම මම කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපේ දේශපාලන සංස්කෘතිය වෙනස්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne, you have two more minutes.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මගේ කථාව අවසන් කරන්නම්.

මෙතැන සිටින අපි 159දෙනා ඇවිල්ලා ඉන්නේ මහා දේශපාලන ව්‍යාපාරයක ප්‍රතිඵලයක් ලෙස. ඔබතුමන්ලාට වාගේ අපට තනි තනි දේශපාලන ගමනක් නොවෙයි තිබෙන්නේ. මේක සටනක්, මුළු මහත් මහජනතාව උස්සාගෙන යන. මේ දේශපාලන ව්‍යාපාරය මේ මහ පොළොවේ ලක්ෂ ගණනක් මිනිස්සු ශත 5ක හෝ ලාභයක් නැතුව උස්සාගෙන යනවා. ඒක නිසා තමයි අද අපි මෙතැන ඉන්නේ. ඒ මිනිසුන්ගේ කඳුළින්, දහඩියෙන් තමයි අපි මෙතැනට ඇවිල්ලා ඉන්නේ. මම නියෝජනය කරන කඩුවෙල ආසනයේ මිනිස්සු අපේ මේ දේශපාලන ව්‍යාපාරය කරනකොට canvassing ගිහිල්ලා මහන්සිවෙලා පපුවේ අමාරුව හැදිලා මැරුණා. ගරු මන්ත්‍රීවරුනි, එම නිසා අපට මේක බරපතළයි. අපට මේක විහිළුවක් නොවෙයි. අපි උදේට මෙතැනට එන්නේ පුටු රත් කරලා යන්න නොවෙයි. හවස් වෙනකොට එහා පැත්තේ විපක්ෂයේ මන්ත්‍රීවරු කවුරුත් නැහැ, ආසන ඔක්කෝම හිස්. එක් ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ, මේ සභාවේ නැති වුණත්, අඩුම තරමින් පිටුපසට ගිහිල්ලා හෝ ඉඳගෙන පාර්ලිමේන්තුවේ කථාවලට සවන් දෙන්න. අපට මේක serious. අපි ඇවිල්ලා ඉන්නේ මිනිසුන් වෙන්වෙන්; මිනිසුන්ගේ ව්‍යාපාරයක් වෙනුවෙන්. මෙතැන අපි කාටවත් පෞද්ගලික අපේක්ෂා නැහැ. මිනිස්සු වෙනුවෙන් අපට බරපතළ වගකීමක් සහ කැපවීමක් තිබෙනවා. ඔබතුමන්ලා හිතනවා නම්, උදේට ඇවිල්ලා විනාඩි 5ක් මේ පාර්ලිමේන්තුවට disturb කරලා ගිහින් අපේ ආණ්ඩුව අවුරුදු දෙකකින් වට්ටන්න පුළුවන් කියලා, ඒක නම් හිතන්න එපා මන්ත්‍රීවරුනි.

අපි පසුගිය අවුරුදු පහේ කටයුතු කළේ මොන තරම් කැපවීමකින්ද, සංයමයකින්ද, අපි ඉදිරි අවුරුදු පහේදීත් ඒ කැපවීමෙන්, ඒ සංයමයෙන්, ඒ අධිෂ්ඨානයෙන් මේ ආණ්ඩුව ගෙනියනවා කියන කාරණය නැවතත් මේ ගරු පාර්ලිමේන්තුවට අවධාරණය කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Sajith Premadasa. You have ten minutes.

[පූ.භා. 11.38]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
I will take some more minutes for my speech, Hon. Deputy Speaker.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන රජය සුවිශේෂී වරමක්, විශාල ජනවරමක් අරගෙන මේ රටේ වගකීම භාර ගත්ත අවස්ථාවේ යෝජනා වුණා, ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියවන්න කියලා. ඒක උපුටා දක්වමින් මම මේ කාරණය පෙන්නුම් කරන්න කැමතියි. මේ රජය බලයට ආපු ගමන්ම ජනවරම උල්ලංඝනය කරලා, ජනතාවගේ අයිතිය පාවා දීලා, ඉස්පිල්ලක්, පාපිල්ලක් නැර, තිබුණු ආකාරයටම IMF වැඩ පිළිවෙළට එකඟ වීම මෑත කාලයේ සිදුවුණු ලොකුම පාවාදීම හැටියට අපට හඳුන්වන්නට පුළුවන්.

"පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති මාලාවේ 105වැනි පිටුවේ කියනවා, "විකල්ප ණය තිරසරකරණ විශ්ලේෂණයක්" කියලා. ඒ කියන්නේ Alternative Debt Sustainability Analysis එකක්. ඒ හරහා තමයි මාලිමාව රජය IMF එකත් එක්ක ඒ ඇති කර ගත්ත අවබෝධතා ඉදිරියට ක්‍රියාත්මක කරන්නේ කියනවා. මම අහන්න කැමතියි, පසුගිය දිනක IMF එකත් එක්ක ඇති කරගත්ත එකඟතාව අලුත් Debt Sustainability Analysis එක හරහාද කළේ, එහෙම නැත්නම් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ රජයේ ක්‍රියාත්මක වුණු විකල්ප ණය තිරසරකරණ විශ්ලේෂණය හරහාද කළේ කියලා. ඒක තමයි පළමුවැනි කාරණාව.

දෙවැනි කාරණාව මේකයි. ඔබතුමන්ලාගේ අභිලාෂය පොහොසත් රටක් ලස්සන ජීවිතයක් නිර්මාණය කිරීම. හැබැයි, මේ පොහොසත් රට ලස්සන ජීවිතය නිර්මාණය කිරීමේ ගමන සම්පූර්ණයෙන්ම කඩා වැටෙනවා, මේ පවතින IMF ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර අවබෝධතාව, එකඟතාව මත ඉදිරියට යනවා නම්. මම මේ කාරණය පෙන්වන්න කැමතියි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලම - IMF - 2023 මාර්තු මාසයේ ඔවුන්ගේම වාර්තාවේ - Country Report එකේ - කියනවා නැවත ණය ගෙවීම ආරම්භ කිරීම 2033දී ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් කියලා. ද්විපාර්ශ්වික ණය පමණක් නොවෙයි, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර පවා. මේ IMF Report එකේ ඒක කියන්නේ. හැබැයි, මේ ගිවිසුම හරහා මේ ණය ගෙවීමේ ක්‍රියාවලිය තව අවුරුදු හතරකින් 2028දී ආරම්භ වෙනවා. මොහොතකට හරි ඔබතුමන්ලා හිතනවාද, කෙටි කාලයක් තුළ -අවුරුදු හතරකින්- මේ ණය ආපසු ගෙවීමේ ක්‍රියාවලිය සඳහා ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නඟන්න පුළුවන් කියලා? කවුරු රජයේ හිටියත් එහෙම කරන්න පුළුවන්ද? එහෙම නම් මේ ගිවිසුම හරහා අපේ රට අනතුරට ලක් කරලා තිබෙනවා. වසර නවයකින් ණය ගෙවීමේ කාර්යභාරය ආරම්භ කරන්නට තිබුණු මොහොතක, එය වසර හතරකින් ක්‍රියාත්මක කරන්නට පසුගිය රජය එකඟ වෙලා තිබෙනවා. ඒ අඩි පාරේම ඔබතුමන්ලාත් යනවා. ඔන්න අපි දකින අඩු පාඩුව. අපි දකින වරද. පළමුවැනි එක හැටියට, "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති මාලාවේ 105වැනි පිටුවේ සඳහන් වන දේ සම්පූර්ණයෙන් උල්ලංඝනය කරලා තිබෙනවා. ඒ වාගේම, 2033දී ණය ගෙවීම ප්‍රමාණවත් කියලා IMF එකම කියනකොට, "නැහැ, 2033 නොවෙයි, අපි 2028 ඉඳලාම ණය ගෙවන්නම්" කියන අවබෝධතාවකට, ගිවිසුමකට මේ IMF වාර්තාව කියවන්නේ නැතිව, අපි හිතන ආකාරයට කිසිම පරිශීලනයක් නැතිව ඔබතුමන්ලා එකඟ වෙලා කඩිමුඩියේ Staff-level

Agreement එකට අත්සන් කරලා කටයුතු කළේ විස්තීර්ණ ණය පහසුකම - Extended Fund Facility එක - ලබා ගැනීමේ අරමුණම පමණක් හිතේ තියාගෙනයි. එසේ කටයුතු කිරීම මහ භයානක තත්ත්වයක් හැටියට පෙන්වා දෙන්නටයි මම මේ අවස්ථාවේ කථා කරන්නේ.

ඒ නිසා, මම විශේෂයෙන්ම කියන්නට ඕනෑ මේ පවතින IMF ගිවිසුම දුර්වල ගිවිසුමක් බව; ඒක weak negotiation එකක්. අපි මේ ගිවිසුමෙන් ඔබ්බට යන්නට ඕනෑ. දැන් මෙතැනදී කියවුණා, ජනාධිපතිවරණයට දින දෙකකට පෙර announcement එකක් කරලා අත්සන් කළා ලු. ඊට පස්සේ කියනවා, අත්සන් කළේ නැහැ ලු, අවබෝධතාවක් ඇති කර ගත්තා ලු. ඊට පස්සේ කියනවා, නැහැ එහෙම කරගත්තේ නැහැයි කියලා.

මම ඔබතුමන්ලාට උදාහරණයක් පෙන්වන්නම්. ඝානා කියන රට කොහොමද කටයුතු කළේ? මතක තබාගන්න, අපේ මේ ස්වෛරී බැඳුම්කර ප්‍රශ්නයට මැදිහත් වුණු Lazard and Clifford Chance කියන ආයතනයම තමයි ඝානා රට වෙනුවෙනුත් මේ සාකච්ඡාව - negotiation එක - කළේ. මොකක්ද, ඝානා රටේ වුණේ? සියයට 37කින් ගෙවිය යුතු මූලික ණය කප්පාදු කරගත්තා. ඒ විතරක් නොවෙයි. සියයට 6ක පොලී අනුපාතයකට එකඟ කරවා ගන්නට ඝානා රටට හැකියාව ලැබුණා. අපට මොකක්ද වෙන්නේ? අපි උපකල්පනය කළොත්, 2025-2027 අතර දළ දේශීය නිෂ්පාදිතයේ සාමාන්‍යය ඩොලර් බිලියන 107යි කියලා, තිබුණු ණයටත් වඩා වැඩිපුර ණය ඩොලර් බිලියන 2.3ක් ගෙවන්න සිද්ධ වෙනවා කියලා අවබෝධ කරගන්න. ඒ විතරක් නොවෙයි. 2028 සිට පොලී අනුපාතය සියයට 6.8යි. 2032න් ඔබ්බට පොලී අනුපාතය සියයට 9.65යි.

මම බොහොම සරල ප්‍රශ්නයක් අහන්න කැමැතියි. ඝානාවට පුළුවන් වුණා නම් පළමුවැනි ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර යෝජනාව ප්‍රතික්ෂේප කරන්න - ප්‍රතික්ෂේප කරලා හොඳ ගිවිසුමකට ගියා. - ඇයි අපට බැරි? දැන් බැලූ බැල්මට පෙන්වනවා හොඳ haircut එකක් හම්බ වෙනවා, හොඳ ණය අඩු කිරීමක් හම්බ වෙනවා කියලා. හැබැයි, ඉතින් තිබුණාටත් වඩා වැඩිපුර ණයක් ගෙවන්න සිද්ධ වෙනවා, මේ තිබෙන scenario එක තුළ; මේ තිබෙන වැඩ පිළිවෙළ තුළ. බලන්න, ඝානාවයි ශ්‍රී ලංකාවයි සංසන්දනය කරලා. මම මේ දළ වශයෙන් කියන්නේ. ඒගොල්ලන්ට තිබුණු ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ණය ප්‍රමාණය ඩොලර් බිලියන 13.1ක්, අපේ ඩොලර් බිලියන 14කුත් ගණනක්. ඒ අයට පුළුවන්කම ලැබුණා සියයට 37ක කප්පාදුවක් ඇති කරගන්න; ණය අඩු කිරීමක් කරගන්න. මේ තිබෙන scenario එක තුළ අපට කිසිම ණය අඩු කිරීමක් ලැබෙන්නේ නැහැ. ඒ අයට පුළුවන්කම ලැබුණා සියයට 6ක පොලියක් සාකච්ඡා - negotiate - කර ගන්න. අපට, සියයට 6.8 සිට 2032 ඉඳලා සියයට 9.5 දක්වා වැඩි වීමේ තත්ත්වයක් තිබෙනවා.

දැන් සමහරු තර්කයක් ඉදිරිපත් කරයි, ඝානාව කියන්නේ එක්තරා මාදිලියක රටක්, අපේ රට වෙනස් කියලා. නැහැ, දෙකම lower middle-income countries, දෙකම අඩු මැදි ආදායම් රටවල්. එහෙම නම් මේ ගිවිසුමට ඔබගේත් සහයෝගය ලබා දීම තුළ මොකක්ද මේ රටට අත්පත් වන්නේ? ණය බර වැඩිවෙනවා. අසහනය, පීඩනය වර්ධනය වෙනවා. දුප්පත්කම වැඩි වෙනවා. සමාජයේ අවදානමට ලක් වුණු කොට්ඨාසවලට - දරුවන්, මව්වරුන්, ආබාධිත ප්‍රජාව, තරුණ ප්‍රජාව - ලොකු හානියක් සිද්ධ වෙනවා. රාජ්‍ය ආදායමෙන් වැඩි මුදලක් මේ අධික ණය ගෙවන්න වෙන් කරන්න සිදු වෙනකොට අධ්‍යාපනයට, සෞඛ්‍යයට, කෘෂි කර්මාන්තයට, ධීවර ක්ෂේත්‍රයට, කර්මාන්ත ක්ෂේත්‍රයට සමස්ත පොදු ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් ආයෝජනය ඉවත් වෙනවා; අවම වෙනවා; අඩු වෙනවා. දැන් මේ සියලු ප්‍රශ්නවලට තිබෙන විසඳුම මොකක්ද? අපි කැමැතියි විසඳුමක් යෝජනා කරන්න. දැන් ඔබතුමන්ලා කිව්වා, එකඟතාවක් ඇති වෙලා තිබෙනවාය කියලා. ඇත්තම කථාව තමයි ඕක වෙනස් කරන්නට අපට හැකියාව තිබුණා. අපි ඔබගේ කාර්යය පහසු කරන්නම්; රජයේ කාර්යය පහසු කරන්නම්. ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරුවන්ට දැන් අවස්ථාව ලැබිලා තිබෙනවා ඔබගේ රජයත් එකඟ වුණු ඒ ISB එකඟතාව පිළිබඳ මතයක් පළ කරන්න. ඒක දෙසැම්බර් 12 වැනිදාට යෙදිලා තිබෙනවා. අපි සූදානම්, 12 වැනිදාට පෙර ඔබතුමන්ලාගේ යෝජනාවක් පරිදි පාර්ලිමේන්තුව කැඳවලා,- මොකද, ඔබතුමන්ලා තමයි Parliamentary Business එක decide කරන්නේ.

ඔබතුමන්ලා ISB Agreement එක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, විවාදයට ලක් කරන්න. එය සාකච්ඡාවට භාජන වනකොට, ඔබතුමන්ලාට සහයෝගය ලබා දෙන්න අපි සූදානම්. ඝානාව රටේ වාගේ, "අපි මේ ගිවිසුමට එකඟ නැහැ. අලුත් ISB එකඟතාවකට අපි යන්න ඕනෑ. ඒකට පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව ආණ්ඩු පක්ෂයත් එකඟයි, අපිත් එකඟයි" කියන ප්‍රකාශය කරන්න අපි සූදානම්. ඒකට උදවු කරන්න අපි සූදානම්. හැබැයි, බොහොම පැහැදිලිව මම යෝජනා කරනවා, ඝානාව ගිය අඩි පාර ගැන ඔබතුමන්ලා පොඩ්ඩක් හොයලා බලන්න කියලා. ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර - ISB - හිමියන් කියූ පළියට ඝානාව එකඟ වුණේ නැහැ. ඒකටත් මැදිහත් වුණේ, Lazard and Clifford Chance කියන ආයතන; මේ අපි වෙනුවෙන් negotiate කරපු ආයතන. ඔබතුමන්ලාට පුළුවන් ඒගොල්ලන්ට කථා කරලා අහන්න, "ඝානාව දිනා ගත් ජයග්‍රහණය ශ්‍රී ලංකාවට දිනා ගන්න බැරි ඇයි?" කියලා. මේකට තිබෙන එකම විසඳුම එයයි.

දැන් ඔබතුමන්ලා කථා කරනවා, එකතු වෙලා රට ගොඩනඟන්න. අපිත් සූදානම් එකතු වෙලා රට ගොඩනඟන්න. නමුත් හොඳට මතක තබා ගන්න, මේ ගිවිසුම හරහා ඔබතුමන්ලා බලාපොරොත්තු වන "පොහොසත් රට ලස්සන ජීවිතය" නිර්මාණය කරන්නට බැහැ කියන එක. අපි අනිවාර්යයෙන්ම විෂම ණය චක්‍රයක වහල්ලුන් බවට පත් වනවා. විෂම ණය චක්‍රයේ කොටස්කරුවන් බවට පත් වෙලා දශක ගණනාවක් යනතෙක් ණය බරින් පිරිච්ච රටක් බවට අප පත් වනවා. ඒ නිසා මා නැවතත් යෝජනා කරනවා, කරුණාකරලා 12වැනි දාට පෙර ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් එක්ක ඇති කර ගන්නට යනවාය කියන එකඟතාව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. එය විවාදයට භාජන කරලා, ඡන්දයකුත් දීලා ආණ්ඩුවයි, විපක්ෂයයි එක්කහු වෙලා මේ රටට අහිතකර ගිවිසුම, රටට වාසිදායක නොවන ගිවිසුම, සදාකාලික ණය බරට ලක් කරන ගිවිසුම, ප්‍රතික්ෂේප කරන්නට අපි දෙගොල්ලෝම එකඟ වෙමු කියලා මම මේ අවස්ථාවේ යෝජනා කරනවා.

මතක තබා ගන්න, අපට යන්න තිබෙන්නේ මැද මාවතේ. රටක් ගොඩනඟන්නට අන්ත ධනවාදය සුදුසුත් නැහැ, අන්ත සමාජවාදය සුදුසුත් නැහැ. අපි යන්නට ඕනෑ මැද මාවතේ. නමුත්, කනගාටුදායක තත්ත්වය තමයි අද ඔබතුමන්ලා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය ගිය මාවතේ, නව ලිබරල්වාදී සංකල්පයේ මුදුන් මුලක් බවට පත් වෙලා. එතැනට යන්නට එපා. උග්‍ර ධනවාදයෙන් මේ රටේ ප්‍රශ්න විසඳන්න බැහැ. අන්ත සමාජවාදයෙන් මේ රටේ ප්‍රශ්න විසඳන්න බැහැ. මේ රටේ ප්‍රශ්න විසඳන්න පුළුවන් මැද මාවත තමයි සමාජ වෙළඳපොළ ආර්ථිකය, මානුෂීය ධනවාදය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය කියන සංකල්ප.

මේ අවස්ථාවේ ගරු හරිනි අමරසූරිය අගමැතිතුමියවත්, ගරු විජිත හේරත් අමාත්‍යතුමාවත් ගරු සභාවේ නැහැ. ඒ දෙපළම IMF

[ගරු සජිත් ප්‍රේමදාස මහතා ]

ගිවිසුමට විරුද්ධව එදා මේ ගරු සභාවේ ඡන්දය දුන්නා. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරනකොට, EPF එකේ, ETF එකේ මුදල් මංකොල්ල කනකොට ඒ දෙකටම විරුද්ධව වත්මන් ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මැතිතුමාත්, ජාතික ජන බලවේගයේ අනෙක් මන්ත්‍රීවරු දෙදෙනාත්, අපිත් ඇතුළුව එදා domestic debt restructuring තුළින් අර්ථසාධක අරමුදලෙන් පික්පොකට් ගහනකොට ඊට විරුද්ධව ඡන්දය දුන්නා. දැන් කොහොමද ඒකට එකඟ වෙන්නේ? සමාන විධියට සලකන්න ඕනෑ - comparability of treatment - කියලා, ISB එක ඒ ඉල්ලන කප්පාදුවට සමාන කප්පාදුවක් අර්ථසාධක අරමුදලෙන් සිදු වෙන්න ඕනෑ කියලා, ඒ කප්පාදුව කළා. ඒකට විරුද්ධව අපි එකට හිට ගත්තා; වැඩ කරන ජනතාවගේ, සාමාන්‍ය ජනතාවගේ ඉතිරි කිරීම් රැක ගන්නට, ආරක්ෂා කරන්නට අපි එකට හිට ගත්තා. දැන් කොහොමද වෙනස් වෙන්නේ? ඒ නිසා මම බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලාට හැකියාව තිබෙන්නට ඕනෑ 12වැනි දාට පෙර හදිසි පාර්ලිමේන්තු කැඳවීමක් කරන්න. අපි ඒකට සූදානම්. ගරු සභාවේ විශේෂ රැස්වීමක් පවත්වලා අපි රටක් හැටියට, රට නියෝජනය කරන මන්ත්‍රීවරු 225දෙනා හැටියට කල්ලිවලට, කණ්ඩායම්වලට, පක්ෂවලට හා න්‍යායවලට බෙදෙන්නේ නැතුව ස්වෛරී බැඳුම්කර හිමියන්හට එක හඬින් අපේ පණිවුඩය දෙමු; "මේ ගිවිසුමට අපි එකඟ වෙන්නේ නැහැ. සානාවට ලැබුණා වාගේ ගිවිසුමක් අපි අත්සන් කරන්න ඕනෑ. මේ ගිවිසුමට අපි සූදානම් නැහැ" කියන පණිවුඩය දෙමු. ඇත්තෙන්ම බැලුවොත් මේකෙන් ණය කප්පාදුවක් වෙන්නේ නැහැ. බැලූ බැල්මට පෙනෙනවා සියයට 14ක් කැපෙනවා කියලා. දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය වනවා කියන scenario එක දිහා බැලුවාම, අපට කිසිම වාසියක් නැහැ. අපි රට වෙනුවෙන් එකට එකතු වෙලා මේ තීන්දුව ගනිමු.

අවසාන වශයෙන් මම මතක් කරන්න කැමැතියි, මේ කාරණයත්. අපේ රටේ ආර්ථික වර්ධනයේ ප්‍රධානතම සාධකය වන්නේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්. පරාටේ නීතිය තාවකාලිකව අත්හිටවපු ඒ කාල සීමාව දෙසැම්බර් 15වෙනි දා වෙනකොට අවසන් වෙනවා. ඉන් පසු ආපසු පටන් ගනීවි, වෙන්දේසිය. මම රජයට යෝජනා කරනවා, මේ සඳහා විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා. ඒ අනුව, පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම තව කාලයකට අත්හිටුවන්න. හැබැයි, ඒ අත්හිටුවීම පමණක්ම මේ සඳහා ප්‍රමාණවත් වන්නේ නැහැ. ඒ ආයතනවල තිබෙන non-performing loans, අසාදු ලේඛනවලට ලක්වීම - blacklisting, ඒ අයගේ ණය ප්‍රශ්නවලට විසඳුමක් හැටියට ප්‍රාග්ධනයට ප්‍රවේශය - access to capital, කාරක ප්‍රාග්ධනයට ප්‍රවේශය - access to working capital, කියන මෙන්න මේ මාතෘකා මත යම්කිසි සැලසුම් සහගත වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් මගේ අදහස් ඉදිරිපත් කිරීම අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Prof.) Anil Jayantha?

**ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. පුංචි පැහැදිලි කිරීමක් කරන්නම්, විශේෂයෙන් මේ මතු වෙච්ච කාරණාවලදී, නැවතත් මේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් ඇති වෙච්ච ගිවිසුම පිළිබඳව වැරදි අදහසක් සභාගත වන නිසා.

ඇත්තටම මේ ගිවිසුම හොඳයි, ගිවිසුම ක්‍රියාත්මක කිරීම හොඳයි කියා ගිවිසුම සැදීමට සම්බන්ධ වෙච්ච කණ්ඩායමක් නොවෙයි, අපි. මේ ගිවිසුම පිළිබඳව අපට විවේචන තිබුණා; අදත් තිබෙනවා. ඒ වාගේම මේ ගිවිසුමේ වාසි, අවාසි සහ ඉදිරියේදී ඇති වන තත්ත්වයන් පිළිබඳවත් අපට ලොකු අවබෝධයක් තිබෙනවා. අවශ්‍ය නම්, ඒ පිළිබඳව විවාදයක් කරන්න අපට පුළුවන්. ඒකේ වගකීමත් ගන්න වෙන්නේ ඒක නිර්මාණය කරපු අයට. අපි පැහැදිලිව ඉදිරිපත් කළේ ඒ තත්ත්වයන් නිර්මාණය කරලා අවසාන අදියරේදී, අද තිබෙන තත්ත්වයේදී තිබෙන ප්‍රායෝගිකව ගන්න උත්තරය ගැන. එහෙම නැතුව, ගිවිසුම වෙනුවෙන් පෙනී සිටීම නොවෙයි. ඒ උත්තරයේදී, අපට තිබුණේ ප්‍රශ්න දෙකයි. මොකද, මේ ගිවිසුම වෙනස් කරලා අලුත් ගිවිසුමකට යනවා නම්, ඒක සතියෙන් දෙකෙන් කරන්නට බැහැ. ඒ සඳහා තව අවුරුද්දක් විතර යනවා. එතැනින් සිද්ධ වෙන පාඩුව සහ ආර්ථිකයේ බිඳ වැටීම වෙනුවට අපි සැලසුම් කරලා තිබෙන ආර්ථිකය ගොඩනැඟීමේ වැඩ පිළිවෙළට මේ ගිවිසුම ඉදිරියට අරගෙන යනවාද කියන කාරණය තමයි වැදගත් වුණේ. එතැනදී තමයි අපි තෝරා ගත්තේ ඒ පිරිවැය දැරීම සැලකිල්ලට භාජන කරමින් රට ඉදිරියට ගෙන යෑමේ ප්‍රායෝගික ප්‍රවිෂ්ටයක් සඳහා යා යුතුයි කියලා.

ඒත් එක්කම තමයි අර ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 3,000 පැන නැඟුණේත්. එහෙම නැතිව වෙන මොකක්වත් නිසා නොවෙයි. දැනට මේ ස්වෛරී බැඳුම්කර හිමියන් අතේ පරණ බැඳුම්කර පත්‍රිකා, නෝට්ටු ටික තිබෙනවා. ඒ නිසා මේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කාරණයේදී ඒ ණය පත්‍රිකා ටික අරගෙන අලුත් පත්‍රිකා ටිකක් නිකුත් කරන්න ඕනෑ. ඒ අනුව අලුතෙන් නිකුත් කරන පත්‍රිකාවල වටිනාකම තමයි, රුපියල් බිලියන 3,000. ඒවා නිකුත් කරනකොට ඒක න්‍යායාත්මකව, තාක්ෂණික වශයෙන් අලුතෙන් ණය ගැනීමක් විධියට පෙනුණාට මෙහිදී කිසිම ආකාරයක අලුතෙන් ණය ගැනීමක් සිද්ධ වෙන්නේ නැහැ කියන කාරණයත් මේ සභාවට දැනුම් දෙන්න මා කැමැතියි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Deputy Speaker, may I speak?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Kabir Hashim.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

Hon. (Prof.) Anil Jayantha, I thank you for putting that forward. The Government oppose the Debt Sustainability Analysis of ISBs. Now, you have an opportunity. We, as the Opposition, also had certain reservations about the conditions that the previous Government was going to sign on. You have an

opportunity till the 12th. As the Hon. Leader of the Opposition requested, bring it to Parliament, have a debate and take a vote on it. Then, we can go through the process after that. We can talk about what clauses we should let go, what we should agree on and whether we need to rethink the entire Agreement. Then, you also can vote.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Deputy Speaker, may I add something to this very important discussion? The Hon. Ranil Wickremesinghe brought that Agreement to Parliament. He did not really have to do it because previously, IMF Agreements were never voted for in Parliament. But, he did it to get commitment from the Legislature. It is true that you do not need Parliamentary approval to enter into this Agreement, but given the situation you are in, you can defend it by bringing it before Parliament and saying whatever you want to say about it; there is nothing wrong in doing that.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Leader of the House?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී මම ඉතාම කරුණාවෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. ලංකා ඉතිහාසයේ පළමුවැනි දෘශ්‍යාබාධිත මහජන නියෝජිත වන ගරු සුගත් වසන්ත ද සිල්වා මැතිතුමාට තමයි ඊළඟ කථාව තිබෙන්නේ. ඒ අනුව මේ පාර්ලිමේන්තුව තුළ එතුමාගේ පළමුවැනි කථාව තමයි දැන් කරන්න යන්නේ. අපි පිළිගන්නවා, මෙතැන ඉන්න මන්ත්‍රීතුමන්ලාට මේ විෂයය පිළිබඳව තිබෙන උනන්දුව පිළිබඳව. නමුත්, හැම වෙලාවේම එකම පිරිසක් නැඟිට නැඟිට කථා කරන්න ගියාම, ඇත්තටම තමන්ගේ පළමුවැනි කථාව කරන්න ඉන්න මන්ත්‍රීතුමන්ලාට එය බාධාවක් වෙනවා. මේක කොහොමත් විවාදයකින් අවසන් කරන්න බැහැ නේ. අනෙක් මන්ත්‍රීතුමන්ලාට කථා කිරීමට තිබෙන අයිතිය ගැනත් අපි respect කරන්න ඕනෑ. අපට interest එකක් තිබෙනවා තමයි subject එක ගැන. නමුත් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුනුත් ඒ ගැන හිතන්න ඕනෑ. ඒ නිසා මම ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, එක intervention එකකට පමණක් ඉඩ දෙන්න කියලා. මොකද, අද ගොඩක් කථිකයෝ ඉන්න නිසා ඒක දිගටම කරගෙන යන්න අමාරුයි. බොහොම ස්තුතියි. මේක අපේ ඉල්ලීමක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Sugath Wasantha de Silva. You have 17 minutes.

Order, please! Will an Hon. Member propose the Hon. Sanjeewa Ranasingha to the Chair?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 12.02]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසරයි. සභානායකතුමා කිව්වා වාගේම ඇත්තෙන්ම මේක මම පාර්ලිමේන්තුව තුළ සිදු කරන මංගල කථාවයි. මේක ඓතිහාසික කථාවක්. මේ කථාව ආකාර කිහිපයකින් ඓතිහාසික බවට පත් වෙනවා.

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ඉතිහාසය තුළ අවුරුදු 76කට පස්සේ ආබාධ සහිත පුද්ගලයෙකුට පාර්ලිමේන්තු වරම් හිමි වෙනවා. ආබාධ සහිත පුද්ගලයෙකුට පාර්ලිමේන්තු වරම් හිමි වෙන්නේ අහඹු ලෙස ආකස්මිකව හෝ ඉහළින් පහත් වෙච්ච දෙයක් නිසා නොවෙයි. මේ ඓතිහාසික මොහොත උදා කර ගන්න වෙහෙසුණු කණ්ඩායමක් ඉන්නවා, දේශපාලන නායකත්වයක් ඉන්නවා. ඔවුන්ට මගේ ප්‍රජාව - ලක්ෂ 17කට අධික ආබාධ සහිත ප්‍රජාව - වෙනුවෙන් ස්තුති කරන්න මට අවශ්‍යයි. ආබාධ සහිතවූවන්ට තමන් පිළිබඳවත් තීන්දු-තීරණ ගන්නා වූ උත්තරීතර සභාවට නියෝජනයක් අවශ්‍යයි කියන එක තේරුම් ගත්තේ ජාතික ජන බලවේගය පක්ෂය - මේ දේශපාලන ව්‍යාපාරය විතරයි. ඔවුන්ට ඒ සංවේදීතාව ඇති වුණේ කොහොමද?

මේක දේශපාලන සැරසිල්ලක්, ජාතික ලැයිස්තුවට ලකුණු දමා ගැනීමේ වැඩක් විධියට තමයි, පසුගිය දේශපාලනික ප්‍රචාරණ යන්ත්‍රණය තුළ විපක්ෂයේ කණ්ඩායම්, සමහර විරුද්ධවාදීන් කිව්වේ. ඒක සැරසිල්ලක් නොවන බව මම මේ පාර්ලිමේන්තුව තුළ පෙනී සිටීම තුළින් ඔබට පෙනෙනවා ඇති. ඒ වාගේම ගොඩක් අය ඇහුවා, ආබාධිත පුද්ගලයෙකුට මෙතැනට ඇවිල්ලා කරන්න පුළුවන් වෙන්නේ මොකක්ද කියලා. අපි ඒක ඉදිරි අවුරුදු පහ තුළ මගේ සහෝදර මන්ත්‍රී කණ්ඩායමත් එක්ක ඔප්පු කරලා පෙන්වනවාය කියන එක මම පැහැදිලිව කියන්න ඕනෑ. මේ කර්තව්‍යයට නායකත්වය දීපු ජාතික ජන බලවේගයේ නායකත්වයට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ සමඟ සහසම්බන්ධ වෙච්ච කලින් මම කියපු ලක්ෂ 17කට අධික ආබාධ සහිත කණ්ඩායමටත් මං ස්තුතිවන්ත වෙනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මූලාසනයේ සිට පාර්ලිමේන්තු මහ ලේකම්තුමිය ඇතුළු අපේ පාර්ලිමේන්තු කණ්ඩායමත්, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයත්

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

මට මේ කටයුත්ත කරගෙන යෑමට පහසුකම් සලසනවා. ඒ පිළිබඳව මම ඔවුන්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ඒ එක්කම මගේ හිතවතුන්, මගේ ඥාතීන් ඇතුළු මේ සියලුදෙනාම ආබාධිත ප්‍රජාව වෙනුවෙන් මගේ වගකීම හා යුතුකම ඉෂ්ට කරන්න මට සහයෝගය දෙනවා; අත්වැල් සපයනවා. මම කලින් කිව්වා වාගේම දාහත්ලක්ෂයක් ආබාධිත මිනිස්සු මේ ශ්‍රී ලංකාව තුළ ඔබත් එක්ක එකට හුස්ම ගන්නවා. මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ මම ආබාධිත පුද්ගලයෙක් විධියටත්, ඔබතුමන්ලා ආබාධිත නොවන පුද්ගලයින් විධියටත් ජීවත් වෙනවා. අපි වාද විවාද කරනවා; තොරතුරු බෙදා ගන්නවා.

ආබාධ සහිත පුද්ගලයා කියන්නේ කවුද? මම පෞද්ගලිකව විශ්වාස කරනවා, ආබාධ සහිත පුද්ගලයා කියන්නේ මේ ලෝකයට ලස්සන කැන්දන් එන්න ආපු දූත පිරිසක් කියලා. ඔබ දකින ලස්සන නිර්මාණය වෙන්නේ විවිධත්වය තුළයි. ඒ විවිධත්වය තුළ තමයි විචිත්‍රත්වය නිර්මාණය වෙන්නේ. ඇස් පෙනෙන අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනයේ ඉන්නවා. ඒ වාගේම ඇස් පෙනෙන මාගේ කණ්ඩායමත් ඉන්නවා. ඒ අය අතරේ ඇස් නොපෙනෙන මම ඉන්න නිසා මෙතැන විවිධත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ එක්කම සංඥා භාෂාවෙන් මගේ කථාව පරිවර්තනය කරන්නේ ඇයි? මට ඇහුණත්, මට වාගේ ඇහෙන්නේ නැති ලක්ෂ සංඛ්‍යාත කණ්ඩායමක් මේ රටේ ඉන්නවා. ඔවුන්ට මේ පණිවුඩය ගෙනියන්න, ඔවුන්ට සන්නිවේදන අවශ්‍යතාව ඉෂ්ට කරන්න තමයි පාර්ලිමේන්තු සන්නිවේදන දෙපාර්තමේන්තුව මඟින් සංඥා භාෂාවෙන් මේ කථාව පරිවර්තනය කරන්නේ. විවිධ ආබාධ සහිත මිනිස්සු ඉන්න නිසා තමයි මේ මානව සමාජයේ විචිත්‍රත්වය, ලස්සන නිර්මාණය වෙලා තිබෙන්නේ. අන්න, ඒකට දායක වෙන කෙනෙක් තමයි මම. මාත් එක්ක ජීවත් වෙන ලක්ෂ දාහතකට අධික ආබාධ සහිත කණ්ඩායම තමයි මේ මානව සමාජයට ලස්සන ගෙනෙන්නේ. හැබැයි, තිබෙන ප්‍රශ්නය තමයි මේ ලස්සන ගෙනෙන ආබාධිත කණ්ඩායමට කොයි වාගේ තත්ත්වයක්ද උරුම වෙලා තිබෙන්නේ කියන එක.

මීට අවුරුදු හතළිස් ගණනකට කලින් මේ පාර්ලිමේන්තුව විවෘත කරන වෙලාවේ දැස් නොපෙනෙන ළමයෙක් විධියට මම මේ පාර්ලිමේන්තු සභා ගැබේ කෙරෙන කථා, රේඩියෝවට කන් දීගෙන අහගෙන හිටියා. මට තවමත් මතකයි, සරත් මුත්තෙට්ටුවේගම මන්ත්‍රීතුමා කරපු කථාවේ කොටස්. හැබැයි, පසුගිය අවුරුදු දෙක, තුන, හතර, පහ ඇතුළේ මේ පාර්ලිමේන්තුවේ කෙරෙන කථා අහගෙන ඉන්නකොට ඇහුණේ, මගේ ආබාධිතතාව හෑල්ලු කරන වචන සහ වෙනත් ආබාධිතතා සහිත පුද්ගලයන් හෑල්ලු කරන වචන. ඒ නිසා මම මූලාසනයෙන් ඉල්ලා සිටිනවා, පින්සිද්ධ වෙයි, මේ වාගේ හිංසනයට ලක් කරන වචන භාවිතාවට නම් පාර්ලිමේන්තුව තුළ ඉඩ දෙන්න එපා කියලා. මේ, උත්තරීතර ආයතනය කෙලෙසන වචන. ආබාධ සහිත ලක්ෂ සංඛ්‍යාත ජනතාව ඒ වචනවලින් තැවෙන බව, වේදනාවට පත් වෙන බව ඔබතුමන්ලා හිතන්න ඕනෑ.

මොකද, මේ ආබාධිතතාව කියන එක අපි බලෙන්, කැමැත්තෙන්, බලහත්කාරයෙන් උරුම කරගත් දෙයක් නොවෙයි. හැබැයි, අපි මේ ආබාධිතතාව සමඟ ජීවිතය අත්නොහැර, ජීවිතයට පෙම් බඳිමින් අනවරත අරගළයක් කරන අය. මේ මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය මොකක්ද? ඔබතුමන්ලා විශ්වාස කරනවාද, ආබාධ සහිත තැනැත්තන්ගෙන් සියයට 3කට රැකියා සඳහා කෝටාවක් දෙන්න ඕනෑ කියලා 1988දී චක්‍රලේඛයක් ඇවිල්ලා තිබෙන බව. අද වෙනකොට අවුරුදු කීයක් ගත වෙලා තිබෙනවාද? හැබැයි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පසුගිය වාර්තාව අනුව රැකියා විරහිතව සියයට 71ක් ඉන්නවා. මේකට අපි ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් විධියට අනිවාර්යයෙන්ම පිළිතුරු සොයනවා. හැබැයි, මේ තත්ත්වය උරුම කර දීපු විපක්ෂය සහ පැරණි ආණ්ඩු ඔවුන්ව මේ කරුමක්කාර ජීවිතයෙන් මුදා ගන්න කිසිම වැඩක් කළේ නැහැ.

මම ඒ සඳහා එක උදාහරණයක් කියන්නම්. ලංකාවේ පළාත් සභා ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා. පළාත් සභාවෙන්, පළාත් සභාවට එක නීතියක් නොවෙයි ක්‍රියාත්මක වෙන්නේ. ඒක හරිම අවාසනාවන්ත තත්ත්වයක්. අධ්‍යාපන අමාත්‍යාංශය කැබිනට් මණ්ඩලය හරහා දීපු කැබිනට් තීන්දුවක් අනුව ආබාධ සහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ ක්‍රියාදාමයක් සිදු වුණා. ඒක සියලු පළාත් සභාවලින් ක්‍රියාත්මක කරද්දී මධ්‍යම පළාත් සභාව ක්‍රියාත්මක කළේ නැහැ; බස්නාහිර පළාත් සභාව ක්‍රියාත්මක කළේ නැහැ. මොකක්ද අපට තිබෙන දුක? උපාධිය දිනාගෙන රැකියා විරහිතව තවත් දෘශ්‍යාබාධිත කණ්ඩායමක් තමන්ගේ අම්මා පොවාපු කිරිවල ණය ගෙවන්න බැරිව ගෙවල්වලට කොටු වෙලා දුක් විඳිනවා. ඒවාට විසඳුම් අවශ්‍යයි. එහෙම ඉන්නේ උපාධියක් ගත්ත අය. හැබැයි, උපාධියක් නැතිව ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් රැකියා විරහිතව ආබාධිත දීමනාව මත යැපෙමින් ඉන්නවා. අපි ඉදිරිපත් කරන ඉදිරි අය වැය ලේඛනයෙන් අනිවාර්යයෙන්ම ආබාධිත සහිත ප්‍රජාවට වෙන් කරන ආබාධිත දීමනාව රුපියල් 7,500 සිට රුපියල් 10,000 දක්වා වැඩි කරන බව මම ඉතා පැහැදිලිව ප්‍රකාශ කරන්න කැමැතියි. හැබැයි, මේ දීමනාව ඉදිරිපත් කරන්නේ සියයට සියයක්ම සුභසාධනය මත, යැපුම් මානසිකත්වයකින්, ආබාධ සහිත ප්‍රජාවට ඉන්න නොවෙයි. ඔවුන් සමාජ බලගැන්වීමක් තුළින් රැකියා කරමින් ශ්‍රම බලකායට දායක වෙමින් රටේ සංවර්ධනයට බලාත්මකව, තීරණාත්මකව මැදිහත් වෙන පුරවැසියන් බවට පත් කිරීමේ වගකීම ජාතික ජන බල වේගයේ රජය භාර අරගෙන තිබෙනවා. ඔවුන් තමන්ගේ එක්ව අත් නොහැර යන ගමනේ, ප්‍රතිපත්තියේ, වැඩ පිළිවෙළේ මේ කාරණා අඩංගු කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, පසුගිය රජයන් මෙතෙක් ඉෂ්ට නොකරපු සමාජ වගකීමත්, ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳව වගකීමත්, අනෙක් පැත්තෙන් ජාත්‍යන්තර වගකීමත් ඉෂ්ට කරන්න.

ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට 2006 වර්ෂයේදී ලංකාව අත්සන් කරනවා. ඊට අවුරුදු 10කට පස්සේ ඒක අපි අපරානුමත කරනවා. හැබැයි, මේකට ගැළපෙන නීතියක් හදාගන්න තවම අපි අපොහොසත් වෙලා තිබෙනවා. මේ නීතිය අනිවාර්යයෙන්ම එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට සමානුපාත විය යුතුයි; ගැළපිය යුතුයි. එහි ප්‍රතිපත්ති තිබෙනවා. අයිතිවාසිකම් 25ක් අන්තර්ගතයි. අනෙක් පැත්තෙන් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 33වන වගන්තිය විසින් අපට බල කරනවා, අපට ඒත්තු ගන්වනවා, අපට මඟ පෙන්වනවා, අපි රාජ්‍ය අංශය විධියට කොහොමද ආයතනික රටාවක් ගොඩනඟන්නේ කියලා. මේ ආයතනික රටාව තුළ ආබාධ සහිත තැනැත්තන්ගේ සක්‍රිය දායකත්වය ඉල්ලා සිටිනවා. සක්‍රිය දායකත්වය ඉල්ලා සිටින්නේ ඇයි? ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ තීන්දු-තීරණ ගන්නා මොහොතවල්වලදී ඔවුන්ගේ සක්‍රිය දායකත්වය ලැබුණේ නැති වුණොත් ඇත්තෙන්ම නියම ප්‍රතිඵලයක් භුක්ති විඳින්න මේ ආබාධ සහිත ප්‍රජාවට අවස්ථාව ලැබෙන්නේ නැහැ. අන්න ඒක වළක්වාලන්න තමයි ආබාධ සහිත ප්‍රජාවට මෙන්න මේ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය හරහා නව පනත් කෙටුම්පතක් ගෙනෙන්න ඕනෑ කියලා අපි යෝජනා කරන්නේ. අපට දැනට ක්‍රියාත්මක වෙන පනත අවුරුදු 28ක් පරණයි. ඒ පනත සම්මත වුණේ 1996. ඒ පනතින් අපට ලැබුණේ අයිතිවාසිකම් තුනයි. ඒ, අධ්‍යාපනයට ප්‍රවේශය, රැකියාවට ප්‍රවේශය සහ වෘත්තීය පුහුණුවට ප්‍රවේශය. රැකියාවට ලැබිච්ච ප්‍රවේශයේ තරම මම අර කියාපු සියයට 71ක්

රැකියා විරහිතව යැපුම් මට්ටමේ ඉන්නවා කියන එකෙන් ඔබට තේරෙනවා ඇති. අධ්‍යාපනයට ප්‍රවේශය කොහොමද ලැබිලා තිබෙන්නේ? අපට අන්තර්කරණය වෙච්ච පන්ති කාමරයක් තුළ ඉගෙන ගන්න අවශ්‍ය පහසුකම් නැහැ. ඒක සියලු ආබාධ සහිත කණ්ඩායම්වලට අදාළයි. සන්නිවේදන පහසුකම් නැති නිසා බිහිරි ප්‍රජාව අධ්‍යාපනයෙන් ගිලිහිලා තිබෙනවා. දෘශ්‍යාබාධිත ප්‍රජාව අධ්‍යාපනයෙන් ගිලිහෙනවා, ආර්ථික ගැටලු සහ ඔවුන්ට අවශ්‍ය උපකරණ, අධ්‍යාපනයට අවශ්‍ය මෙවලම් නැති නිසා. පන්ති කාමරයට ප්‍රවේශ වෙන්න බැරි, චලනාබාධිත ප්‍රජාව අධ්‍යාපනය හැර යනවා. ඔවුන්ට අධ්‍යාපනයට ප්‍රවේශ වෙන්න බැහැ.

බුද්ධි වර්ධන ඌනතා සහිත කණ්ඩායම්වල තත්ත්වය මීටත් වැඩිය බරපතළයි; මීටත් වැඩිය ඛේදජනකයි. මේ වාගේ වටපිටාවක් තුළ අධ්‍යාපනයට ප්‍රවේශයක් තිබෙනවා කියන මේ මිථ්‍යාව පනතක් ලෙස සම්මත වෙලා තිබිලා වැඩක් නැහැ.

වෘත්තීය පුහුණුව ගත්තත් එහෙම තමයි. ආබාධ සහිත වූවන්ට ගැළපෙන වෘත්තීය පුහුණු පාඨමාලා නවීකරණය වෙන්නේ නැහැ. නව වෙළෙඳ පොළට ගැළපෙන වෘත්තීය පුහුණුවක් ලැබුවේ නැත්නම්, ව්‍යවසායකයෙක් විධියට, ස්වයං රැකියාලාභියෙක් විධියට ආබාධ සහිත පුද්ගලයන්ට තමන්ගේ අභිමානය රැකගෙන තමන්ගේ නිෂ්පාදන හැකියාව ජාතියේ නිෂ්පාදනයට දායක කර ගැනීමේ අවස්ථාව ලැබෙන්නේ නැහැ. ප්‍රශ්නයව තිබෙන්නේ 1996දී සම්මත කළ පනත. අවුරුදු 28ක් ගතවෙලා තිබෙන පනත ආබාධ සහිත වූවන් පිළිබඳ කිසිදු අයිතිවාසිකමක් උල්ලංඝනය වුණා කියලා උසාවි යන්න ප්‍රමාණවත් කරගෙන තිබුණේ නැහැ, මේ රාජ්‍ය යන්ත්‍රණය. හැබැයි ගෞරවයෙන් කියන්න ඕනෑ, ආචාර්ය අජිත් සී. පෙරේරා මහත්මයා ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා, ශ්‍රී ලංකාවේ ප්‍රවේශ පහසුකම් භුක්ති විඳීමේ තිබෙන බාධකය අරගෙන. තීන්දුව දීලා අවුරුදු 14යි. හැබැයි, කිසිම ආණ්ඩුවක්; පසුගිය ආණ්ඩු එකක්වත් මේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව භූමියේ යථාර්ථයක් කරලා ආබාධ සහිත ප්‍රජාවට භුක්ති විඳීමට අවශ්‍ය පොදු පහසුකම් භුක්ති විඳින්න අවකාශය නිර්මාණය කළේ නැහැ. ඒ ගැන කනගාටුයි.

ගරු ප්‍රවාහන ඇමතිතුමනි, මම මේ කියන කාරණය නිරීක්ෂණය කරන්න. ශ්‍රී ලංකාවේ මෙච්චර ආබාධ සහිත කණ්ඩායමක් හිටියාට, ප්‍රවේශ පහසුකම් සහිත එක බස් එකක්, එක කෝච්චි පෙට්ටියක් මේ පොදු ප්‍රවාහන සේවාව තුළ මෙතෙක් නැහැ. මේක කනගාටුවට කාරණයක් නොවෙයි ද? මේ මිනිසුන්ට ගෙයින් එළියට බහින්න බැරි තත්ත්වයක් ඇතිව තිබෙන්නේ ප්‍රවාහන පහසුකමක් නැති තත්ත්වයක් තුළයි. සහෝදර මන්ත්‍රීවරුනි, දැස් හැර බැලුවාට පාරේදී ආබාධ සහිත මිනිස්සු දකින්න ලැබෙන්නේ නැත්තේ ඒ නිසායි. අපි යෝජනා කරනවා, පොදු ප්‍රවාහනයට, පොදු ආයතනවලට ප්‍රවේශ වීමේ හැකියාවක් මේ මිනිසුන් වෙනුවෙන් ඇති කරන්න කියලා. පුළුවන් නම් දැන්වත් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව සියලුම රජයේ ආයතන හරහා ක්‍රියාත්මක කරන්න. ඇත්තෙන්ම මෙන්න මේ ආබාධ සහිත මිනිසුන්ට භෞතික පරිසරය විසින් එළඹවා තිබෙන බාධක ඉවත් කරගෙන, ඔවුන් ඒ බාධක ජය ගන්නා වූ උත්සාහයට අපි සහයෝගය ලබා දෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
මට ඉතා කෙටි කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා. ඔවුන්ගේ ආබාධතාව අවම කර ගැනීමට අවශ්‍ය උපකරණ සහ මෙවලම් ලබා ගැනීමේදී බදු සහන ලබා දෙන්න ඕනෑ. මේ ආබාධ සහිත කණ්ඩායම සුදානම් පොහොසත් රටක් තුළ අභිමානවත්, ලස්සන ජීවිතයක් ගත කරන්න. ඒ සඳහා අපි ඉදිරි අවුරුදු 5 තුළ අනිවාර්යයෙන්ම ජාතික ජන බලවේගය විධියට, මේ රජය විධියට ඇප වෙනවා, කැප වෙනවා සහ ඒ වෙනුවෙන් කළ හැකි උපරිම දේ කරන බව සහතික කරමින්, මේ ඓතිහාසික මොහොත ලබා දුන් ඔබ සියලු දෙනාටම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.19]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරු සම්මත ගිණුම සම්බන්ධ විවාදය අවස්ථාවේදී මට කථා කරන්න ලැබීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. මේ රටේ ඉතිහාසය පුරා අතුරු සම්මත ගිණුම් 14ක් ඉදිරිපත් කරලා තිබෙනවා. සර්වජනබල ආණ්ඩුවක පළමුවැනි අතුරු සම්මත ගිණුම 1931දී තමයි ඉදිරිපත් වුණේ. මම නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව -මැතිනියගේ ආණ්ඩුව- 1960දී අතුරු සම්මත ගිණුමක් ගෙනාවා. පත්තර පනත පැරදිලා අතුරු සම්මත ගිණුමක් ගෙනාවා. 1960දී මැතිවරණ දෙකක් පවත්වා තිබෙනවා. මන්ත්‍රීවරයකුගේ කාර් එකේ හුළං ගිය නිසා - මම නියෝජනය කරන පස්සර මැතිවරණ කොට්ඨාසයේ මන්ත්‍රීවරයකුව සිටි අමරානන්ද රත්නායක මැතිතුමාගේ කාර් රථයේ රෝදයක හුළං ගිය නිසා - තමයි එදා ආණ්ඩුව පැරදුණේ. ඊට පස්සේ පත්තර පනත ගෙනැල්ලා ආණ්ඩුව පැරදිලා තමයි මම හිතන්නේ අතුරු සම්මත ගිණුමක් ගේන්න වුණේ.

කොවිඩ්-19 වසංගතයත් එක්ක එවකට ආණ්ඩුව 2020 අතුරු සම්මත ගිණුම් දෙකක් ගෙනාවා. මේ ගෙනැවිත් තිබෙන්නේ 14වැනි අතුරු සම්මත ගිණුම. හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(2) සහ (3) අනුව්‍යවස්ථා යටතේ, ජනාධිපතිවරයාට ඕනෑ වෙලාවක අතුරු සම්මත ගිණුමක් ගේන්න බලය තිබෙනවා. ඒ වාගේම, අපි 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයෙන් සම්මත කළා. එහි 23වැනි වගන්තියේ තිබෙනවා, අතුරු සම්මත ගිණුමක් ගෙන ඒම පිළිබඳව. හැබැයි, මෙතැනදී පරස්පරවිරෝධී විධියට අතුරු සම්මත ගිණුම ගේන්නේ නැතුව ආණ්ඩුවට විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න ඕනෑ තරම් අවස්ථාව තිබුණා. විසර්ජන පනත් කෙටුම්පත විවාද කරන්න තිබුණා, දවස් 10ක් හරි. රෑ, දවල් නැතුව හරි විවාද කරලා සම්මත කරගන්න තිබුණා. එක පාරම විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න ආණ්ඩුවට අවස්ථාව තිබුණා.

සාමාන්‍යයෙන් ආණ්ඩුවක් අතුරු සම්මත ගිණුමක් ගේන්නේ, ආණ්ඩුවක් කරගෙන යන්න බැරි අවස්ථාවක, ආණ්ඩුවක් දණ ගහපු අවස්ථාවක. නමුත් මේ ආණ්ඩුව එහෙම වෙලාවක නොවෙයි, මේ අතුරු සම්මත ගිණුම ගෙනාවේ. ආණ්ඩුවට ඕනෑ තරම් කාලයක් තිබුණා, විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න. නමුත් ආණ්ඩුව විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ නැහැ; අතුරු සම්මත ගිණුමක් ගෙනාවා. ඒ අතුරු සම්මත ගිණුම අද විවාද කරනවා. මේකට විවාදයක් ඕනෑ නැහැ, බෙදීම් ඕනෑ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කියලා තිබෙනවා, ඕනෑ

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

වෙලාවක අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරලා, සම්මත කරගන්න පුළුවන් කියලා. හැබැයි, ආණ්ඩුව මොකක්ද කියන්නේ? මේ අතුරු සම්මත ගිණුම ගෙනාපු වෙලාවේ අපිට බණින්න එපා, අපිට දොස් කියන්න එපා, අපිට කෑ ගහන්න එපා, අපේ අඩුපාඩු කියන්න එපා" තියලා ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් අපිට කියනවා.

අද එළියේ කථා කරන්නේ මොකක්ද? ඊයේ කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වේ මොකක්ද? රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ කාලයේ තිබුණු වැය ශීර්ෂයම තමයි තුනට කඩලා මාස හතරකට ඔබතුමන්ලා ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේක ආණ්ඩුවේ වැරැද්දක් නොවෙයි. මේ වැරැද්ද වෙලා තිබෙන්නේ මෙහෙමයි. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් අවුරුද්දේ වැය ශීර්ෂය තුනට කඩලා මාස හතරට එව්වා. කිසිම සංශෝධනයක් නැතුව එව්වා. නිලධාරින් තමයි ඔබතුමන්ලාව මුළා කරන්නේ. අවුරුදු 70ක් අපිව මුළා කරපු නිලධාරින්ම තමයි ඔබතුමන්ලාවත් මුළා කරලා තිබෙන්නේ. මේක හදලා තිබෙන්නේ කොහොමද? අවුරුද්ද තුනට කැඩුවා, මාස හතරක එක එව්වා, මුදල් අමාත්‍යාංශයට. මුදල් අමාත්‍යාංශයේ අය වැය අධ්‍යක්ෂ ජනරාල් ලියුමක් යොමු කරලා ජනාධිපති කාර්යාලයෙන් අහලා තිබෙනවා, මේ වැය ශීර්ෂය සංශෝධනය කරනවාද කියලා. සංශෝධනය කරන්නේ නැතුව ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ඒ විධියටම එවලා තිබෙනවා, සියයට 10ක් එකතු කරලා.

අපි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරු විධියට හිටියා. ගණන් දීමේ නිලධාරියෙක් ඒ කාලයේ කළේ සියයට 10ක් එකතු කරලා හදනවා. මම පළාත් සභාවේ හිටපු මහ ඇමති වාගේම මුදල් ඇමති. ගණන් දීමේ නිලධාරියෙක් මොකක්ද කරන්නේ? සියයට 10ක් එකතු කරලා පරිපූරක ඇස්තමේන්තුව පළාත් සභාවේ ඉදිරිපත් කරන්න කියනවා. ඕක තමයි අවුරුදු 70ක් නිලධාරින් කළේ. ඒ නිලධාරින් අවුරුදු 70ක් කරපු එක කරන්න නොවෙයි ඔබතුමන්ලා බලයට ආවේ. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් මේ වැය ශීර්ෂය සංශෝධනය නොකර එවා තිබෙනවා. අවුරුද්ද තුනට කඩලා මාස 4ක ගණන හදලා ඔබතුමන්ලාට එව්වා.

දැන් බලන්න, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ කාලයේ තිබුණු divisions 13ක් අනුර කුමාර ජනාධිපතිතුමා අයින් කරලා තිබෙනවා. ඒ divisions 13න් කිහිපයක් මම කියන්නම්. ලෝක ආහාර වැඩසටහන ඉන් එකක්. අද ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ඒ division එක අයින් කරලා තිබෙනවා. ඊළඟට, "උරුමය" වැඩසටහනත් එක division එකක්. අද ඒක අයින් කරලා තිබෙනවා. ඊළඟ division එක විදේශගත ශ්‍රී ලාංකිකයන්ට සිදු වූ අකටයුතුකම් සම්බන්ධයෙන් වන division එක. ඒකත් එක division එකක්. එතැන divisions තුනයි. Divisions 13ක් ජනාධිපති වැය ශීර්ෂයෙන් අයින් කරලා තිබෙනවා. එතකොට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ කාලයේ තිබුණු divisions 13ක් තිබියදී වැය ශීර්ෂය එව්වරයි. දැන් divisions 13ක් අයින් කරලා තිබෙනවා. ඔබතුමන්ලා රට හදන්න ආපු මිනිස්සු. ඔබතුමන්ලාගේ වැරැද්දක් නැහැ. මේ වැරැද්ද ගැන හොයලා බලන්න. අය වැය අධ්‍යක්ෂ ජනරාල් ජනාධිපති ලේකම් කාර්යාලයට ලිපියක් යොමු කර අහලා තිබෙනවා. මේගොල්ලෝ මොනවත් කරන්නේ නැහැ, repeat ගහන්නේ. අවුරුදු 70ක් repeat ගැහුවේ. ගරු ඇමතිතුමනි, මේවා ඉගෙන ගන්න අපෙන්.

මම පළාත් සභාවේ මුදල් ඇමති. නිලධාරින් කරන්නේ මොකක්ද? අවුරුද්දේ අන්තිම දවසේ; දෙසැම්බර් 31 warrant order එක අත්සන් කරන්න ඕනෑ. warrant order එක අත්සන් කරවා ගන්නේ කාගෙන්ද? කියන්න. warrant order එක අත්සන් කරවා ගන්න ඕනෑ මුදල් ඇමති හැටියට මහ ඇමතිගෙන්.

මා ප්‍රධාන අමාත්‍යවරයාව සිටි කාලයේ warrant එක අත්සන් කරවාගන්න අරගෙන ආවා, මා ළඟටත්. Warrant එක අත්සන් කරවාගන්න ආපු දවසක ප්‍රධාන අමාත්‍යවරයා හැටියට මම ප්‍රධාන ලේකම්වරයාගෙන් ඇහුවා, ගිණුම්වල කීයක් තිබෙනවාද කියලා. ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මිලියන 1,000යි; ලංකා බැංකුවේ මිලියන 800යි; මහජන බැංකුවේ මිලියන 800යි. මිලියන 2,600ක් පළාත් සභාව ස්ථිර තැන්පත් දමාගෙන තිබෙනවා. පළාත් සභාවකට ස්ථිර තැන්පත් දමන්න පුළුවන්ද? පළාත් සභාව මුදල් ඉල්ලන්නේ කොළඹින්. පොදු ගිණුමෙන් සල්ලි අරගෙන ගිහිල්ලා පළාත් සභාව ස්ථිර තැන්පත් දමනවා. රටේ මිනිස්සු IMF එකෙන් ණය ගන්නවා; පොදු ගිණුම සඳහා ණය ඉල්ලනවා; හැබැයි ඒ ආයතන ගිහිල්ලා එක එක තැන්වල සල්ලි දමා ගන්නවා. මේ වැරැද්ද වෙලා තිබෙනවා. ඒ අය ඔයගොල්ලන්ගේ කනෙන් රිංගයි. ඒ අය ඔයගොල්ලන්ගේ කනෙනුත් රිංගලායි තිබෙන්නේ.

අපි ප්‍රශ්න කිහිපයක් අහලා තිබෙනවා. තව ප්‍රශ්න කිහිපයක් ඉදිරියේදීත් අපි අහන්නම්, ඇමෙරිකාවේ වොෂින්ටන්වලට ගිය එක ගැන, IMF එකේ සාකච්ඡා ආදිය ගැන. වොෂින්ටන් ගිහිල්ලා වියදම් කරපු ගණන සම්බන්ධයෙනුත් මම පාර්ලිමේන්තුවේදී අහනවා. මම ඔබතුමන්ලාට කියන්නේ මේවා අපේ ඇඟට දමන්න එපා කියලායි. ජනාධිපතිතුමාගේ කනෙන් රිංගලා. ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය සමාන කරන්න බැහැ. මේක කළේ ගිය අවුරුද්දේ. වැය ශීර්ෂය තුනට කඩලා එව්වා. ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඇහුවා ඒක සංශෝධනය කරනවාද කියලා. නමුත්, සංශෝධනය කළේ නැහැ.

ඔබතුමන්ලාට මහාචාර්ය, ආචාර්ය පට්ටම් තිබෙන්න පුළුවන්. අපි ඒවාට තරහා නැහැ. අපෙනුත් ඉගෙන ගන්න දේවල් තිබෙනවා. මා ප්‍රාදේශීය සභාවට එනකොට මට අවුරුදු 23 යි. දේශපාලනයට ඇවිත් ප්‍රාදේශීය සභාවේ ඉඳන් අවුරුදු 55ක් වනකල් අවුරුදු 32ක් එක වතාවක්වත් පැරදෙන්නේ නැතුව දේශපාලනය කරපු මිනිහෙක්, මම. ප්‍රාදේශීය සභාවේ, පළාත් සභාවේ මන්ත්‍රී ධුරයෙන් පටන් ගෙන මහ ඇමති වෙච්ච මිනිහෙක්, මම. ඒ නිසා මම දන්නවා මොනවාද වෙලා තිබෙන්නේ කියලා.

අද එළියේ කියන කථාව මොකක්ද? අද අනුර කුමාර ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයයි, හිටපු ජනාධිපති රනිල් මහත්මයාගේ වැය ශීර්ෂයයි සමානයි. එහෙම කියලා තමයි ඊයේයි, අදයි ප්‍රවෘත්ති පත්‍රවලවල ආණ්ඩුවට දොස් පවරා තිබෙන්නේ. ආණ්ඩුව මේවා ගැන හොයන්න, බලන්න. දේශපාලනඥයන්ගේ කනෙන් රිංගන නිලධාරින් ඉන්නවා. අවුරුදු 70ක්ම කනෙන් රිංගුවා. එහෙම කනෙන් රිංගලා තමයි අපට කෙළියේ.

මෙතැන ඉන්නවා මාලිමාව නියෝජනය කරන මන්ත්‍රීවරු. මම ඔබතුමන්ලාගෙන් ප්‍රශ්නයක් අහනවා. හෘදය සාක්ෂියට එකඟව උත්තර දෙන්න. ඔබතුමන්ලා පාර්ලිමේන්තුවෙන් එළියේ මොකක්ද කිව්වේ? අද මාලිමාවේ මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා යන්න, මාදිවෙලට. මාදිවෙල මන්ත්‍රී නිවාස දිහා ඔබතුමන්ලා බැලුවා. ඒවායේ දුක් විඳින්නේ කොහොමද කියලා ඔයගොල්ලන් දැක්කා. අපිත් මාදිවෙල ඔය විධියට තමයි දුක් වින්දේ. අපේ හෘදය සාක්ෂිය ඒ ගැන දන්නවා. අපි ඒක එළියට කිව්වේ නැහැ. අපි මාදිවෙල විඳපු දුක් එළියට පෙන්නුවේ නැහැ. හැබැයි අද ඔයගොල්ලන්ගේ ඇස්වලට දැක ගන්න පුළුවන් වෙලා තිබෙනවා, මාදිවෙල පිහිටි මන්ත්‍රී නිවාසවල තත්ත්වය. මෙන්න මේවා ඉගෙන ගන්න.

ආණ්ඩු වට්ටන්නෙත් නිලධාරින්. ඒකයි මා කියන්නේ. ආණ්ඩුවේ අය මාතර දිස්ත්‍රික්කයේ වේදිකාවල කිව්වා නේ, ලස්සන කථා. මුදල් අමාත්‍යාංශයේ ලේකම් අනෙක් පහුවදා

එළවනවා කිව්වා. එළෙව්වා ද? මහ බැංකුවේ අධිපති අනෙක් පහුවදා එළවනවා කිව්වා. මම මහ බැංකුවේ අධිපතිවරයාට ඡන්දයට පහුවදා කථා කරලා සුබපැතුවා. මම ඇහුවා, කවදා ද යන්නේ කියලා. "නැහැ, මම යන්නේ නැහැ, මම ඉන්නවා" කිව්වා. ඔබතුමන්ලා මහ බැංකුවේ අධිපතිවරයා එළෙව්වා ද? ඔබතුමන්ලාට එතුමා එළවා ගන්න බැරි වුණා.

වෙළෙඳ ඇමතිතුමා මෙතැන ඉඳලා දැන් පිටව ගියා. වෙළෙඳ ඇමතිතුමා, ඔබතුමාට පොල් ගෙඩි ලක්ෂ 10ක් දෙන්න බැහැ. මොකද, NLDB එකේ වතුවල - රජයේ වතුවල - පොල් නැහැ. අගමැතිතුමිය ගිහින් Keells supermarket එකෙන් බඩු ගන්න පුළුවන්. හැබැයි පෞද්ගලික ආයතනවල වැඩ කරන අහිංසක මිනිසුන්ට පෝලිමේ ගිහිල්ලා හාල් කිලෝ 5 ගන්න බැහැ. ඒ මිනිස්සු, කම්කරු රස්සාව කරන මිනිස්සු හවසට යන්නේ හාල් කිලෝ එක, පොල් ගෙඩිය අරගෙන එවේලේ උයාගෙන කන්න. පාර්ලිමේන්තුවේ සේවය කරන මෙගොල්ලන්ටත් බැහැ, පෝලිමේ ඉඳලා හාල් කිලෝ 5 ගන්න. මෙගොල්ලන් හවස 5.30 වෙන කොට ගෙවල්වලටයි දුවන්නේ. ඔය සතොසවල පෝලිමේ ඉඳීවි රස්තියාදු ගහන මිනිස්සු. අනෙක් අයට බැහැ, රුපියල් 220 ගණනේ හාල් කිලෝ 5 ගන්න, රුපියල් 130ට පොල් ගෙඩිය ගන්න පෝලිමේ ඉන්න. ඒක හොඳට තේරුම් ගන්න. පොළොවේ යථාර්ථය තේරුම් ගන්න. ඒක තේරුම් අරගෙන වැඩ කරන්න. අපට දොස් කියන්න එන්න එපා.

අපි කැමැති නැහැ ඔයගොල්ලන්ගේ ආණ්ඩුව වැටෙනවාට. ඔයගොල්ලන්ගේ ආණ්ඩුව තවත් කාලයක් තිබෙන්න ඕනෑ. එතකොට තමයි අපට මේවා ගැන කියන්න පුළුවන් වෙන්නේ. ජනතාව ඔයගොල්ලන්ට දීලා තිබෙනවා, ආණ්ඩුවක්. මේ වැරදි වෙන්නේ කොහෙන්ද, වැරදි කරලා තිබෙන්නේ කොහෙන්ද කියලා අපි හොයලා කියන්නම්. මම මේ වෙලාවේදී ඔයගොල්ලන්ට කියන්න ඕනෑ, ඔයගොල්ලෝ අපට දොස් කියන්න එපා කියලා. අගමැතිතුමියට වැඩ නැති හින්දා Keells supermarket එකට යන්න ඇති. අගමැතිතුමියට වැඩක් නැතුව ඇති. Keells supermarket එකට ගිහිල්ලා බඩු ගන්න පුළුවන් අගමැතිතුමියට, වැඩ නැති හින්දා. හැබැයි වැඩ තිබෙන අහිංසක මිනිසුන්ට, පැය 12 වැඩ කරන මිනිසුන්ට ගිහිල්ලා සතොසේ පෝලිමේ ඉඳලා හාල් කිලෝ 5යි, පොල් ගෙඩි 3යි ගන්න බැහැ.

ඔය රජයේ වතුවලින් පොල් ගෙඩි ලක්ෂ 10ක් කඩන්න පුළුවන්ද? එහෙම වෙන්න බැහැ. වැඩ පිළිවෙළක් ඇතුව කටයුතු කරන්න. එක පැන් පාරෙන් කරන්න පුළුවන් කිව්වා. මම ජනාධිපතිතුමාට කියනවා, රාජ්‍ය යන්ත්‍රණය ගෝඨාභය හිටපු ජනාධිපතිතුමාත් ඔය විධියට තමයි මුළා කළේ කියලා. ඒ නිසා මේ ජනාධිපතිතුමාටත් ළඟට ගන්න එපා කියන්න ළඟ අය. ළඟට ගන්න දුර අය. ජනාධිපති කාර්යාලයට මේක කියන්න. ළඟ අය ගත්තොත්, ළඟ අය තමයි ඉස්සෙල්ලාම කෙළින්නේ ආණ්ඩුවට. ළඟ අය තමයි අපට ඉස්සෙල්ලාම කෙළියේ. ඒ නිසා දුර අය අරගෙන වැඩේ හරියට කරන්න. මේ කාරණය හරියට තේරුම් ගන්න, ඔය මන්ත්‍රීවරු. අපට ඇඟිල්ල දිගු කරන්න එන්න එපා. මම ඇමතිතුමන්ලාටයි මේ කියන්නේ. ඊයේ එක ඇමතිතුමෙක් කිව්වා, පරණ පව් ගෙවන්න ඕනෑ කියලා. ඒ පව් ගෙවන්න වෙනවා. මම මහ ඇමතිකම දාලා යන කොට අනෙක් මිනිහා ඒක කරන්න ඕනෑ. මම සභාපතිකම දාලා යන කොට අනෙක් මිනිහා ඒක කරන්න ඕනෑ. ඒක තමයි හැටි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම මීට වඩා කථා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියනවා. පාර්ලිමේන්තුවේ තාත්තලා-පුතාලා හිටියා; බාප්පලා-පුතාලා හිටියා; අක්කලා-අයියලා හිටියා; නංගිලා-අක්කලා හිටියා. ඒ ඔක්කොම හිටියා. අඩු වෙලා තිබුණේ එකයි; මහත්තයයි-නෝනයි. ඒකත් ඉන්නවා. දෙයියන්ගේ පිහිටයි!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු අපර භාග 1.00 දක්වා අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON.(MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ක්‍රිෂාන්ත අබේසේන ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

**ගරු ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(Hon.Chrishantha Abeysena - Minister of Science and Technology)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම මේ කරන්නේ මගේ මංගල කථාව. පළමුවෙන්ම, පාර්ලිමේන්තුවට මා තෝරා පත්කර එවූ ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට, විශේෂයෙන්ම වත්තල සහ ජාඇල ජනතාවට මගේ කෘතඥතාව පළ කරනවා. වත්තල ආසනය අපි වැඩි ඡන්ද 45,699කින් ජයග්‍රහණය කළා. මම හිතන හැටියට අපි ජාතික ජන බලවේගය හැටියට දේශපාලන ඉතිහාසයේ වත්තල ආසනයේ වැඩිම ඡන්ද ප්‍රමාණය ලබා ගත්තා. ඒ නිසා මම විශේෂයෙන්ම වත්තල ජනතාවට මගේ කෘතඥතාව පළ කරනවා.

ඒ එක්කම අපේ මේ දේශපාලන ව්‍යාපාරය තුළ කිසිම ලාභ ප්‍රයෝජනයක් නැතුව ස්වේච්ඡාවෙන් වැඩ කරන ජනතා විමුක්ති පෙරමුණේ අපේ සහෝදර සහෝදරියන්ටත් මගේ කෘතඥතාව පළ කරන්න ඕනෑ. ඒක මුළු ලංකාවේම එහෙමයි. ඒ ගොල්ලන් තමයි අපේ දේශපාලන ව්‍යාපාරයේ ශක්තිය.

ඒ වාගේම කියන්න ඕනෑ, මම දේශපාලනයට පැමිණියේ ශිෂ්‍ය ව්‍යාපාරය තුළින් බව. අපි දන්නවා, නිදහස් අධ්‍යාපනය වෙනුවෙන්, වෛද්‍ය අධ්‍යාපනය වෙනුවෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් කරන කැපවීම. ඒ නිසා ඒ අයටත් උපහාර කළ යුතු වෙනවා අද කරන මගේ මේ පළමුවැනි කථාවේදීම.

[ගරු ක්‍රිෂාන්ත අබේසේන මහතා]

අපේ රටේ නිදහස් අධ්‍යාපනයේ පියා වන සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහත්මයාගේ නම විකුණ විකුණා පසුගිය රජයන් නිදහස් අධ්‍යාපනය දවසින් දවස නැති කළා. විශේෂයෙන්ම 1977න් පස්සේ ධවල පත්‍රිකාව ගෙනැල්ලා, ඊට පස්සේ මේ වෙනකල් එක එක විධියේ programmes ගෙනැල්ලා, නිදහස් අධ්‍යාපනය දවසින් දවස නැති කළා. අද වෙද්දී ළමයෙකුට ඉස්කෝලේ යන්න හැටියක් නැහැ. ළමයි ඉස්කෝලේ අත්හැරලා යනවා. ඒ අයට පොත් ගන්න හැටියක් නැහැ, බෑග් එකක් ගන්න හැටියක් නැහැ, සපත්තු දෙකක් ගන්න හැටියක් නැහැ. ඒ තරමට අද නිදහස් අධ්‍යාපනය වළ පල්ලට ගිහිල්ලා තිබෙනවා.

ඒ වාගේම අපිත් එක්ක එකට හිටපු වෛද්‍ය ශිෂ්‍යයෝ ඝාතනය වුණා. මම ඒ අයත් මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ අක්‍රමවත් ප්‍රතිපත්ති, අවිද්‍යාත්මක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා වෛද්‍ය අධ්‍යාපනය කඩාකප්පල් වුණා. ඒක එක පාරක් නොවෙයි, දෙපාරක් වුණා. ඒ නිසා නැවත වතාවක් අපේ වෛද්‍ය ශිෂ්‍යයන් පාරට නොබසින වටපිටාවක් අපේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව යටතේ ඇති කරන බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

අද අලුත් වෛද්‍ය පීඨ ඇතුළේ ප්‍රශ්න තිබෙනවා. ඒ අයට clinical facilitiesවල ප්‍රශ්න තිබෙනවා; staff එක සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා. අපි ඒවාට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නවා. ඒ වාගේම ඒවායේ අධ්‍යයන - academic - අංශයේ ප්‍රශ්න තිබෙනවා. මමත් අවුරුදු 28කට ආසන්න කාලයක් රාගම වෛද්‍ය පීඨයේ අධ්‍යයන අංශයේ හිටියා. අවසානයේදී මම nomination දෙන්න ආවේ, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු හැටියට. ඉතින් මම දන්නවා ඇතුළේ තිබෙන ප්‍රශ්න. ඉතින් මම කාරුණිකව කියා සිටිනවා, සියලු වෛද්‍ය පීඨවල, විශේෂයෙන්ම වයඹ, සබරගමුව, මොරටුව, ඌව වැනි අලුත් වෛද්‍ය පීඨවල ඉන්න අධ්‍යයන කාර්ය මණ්ඩල වෙනුවෙන් වහාම නිසි පියවර ගන්න කියලා. මම හිතනවා ඒ අය හැමෝම දන්නවා ඇති කියලා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ minimum qualifications. ඒ ගැසට් එක අනුව අධ්‍යාපනය දෙන්න. අඩුම ගණනේ ඒ ගැසට් එක අනුව අධ්‍යාපනය දෙන්න ඒ අය ක්ෂණිකව ක්‍රියා කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා. රජයක් හැටියට අපි ඒ අයට අපේ උපරිම සහයෝගය ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. අපේ රටේ කිසිම වෛද්‍ය ශිෂ්‍යයෙක්, කිසිම විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක් ඒවා වෙනුවෙන් පාරට බැසිය යුතු නැහැ.

ඒ වාගේම අපි දන්නවා, අපේ රටේ කම්කරු ව්‍යාපාරය ගැන. අපේ රටේ කම්කරු සටන්, ගොවි සටන් ඇති වුණේ ඇයි? මේ රටේ බලයේ හිටපු ආණ්ඩු ගොවියා ගැන සැලකිල්ලක් දැක්වුවේ නැහැ, කම්කරුවා ගැන සැලකිල්ලක් දැක්වුවේ නැහැ. ඒ අය දිහා බැලුවේ වෙනත් අතකින්.

හැබැයි, කම්කරු ව්‍යාපාර, ගොවි ව්‍යාපාර යම් දෙයක් ලබාගෙන තිබෙනවා නම්, -වෛද්‍යවරු ඇතුළුව එහෙමයි- ඒ දේ හැම තිස්සේම ලබාගෙන තිබෙන්නේ විරෝධතා දක්වලා. වෛද්‍ය ක්ෂේත්‍රයේ විරෝධතා, වැඩ වර්ජන මම පෞද්ගලිකව පිළිගන්නේ නැහැ. නමුත් ඉතිහාසයේ වෙලා තිබෙන්නේ එහෙමයි. ඒවාට mechanism එකක්, වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. ජනතාව අපහසුතාවට පත් නොකර ඒ ප්‍රශ්න, ගැටලු විසඳීමේ වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ වාගේම මම මෙය අවස්ථාව කර ගන්නවා ගොවි කම්කරු ජනතාව ගැන විතරක් නොවෙයි, මේ රටේ පීඩිතයා වෙනුවෙන් කථා කළ හැමෝටම ස්තුති කරන්න. ආගම නිසා වෙන්න පුළුවන්, ජාතිය නිසා වෙන්න පුළුවන්, ආබාධිත තත්ත්වය නිසා වෙන්න පුළුවන්, එහෙම නැත්නම් සිරකරුවකු නිසා වෙන්න පුළුවන්, ඒ හැම කෙනෙක් වෙනුවෙන්ම යුක්තිය, සමාජ සාධාරණත්වය ගැන කථා කළ හැම කෙනෙකුටම මගේ ප්‍රණාමය පුද කරනවා.

අද පාස්කු ප්‍රහාරය ගැනත් කථා කළා. දැන් පාස්කු ප්‍රහාරය වෙලා අවුරුදු පහමාරක් ඉවර වෙලා. පාස්කු ප්‍රහාරය ඇති වුණේ යහ පාලන ආණ්ඩුව කාලයේ. අපි දන්නවා, ඒකට තව ගැඹුරු දේශපාලන සම්බන්ධකම් තිබෙනවා. නමුත් ඒ තිබුණු ආණ්ඩු පාස්කු ප්‍රහාරය ගැන සෙවීම වෙනුවෙන්, ඒ වින්දිතයන් වෙනුවෙන් කිසිම දෙයක් කළේ නැහැ, හැම දාම ගේම් ගැහුවා. විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරුත් ගේම් ගැහුවා. ඒක අපි දන්නවා, ඒ නිසා අපි ඒ ගැනත් මතක් කරනවා. අපි පාස්කු ප්‍රහාරයේ වින්දිතයන්ට සාධාරණය ඉටු කරනවා.

ඒ වාගේම අපි හැම තිස්සේම කිව්වා, අපේ මේ සභාවේ මන්ත්‍රීවරුත් කථා කළා ජාතික සමඟිය ගැන. අපි කිව්වා ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු ලංකාව පුරාම ඉන්නවා කියලා. ඒක හොඳයි. හැබැයි ඒක විතරක් මදි. මීට ඉස්සෙල්ලා ආණ්ඩුවලත් අනෙක් දේශපාලන පක්ෂ, ඒ කියන්නේ දෙමළ ජනතාව නියෝජනය කරන, මුස්ලිම් ජනතාව නියෝජනය කරන අය හිටියා. හැබැයි, එහෙම හිටියත් ඒ මුස්ලිම් ජනතාවගේ ප්‍රශ්න, දෙමළ ජනතාවගේ ප්‍රශ්න, සුළු ජාතිකයන්ගේ ප්‍රශ්න සහ ආගමික ප්‍රශ්නවලට විසඳුම් නැහැ. ඒ නිසා ආණ්ඩු හැදුවාට, ඒ ආණ්ඩුවලට එකතු වූ පළියටම ඒ ජනතාවගේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. එහෙම නම් මොකක්ද අපේ වෙනස? අපි ජාතිවාදී නැහැ, අපි ආගම්වාදී නැහැ. ජාතික ජන බලවේගයේ ඉන්න 159දෙනාම එහෙමයි. අපේ හෘදය සාක්ෂිය ඒක දන්නවා. හැමෝටම සමාන අවස්ථා දිය යුතු බව අපි දන්නවා. හැමෝටම සමාන අයිතිවාසිකම් තිබෙන බව අපි දන්නවා. ඒ නිසා ඒවාට තිබෙන සියලු බාධක ඉවත් කරගෙන ජාතික සමඟිය ඇති කිරීමට උඩින් විතරක් කටයුතු කරන්නේ නැතිව - superficial විදිහට නැතිව - ගැඹුරුව, හදවතින්ම රට ගොඩ නැඟීමට කටයුතු කිරීම අපි 159දෙනාගේම බලාපොරොත්තුවක්.

මගේ විෂයය වන විද්‍යා හා තාක්ෂණ පැත්ත ගැනත් යමක් කිව යුතුයි. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයක් මුලින්ම අපේ රටේ ඇති කළේ 1994දී. මට මතක හැටියට එහි පළමුවෙනි ඇමතිවරයා හැටියට හිටියේ ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කළ බැටී වීරකෝන් මහත්මයා. එදා ඉඳන් විද්‍යා හා තාක්ෂණයට සම්බන්ධ අමාත්‍යාංශයක් තිබුණත්, සමහර කාලවල එහෙම තිබුණෙත් නැහැ. මම හිතන විධියට පසුගිය අවුරුදු 5 තුළ එවැනි අමාත්‍යාංශයක් ඇති කරලා තිබුණේ නැහැ. විද්‍යා හා තාක්ෂණයට අපි කොච්චරක් වියදම් කරනවාද? අපි අපේ දළ ජාතික නිෂ්පාදනයෙන් විද්‍යාව හා තාක්ෂණයට වියදම් කරන්නේ සියයට 0.12ක්. හැබැයි අනෙක් රටවල් වැඩි මුදල් ප්‍රමාණයක් විද්‍යාව හා තාක්ෂණයට යොදවනවා. උදාහරණයක් හැටියට, ඊශ්‍රායලය සියයට 6ක් දළ ජාතික නිෂ්පාදනයෙන් විද්‍යාව හා තාක්ෂණයට වෙන් කරනවා. දකුණු කොරියාව සියයට 5.2ක්, ජපානය සියයට 3.4ක්, චීනය සියයට 2.5ක්, ඉන්දියාව සියයට 6.5ක් විද්‍යාව හා තාක්ෂණයට යොමු කරනවා. නමුත් අපේ රටේ වෙන් කරන්නේ බොහොම සුළු ප්‍රමාණයක්. මොකද, ඒ විෂය, විද්‍යාව හා තාක්ෂණය අපේ රටේ ආර්ථිකයට වඩා වැදගත් කියන එක හරියට හඳුනාගෙන තිබුණේ නැහැ, මේ රටේ ආණ්ඩු.

ඒ වාගේම මේ වසරේ මෙම අමාත්‍යාංශය තුළ වියදම් කර තිබෙන ප්‍රමාණය පිළිබඳ දත්ත මම ලබා ගත්තා. ඒ වියදම් අතරින් ප්‍රාග්ධන වියදම් සිදු කර තිබෙන්නේ සියයට 38ක ප්‍රමාණයකින්. අමාත්‍යාංශය වියදම් කර තිබෙන්නේ බොහොම පොඩි

ප්‍රමාණයක්. හැබැයි, මේකට සාධාරණ හේතු තිබෙන්නත් පුළුවන්. අමාත්‍යාංශයට වෙලාවට මුදල් ලැබී නැති වෙන්නත් පුළුවන්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு கிரிஷாந்த அபேசேன)
(Hon.Chrishantha Abeysena)
හොඳයි, මම ඉක්මනින් අවසන් කරන්නම්.

එහෙම තමයි මෙම අමාත්‍යාංශයට සලකා තිබෙන්නේ. එහෙම තමයි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙන්නේ. විද්‍යාව හා තාක්ෂණය කියන්නේ එකක්. සමහර වෙලාවට සාක්ෂි තිබෙනවා. ඒ සාක්ෂි practise කරන්න යන්ත්‍රණයක් නැහැ. මේක සෞඛ්‍යයටත් අදාළයි. අපිට evidence තිබෙනවා, researches කර තිබෙනවා. නමුත් ඒවා practise වෙන්නේ නැහැ; ඒකට යන්ත්‍රණයක් නැහැ. ඒ සම්බන්ධයෙන් යන්ත්‍රණයක් සැකසිය යුතුව තිබෙනවා.

ඒ වාගේම අපිට ස්වාභාවික සම්පත් තිබෙනවා. එම ස්වාභාවික සම්පත්වලින් අගය එකතු කළ නිෂ්පාදන සිදු කරන්න අපට පුළුවන්. ස්වාභාවික සම්පත් ගොඩක් අපේ රටේ තිබෙනවා. ඒවායෙන් අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය කිරීම හරහා අපට ආදායමක් ලබා ගන්න පුළුවන්. පොස්පේට් පිළිබඳව සඳහන් කරනවා නම්, අපිට අවුරුද්දකට පොස්පේට් මෙට්‍රික්ටොන් 50,000ක් ආනයනයට රුපියල් බිලියන 8ක් වැය වෙනවා. අපිට පුළුවන් එප්පාවල තිබෙන අපේ පොස්පේට් නිධිය ප්‍රයෝජනයට ගනිමින් අගය එකතු කළ නිෂ්පාදන සිදු කරන්න. අපි කර්මාන්ත අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා ඒ සම්බන්ධයෙන් ඉස්සරහට කටයුතු කරනවා. ත්‍රිත්ව සුපර් පොස්පේට් හදලා ඒවා පොහොර හැටියට අපේ රටේ ජනතාවට දෙන්න පුළුවන්. ඒ විධියට තමයි අපේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය ඉස්සරහට ගෙන යන්නේ. අපිට අවශ්‍ය වෙනවා, අගය එකතු කළ භාණ්ඩ. අපේ රටේ ඒවා නිෂ්පාදනය කිරීමෙන් පසුව ඒවා පිටරටින් ගෙන්වීමට තවදුරටත් අපේ විදේශ විනිමය වැය වෙන්නේ නැහැ. අපට විදේශ විනිමය හොයන්නත් පුළුවන්. ඒ විධියට අපි අපේ අමාත්‍යාංශය තුළින් වැඩ කටයුතු කරගෙන යනවා.

සමහර අය මැද මාවත ගැන කථා කළා. මම දන්නේ නැහැ, ඒ මැද මාවත මොකක්ද කියලා. ඉස්සර නම් මැද මාවත කියලා කිව්වේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට. දැන් තවත් අය ඒක කියනවා. හැබැයි ඒගොල්ලන් වමට සිග්නල් දමලා, ගියේ දකුණට. අර එකට හිටපු කට්ටිය දැන් ISBs ගැන කථා කරනවා. ISBs වැඩියෙන් ගත්තේ යහපාලන ආණ්ඩුව පැවැති කාලයේ. එහෙම අරගෙන, මේක විසඳන හැටි ගැන දැන් අපට කියනවා. මැද මාවතක් නැහැ. එකම කට්ටිය. දැන් අපෙන් අහනවා, රනිල් වික්‍රමසිංහ සහ අපි ඩීල් දමනවාද කියලා. මොකක්ද, අපේ ඩීල් එක? ඡන්දයට ඉස්සෙල්ලා ඒගොල්ලන්ගේ කට්ටිය ඩීල් දමපු හැටි අපි දන්නවා. ඡන්දයෙන් පසුවත් ඒගොල්ලන් එකතු වෙන්න හදපු හැටි අපි දන්නවා. ඉතින් මේවා තමයි ජනතාව ප්‍රතික්ෂේප කර තිබෙන්නේ. ඒ නිසා ඒ වැරදි මත ප්‍රතික්ෂේප කරලා, "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්තිය අපි ඒ විධියටම ක්‍රියාත්මක කරනවා. ඒකට අවශ්‍ය ධෛර්යය හා ශක්තිය අපට තිබෙනවාය කියලාත් අපි විශ්වාස කරනවා. ඒ අනුව අපි වැඩකටයුතු සිදු කරන බව කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු පත්මනාදන් සත්‍යලිංගම් මහතා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.13]

**ගරු පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. Pathmanathan Sathiyalingam)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இந்தச் சபையில் மூன்று பிரதான விடயங்கள் பற்றிப் பேசலாமென நினைக்கின்றேன். முதலாவதாக, மாண்புமிகு சனாதிபதி அவர்களுடைய அக்கிராசன உரை தொடர்பாகவும் இரண்டாவதாக, கணக்கு வாக்குப் பணம் தொடர்பாகவும் மூன்றாவதாக, வெள்ள அனர்த்தம் தொடர்பாகவும் பேசலாமென நினைக்கின்றேன்.

இலங்கையின் 10ஆவது பாராளுமன்றத்தில் ஒரு மக்கள் பிரதிநிதியாகப் பேசுவதற்கு எனக்குச் சந்தர்ப்பம் தந்த, இலங்கைத் தமிழரசுக் கட்சிக்கு வாக்களித்த வடக்கு, கிழக்கு மாகாணத்தில் வாழுகின்ற அனைவருக்கும் முதற்கண் எனது நன்றியைத் தெரிவித்துக் கொள்வதோடு, எங்களுடைய கட்சிக்கும் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

அடுத்து, இந்தச் சபையில் ஒரு தனிப்பெரும் கட்சியாக ஆட்சி அமைத்திருக்கின்ற தேசிய மக்கள் சக்திக்கு என்னுடைய பாராட்டுகளைத் தெரிவித்துக்கொள்கின்றேன். அத்துடன், இந்தச் சபையில் இருக்கின்ற தேசிய மக்கள் சக்தியைச் சேர்ந்த பெண் பாராளுமன்ற உறுப்பினர்கள் உட்பட 22 பெண் பாராளுமன்ற உறுப்பினர்களுக்கும் எனது பாராட்டுகளைத் தெரிவித்துக்கொள்கின்றேன். மேலும், இலங்கையில் இருக்கின்ற விசேட தேவைக்கு உட்பட்டவர்களைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற, விசேட தேவைக்குட்பட்ட சக பாராளுமன்ற உறுப்பினருக்கும் எனது வாழ்த்துகளைத் தெரிவித்துக்கொள்கின்றேன்.

நாங்கள் இங்கு எதிர்க்கட்சியில் இருந்தாலும், இந்த அரசாங்கம் மேற்கொள்கின்ற முன்னேற்றகரமான, முற்போக்கான அனைத்து விடயங்களுக்கும் எங்களுடைய கட்சி உறுதுணையாக இருக்கும் என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

தற்பொழுது எனக்கு வயது 56. எந்த அரசாங்கம் வந்தாலும் அதற்கு எதிரான ஒரு மனநிலையோடுதான் நாங்கள் சிறுவயதிலிருந்து வளர்ந்து வந்திருக்கிறோம். ஏனென்றால், எண்ணிக்கையில் சிறுபான்மையாக இந்த நாட்டிலிருக்கின்ற மக்கள், ஏனையவர்களுக்குச் சமமாக நடத்தப்படவில்லை என்ற எண்ணம் எங்களுடைய மனதில் சிறுவயதிலிருந்து இருக்கின்றது.

எனது தந்தையார் ஒரு கம்யூனிசவாதி! அவர் இந்த நாட்டில் Communist Partyஇல் நீண்டகாலம் இருந்தார். அவருடைய வளர்ப்பில் வளர்ந்தவன் நான். இனம், சாதி, குலம், சமயம் என்ற வேறுபாடு என்னிடம் இல்லை. நான் எல்லோரையும் மனிதனாகத்தான் பார்க்கின்றேன். அப்படி இருந்தும், ஏன் எங்களிடத்தில் வெறுப்பு மனநிலை வந்தது? என்பதை இந்தச் சபை உன்னிப்பாக அவதானிக்க வேண்டும்.

[ගරු පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

இந்த நாட்டுக்கென ஒரு தேசிய கீதம் இருக்கின்றது; ஒரு தேசியச் கொடி இருக்கின்றது. அந்தத் தேசிய கீதத்துக்கும் தேசியக் கொடிக்கும் மற்றையவர்கள் மதிப்பளிக்கும் அளவுக்கு மதிப்பளிக்க முடியாதவொரு மனநிலை எங்களிடம் இருந்தது. நான் எதைச் சொல்கின்றேன் என்பதை இந்தச் சபை புரிந்துகொள்ள வேண்டும்.

இந்தச் சபையில் 159 பாராளுமன்ற உறுப்பினர்களைக் கொண்டுள்ள, மூன்றில் இரண்டு பெரும்பான்மைப் பலத்தைக் கொண்டுள்ள இந்த அரசாங்கம், இவ்வாறான மனநிலை எழாத வகையில் இந்த நாட்டில் வாழ்கின்ற அனைத்துப் பிரஜைகளையும் சமமாக நடாத்தக்கூடிய ஒரு முறைமையைக் கொண்டுவர வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் அவர்கள் தனது உரையில் ஒரு விடயத்தைக் குறிப்பிட்டார். அதாவது, இந்த நாட்டில் சாந்தியும் சமாதானமும் நிலவ வேண்டுமாக இருந்தால், நாங்கள் எங்களுடைய மனநிலையை மாற்றிக் கொள்ள வேண்டும் எனக் குறிப்பிட்டார். நடத்தை மாற்றத்தை அல்லது மனநிலை மாற்றத்தை ஏற்படுத்துவது ஒரு பெரிய process என்பது உங்கள் எல்லோருக்கும் தெரியும்! அதனை ஒரு நாளில் ஏற்படுத்திவிட முடியாது. ஆகவே, நாங்கள் பரஸ்பரம் ஒருவருக்கொருவர் நம்பிக்கையை ஏற்படுத்தக்கூடிய விடயங்களைச் செய்ய வேண்டும். அந்த நம்பிக்கையை யார் முதலில் ஏற்படுத்துவது? அல்லது அந்த நம்பிக்கையை எப்படி ஏற்படுத்தலாம்? என்பது பற்றி நாங்கள் சிந்திக்க வேண்டும்.

இன்று மூன்றில் இரண்டு பெரும்பான்மை பலத்துடன் இருக்கின்ற, எதையும் செய்யக்கூடிய நிலையில் இருக்கின்ற இந்த அரசாங்கம், தனது பக்கத்திலிருந்து அந்த நம்பிக்கையை ஏற்படுத்துகின்ற விடயங்களைத் தொடங்க வேண்டும் என்று நான் எதிர்பார்க்கின்றேன். அவ்வாறான நம்பிக்கையை ஏற்படுத்துகின்ற ஒரு விடயத்தை இந்த அரசாங்கம் செய்திருக்கிறது. யுத்தத்தில் இறந்த தமது உற்றார், உறவினர்கள், நண்பர்களை நினைவுகூருகின்ற நினைவேந்தல் நிகழ்வுகளைக் கடந்த மாதம் எமது மக்கள் நடத்தும்போது, அவற்றுக்குத் தடைவிதிக்காமல் இருந்ததற்காக நான் இந்த அரசாங்கத்துக்கு என்னுடைய மக்கள் சார்பாக நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

அது ஒரு நல்லெண்ண முயற்சி! இன்னொரு விடயத்தையும் நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். யுத்தத்தில் இறந்த எங்களுடைய உறவுகள் புதைக்கப்பட்டுள்ள சில இடங்கள் இன்றும் இராணுவ முகாம்களாக இருக்கின்றன. உதாரணத்துக்கு, நான் வாழுகின்ற வவுனியா மாவட்டத்தில் ஈச்சங்குளம் என்ற பிரதேசத்தில் ஒரு துயிலும் இல்லம் இருக்கிறது. அந்தத் துயிலும் இல்லத்தில் நூற்றுக் கணக்கானவர்கள் புதைக்கப்பட்டு இருக்கிறார்கள். அவர்கள் யாராக இருந்தாலும், அவர்களது பெற்றோருக்குப் பிள்ளைகள்! அவர்கள் புதைக்கப்பட்டுள்ள இடம் இன்று ஓர் இராணுவ முகாமாக இருக்கின்றது. எமது மக்கள் வருடத்துக்கு ஒரு தடவை அந்த இடத்துக்குச் சென்று தங்களுடைய பிள்ளைகளை, சகோதரர்களை, உறவுகளை நினைவுகூரக் கூடிய வகையில் ஓர் ஏற்பாடு செய்யப்படல் வேண்டும். அந்த இடம் ஒரு மயானமாகப் பிரகடனப்படுத்தப்பட வேண்டும். அந்த இடத்தைத் தொடர்ந்து இராணுவ முகாமாக வைத்திருந்தால், நாங்கள் நினைக்கின்ற நல்லெண்ணத்தைக் கட்டியெழுப்புவதற்கு அது ஒரு தடையாக இருக்குமென நான் கருதுகின்றேன். அதுமாத்திரமன்றி, செய்த குற்றத்துக்காக அல்லது செய்யாத குற்றத்துக்காக நீண்ட காலமாக - 25 - 30 வருடங்கள் - சிறையில் இருக்கின்ற அரசியல் கைதிகளை விடுதலை செய்ய வேண்டும். இவ்வாறான நல்லெண்ண நடவடிக்கைகளை அரசு என்ற வகையில் நீங்கள் செய்ய வேண்டும்.

எங்களுடைய நாட்டில் இரு முக்கிய பிரச்சினைகள் இருக்கின்றன. இந்த NPP அரசாங்கம் எப்படி ஆட்சிக்கு வந்தது? கடந்த சனாதிபதித் தேர்தலில் தோழர் அநுர குமார திஸாநாயக்க அவர்கள் தெரிவு செய்யப்பட்டதன் பின்னர், இந்த நாட்டில் பல மாற்றங்கள் நடைபெற்றன. உதாரணத்துக்கு, மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களுக்கு கடந்த சனாதிபதித் தேர்தலின்போது 27,000 வாக்குகள் கிடைத்த ஓர் இடத்தில், 2 மாதங்களுக்குள் நடைபெற்ற பாராளுமன்றத் தேர்தலில் அவருடைய கட்சிக்கு 80,000 வாக்குகள் கிடைத்தன. ஏன் அந்தளவு தொகை வாக்குகள் அவருடைய கட்சிக்குக் கிடைத்தன? என நாங்கள் யோசிக்க வேண்டும். பொதுவுடைமைத் தத்துவத்தை அடிப்படையாகக் கொண்ட, இளமையான சனாதிபதி அவர்கள், இந்த நாட்டில் ஊழலற்ற, சமத்துவமான ஆட்சியை ஏற்படுத்துவார் என்ற நம்பிக்கையில்தான் மக்கள் அந்தளவு தொகை வாக்குகளை அவருடைய கட்சிக்கு வழங்கி யிருக்கிறார்கள்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. Pathmanathan Sathiyalingam)
ஆகவே, நீங்கள் அந்த நம்பிக்கையைக் கட்டியெழுப்புகின்ற செயற்பாட்டை மேற்கொள்ளவில்லை என்றால், நிச்சயமாக நீங்கள் நினைக்கின்ற சமாதானமும், சாந்தியும் இந்த நாட்டில் ஏற்படாது எனக்கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු (ආචාර්ය) නාමල් සුදර්ශන නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (சிரேஷ்ட பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (SNR. PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 1.23]

**ගරු (ආචාර්ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. දසවැනි පාර්ලිමේන්තුවේ මගේ මංගල කථාව ආරම්භ කරන මේ මොහොතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආදරණීය ජනතාවට මුලින්ම විශේෂ ස්තුතියක් පුද කරන්න මා කැමැතියි. ඒ, ඉතිහාසයේ පළමුවැනි වතාවට සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් මන්ත්‍රීවරුන් දොළොසේදෙනෙකු මේ පාර්ලිමේන්තුවට පත් කර එවන්න ජාතික ජන බලවේගය එක්ක අත්වැල් බැඳ ගැනීම සම්බන්ධයෙන්. ඒ එක්කම ශ්‍රී ලංකාවේ මුළුමහත් ජනතාවටත් මේ මොහොතේ අපේ ගෞරවනීය ස්තුතිය පළ කරනවා. උතුර, දකුණ, නැඟෙනහිර, බස්නාහිර, මධ්‍යම ඇතුළු සියලු පළාත් එකම පාටකින් පින්තාරු කරන්නට, ජාතික ජන බලවේගයට මේ අතිවිශිෂ්ට ජයග්‍රහණය ලබා දෙන්නට ජාති, කුල-මල, ආගම් භේද පසෙක තබා එකම අරමුණකින් ජාතික ජන බලවේගය කියන පුළුල් කුඩය යටට සියලු ජනතාව එක් රොක් වුණා. ඒ සියලු ජනතාවට අපේ ප්‍රණාමය පුද කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ජයග්‍රහණය විශාලයි, විශිෂ්ටයි. විශාල කැප කිරීමක් කරමින් කොන්දේසි විරහිතව මැදිහත්ව, බලාපොරොත්තුත්, විශ්වාසයත් පෙරදැරි කරගෙන පෞද්ගලික අරමුණු, පටු පරමාර්ථ පසෙක තබා ජාතික ජන බලවේගය කියන ජාතික ව්‍යාපාරයට මේ රටේ බලය අත්පත් කර දෙමින්, ලස්සන ජීවිතයක් සහිත පොහොසත් රටක් නිර්මාණය කිරීමට අපිත් එක්ක එකතු වුණු සියලු ජනතාවට මේ අවස්ථාවේදී අපේ ප්‍රණාමය පුද කරන්න මා කැමැතියි.

ඒ වාගේම ජයග්‍රහණයේ විශිෂ්ටත්වයට, විශාලත්වයට සමානවම ජනතාවගේ බලාපොරොත්තුත් විශාල බව අප සියලුදෙනා අවබෝධ කරගෙන සිටිනවා. ඒ නිසා අප කිසි කෙනෙක් මේ ජයග්‍රහණයෙන් උද්දාමයට, එහෙම නැත්නම් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කිව්වා වාගේ ඔළුව උදුම්මා ගෙන නැහැ. මේ බර අපේ කරට දැනිලා තිබෙනවා. අපි දන්නවා, මේ ජයග්‍රහණයේ විශාලත්වයට බලාපොරොත්තුවේ විශාලත්වයත් සමාන බව.

මේ මොහොතේ මා මතක් කරන්න කැමැතියි, ජාතික ජන බලවේගය විධියට අපි මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් සුවිශේෂ මැදිහත්වීමක් කිරීමේ බලාපොරොත්තුවෙන් තමයි, මේ රජයේ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙන්නේ කියන එක. එබැවින් "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පළමු පරිච්ඡේදය වෙන් කරලා තිබෙන්නේ මේ රටේ අධ්‍යාපනය වෙනුවෙනුයි. තවත් පැහැදිලි කළොත්, ශිෂ්ට සම්පන්න පුරවැසියෙක්, දියුණු මානව සම්පතක් නිර්මාණය කිරීම වෙනුවෙන් මේ රටේ සියලු දරුවන්ට අධ්‍යාපනයේ සම ප්‍රවේශයක් ලබා ගත හැකි වාතාවරණයක් සකස් කිරීම වෙනුවෙනුයි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පළමුවැනි පරිච්ඡේදය වෙන් කරලා තිබෙන්නේ.

අපේ පාසල් අධ්‍යාපනයේ විශාල විෂමතාවක් තිබෙනවා. 2022දී අපේ රටේ පාසල් පද්ධතියේ 10,126ක් වන පාසල් අතුරින් සිසුන් 50ට අඩු පාසල් 1,472ක් තිබෙනවා. එය සියයට 14.5ක් වෙනවා. සිසුන් 200ට අඩු පාසල් 5,024ක් තිබෙනවා. එය සියයට 51ක් වාගේ වෙනවා. ජාතික මට්ටමේ පාසල් තිබෙන්නේ 296ක් පමණයි. අධ්‍යාපනය කියන්නේ වරප්‍රසාදයක් නොවෙයි, අයිතියක්. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් නිදහස් අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කළා. එහිදී අවුරුදු 76ක් තිස්සේ මේ රට පාලනය කරපු දේශපාලන ව්‍යාපාර විසින් කරපු සාධනීය දේවල් අතර නිදහස් අධ්‍යාපනය සම්බන්ධයෙන් කිහිප වතාවකදී පුන පුනා මතක් කළා. හැබැයි ඒ නිදහස් අධ්‍යාපනය වරප්‍රසාදයක් නොවෙයි අයිතියක් බවත්, එය දිනා ගැනීමට අරගළ කළ බවත් එතුමන්ලාට අමතක වෙලා තිබෙනවා.

නිදහස් අධ්‍යාපනය ගැන කතිකාව මේ සමාජයට ඒත්තු ගැන්වෙන්නේ 1917දී ඇති වූ රුසියානු විප්ලවයෙන් පසුවයි. නිදහස් අධ්‍යාපනය කියන සංකල්පය බිහි වෙන්නේ ඒ මැදිහත්වීම තුළයි. 1930 දශකයේ තමයි නිදහස් අධ්‍යාපනය සම්බන්ධයෙන් සාකච්ඡාවක් ලංකාවේ ගොඩනැඟුණේ. 1931දී සහ 1936දී රාජ්‍ය මන්ත්‍රණ සභාවල අධ්‍යාපන කාරක සභාවේ සභාපතිවරයා විධියට කටයුතු කළේ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතායි. නිදහස් අධ්‍යාපනය මේ රටේ ස්ථාපිත කරන්න ඒ අවස්ථාවලදී එතුමා යම් යම් උත්සාහයන් දැරුවා. හැබැයි, ඒ මොහොතේ නායකත්වය දුන් දේශපාලන ව්‍යාපාර නිදහස් අධ්‍යාපනය ගැන කිව්වේ මොකක්ද? නිදහස් අධ්‍යාපන පනත සම්මත කළොත්, අපේ වත්තක පොල් ගෙඩියක් කඩා ගන්න කොල්ලෙක් හොයා ගන්න බැරි වෙයි කිව්වා. එහෙම තමයි එදා කථා කළේ. හැබැයි, එතුමා ඒ සටන අතහැරියේ නැහැ. නිදහස් අධ්‍යාපනය මේ රටේ ස්ථාපිත කරන්න එතුමා විශාල අරගළයක් කළා. 1931දී සහ 1936දී රාජ්‍ය මන්ත්‍රණ සභාව ඇතුළේ සාකච්ඡා කරලා නිදහස් අධ්‍යාපන පනත සම්මත කර ගන්න අවස්ථාව ලැබුණේ 1947දීයි. ඒ, විශාල පරිශ්‍රමයකින් පස්සේ. නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතා රාජ්‍ය මන්ත්‍රණ සභාව තුළ අරගළයක් කරන අතරතුර ඒ වෙනුවෙන් එළියේත් සටනක් තිබුණා. ශිෂ්‍ය ව්‍යාපාරයත් මේකට මැදිහත් වුණා. යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම හාමුදුරුවෝ, වල්පොල රාහුල හාමුදුරුවෝ වැනි යතිවරුන්, කලල්ඇල්ලේ ආනන්ද සාගර වැනි විද්වතුන් මේ වෙනුවෙන් විශාල මැදිහත්වීමක් කළා. එදා වාමාංශික ව්‍යාපාරයේත්, ශිෂ්‍ය ව්‍යාපාරයේත් මැදිහත්වීමෙන් මේ සමාජය තුළ විශාල බලපෑමක් ඇති කරලා තමයි නිදහස් අධ්‍යාපනය මේ රටේ ස්ථාපිත කර ගත්තේ. එහෙම නැතිව වරදානයක්, වරප්‍රසාදයක් විධියට ඒ පැවති ආණ්ඩු මඟින් අපට ලබා දුන් දෙයක් නොවෙයි, නිදහස් අධ්‍යාපනය. එය අරගළ මැද දිනා ගත්ත දෙයක්. ඒ නිසා මේ රටේ ස්ථාපිත කරපු නිදහස් අධ්‍යාපනය එදා ඉඳලා හිස, පපුව සහ අත වාගේම දැනුම, ආකල්ප සහ කුසලතා ආදී සියල්ලත් එක්ක ඉස්සරහට ඇවිල්ලා අද වෙනකොට වළපල්ලට යමින් තිබෙනවා. එය ආරක්ෂා කරන්න, ඉස්සරහට ගෙන යන්න, නිදහස් අධ්‍යාපනයේ තිබෙන ගුණාංග ටික තවදුරටත් ආරක්ෂා කරමින් ස්ථාපිත කරන්න ජාතික ජන බලවේගය විධියට අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ පළමු පරිච්ඡේදය අපි වෙන් කරලා තිබෙනවා.

නිදහස් අධ්‍යාපනය ඇතුළේ විශේෂයෙන්ම අපට අතහැරුණු, අපි කථා නොකරන කොටසක් තිබෙනවා. මම නියෝජනය කරන කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට අයත් එක කොටසක් වන පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය සම්බන්ධයෙන් අප කථා කළ යුතුව තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න ගොඩක්

[ගරු (ආචාර්ය) නාමල් සුදර්ශන මහතා]

තිබෙනවා. මේ අමාත්‍යාංශය කාලයක් තිස්සේ අතහැරුණු අමාත්‍යාංශයක්. කාලයක් තිස්සේම මේ අමාත්‍යාංශයට කැබිනට් ඇමතිවරයෙක් ඉඳලා නැහැ. හැබැයි, රටේ දරුවන් සහ කාන්තාවන් කියන්නේ විශේෂ කොටසක්. ඒ නිසා කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ලේකම් කාර්යාලය කාලයක් තිස්සේ කටයුතු කරගෙන ආවා. නමුත්, එහිත් අඩුපාඩු ගොඩක් තිබෙනවා. තවදුරටත් අවධානයට ලක් විය යුතු විශේෂ කාරණා විශාල සංඛ්‍යාවක් එහි තිබෙනවා. අවුරුදු තුනේ සිට පහ දක්වා වූ දරුවාට විධිමත් මුල් ළමාවිය අධ්‍යාපනයක් ලබා දීම රජයේ මූලිකම වගකීමක් බවට පත් කරන්න අපේ යෝජනා ඇතුළේ අපි සාකච්ඡා කරලා තිබෙනවා.

ඒත් එක්කම බහු සංස්කෘතික විවිධත්වය හඳුනා ගැනීමට, බහු සංස්කෘතික විවිධත්වයට ගරු කිරීමට, එයට හුරු වෙච්ච ළමා පරම්පරාවක් අපි බිහි කර ගත යුතුයි. ඒත් එක්කම බහු භාෂා හැකියාව සම්බන්ධයෙනුත් අපි වැඩ පිළිවෙළක් යෝජනා කරලා තිබෙනවා. ඒත් එක්කම අධ්‍යාපනයට සමගාමීව සෞඛ්‍ය සහ පෝෂණය ඇතුළු මුල් ළමාවිය සංවර්ධනයට විශේෂයෙන් සම්බන්ධ වන කාරණා කිහිපයක් තිබෙනවා. ඒත් ඒක්කම මේ මුල් ළමාවිය සංවර්ධන ආයතන එක්ක සම්බන්ධ වෙලා ඉන්න පාලිකාවන්, ගුරුවරියන් සම්බන්ධයෙනුත් යම් ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ අවශ්‍ය වෘත්තීය පුහුණුව සම්බන්ධයෙන් ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මේවා සම්බන්ධයෙන් මැදිහත් වීමට අවශ්‍ය කටයුතුත් අපි සංවිධානය කරනවා. ඒත් එක්කම මේ සඳහා මැදිහත් වෙන වෘත්තිකයන් පුහුණු කිරීමට ජාතික මට්ටමෙන් අධ්‍යාපන ආයතනයක් සහ ශාඛා පද්ධතියක් මේ රටට අවශ්‍ය කරනවා. ඒ වෙනුවෙනුත් යම් මැදිහත්වීමක් කරන්න අවශ්‍යයි. පූර්ව ළමාවියෙන් පසුව ජනගහනයෙන් සියයට 30ක් පමණ වන වයස අවුරුදු 18 දක්වා වූ දරුවන් වෙනුවෙන් සුවිශේෂී මැදිහත්වීමක් ද අවශ්‍ය වෙනවා. දුර්වල ආරක්ෂණ සේවා, අධ්‍යාපන දුෂ්කරතා, මන්දපෝෂණය වැනි කාරණා විසඳීමට අපේ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළින් යම් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

දරුවන් සහ තරුණ පරම්පරාව සම්බන්ධයෙන් වන සමාලෝචනය කළ යුතු, සංශෝධනය කළ යුතු, එහෙම නැත්නම් අවලංගු කළ යුතු සමහර නීති පද්ධති තිබෙනවා. ඉදිරියේදී අපට ඒ සම්බන්ධයෙන් සමාලෝචනයක් කර ගැනීමට අවශ්‍යයි. උදාහරණයක් විධියට ගත්තොත්, 1939 අංක 48 දරන ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥාපනත 1939දී තමයි මේ රටට ඉදිරිපත් වෙන්නේ. ඒත් එක්කම 1941 අංක 24 දරන ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනතත් තිබෙනවා. එම ආඥාපනත් වසර ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වෙනවා. නමුත්, සමාලෝචනයට භාජන කරලා, ඒවායේ තිබෙන අඩු පාඩු ගැන සාකච්ඡා වෙලා නැහැ. ඒ ගැන තීන්දු තීරණ ගන්න, අපට ඒවා සම්බන්ධයෙන් සාකච්ඡා කරන්නට අවශ්‍ය වෙනවා. ඒත් එක්කම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වැනි ආයතන ක්‍රියාත්මක වුණත්, ඒවා අතර සම්බන්ධීකරණයේ ගැටලු තිබෙනවා. ඒවා නිවැරදි කර ගැනීම සඳහා අපට සාකච්ඡා කරන්න අවශ්‍ය වෙනවා.

ඒ එක්කම, අවදානමට ලක් වුණු දරුවන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සෘජුව අධීක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන්න අපි යෝජනා කරලා තිබෙනවා. මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය, රැකවරණය, පෝෂණය සහ යහ පැවැත්ම වෙනුවෙන් මෙවැනි සුවිශේෂී වැඩ පිළිවෙළක් සංවිධානය කිරීමට අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම විශේෂයෙන් මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. අපේ ජනගහනයෙන් සියයට 52ක් පමණ වන කාන්තාවන් සම්බන්ධයෙනුත් මම කථා කළ යුතුයි. මේ සමාජය තුළ විශේෂ කාර්යභාරයක් ඉටු කරන, විශේෂ මැදිහත්වීමක් කරන, නමුත් පසුගිය කාලය පුරා සමාජ, ආර්ථික, සංස්කෘතික සහ දේශපාලන ක්‍රියාවලිය තුළ ආන්තිකකරණයට ලක් වුණු කාන්තාවන් වෙනුවෙන් අපේ අමාත්‍යාංශය හරහා ඉදිරියේදී විශේෂ මැදිහත්වීමක් කරන්න කටයුතු සංවිධානය කරමින් ඉන්නවා.

අද නිදහස් අධ්‍යාපනය සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් මතුවෙලා තිබෙන නිසා මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න කැමතියි. ශ්‍රේෂ්ඨ නායකයෙක් වන, ඒ වාගේම ඔක්තෝබර් විප්ලවයේ නායකයා වන ලෙනින් සහෝදරයා ප්‍රකාශ කරලා තිබෙනවා, "ඉගෙන ගන්න පළමුවත්, ඉගෙන ගන්න දෙවනුවත්, ඉගෙන ගන්න තෙවනුවත්" කියලා. පළමුව ලෝකයේ මිනිසා මෙතෙක් සොයා ගත් දැනුම ඉගෙන ගන්න. ජාතික ජන බලවේගය හරහා විශාල පිරිසක් මන්ත්‍රීවරු ලෙස අද පාර්ලිමේන්තුවට පත්වෙලා ඉන්නවා. ඒ, නිදහස් අධ්‍යාපනයේ ඵල ප්‍රයෝජන උපරිම වශයෙන් අරගෙන, නිදහස් අධ්‍යාපනයේ ප්‍රමුඛයන් බවට පත් වුණු පිරිසක්. අපි ඉගෙන ගෙන තිබෙනවා, මේ ලෝකයේ මිනිසා මෙතෙක් සොයා ගත් දැනුම.

දෙවනුව, ඔබේ සමාජයේ පීඩිත මිනිසුන්ගේ වේදනාව ඉගෙන ගන්න. අපි සියලුදෙනාම ඒ වේදනාවත් එක්ක ජීවත් වුණු මිනිස්සු, ඒ වේදනාව ඉගෙන ගත් මිනිස්සු, ඒ වේදනාවත් එක්ක කාලය ගත කරපු මිනිස්සු. බොහෝදෙනා නිදහස් අධ්‍යාපනය ඇතුළේ ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉඳලා ඉස්සරහට ඇවිල්ලා, ඒ වේදනාවත් එක්ක ජීවත් වෙලා, ඒ වේදනාව හඳුනාගෙන, කාලයක් තිස්සේ මේ දේශපාලන ව්‍යාපාරයත් එක්ක තමන්ගේ භාවිතාව ඇතුළේ කටයුතු කරපු පිරිසක්.

තෙවනුව, මේ ලෝකය වෙනස් කිරීමට ඉගෙන ගන්න. කිසිම පෞද්ගලික ලාභ ප්‍රයෝජනයක් හෝ කිසිම අපේක්ෂාවකින් තොරව, පෞද්ගලිකත්වය පැත්තකින් තියලා, පොදු අරමුණක් කරා මේ රට මෙහෙයවන්නට, මේ ලෝකය වෙනස් කිරීමේ, මේ රට වෙනස් කිරීමේ කාර්යභාරයට උර දෙන්න, ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න, මේ රටේ අනාගතය වෙනුවෙන් වැඩ කරන්න තමයි අපි සියලුදෙනාම මෙතැනට එකතු වෙලා තිබෙන්නේ. ඒ වෙනුවෙන් අපි සියලුදෙනාම අත් වැල් බැඳගෙන ඉදිරියට යනවාය කියන කාරණය ඉදිරිපත් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චානක සම්පත් මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.37]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මට ඡන්දය දුන් සියලුදෙනාට කෘතවේදීත්වය පළ කිරීම පාර්ලිමේන්තුවේ මගේ පළමුවැනි කථාවේදීම සිදු කළ යුතු පළමුවැනි යුතුකම හා වගකීම විධියට මම සලකනවා.

විශේෂයෙන්ම මෙවැනි අභියෝගාත්මක වෙලාවක, අපේ දේශපාලන කඳවුර යම් මට්ටමකින් පහළට වැටුණු වෙලාවක, ඒ වාගේම ලංකාවෙන්ම අපේ පක්ෂයෙන් මන්ත්‍රීවරු තිදෙනෙක් පත් වුණු වෙලාවක, ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මේ උත්තරීතර පාර්ලිමේන්තුවට මාව තෝරා පත්කර එවන්න ගාල්ල දිස්ත්‍රික්කයේ අපේ වීරෝදාර ජනතාව කටයුතු කළා. ඒ පිළිබඳව අක්මීමන ප්‍රමුඛ ගාල්ල දිස්ත්‍රික්කයේ සමස්ත ජනතාවට මගේ කෘතවේදීත්වය පළ කරන්න පළමුවෙන්ම මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

මගේ දේශපාලන ජීවිතය ගොඩනැඟෙන්න මූලික අඩිතාලම වැටුණේ අපේ ආදරණීය දේශපාලන නායකයා වන හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා ගත්ත තීරණයක් නිසායි. මම එදා පළාත් පාලන මැතිවරණයෙන් වැඩිම මනාප ගත්ත වෙලාවේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විධියට මාව තෝරා පත් කර ගැනීම නිසා තමයි මගේ දේශපාලනය ගොඩනැඟෙන්න අවස්ථාව උදා වුණේ. ඒ නිසා එතුමාට මගේ ගෞරවය පළ කරන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

විශේෂයෙන් මට මේ අවස්ථාවේදී තවත් යුතුකමක් ඉෂ්ට කරන්න තිබෙනවා. මම දේශපාලනය ආරම්භ කළ වෙලාවේ අමාත්‍යවරුන් විධියට කටයුතු කළ අපේ ගරු චන්ද්‍රිම වීරක්කොඩි මැතිතුමා සහ ගරු රමේෂ් පතිරණ මැතිතුමා යන දේශපාලන නායකයන් දෙපළට මගේ ස්තුතිය පළ කරන්නටත් මම මෙය මොහොතක් කර ගන්නවා. මොකද, මම එතුමන්ලා දෙදෙනා යටතේ දේශපාලනය ආරම්භ කළ නිසා. දේශපාලනය කිරීමට ඔවුන්ගෙන් ලැබුණු පිටුවහල මට ශක්තියක් වුණා. ඒ කාරණා තුන සිහිපත් කරමින් මම, මගේ කථාව ආරම්භ කරනවා.

අපි නවක මන්ත්‍රීවරු විධියට මේ පාර්ලිමේන්තුවට පැමිණි පළමුවැනි දවසේ සිට අද දක්වා මේ පාර්ලිමේන්තුව තුළ කථා කරපු දේවල් අහගෙන හිටියා. මේ පාර්ලිමේන්තුව තුළ වංචාව, දූෂණය, 76 වසරක සාපය කියන කාරණා තමයි පළමුවැනි දවසේ සිට මේ දක්වා වැඩියෙන්ම කථා වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරලා ඒ පිළිබඳ විවාද කරන මේ වෙලාවේ 76 වසරක සාපය, වංචාව, දූෂණය පිළිබඳව මේ පාර්ලිමේන්තුව තුළ කථා කරන මන්ත්‍රීවරුන්ට අපි සිහිපත් කරන්නට ඕනෑ, 76 වසරේ සාපය මේ රට තුළ ගොඩනැඟුණේ කොහොමද කියන කාරණය. අපි දන්නවා, මේ 76 වසර තුළ මේ රට සුමටව ගමන් කළේ නැහැ කියලා. සුද්දාගෙන් මේ රට නිදහස් කර ගත්තාට පස්සේ 71 කැරැල්ල ඇති වුණා. ඒ 71 කැරැල්ල නිසා මේ රට ආපස්සට ගියා. 83 කළු ජූලිය තිබුණා. ඒ කළු ජූලිය නිසා රටේ දෙමළ ව්‍යාපාරිකයන් ව්‍යාපාර අත්හැරියා. රට ආපස්සට ගියා. ඒ වාගේම 88-89 තරුණ කැරැල්ල තිබුණා. ඒ තරුණ කැරැල්ල නිසා මේ රටට අහිමි වෙච්ච දේපළ, ජීවිත පිළිබඳව අදටත් ගණනය කරලා නැහැ. ඒ නිසාත් මේ රට ආපස්සට ගියා.

ඒ විතරක් නොවෙයි. තිස් වසරක සාපලත් යුද්ධය අද අමතක වුණාට ඒ තිස් වසරක සාපලත් යුද්ධය මේ රට දැවැන්ත විධියට ආපස්සට අරගෙන ගියා කියලා මම විශ්වාස කරනවා. ඒ විතරක් නොවෙයි. සුනාමිය නිසාත් මේ රට ආපස්සට ගියා; සහරාන් එල්ල කළ පාස්කු ප්‍රහාරය නිසාත් මේ රට ආපස්සට ගියා; කොරෝනා වසංගතය නිසාත් මේ රට ආපස්සට ගියා. ඒ විතරක් නොවෙයි. වෘත්තීය සමිති ක්‍රියා මාර්ග, වැඩ වර්ජන නිසාත් මේ රට ආපස්සට ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මෙන්න මේ කාරණාවලට තමයි 76 වසරක සාපය කියා කියන්න ඕනෑ. අතුරු සම්මත ගිණුම පිළිබඳ මේ ගරු සභාව තුළ කතිකාවක් ගොඩනැඟුණු අවස්ථාවේදී මට ලැබුණු කෙටි වෙලාව තුළ මම මේ කාරණයත් සිහිපත් කරන්න කැමතියි. 76 වසරක සාපයෙන් ඔබ්බට මේ රට ගොඩනගන්න හදන වෙලාවක, අලුත් ජනතා වරම පිළිබඳ දැඩි විශ්වාසයක් මේ රට තුළ ගොඩනැඟී තිබෙන වෙලාවක අපි ඔවුන්ට සුබ පතනවා, ඒ කරුණු කාරණා ඉෂ්ට කරන්න හැකියාව ලැබේවා කියා. පසුගිය කාලයේ සෑම ක්ෂේත්‍රයකම කටයුතුවලට පිළිතුරු සපයමින් ඔවුන් තමයි මේ රට තුළ කටයුතු කළේ. පසුගිය ආණ්ඩු සිදු කරපු හැම ක්‍රියාවලියකම වැරැදි, අඩුපාඩුවලට උත්තර සැපයුවේ ඔවුන්. ඒ නිසා අද ඔවුන්ට බලය ලැබී තිබෙනවා. එදා වැඩ වර්ජන කළ නායකයින් අද මේ රටේ ඇමතිකම් දරනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, ඒ නායකයන්ට අද උත්තර ඇති කියලා. එදා ධීවර ගැටලුවලට, අධ්‍යාපන ගැටලුවලට, සෞඛ්‍ය ගැටලුවලට, කෘෂි කර්මාන්තයේ ගැටලුවලට අදාළ වැඩ වර්ජනවලට ඉදිරිපත් වෙච්ච නායකයන් අද මේ රටේ වරමක්, බලයක් අරගෙන වගකීම් දරමින් ඉන්නවා. ඒ නිසා මම විශ්වාස කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔවුන් එදා කියපු කථා මේ මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කරන්න අවස්ථාවක් ලැබිලා තිබෙනවා කියලා. ඔවුන් ඒ අවස්ථාව නිවැරදිව පාවිච්චි කරයි කියාත් මම විශ්වාස කරනවා.

අවසාන වශයෙන්, මට තව එක කාරණයක් ඉදිරිපත් කිරීම සඳහා පමණක් අවස්ථාව ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද මේ රට තුළ ජාතිවාදය හිස ඔසවනවා කියමින් කටයුතු කරනවා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතිවාදය ගැන කියමින් නැවත වරක් මේ රට තුළ ත්‍රස්තවාදය ගොඩනැඟෙන්න, හිස ඔසවන්න ඉඩදෙන්න එපා කියා අපි කියනවා. මම මේ වෙලාවේ ඇක්ටන් සාමි කියපු ප්‍රකාශයකින් මගේ කථාව අවසන් කරනවා. ඔහු කියා තිබෙනවා, "බලය මිනිසා දූෂණය කරයි. අධික බලය මිනිසා අත්‍යන්තයෙන්ම දූෂණය කරයි" කියලා. එහෙම නොවේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙන්නම්. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ශාන්ත පද්ම කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.43]

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මම ප්‍රකාශ කරන්න කැමැතියි මෙය ගරු පාර්ලිමේන්තුවේ මගේ මංගල කථාව බව. අපේ මන්ත්‍රීවරු 159දෙනෙක් මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. ඒ වාගේම, රත්නපුර දිස්ත්‍රික්කයේ අපේ සිංහල, දෙමළ, මුස්ලිම් සහෝදර ජනතාව ලක්ෂ ගණනින් ඡන්දය පාවිච්චි කරලා, අතිවිශාල මනාප ප්‍රමාණයක් ලබා දීලා අපේ දිස්ත්‍රික්කයෙන් මන්ත්‍රීවරු අටදෙනෙක් මේ ගරු සභාවට තෝරා පත් කළා. මුලින්ම මේ ගරු සභාවේදී රත්නපුරයේ අපේ ආදරණීය සිංහල, දෙමළ, මුස්ලිම් සහෝදර ජනතාවට මගේ ස්තුතිය, ප්‍රණාමය, ගෞරවය පුද කරනවා. ඔවුන් ලබා දීපු ජන වරම පිළිබඳ හොඳ අවබෝධයක්, හොඳ විග්‍රහයක් අපට තිබෙනවා. මෙතෙක් කලක් -වසර 76ක පමණ කාලයක්- පුරාවට විවිධ දේශපාලන පක්ෂ විසින් ගෙන යනු ලැබූ ඒ ආණ්ඩුකරණය ඇතුළේ අපේ රට ආර්ථික, සමාජයීය, දේශපාලනික, සංස්කෘතික ආදී හැම පැත්තෙන්ම අගාධයට වට්ටපු මොහොතක තමයි රටේ ජනතාව විවිධ ආකාරයෙන් අරගළ කරලා, විවිධ උත්සාහ දරලා අන්තිමට

[ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා]

ඉතාම ප්‍රජාතන්ත්‍රවාදී විධියට ජාතික ජන බලවේගයේ අපේ ව්‍යාපාරය පිළිබඳ ඉතා විශ්වසනීය අදහසකින් යුක්තව අතිවිශාල බලයක් අපට ලබා දුන්නේ.

මීට පෙර කථා කරපු අපේ ගරු චානක සම්පත් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ අතිවිශාල බලයක් අපට ලබා දුන්නා. ඔව්, අපි අහලා තිබෙනවා දේශපාලනික දාර්ශනිකයකු වුණු බ්‍රයිස් සාමි කිව්වා, "බලය දූෂිතයි. ඒ වාගේම අධික බලය අත්‍යන්තයෙන්ම දූෂිතයි" කියලා. ඒක අපි ඉගෙනගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාට අපි පැහැදිලි කරන්න කැමැතියි, මේ බලය ලැබුණේ තනි පුද්ගලයෙකුට නොවෙයි කියලා. මේ බලය ලැබුණේ ව්‍යාපාරයකට. ව්‍යාපාරයක් විධියට තමයි අපි තීන්දු-තීරණ ගන්නේ. ඒ නිසා ඔබටත්, මේ රටටත් සහතිකයක් දෙන්න අපට පුළුවන් මේ අසීමිත බලය ඉතාම සීමිත විධියට අවශ්‍ය තැනදී, අවශ්‍ය ප්‍රමාණයෙන්, අවශ්‍ය මොහොතට පාවිච්චි කරනවා කියලා. ඒ නිසා මේ රටේ ජනතාවටත්, විපක්ෂයේ ඔබටත් අපි කියනවා, ඒ අධික බලය පිළිබඳව කිසිදු බයක් සැකක් තබාගන්න එපා කියලා. ඒ බලය ලබා දීම තුළින් රටේ ජනතාව බලාපොරොත්තු වුණා අපි ඇවිල්ලා පරිසරය ආරක්ෂා කරයි කියලා.

අතුරු සම්මත ගිණුම පිළිබඳ විවාදය පැවැත්වෙන මේ මොහොතේ පක්ෂ, විපක්ෂ සියලු දෙනාම මේ කාරණය සම්බන්ධයෙන් අඩු වැඩි වශයෙන් අදහස් දැක්වූවා. ඒ නිසා මේ ගරු සභාවේ අවධානය වෙනත් පැත්තකට රැගෙන යන්න මම කැමැතියි. මගේ දිස්ත්‍රික්කය වන රත්නපුර දිස්ත්‍රික්කය පිළිබඳව මීට දින දෙකකට පෙර එම දිස්ත්‍රික්කයම නියෝජනය කරන විපක්ෂයේ මන්ත්‍රී ගරු හේෂා විතානගේ මැතිතුමා මේ ගරු සභාවත්, රටත් නොමඟ යවනසුලු ප්‍රකාශයක් කළා. ඒ තමයි, අපේ පක්ෂය විසින් රත්නපුරයේ ඉදිකිරීමට යන කුඩා ජල විදුලි ව්‍යාපෘතියකින් මුදල් ලබා ගත්තා, ගැටුම් ඇති කළා කියා සිදු කළ අසත්‍ය ප්‍රකාශය. ඒ නිසා පළමුවෙන්ම එය නිවැරදි කර මේ ගරු සභාවටත්, රටේ ජනතාවටත් ඇත්ත කතන්දරය පැහැදිලි කරන්න මම කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බඹරබොටුව ග්‍රාම නිලධාරි වසමේ තමයි මේ කුඩා ජල විදුලි ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙන්නේ. ඒක 2015 වාගේ කාලයේ තමයි ආරම්භ කර තිබෙන්නේ. දැන් විපක්ෂයේ ඉන්න පක්ෂ දෙකම ආණ්ඩු කරපු කාලයේ තමයි ඒක ආරම්භ කර තිබෙන්නේ. 2015දී ඒ ව්‍යාපෘතිය ආරම්භ කළාට ප්‍රදේශයේ මහජනතාව; මේ රටට, මේ පරිසරයට ආදරය කරන මහජනතාව දිගින් දිගටම උද්ඝෝෂණය කළා. ඒ උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් විධියට ඒ ජනතාවට පුළුවන්කම ලැබුණා මේ දක්වා එම ව්‍යාපෘතිය නවත්වාගෙන ඉන්න. ඇයි, එම ව්‍යාපෘතිය නවත්වන්න කියා ජනතාව උද්ඝෝෂණය කරන්නේ? ඒ පිළිබඳව මා ගරු සභාව දැනුවත් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ව්‍යාපෘතිය ඉදි කරන්න අවසර ඉල්ලන්නේ කදුරුගල්දොළ හරස් කරලා. නමුත්, ඇත්ත කතන්දරය ඒක නොවෙයි. කදුරුගල්දොළ විතරක් නොවෙයි, එම ප්‍රදේශයේ තිබෙනවා පාඬි ඔය ඇල්ල සහ මදනගිරි ඇල්ල. එය සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක් වුණු භූමියක්. ඒ විතරක් නොවෙයි, අධි සංවේදී පරිසර ප්‍රදේශයක්. ඒ ප්‍රදේශයේ පුවරු සවි කරලා තිබෙනවා, "මෙය අධි සංවේදී පරිසර කලාපයක්" කියලා. එම කලාපයේ තමයි, ව්‍යාපෘතිය ඉදිකරන්නේ. ඇත්ත කතන්දරේ, කදුරුගල්දොළ හරස් කරලා නොවෙයි, පාඬි ඔය ඇල්ල සහ මදනගිරි ඇල්ල තමයි හරස් කරන්නේ. එතැන කදුරුගල්දොළත් තිබෙනවා. සත්‍ය විකෘති කරලා තමයි එම ව්‍යාපෘතිය පටන් ගන්නේ. ඒ වාගේම, එස්.එන්. හයිඩ්‍රෝ පවර් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ආයතනය, අංක 104, රතනජෝති මාවත, රත්නපුර කියන ලිපිනය තමයි එම ව්‍යාපෘතිය ආරම්භකයින්ගේ ලිපිනය විධියට සඳහන් කරන්නේ. නමුත්, එවැනි සමාගමක් එම ලිපිනයේ ලියාපදිංචි කරලා නැහැ. එම ලිපිනයත් බොරුවක්. ඒ විතරක් නොවෙයි, එම ප්‍රදේශය පිළිබඳව හඳුන්වන නාමකරණයත් බොරුවක්.

ඒ විතරක් නොවෙයි. මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු පරිසර අමාත්‍යාංශයට අයත් ආයතන 14ක් නොමඟ යවලා කූට ලේඛන සකස් කරලා තමයි එම ව්‍යාපෘතියට නීතිමය අවසර අරගෙන තිබෙන්නේ. නමුත්, මහජන උද්ඝෝෂණය නිසා තමයි එම ව්‍යාපෘතිය කර ගන්න නොහැකි වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ජනතාව උද්ඝෝෂණ කරනවා. පසුගිය 28වැනි දාත්, ඊයේත් ජනතාව විසින් උද්ඝෝෂණය කළා, එම ව්‍යාපෘති නවත්වන්න කියලා. නමුත් ඒකට ඇහුම්කන් දුන්නේ නැහැ. මේ පිළිබඳව විශේෂයෙන් සලකා බලන්න කියලා ගරු පරිසර ඇමතිතුමාගෙන් මා මේ අවස්ථාවේත් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රදේශය ඉතාම සංවේදී පරිසර කලාපයක්. ඒ වාගේම සංචාරක ආකර්ෂණයෙන් යුත් ප්‍රදේශයක්. ශ්‍රී ලංකාවට ආවේණික මත්ස්‍ය විශේෂ එහි ජීවත් වනවා. උදාහරණයක් වශයෙන් කිව්වොත්, ගල් පාඬියා කියන මත්ස්‍ය විශේෂය එම ඔයවල ජීවත් වනවා. එම මත්ස්‍ය විශේෂය අපේ මිරිදිය ජලයේ ගුණාත්මකභාවය මනින දර්ශකයක් ලෙස සලකනවා. එය ඉතාම සංවේදී ප්‍රදේශයක් වාගේම, ජනතාව එම ජල මූලාශ්‍රවලින් තමයි පානීය ජලය රැස් කර ගන්නේ. එම නිසා මා ගරු සභාවට ප්‍රකාශ කරන්න කැමැතියි, මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන්න කියලා. ඒ ජනතාව උද්ඝෝෂණය කරන්නේ, අස්වැසුම ප්‍රතිලාභ ලබා ගන්න හෝ රුපියල් හයදහසේ දීමනාව ලබා ගන්න හෝ වෙනත් පෞද්ගලික ප්‍රතිලාභයක් ලබා ගන්න නොවෙයි. එම පරිසරයට සහ එම ප්‍රදේශයට වන හානිය නිසා. එම නිසා ගරු සභාවේ අවධානය එම කාරණාව කෙරෙහි යොමු කරන්න කියලා මම කියන්න කැමතියි. මේ කාරණයේදී ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා ගරු සභාව නොමඟ යැව්වා. එතුමා ජනතාව නියෝජනය කරමින් නොවෙයි, එම ව්‍යාපෘතිය කරන අය නියෝජනය කරමින් තමයි කථා කළේ. එතුමා කිව්වා, **"අපි මුදල් ගත්තා"** කියලා. අන්න බළලා මල්ලෙන් එළියට පැන්නා. එහි ඇත්ත කථාව තමයි මම මේ කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015දී තමයි මේ ව්‍යාපෘතිය ආරම්භ වෙන්නේ. 2015 ඉඳලා අවුරුදු 9ක් ජනතා විරෝධය නිසා ව්‍යාපෘතිය නවත්වාගෙන ඉන්න පුළුවන්කම ලැබුණා. හැබැයි, ආණ්ඩු දෙකක් ව්‍යාපෘතියට අවස්ථාව සලසා තිබෙනවා. ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමන්ලාගේ යහ පාලන ආණ්ඩුව සහ පසුගිය පොදුජන පෙරමුණු ආණ්ඩුව කියන ආණ්ඩු දෙකෙන්ම එම ව්‍යාපෘතියට අවස්ථාව සපයා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, සුනිත්‍ය බලශක්ති අධිකාරිය තනියෙන් නඩුවක් පැවරුවා; එම විරෝධකරුවන්ගෙන් කිසිදු ප්‍රකාශයක් ගන්නේ නැතුව එම ව්‍යාපෘතියේ අයිතිකරුවන්ට වුවමනා විධියට හැසිරිලා නඩුවක් පැවරුවා. ඒ නඩුවෙන් පරාද වනවා. ඒක දඩමීමා කරගෙන තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට ව්‍යාපෘතිය ආරම්භ කරලා තිබෙන්නේ. එම නිසා ගරු සභාවෙනුත්, ගරු පරිසර ඇමතිතුමාගෙනුත් මම ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් වහාම මැදිහත් වෙන්න කියලා. මොකද, මේ මොහොතෙත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වනවා. දවසක් එම ව්‍යාපෘතියේ වැඩ කෙරුණොත් එම අධි සංවේදී පරිසර කලාපයට විශාල හානියක් සිදු වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ ගරු සභාවෙන් මා ඉල්ලා සිටින්නේ, විශේෂයෙන් ගරු පරිසර ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මේ පිළිබඳව වහාම මැදිහත් වෙලා මේ ව්‍යාපෘතිය තාවකාලිකව හෝ නවත්වන්න කටයුතු කරන්න කියලායි. ඊට පස්සේ අපට පුළුවන් විධිමත් පරීක්ෂණයක් පවත්වා මේ ව්‍යාපෘතිය දිගට කරගෙන යනවාද, නැද්ද කියන කාරණය විමසන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.53]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම දහවන පාර්ලිමේන්තුව අමතා මා කරන මංගල කථාවේදී ඉස්සෙල්ලාම මම කැමැතියි මේ නව රජයට, ගරු අග්‍රාමාත්‍යතුමිය ඇතුළු සියලු ගරු මන්ත්‍රීවරුන්ට සුබ පතන්නට. ඒ වාගේම, මගේ විශේෂ ස්තුතියක් පුද කිරීමට තිබෙනවා. ඒ, සර්වජන බලය නියෝජනය කරමින් මට මේ පාර්ලිමේන්තුවට පැමිණීමට මහ සලසා දුන් අපගේ සර්වජන බලය එකමුතුවේ සියලු සහෝදර පක්ෂවලටයි. ඔවුන් ඉතා විශාල කැපවීමකින් යුතුව අප එක්ක කටයුතු කිරීම නිසා මෙවර මැතිවරණයේදී වැඩිම ප්‍රතිශතයකින් ඡන්ද ප්‍රමාණය වැඩි කර ගැනීමට හැකි වුණු පක්ෂය බවට සටහන් කිරීමට අප පක්ෂයට අවස්ථාව ලැබුණා. ඒ වාගේම, මේ සර්වජන බලය එකමුතුව නිර්මාණය වීමට කලින් මව්බිම ජනතා පක්ෂය හැටියට අප මේ පක්ෂය නිර්මාණය කළේ, එවකට ශ්‍රී ලංකාවේ දේශපාලනයේ මතු වුණු දරුණු දේශපාලන රික්තයට සහ ව්‍යාකූලත්වයට මුහුණ දීම සඳහායි. ඒ තුළ අප උත්සාහ කළේ, අපට අහිමි වෙමින් පැවතුණු ඒ සහෘදත්වයේ, සහෝදරත්වයේ, එකමුතුකමේ, ඒ වාගේම සෙනෙහසේ දේශපාලනය නැවත මේ පොළොවේ නිර්මාණය කර ගන්නටයි. ඒ වාගේම, මේ රටේ අපට අහිමි වෙමින් පැවතුණු ඒ නිර්මල වාමවාදී දේශපාලන ප්‍රවේශය රැක ගැනීමට වාගේම අප හැමදාම විශ්වාස කරමින් මේ රටට රැක දුන් ජාතිකත්ව දේශපාලනය රැක ගැනීමටයි අපි මේ සන්ධානය - සංවිධානය - නිර්මාණය කළේ. ඉතින් අපි අද සතුටු වෙනවා, ඒ තිබුණු දේශපාලන රික්තය පුරවන්නට මට මෙසේ පාර්ලිමේන්තු නියෝජනයක් කරන්නට අවස්ථාව ලැබීම ගැන. මෙයට සහයෝගය දුන් සියලුම ශ්‍රී ලාංකිකයන්ට මම ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමාගේ මංගල ප්‍රතිපත්ති ප්‍රකාශයත්, ඒ වාගේම පරිපූරක ඇස්තමේන්තුවත් කියන සමස්තය තුළ මේ නව පාර්ලිමේන්තුවේ සිදු වුණු කථා බහ නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් මම බොහොම උනන්දුවෙන් අසාගෙන හිටියා. මම ඒ කථා සියල්ලටම ඉතාම උනන්දුවෙන් ඇහුම් කන් දුන්නා. "මෙය ඓතිහාසික තීන්දුවක්" කියන වචන පාවිච්චි කරමින් ඔවුන් මේ අභිනව රජය නිර්වචනය කරනවා. මා එසේම නොදකින නමුත් - එසේ කියන්න හේතුවක් තිබෙනවා - ඔබතුමන්ලාට විශාල ඡන්ද ප්‍රමාණයක් සහ විශාල ආසන ප්‍රමාණයක් ලැබිලා තිබෙනවා. ඉතින් අපි ඒ ගැන බොහොම සතුටුයි. නමුත් අපි වැඩි වශයෙන් කල්පනා කරන්නට ඕනෑ, මේ රජයට මේ බලය ලැබෙන්නේ කොහොමද කියන එකත්, මේ මුළු කථා බහ පුරාම කියැවුණු "76 වසරක ශාපය" කියන සංකල්පයත්, ඒ වාගේම නිතර නිතරම භාවිත වුණු "ජාතිවාදය" කියන සංකල්පයත් පිළිබඳව.

කොහොම වුණත්, මා දකින විධියට මේ තීන්දුව -තුනෙන් දෙකක බලයක් දක්වා හෝ ඉන් ඔබ්බට ගිය තීන්දුව- ලබා දීමට කරුණු කාරණා කිහිපයක් හේතු වෙලා තිබෙනවා. මම හිතනවා, මේ අභිනව රජය මේ ජනතා කැමැත්ත කියන එක ප්‍රකාශ වන ආකාරය දෙස නිරහංකාරව, විවේචනාත්මකව බලන්නට ඕනෑ කියා. එහෙම නැත්නම් මම හිතනවා, ඔබ ලොකු අමාරුවක වැටෙන්නට ඉඩ තිබෙනවා කියා.

මොකද, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බලයට ආවාට පසුව බිහි වුණු රජයටත් තුනෙන් දෙකක බලයක් ලැබුණා. නමුත්, එම පක්ෂය අද ආසන තුනට වැටිලා තිබෙනවා. ඔබ හිටියේත් ආසන තුනේ. මා ක්‍රියාකාරී දේශපාලනයට ආවේ මෑතක වුණත්, සරසවියෙන් ඇරඹුණු මගේ දීර්ඝ කාලීන දේශපාලන ජීවිතය තුළ මෙය දේශපාලනිකව කියවා ගැනීමට තරම් පසුබිමක් මට තිබෙනවා කියා මම හිතනවා. ඒ වාගේම, ඔබ දන්නා පරිදි මම ඔබගේ පක්ෂයේ පන්ති 5ට දෙවරක් ගිහිල්ලා, ඔය පක්ෂයට ආශීර්වාද කරමින් සිටි කෙනෙක්. 2008 ඉතාම තීරණාත්මක අය වැය හමුවේ යුද්ධය අවසන් වන්නට ඔන්න මෙන්න තිබියදී ඔබ විසින් ගන්නා ලද තීරණය නිසා ඉතාම කලකිරීමට පත් වුණු පුද්ගලයෙකු හැටියටත්, ඒ පිටුපස ඇති දේශපාලන අවබෝධය පාවිච්චි කරමිනුත් මට පුළුවන් මේ රටේ ජනතාව මේ තීන්දුව දුන්නේ කුමක් නිසාද යන්න වාක්‍ය තුනකින් වටහා ගන්නට.

අංක එක, කලකිරීම! කලකිරුණේ මොකක් එක්කද? තිබුණු දේශපාලන සංස්කෘතිය හා ඒ වටා ඇති වුණු දූෂණ චෝදනා, ඒ සංස්කෘතිය පිටුපස මැවුණු දහසකුත් එකක් චිත්ත රූප නිසා සුවහසක් දේශප්‍රේමී ශ්‍රී ලාංකිකයන්, වාමවාදී ජාතික කඳවුරට සැමදා ආදරය කරපු අය කලකිරුණා. ඒ කලකිරීමේ ඡන්දය තමයි ලබා දුන්නේ. එසේ නොවෙයි කියා ඔබ මොහොතකටවත් හිතන්නට එපා. ජනතාව ඔබට බලය දුන්නේ ඔබගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවා හෝ ඔබගේ පන්ති 5ට ගිහිල්ලා හෝ ඔබගේ මේ දේශපාලනය අවබෝධ කරගෙන හෝ ඔබගේ මේ දේශපාලනය පිටුපස තිබෙන, මේ දේශපාලනය ඇතුළේ තිබෙන දේශපාලනය අවබෝධ කරගෙන හෝ නොවෙයි කියන එක මම මේ ගරු සභාවට කියන්නට කැමැතියි.

අපේ විපක්ෂයටත් අපි කාරණයක් කියන්නට ඕනෑ. මේ විපක්ෂය කෙතරම් දුර්වලව කටයුතු කළේ ද කියන එක තහවුරු වුණා, මේ ප්‍රතිඵලය තුළ. ඒ නිසා මේ ප්‍රධාන විපක්ෂය වටහා ගන්නට ඕනෑ, තමන් විපක්ෂයේ කාර්ය භාරය කරන්නේ කොහොමද, විපක්ෂයක් හැටියට කෙසේ කටයුතු කළ යුතු ද කියන එක. ඒ නිසා තමයි අපේ මැතිවරණ වේදිකාවේ අපි දිගටම කිව්වේ, "අපට අවශ්‍ය නැහැ, රජයක් අමාරුවේ දමන්නට; රජයක් වැටෙනවා බලාගෙන ඉන්නට. අපට ඕනෑ ඔබට උදවු කරන්නයි; සද්භාවයෙන් උදවු කරන්නයි" කියා. ඒක තමයි සහෘදත්වයේ දේශපාලනය. අපට ඕනෑ මේ රජය මී ළඟ අවුරුදු පහ නිවැරදි මාර්ගයක ගමන් කරනවා දකින්නටයි. ඉතින් ඒ වෙනුවෙන් තමයි අපි කැප වෙන්නේ. මේ දුර්වල විපක්ෂය කටයුතු කළ ආකාරය නිසාම ජනතාවට තමන්ගේ කතිරය සටහන් කිරීමට විකල්පයක් නොතිබීමත් ඔබට බලය ලබා දීමට එක හේතුවක්.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න කැමැතියි. ඔබ සියලුදෙනාගේ දේශපාලන ව්‍යාපාරය තුළ ගොඩක් ඇත්ත කිව්වා. මේ රටේ දේශපාලනය තුළ සිදු වන දූෂණ ගැන කිව්වා. ඒක හොඳයි. ඒ වාගේම සිදු වන අකටයුතුකම් ගැන කිව්වා. ඒකත් හොඳයි. හැබැයි, ඊටත් වඩා ඔබ අසත්‍ය දේ කිව්වා. අසත්‍ය දේ මා සම්බන්ධයෙනුත් කිව්වා. ඒකට ප්‍රශ්නයක් නැහැ. නමුත්, ඔබ

[ගරු දිලිත් ජයවීර මහතා]

මතක තබා ගන්න ඕනෑ, මේ ජනතාව තීන්දුව ගන්නට හේතු වුණු ඒ අසත්‍ය කරුණුත්, සත්‍ය කරුණුත් අතර දෝලනය වන තීන්දුවක තමයි මේ ඡන්දය ප්‍රකාශ වුණේ කියන එක. ඒ නිසා ඔබ මතක තබා ගන්නට ඕනෑ, ඔබගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙන ගොඩක් දේවල් ඉටු කරයි කියලා ජනතාව බලාපොරොත්තුවෙන් ඉන්න බව. ඒ සඳහා අපි උදවු කරන්නටත් ඕනෑ. ඒ සඳහා අපි උදවු කරන්න කැමැතියි.

එහෙත් මම මේ කාරණයත් කියන්නට ඕනෑ. අද කෙරුණු සියලු කථාවල, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂය වෙතින් කෙරුණු සියලු කථාවල මා දුටු විශාලතම ප්‍රශ්නය මේකයි. මේ රටේ ජනතාව ඔබගෙන් අපේක්ෂා කරන, ඔබගෙන් බලාපොරොත්තු වන වෙනස ඇති කිරීම සඳහා වන කේන්ද්‍රීය උපාය මාර්ගික වැඩ පිළිවෙළ, ඒ සංකල්පය අපි දැක්කේ නැහැ. ඒ සංකල්පය නැතිව අපේ ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඉබාගාතේ යනවා කියා අපට හිතෙනවා. අප මේවා සෙනෙහසින් කියන්නේ; ආදරයෙන් කියන්නේ; තරහකට නොවෙයි කියන්නේ. ඔබට වුවමනාව තිබුණත්, සද්භාවයෙන්ම වුවමනාව තිබුණත් ඔබගේම වූ උපාය මාර්ගික වැඩ පිළිවෙළකින් තොරව මේ වෙනස කර ගන්නට ඔබට පුළුවන් කියලා මම හිතන්නේ නැහැ.

ඒක තමයි මගේ වැටහීම. කොහොම වුණත් අපි යෝජනා කළා, අපේ මැතිවරණ ව්‍යාපාරය පුරාම ව්‍යවසායකත්ව රාජ්‍යයක් තුළින් සතුටු දැයක් නිර්මාණය කර ගැනීමේ ඒ සැලැස්ම. ඔබගේ භාවිතය සඳහා මම ඒ ජාතික උපාය මාර්ගික සැලැස්ම අද **සභාගත*** කරනවා.

ඉතා දියුණු, විද්‍යාත්මක, අපේ නූතන ලෝකයට ගැළපෙන වැඩ පිළිවෙළක් උපාය මාර්ගිකව කොහොමද "ව්‍යවසායකත්ව රාජ්‍ය" කියන සංකල්පය තුළ භාවිත කරන්නේ කියන එක එහි අන්තර්ගත කරලා තිබෙනවා. In fact, there is some misunderstanding about the concept of an "Entrepreneurial State"; some interpret it differently. It is not just about promoting entrepreneurs; it is the concept of an entrepreneurial state. It is to say that the State should possess an entrepreneurial spirit in their system itself. It promotes creativity, the risk-taking ability and management of risks. That is the concept of an Entrepreneurial State. So, it is my duty to table it in all three languages and I expect you to, at least, be a little humble to study it because we have taken a lot of trouble to prepare it**.** Over the years, we have developed it. So, we would like you to look at it.

කේන්ද්‍රීය උපාය මාර්ගික සංකල්පයක් තුළින් කොහොමද මේ රාජ්‍ය ව්‍යුහය වෙනස් කර ගන්නේ, රාජ්‍යයක් නිර්මාණශීලීව හිතන්නේ? අද අපි පොල් ගෙඩිය ගැන කථා කරනවා. හාල් ගැන කථා කරනවා. මේ ඔක්කෝම පරණ අහපු කථා. මේ විධියට හිතලා මේ රට ගොඩ යන්නේ නැහැ. ඒකෙන් මේ රට අහලක්වත් ඉස්සරහට යන්නේ නැහැ. අපි දියුණු රටක් වෙන්න නම්, තුන්වැනි ලෝකයෙන් ඉස්සරහට යන්න නම් අපේ රාජ්‍ය හිතන විධිය වෙනස් කර ගන්නට ඕනෑ. මේ රාජ්‍යය නිර්මාණශීලී වෙන්නට ඕනෑ. දැන් මේ රාජ්‍යයට නිර්මාණශීලීත්වය එන්නේ කොතැනින්ද, ඔබත් පරණ විධියට හිතනවා නම්; ඔබත් පරණ විධියට කථා කරනවා නම්; ඔබත් මේ 76 වසරක ශාපය කථා කරකර ඉන්නවා නම්; ඔබත් කථා කරන්නේ පරණ සංකල්ප නම්?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අපේ ජනාධිපතිතුමා යටතේ ආයතන 80ක් විතර තිබෙනවා. ඒක හරි පරණ වැඩක්. ඒක ව්‍යවසායකත්ව රාජ්‍යයක සිද්ධ වෙන්න බැහැ. මේ රටේ ප්‍රධාන විධායක නිලධාරියා -CEO- නිදහස් මිනිහෙක් වෙන්නට ඕනෑ. ආයතන 80ක් තියාගෙන නිර්මාණශීලීව හිතන්නේ කොහොමද? හිතන්න වෙලාව එන්නේ කොහොමද? එතුමාට අපි ආදරයෙන් කියනවා, ඒ ඔක්කෝම ටික අත්හැරලා දාන්න කියලා. ඕවා පරණ වැඩ. ආයතන ඔබතුමාගේ යටතේ තියාගන්න එක පරණ වැඩක්. එතුමා මේ පාර්ලිමේන්තුවේ ඉන්න කොට ඒ ගැන ගොඩක් විවේචන කළා. මම එතුමාට ඒක මතක් කරලා දෙන්න කැමැතියි.

මට ඉතා කනගාටුවට හේතුවක් වුණා, මේ සභාවේ දිගින් දිගටම භාවිත කරපු ජාතිවාදය කියන සංකල්පය. ඔබතුමන්ලා දන්නවා, රෝහණ විජේවීර සහෝදරයා ඉතා හොඳින් ඒ පිළිබඳ විග්‍රහයක් කරපු කෙනෙකු බව. විශේෂයෙන්ම ජාතිකත්වය හා ජාතිවාදය කියන මේ සියල්ල පිළිබඳ විග්‍රහයක් තිබුණු කෙනෙක් තමයි විටෙක ඔබගේත්, අපගේත් ගෞරවයට ලක් වුණු පුද්ගලයකු වන රෝහණ විජේවීර සහෝදරයා. අද ඔබතුමන්ලා ඒක ඉතා මතු පිටින් අරගෙන, NGO අර්ථයෙන් අරගෙන විග්‍රහ කළා. සංහිඳියාව යනු NGO විග්‍රහයක්. ජාතිකත්වය යනු උපත පිළිබඳ ප්‍රශ්නයක්වත්, උපතින් ආපු ආගම හෝ ජාතිය පිළිබඳ ප්‍රශ්නයක්වත් නොවෙයි, මේ රටේ සභ්‍යත්වයට බද්ධ වුණු මිනිසුන්ගේ හැඟීම් සමුදායක ප්‍රකාශනයක්. ඒක හැම රටකටම ආවේණිකයි. ඒ හැම රටකටම ජාතිකත්වයක් තිබෙනවා. ඒ අය ඒ ජාතිකත්වයට ගරු කරනවා. ඇමෙරිකාව අද වනවිට එයට ඉහළින්ම ගරු කරනවා. අද ට්‍රම්ප් මහත්තයා බලයට එන්නේ කොහොමද? ඒ ඔවුන්ගේ ජාතිකත්වය භාවිත කරලා. අපට ඒක වහකදුරු වුණේ කොහොමද? ජාතිකත්වය කියන්නේ මොකක්ද? අපි ඒක හැම තිස්සේ ම ජාතිවාදයත් එක්ක පටලවා ගෙන - there is a big difference between nationalism and racism.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
අවසාන වශයෙන් මම මේ රජයේ ඉන්න සාමාජිකයන්ට ඉතා ආදරයෙන් කියන්නේ, ඒ පටලැවිල්ල කරන්න එපා කියලා. අපේ කේන්ද්‍රීය උපාය මාර්ගික සංකල්පය තුළ අපි යෝජනා කරලා තිබෙනවා, මේ රටේ සියලුදෙනාම ජාති, ආගම් භේදයකින් තොරව අපේ සභ්‍යත්වයට ගරු කරන්න කියලා. අපේ ශ්‍රේෂ්ඨ බෞද්ධ දර්ශනය ආගමක් හැටියට විග්‍රහ කරන්න එපා.

ඒ දර්ශනයෙන් අපට ලැබුණු දාර්ශනික ප්‍රවේශයට ගරු කරන්න. ඒ තුළින් අපට එකමුතු ජාතිකත්වයක් නිර්මාණය කර ගන්නට පුළුවන්. ඒකට ඇති බාධාවක් හැටියට මම දකින්නේ මෙයයි. ඔබතුමන්ලා ඉතා සරලව විග්‍රහ කරගෙන ජාතිවාදය - ජාතිවාදය කියන්නේ අපේ ජාතිකත්වයට නම්, ඔබතුමන්ලාට ගොඩක් වැරදිලා. මේ රටේ ජනතාව අභිප්‍රේරණය කරගන්නේ නැතුව, අපේ මානව සම්පත අභිප්‍රේරණය කරගන්නේ නැතුව ඔබතුමන්ලාට කවදාවත් බැහැ මේ රට ඉදිරියට ගෙනියන්නට. ඒ නිසා අවසාන වශයෙන් කියන්නේ මේ රටේ ජනතාව නැතුව ඔබතුමන්ලාට ගමනක් නැහැ, ජනතාව ඕනෑ නම් මේ ජාතිකත්ව මතය තුළ ජනතාව අභිප්‍රේරණය කළ යුතුයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුතුමැණිකේ රත්වත්තේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.09]

**ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) ஏ.எம்.எம்.எம். ரத்வத்தே)
(The Hon. (Ms.) A. M. M. M. Rathwaththe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවට ප්‍රවිෂ්ට වීමට පෙර, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී රටටම ඇහෙන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අද දවස ගැන පොඩ්ඩක් මතක් කරලා දෙන්න හිතුවා. අතේ පටියක් බැඳ ගත්තාට අද දවසේ විශේෂත්වය ගැනවත් නොදන්න, අද දවස ගැන නොසිතා ඒ මන්ත්‍රීවරයා රටටම ඇහෙන්න එහෙම කියන්න පටන් ගත්තා. මන්ත්‍රීවරයෙක් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ට අපහාස වෙන විධියේ ප්‍රකාශ කරන්න පටන් ගත්තා. පසුගිය වසරේ තිබුණු ආණ්ඩුව කාන්තා හා ළමා කටයුතු පිළිබඳ වූ වැය ශීර්ෂයට වෙන් කළ යුතු මුදල සියයට 50කින් අඩු කරපු අවස්ථාවේ මේ පාර්ලිමේන්තුව ඉදිරිපස අපි උද්ඝෝෂණයක් කළා. එදා ඒ කාන්තාවන්ටත් බය වුණු ඒ ආණ්ඩුවේ පිරිස විසින් ඒ කාන්තාවන්ට -අපට- මැර ප්‍රහාර එල්ල කළා. කාන්තා හිංසනය පිටු දකින අද දවසේත් මේ විධියට කාන්තාවන්ට හිංසා කරනවා නම්, කාන්තාවන්ගේ අයිතීන් උල්ලංඝනය කරනවා නම් මෙන්න මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි කියන්න කැමැතියි, දුවන්න පාරවල් හොයාගන්න කියලා.

දේශපාලන ඉතිහාසයේ මෙතුවක් කාලයක් ස්වාමියා මිය ගියාම බිරිඳ පාර්ලිමේන්තුවට පැමිණියා. පියාගේ ඇවෑමෙන් මව පාර්ලිමේන්තුවට පැමිණියා; දුව පාර්ලිමේන්තුවට පැමිණියා. මේ ජාතික ජන බලවේගයේ කිසිම මන්ත්‍රීවරියක් මේ නිර්ණායක මත පදනම්ව පාර්ලිමේන්තුවට පැමිණියේ නැහැ. මේ රටේ ජීවත් වන සියයට 52ක් වන සුවහසක් කාන්තාවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවට තේරී පත් වී ආ මන්ත්‍රීවරියන්ට, මේ මන්ත්‍රීවරියන් අතේ බැඳ සිටින මේ බෑන්ඩ් එක තිබුණත් 'උම්බෑ' කියන තත්ත්වයට පත් වෙලා ඉවරයි. සමහර විට එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉදිරියේදී තීන්දු කරන්න හිතයි, එහෙම කියන මන්ත්‍රීවරුන්ගේ අතට නොවෙයි බෙල්ලට බෑන්ඩ් එක දැමිය යුතුයි කියලා.

මීට පෙර මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ ස්වාමියා සහ බිරිඳ වන දෙපළක් මගේ දිස්ත්‍රික්කයේත් හිටියා. ඔවුන් තමයි අපේ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය දුප්පත්කම වැඩි කළේ. රටේ ග්‍රාමීය දුප්පත්කම නැති කරන්න ඔවුන් ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමයක් යොදාගත්තා. ඒ හරහා කාන්තාවන් බෙල්ලේ වැල දාගන්න තත්ත්වයට පත් වුණා. එදා ඒ වෙනුවෙන් කථා කරන්න මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරපු ඒ ආණ්ඩු පක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් වුණේ නැහැ. අද වාගේ විශේෂ දවසකත් කාන්තා හිංසනය සිදු කරන මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මන්ත්‍රීවරියක හැටියට මගේ විරුද්ධත්වය ප්‍රකාශ කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නියෝජනය කරන්නේ දිගාමඩුල්ල දිස්ත්‍රික්කයයි. දිගාමඩුල්ල දිස්ත්‍රික්කයෙන් මහවැලි-සී කලාපයේ දෙහිඅත්තකණ්ඩියෙන් දේශපාලන ඉතිහාසයේ පළමුවරට මේ පාර්ලිමේන්තුව නියෝජනය කිරීම සඳහා මා තෝරා පත් කර එවූ දෙහිඅත්තකණ්ඩියේ ජනතාවටත්, පොදුවේ දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවටත් මාගේ හෘදයාංගම ගෞරවය සහ ස්තුතිය ප්‍රකාශ කිරීමට පළමුවෙන්ම මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම මගේ මංගල කථාව ආරම්භ කිරීමටත් අවසර පතනවා.

මේ 10වැනි පාර්ලිමේන්තුව කියන්නේ ඇත්තටම විශේෂත්වයක්. මෙතෙක් දේශපාලන ඉතිහාසය තුළ අපි දැකපු වැඩිම කාන්තා නියෝජනයක් තිබෙන්නේ මේ පාර්ලිමේන්තුව තුළයි. අගමැතිතුමිය ඇතුළු කාන්තාවන් 22ක් මේ 10වැනි පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. එමෙන්ම, ශ්‍රී ලංකාවාසී ජනතාව මෙන්ම සියයට 52ක් වූ කාන්තා ප්‍රජාවගේ සුභසිද්ධිය වෙනුවෙනුත්, ප්‍රතිපත්ති සම්පාදනය සඳහාත් අප පත් කර සිටියත්, මින් පෙර පාර්ලිමේන්තුව නියෝජනය කළ කාන්තාවන්ගේ ක්‍රියා පටිපාටිය දෙස බැලුවාම අපට සාධනීය කාර්යභාරයක් සිදුවූ බවට අත්දැකීම් නැහැ. අද වාගේම එදාත් මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරුන්ගේ ක්‍රියාකලාප නිසා කාන්තා මන්ත්‍රීවරියන් හිංසාවට, පීඩනයට, අවලාදයට ලක් වුණා. පසුගිය ආණ්ඩුවල මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ කාන්තාවන්ටද සිදු වූයේ හුදු දේශපාලන බල අරගළයේ ඉත්තන් වීමට පමණයි. එයට උදාහරණයක් ලෙස මීට පෙර පාර්ලිමේන්තුව නියෝජනය කළ කාන්තා මන්ත්‍රීවරියන්ට මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ පවා කථා කළ ආකාරය පිළිබඳව අප මාධ්‍ය තුළින් දැක තිබෙනවා. කාන්තාවන්ගේ සුරක්ෂිතභාවය වෙනුවෙන්, කාන්තාවන්ගේ සාධාරණත්වය වෙනුවෙන් ජාතික ජන බලවේගය ආණ්ඩුව අනිවාර්යයෙන්ම පෙනී සිටිනවා, එය ඉෂ්ට සිද්ධ කරනවා කියලා අපි සහතික වෙනවා.

දිගාමඩුල්ල දිස්ත්‍රික්කය කියන්නේ විශේෂිත දිස්ත්‍රික්කයක්. දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ සිංහල, දෙමළ, මුස්ලිම් සෑම ජන ප්‍රජාවක්ම ජීවත් වන අතර, ඉතිහාසයේ පළමු වතාවට දේශපාලන පක්ෂයක් විසින් දිනා ගන්නා ලද වැඩිම මන්ත්‍රී ආසන ප්‍රමාණයක් දිනා ගැනීමට ජාතික ජන බලවේගයට හැකි වුණා. දිස්ත්‍රික්කයේ යෝධ පතාකයන් යැයි කියා සිටි අනෙක් සියලුම දේශපාලන පක්ෂවල සාමාජිකයන් ගෙදර යවා, ඒ ජනතාව නවක මන්ත්‍රීවරුන් පිළිබඳව විශ්වාස කළා. ජාතික ජන බලවේගය පිළිබඳව ඔවුන් දැඩි ලෙස විශ්වාස කළා. අප ඔවුන්ට මේ අවස්ථාවේදී කියා සිටිනවා, ඔබ තැබූ ඒ විශ්වාසය අබමල් රේණුවකින් හෝ පළුදු නොකර ඒ ආකාරයෙන්ම රැකීමට අප වගබලා ගන්නා බව.

ඒ වාගේම, ඊයේ සහ අද යන දෙදින තුළදී මේ පාර්ලිමේන්තුවේ කථා කළ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ කථා දෙස බැලුවාම එක් මන්ත්‍රීවරයෙක් කිව්වා, ගෝඨාභයට මෙන් අපටද එක හා සමාන ජනවරමක් ලැබී ඇති බව. ඔව්, අපි ඒක පිළිගන්නවා. නමුත්, අපි ගෝඨාභය වාගේ මේ ජයග්‍රහණය වෙනුවෙන්, මේ ජනවරම වෙනුවෙන් ජාතිවාදය ඇවිස්සුවේ නැහැ; පාස්කු ප්‍රහාරය වාගේ ජන සංහාරයන් සිදු කළේ නැහැ; බොරු පොරොන්දු දීලා නැහැ; ජයග්‍රහණයක් බලාපොරොත්තුවෙන් කිසිම දවසක අනෙකාට විරුද්ධව බොරු ප්‍රකාශ කළේ නැහැ. ඒ වාගේම තමයි මේ ඓතිහාසික ජනවරම අපට ලබාදීමට තරම් ඔවුන් අපිව විශ්වාස කළා. ඒ ගැන අපි මේ ජනතාවට අපේ ආදර ගෞරවය ප්‍රකාශ කරනවා. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, ජනාධිපතිතුමා කිව්වා කියලා ණය ගන්නේ නැහැ කියලා. බලය ලබා ගැනීම වෙනුවෙන් බිම් මට්ටමේදී මෙන්ම මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ දීත් මේ මන්ත්‍රීවරුන් පට්ටපල් බොරු ප්‍රකාශ කරනවා. ජනාධිපතිතුමා කිසිම දවසක ණය නොගන්නා බවට ප්‍රකාශ කරලා නැහැ.

එතුමා කිව්වා, ණය ගන්න එක නොවෙයි සාපය; ගත්ත ණය හොරා කෑ එකයි මේ රටට මෙතෙක් කල් සාපයක් වුණේ කියලා. පසුගිය කාලයේ දේශපාලන වේදිකාවල උදම් අනපු විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිව්වා, ජාතික ජන බලවේගයේ අපට අත්දැකීම්

[ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මෙනෙවිය]

නැහැ කියලා. අත්දැකීම් තිබෙන; පළපුරුද්ද තිබෙන, මාරුවෙන් මාරුවට අවුරුදු 76ක් මේ රට පාලනය කරපු අය නිසා අපේ දිස්ත්‍රික්කවල ග්‍රාමීය ජනතාවට එක් දරුවෙකුගේ අධ්‍යාපනය වෙනුවෙන් තවත් දරුවෙකුගේ අධ්‍යාපනය කැප කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඔවුන්ගේ එක දරුවෙකුගේ අධ්‍යාපනය නභා සිටුවීමට තවත් දරුවෙකුගේ අධ්‍යාපනය කැප කරන්නට සිදු වෙලා තිබෙනවා. අත්දැකීම් තිබෙන, අවුරුදු 76ක් මේ රට පාලනය කරපු අය හදපු රටේ බිම් මට්ටමේ අම්මලා තාත්තලා ජීවත් වන විධිය තමයි ඒ.

වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අපි මේ රට තුළ පුනරුදයක් ඇති කරනවා. අපි ප්‍රාර්ථනා කරපු, කියපු දෙයක් තිබුණා. ඒ තමයි, පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් හදනවා කියන එක. ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අපි කියපු ඒ පොහොසත් රට, ලස්සන ජීවිතය සහ නව පුනරුදය ඉදිරියේදී උදා කර දෙනවා කියලා පොරොන්දු වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.19]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරු සම්මත ගිණුමක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී මගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම හත්වෙනි වතාවටත් මම මේ පාර්ලිමේන්තුවට එවන්නට දායකත්වය ලබා දුන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආදරණීය සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට මගේ ගෞරවනීය ස්තුතිය, ප්‍රණාමය හදවතින්ම - හදවතේ මනාපයට - පුද කරන්න මම මේ අවස්ථාව උපයෝගී කරගන්නවා.

ජනතා විමුක්ති පෙරමුණෙන් මේ රටේ ජනාධිපතිවරයෙක් පත් වුණා. ජනතා විමුක්ති පෙරමුණ මන්ත්‍රීවරු 159ක් ලබා ගෙන ආණ්ඩුවක් පිහිටෙව්වා. ඒ වාගේම මේ කාරණයත් මම කියන්න කැමැතියි. මේ මැතිවරණ දෙකේදී ජනතා විමුක්ති පෙරමුණ ජයග්‍රහණය කරන්න හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ජන වරමක් තිබුණත්, ඒ ජන වරමට විශාල ලෙස හොරකම, දූෂණය, වංචාව ඇතුළු කළ බව මම කියන්න කැමැතියි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන ගණනාවකට මම ගියා. එම ඡන්ද මධ්‍යස්ථානවල, polling booths ඇතුළේ SPO මහත්මයා, ග්‍රාම නිලධාරිතුමා, ග්‍රාම නිලධාරිතුමිය සිටියා. සියයට 75ක් විතර, - ඒ ග්‍රාම නිලධාරිතුමාට, ග්‍රාම නිලධාරිතුමියට, එම ඡන්ද මධ්‍යස්ථානවල සේවයට ගමේ දෙන්නෙක් ගන්න පුළුවන් ලු. ඒක බොරුවක්. මැතිවරණ නීතියේ එහෙම නැහැ.

නමුත් එහෙම දෙන්නෙක් අරගෙන, ඒ අය කළු කණ්ණාඩි සහිතව ඡන්ද මධ්‍යස්ථානයේ දොරකඩ යොදවලා, මිනිස්සු බිය වද්දමින් ඡන්දය ලබා ගත්තා. මම ඒ පිළිබඳව මැතිවරණ කොමිසමේ සභාපතිවරයාට ලිඛිතව පැමිණිලි කළා. මේ අවස්ථාවේදී එම වාර්තාව මම **සභාගත*** කරනවා.

හම්බන්තොට සහකාර මැතිවරණ කොමසාරිස්වරයාටත් මම පැමිණිලි කළා, ඒ නිලධාරීන් සිදුකළ ඒ වංචනික, දූෂිත වැඩ පිළිවෙළ ගැන පරීක්ෂණයක් පවත්වන්න කියලා. ඉතින් ඒ නිසා හොරකම, දූෂණය කරන්නේ නැහැ කියලා මෙතුමන්ලාට කියන්න බැහැ. මෙතුමන්ලා හොරකම, දූෂණය, වංචාව උපයෝගී කරගෙන තමයි පසුගිය මැතිවරණ දෙකම ජයග්‍රහණය කළේ. ඒ වාගේම ජනතාවගේ ඔළුවලට වෛරය -ක්‍රෝධය- කා වැද්දුවා. කා වද්දලා, මන්ත්‍රීවරුන් 225දෙනාම හොරුය කිව්වා. මිනිස්සුන්ට මන්ත්‍රීවරු එපා කරවලා, මන්ත්‍රීවරුන් හොරු බවට පත් කරලා තමයි මේ රටේ බලය ලබා ගන්න කටයුතු කළේ. මම කියන්න කැමැතියි, වෙදආරච්චිලා කවදාවත් මේ රටේ කිසිම සම්පතක් හොරකම් කරලා නැති බව. මම නගර සභාවේ අවුරුදු අටක් හිටියා, නගරාධිපතිවරයා හැටියට. පළාත් සභාවේ අවුරුද්දක් හිටියා. පාර්ලිමේන්තුවේ මේ යන්නේ 24වැනි අවුරුද්ද. මගේ පියා නගරාධිපතිවරයෙකු වශයෙන් අවුරුදු 30ක් නගර සභාවේ කටයුතු කළා. මගේ පුතාත් නගරාධිපතිවරයෙකු හැටියට කටයුතු කළා. මගේ මල්ලී නගර සභාවේ විපක්ෂ නායක හැටියටත් කටයුතු කළා. වෙදආරච්චිලා කවදාවත් හොරකම්, දූෂණ කරලා නැහැ; අතේ තිබෙන දේවල් ජනතාවට පරිත්‍යාග කරලා ජනතා සේවය කළා පමණයි. මම ආඩම්බරයෙන් කියනවා, ඒ නිසා තමයි හත්වැනි වතාවටත් ඒ ජනතාව මා පාර්ලිමේන්තුවට එව්වේ කියන එක.

ඊළඟට මම කියන්න ඕනෑ, රෝහණ විජේවීර ගැන. ඒ, ඔබතුමන්ලාගේ හිටපු නායකතුමා, ඔබතුමන්ලාගේ පක්ෂයේ නිර්මාතෘවරයා. ඔහු ජීවත් වුණේ තංගල්ලේ, මගේ නිවස පිටුපස පාරේ. 1970දී තමයි එතුමා ඒ නිවසේ පදිංචියට ආවේ. එතුමා මගේ ඥාතිවරයෙක්. 1971 කැරැල්ලේදී එතුමා බන්ධනාගාරගත වුණා. 1977දී නිදහස් වෙලා ආවා. ඇවිල්ලා තංගල්ලේ නිවසේ එතුමාගේ දේශපාලන කටයුතු ආරම්භ කළා. එතකොට අපට අවුරුදු 14යි,15යි. ඒ කාලයේ අපි යනවා, ඒවා බලන්න. පොඩි ළමයි වශයෙන් ඒ කාලයේ අපි වැල්ලේ සෙල්ලම් කරනකොට එතුමා ඇවිල්ලා අප සමඟ කථා බහ කරමින් ඉන්නවා, වැඩිහිටියෙක් වශයෙන්. එතුමාගේ නායකත්වයෙන්, විමුක්තියෙන් දැන් මේ රටට ජනාධිපතිවරයෙක් පත් වෙලා ඉන්නවා; ආණ්ඩුවක් පිහිටුවලා තිබෙනවා; තුනෙන් දෙකක බලයක් ලබාගෙන තිබෙනවා. එදා රෝහණ විජේවීර සහෝදරයා ඒ නිවසේ පන්ති පැවැත්වූවා. ඒ නිවසට පොලීසියෙන් පැන්නා. එතකොට මගේ තාත්තා නගරාධිපතිවරයා. එවැනි අවස්ථාවලදී මගේ තාත්තා යම් යම් උදව් පදව් කළා. අපේ තාත්තාට "සැම්පාල අයියේ" කියලායි කියන්නේ. සමහර ගමන් බිමන් යනකොට වියදමට සල්ලි නැහැ කියලා මගේ පියාගෙන් මුදල් හදල් පවා ඉල්ලාගෙන ගියා. ඥාති සම්බන්ධකම් අනුව එදා ඒ කටයුතු කළා. මගේ පියාත් එදා ඒ පක්ෂය හදන්න දායකත්වය දීලා තිබෙනවා. එතුමාගේ සහෝදරියක් තමයි, චිත්‍රා විජේවීර කියන්නේ. චිත්‍රා විජේවීර එදා ඒ ගෙදර 100ක, 150ක විතර පිරිසක් එක්ක බතික් ව්‍යාපාරයක් ආරම්භ කළා. අන්න ඒ නිසා තමයි ඒ නිවසට පොලීසිය පැමිණීම අඩු වුණේ. ඉතින් ඔන්න ඔය විධියට එදා මේ පක්ෂය හදාගෙන ආවා. දැන් ජනාධිපතිවරයෙක් බිහිවෙලා ඉන්නවා. ආණ්ඩුවක් පිහිටුවලා තිබෙනවා. ඉතින් මම ඔබතුමන්ලාගෙන් මේ අවස්ථාවේ යමක් ඉල්ලන්න කැමැතියි. අද රෝහණ විජේවීරගේ නිවස ගරා වැටිලා තිබෙන්නේ. චිත්‍රාංගනී විජේවීර අපේ ඥාතිවරිය අද ඉන්න තැනක් නැතුව තිස්ස පාරේ කුලී කාමරයක ඉන්නේ; ගිහින් බලන්න. මට කිව්වා, මේවා කථා කරලා කියන්න කියලා. ඉතින් මම ඔබතුමන්ලාට කියන්න කැමැතියි, ගිහිල්ලා ඔබතුමන්ලාගේ පක්ෂයේ හිටපු නායකයාගේ නිවස ප්‍රතිසංස්කරණය කරලා දෙන්න කියලා. එතැන මහා නයෙක් ඉන්නවා. මොකද, ඒ නිවස වල් වැදිලා තිබෙන්නේ. ඒ නිවස ප්‍රතිසංස්කරණය කරලා ඒ සහෝදරියට උදව් කරන්න කියලා මම ඔබතුමන්ලාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මීට කලින් කථා කළ මන්ත්‍රීතුමිය ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන්, විමුක්තිය වෙනුවෙන් ජීවිත පූජා කළ සහෝදර සහෝදරියන් වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කළා. මමත් මේ අවස්ථාවේදී ඔවුන් වෙනුවෙන් මගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා. හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රමුඛ අපේ රටේ අපේ ඥාතිවරු, අපේ යහළුවෝ, හිතවතුන් කිසිම වරදක් නැතුව, කිසිම චෝදනාවක් නැතුව අවුරුදු දෙකක් තිස්සේ ජනතා විමුක්ති පෙරමුණ විසින් අමු අමුවේ ඝාතනය කළා.

ඒ ඝාතනය වුණු සියලුදෙනාගේම පවුල්වලට මම මේ අවස්ථාවේ මගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා. එදා අහිංසක මිනිස්සු මරා දැම්මා, අහිංසක මිනිස්සුන්ගේ දරු පවුල් අනාථ කළා. ඒ නිසා මම මේ අවස්ථාවේදී ගරු ජනාධිපතිතුමාගෙනුත්, මේ ආණ්ඩුවෙනුත් ඉල්ලීමක් කරනවා, ඒ ඝාතනය වුණු අයගේ සෑම පවුලකටම වන්දියක් වශයෙන් රුපියල් ලක්ෂ 50 බැගින් ලබා දෙන්න කියලා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Sir, I rise to a point of Order.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මගේ වෙලාව මට දෙන්න, ඇමතිතුමා. Point of Order එකක් නැහැ, මගේ වෙලාව මට දෙන්න, මම කථා කරන්න ඕනෑ. මම සාධාරණව කථා කරන මිනිහෙක්. *[බාධා කිරීමක්]* මඩ ගහන්නේ නැහැ, මොකටද මඩ ගහන්නේ? මගේ වෙලාව අඩු කරන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා මැරුණු අයගේ පවුල්වලට ශෝකය ප්‍රකාශ කරමින් යෝජනාවක් කළා. එවකට එතුමන්ලාගේ ආණ්ඩුව 60,000ක් ඝාතනය කළා. එහෙම නම්, ඒ ඝාතකයන්ට දඬුවම් දීමත් ඒ එක්කම සිද්ධ වෙන්න ඕනෑ. මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබතුමා දැන් කිඹුල් කඳුළු හෙළන්න ලැහැස්ති වෙන්න එපා. කිඹුල් කඳුළු හෙළුවාය කියලා බේරෙන්නේ නැහැ. මතක තියාගන්න, ඒ ඝාතකයින්, අපරාධකරුවන් ඇතුළු ඒ අය ආරක්ෂා කළ සියලුදෙනාටත් දඬුවම් දීම සඳහා අදාළ ක්‍රියාමාර්ග මේ ආණ්ඩුව ගන්නවා. ඒ නිසා ඒ ගැන කලබල වෙන්න එපා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මම කලබල වෙන්නේ නැහැ. මට කියන්න දුන්නේ නැහැ නේ. මම කිව්වේ ඒ අයට වන්දි ලබා දෙන ගමන් ඔබතුමන්ලාගේ පාර්ශ්වයෙන් දිවි පිදූ ඒ සහෝදරයන්ටත් වන්දි ලබා දෙන්න කියලායි. ඒ අනුව දෙපාර්ශ්වයටම ඒ වන්දි ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඔබතුමා මට කථා කරන්න දුන්නේ නැහැ නේ. ඔබතුමන්ලාට බලය ලැබුණු වෙලාවේ මම කථා කරන්න ඕනෑ. මගේ යෝජනායි මම ඉදිරිපත් කළේ. *[බාධා කිරීමක්]* කාගෙන්ද? අපේ ආණ්ඩුවට මොකටද ඉදිරිපත් කරන්නේ? අපේ ආණ්ඩුවෙන් නොවෙයි නේ මැරුවේ, ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් නේ මැරුවේ, ඔබතුමන්ලාගේ නායකයෝ නේ මැරුවේ. *[බාධා කිරීමක්]* ඒ නිසා ඒවා ගැන කථා කරන්න ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* ඒ මැරුණු දෙගොල්ලන්ටම තමයි ගෙවන්න කියන්නේ. මගේ ඥාතින් මැරුණු එක ගැන වේදනාවෙන් මම කථා කරන්නේ. මගේ ඥාතින් මැරුණු නිසා නේ මම වේදනාවෙන් කථා කරන්නේ. ඔබතුමන්ලාගේ පාර්ශ්වයෙන් මැරුණු අයටත් ගෙවා ගන්න; දෙගොල්ලන්ටම ගෙවන්න. මම කියන්නේ ඒකයි. මම කියන්නේ ඔක්කෝටම ගෙවන්න කියලායි. දැන් ඔබතුමන්ලානේ ආණ්ඩුව අරගෙන තිබෙන්නේ. ඔබතුමන්ලාගේ නායකයා ආණ්ඩුව පිහිටුවා තිබෙනවා. ඔබතුමන්ලාගේ ජනාධිපතිවරයෙක් ඉන්නවා. ඉතින් ඔබතුමන්ලා ගෙවන්න, දෙපක්ෂයෙන්ම මැරුණු අයගේ පවුල්වලට ගෙවන්න. ඒක තමයි සුදුසුම දේ. ඒක තමයි මම යෝජනා කරන්නේ. ඝාතකයෝ අල්ලන්න, මරපු මිනිස්සු අල්ලන්න. මගේ යෝජනාව මම ඉදිරිපත් කළා.

ඊළඟට මම කථා කරන්න කැමැතියි, අපේ ධීවර ජනතාව ගැන. වර්තමාන අමාත්‍ය ගරු නලින්ද ජයතිස්ස මැතිතුමා පසුගිය දා එතුමාගේ කථාවකදී ප්‍රකාශ කළා, අද ගොවි ජනතාව හොඳ තත්ත්වයෙන් ඉන්නවා, ධීවරයන් වැල්ලේ ගැට ගහපු බෝට්ටු ඔක්කෝම දැන් රැකියාවට යනවා කියලා. මම මේ සම්බන්ධයෙන් සංඛ්‍යා දත්ත කිහිපයක් කියන්න කැමැතියි. 2023දී බෝට්ටු 3,000ක් ගැට ගැහුවා. දැන් මේ ඉවර වෙන්නේ 2024 අවුරුද්ද. තෙල් ප්‍රශ්නය නිසා බෝට්ටු රැකියාවට යන්නේ නැහැ. ඒ ගැන බහුදින ධීවර යාත්‍රා හිමියන්ගේ සංගමයෙන් විමසා බලන්න. ගරු ඇමතිතුමනි, ඒ බෝට්ටු 3,000ම තවම රැකියාවට යන්නේ නැහැ. දැන් රැකියාව නැතිව අවුරුදු එකහමාරක් ඒ බෝට්ටු එක තැන තිබෙනවා. දැන් ඒවායේ එන්ජින් upset වෙලා තිබෙනවා; බෝට්ටු කැඩිලා තිබෙනවා. ඒ කැඩුණු ඒවා දැන් හදන්න ඕනෑ, ඩීසල් ගහන්න ඕනෑ, රැකියාවට යවන්න නම්. මම යෝජනා කරන්නේ රුපියල් ලක්ෂ 50ක ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරලා ඒ බෝට්ටු 3,000 රැකියාවේ යවන්න කටයුතු කරන්න කියලායි. ඒ විතරක් නොවෙයි. රුපියල් 150ක තෙල් සහනාධාරයක් ලබා දෙනවා කියලාත් ජනාධිපතිතුමා කිව්වා. නමුත්, රුපියල් 150ක තෙල් සහනාධාරය වෙනුවට රුපියල් 25ක සහනාධාරයක් දීලා වැඩක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට තවත් විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ලංකාවේ වරායන් විසිදෙකේම තිබෙන මුහුදු යන බෝට්ටුවලට මාසයකට යන්නේ තෙල් ලීටර් ලක්ෂ 70යි. අන්න ඒ තෙල් ලීටර ලක්ෂ 70 වෙනුවෙන් තෙල් ලීටරයක් සඳහා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවෙන් රුපියල් 100ක සහනාධාරයක් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. ධීවර වරාය නීතිගත සංස්ථාවෙන්, රැකියාවේ යන බෝට්ටුවලට token එකක් මාර්ගයෙන් ඒ රුපියල් 100ක තෙල් සහනාධාරය ලබා දෙන්න පුළුවන්.

තෙල් ලීටර් ලක්ෂ 70යි යන්නේ බහුදින යාත්‍රා හයදහස් ගණනටම මාසයකට රැකියාවේ යන්න. ඒ අයට තෙල් සහනාධාරයක් ලබා දෙනවා නම්, මුළු රටේම ජනතාවට ලබා දෙන තෙල්වල මිල අඩු කරන්න රජයට අවශ්‍යතාවක් ඇති වෙන්නේ නැහැ. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව හරහා එය

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

ලබා දෙන්න පුළුවන් කියන එක මම ඔබතුමන්ලාට යෝජනාවක් විධියට ඉදිරිපත් කරනවා. ඒ ක්‍රමවේදය ක්‍රියාත්මක කළොත් බහුදින යාත්‍රා ටික යවා මේ රටට අවශ්‍ය මත්ස්‍ය සම්පත ලබා දෙන්න පුළුවන්.

රටට ආර්ථික වාසියක් උත්පාදනය කරන, විදේශ විනිමය ගෙනෙන වූනා කර්මාන්තය අද කඩා වැටී තිබෙන්නේ. එම කර්මාන්තය දියුණු කරන්න නම්, රුපියල් ලක්ෂ 50ක ණයක් බහුදින යාත්‍රා හිමියන්ට ලබා දීලා, බෝට්ටු රැකියාවේ යන්න රුපියල් 100ක තෙල් සහනාධාරයත් ලබා දෙන්න කියා අතුරු සම්මත ගිණුම සම්බන්ධ යෝජනාව පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී ඔබතුමන්ලාගෙන් මම ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න. මේ විවාදයේදී කියැවුණා, ගොවි ජනතාව වෙනුවෙන් අපේ රජය කිසි දෙයක් කර නැහැ කියලා. ඩී.එස්. සේනානායක මැතිතුමා තමයි මේ රටට නිදහස ලබාගෙන ගොවි ජනපද ඇති කරලා, කෘෂි කර්මාන්තය දියුණු කරලා ගොවීන්ට සහන ලබා දුන්නේ. ඒ වාගේම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ ගාමිණී දිසානායක මැතිතුමා තමයි ලුණුගම්වෙහෙර ව්‍යාපාරය ඇතුළු ව්‍යාපාර 7ක් නිර්මාණය කරලා ගොවීන්ට සහන ලබා දුන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක පමණ කාලයක් ලබා දෙන්න.

කඩා බිඳී ගිය වැව්, අමුණු නිසා අලාභ හානි සිදු වුණු ගොවි ජනතාවට වන්දි ගෙවනකොට මේ කාරණයත් ඉෂ්ට කරන්න කියා ඔබතුමන්ලාගෙන් මම ඉල්ලීමක් කරනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර 35,250ක පමණ පිදී තිබුණු ගොයමට ගිය කන්නයේ කංචන විජේසේකර හිටපු ඇමතිතුමා සමනල ජල ව්‍යාපෘතියෙන් වතුර ලබා නොදුන් නිසා -මහින්ද අමරවීර හිටපු කෘෂිකර්ම ඇමතිතුමාට වතුර ලබා ගන්න හැකියාවක් නොවුණු නිසා- ඒ මුළු ගොයමම විනාශයට පත් වුණා. ඒ ගොවීන් සියලුදෙනාටම වන්දි ලබා දෙන්නත් බැරි වුණා. ඒ අයගෙන් සුළු ප්‍රමාණයකට පමණයි වන්දි ලබා දීලා තිබෙන්නේ. එම නිසා ඒ වන්දි ලබා දීමේ වැඩ කටයුත්තත් ක්‍රියාත්මක කරන්න කියා මම මේ අවස්ථාවේදී ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් මගේ ස්තුතිය පුද කරනවා. මේ දෙපක්ෂයටම අයත් ජනතාවගේ මිය ගිය ඥාතීන් වෙනුවෙන් ඒ පවුල්වල අයට වන්දියක් ලබා දෙන්න කියලායි මම මනුෂ්‍යයෙක් හැටියට යෝජනා කළේ. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දම්මික පටබැඳි අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (சிரேஷ்ட பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (SNR. PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.*

[අ.භා. 2.35]

**ගරු දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon.Dammika Patabendi - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දසවැනි පාර්ලිමේන්තුව තුළ මගේ මංගල කථාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් පළමුව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මෙවර මැතිවරණයේදී ජාතික ජන බලවේගයේ අපට කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ඡන්ද 312,441ක් -සියයට 64.8කට ආසන්න ඡන්ද ප්‍රමාණයක්- ලබා දී අප කණ්ඩායම ජයග්‍රහණය කරවූ කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට ස්තුතිය පළ කරන්නත් මා මෙය අවස්ථාවක් කරගන්නවා.

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාව කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් මන්ත්‍රී ධුර 9න්, 7ක් ජාතික ජන බලවේගයට ලබා දීලා, ජාතික ජන බලවේගයට විශිෂ්ට ජයග්‍රහණයක් ලබා දීමට කටයුතු කළා. කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාගේම මුළු රටෙන්ම අප ලැබූ එම ජයග්‍රහණය ඉතා විශිෂ්ට ජයග්‍රහණයක් හැටියට සනිටුහන් වුණා. ඒ ජයග්‍රහණය සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුව තුළ විවිධ මත පළ කරනවා, ඒ ජයග්‍රහණය හෑල්ලුවට ලක් කිරීමට උත්සාහ කරනවා. හැබැයි, අපි කියන්න කැමැතියි, ඒ ජයග්‍රහණය එහෙම හෑල්ලුවට ලක් කරන්න පුළුවන් ජයග්‍රහණයක් නොවන බව. ඒ ජයග්‍රහණය මිනිස්සුන්ගේ කලකිරීම නිසා ලැබූ ජයග්‍රහණයක්. ඔව්, ඒ ජයග්‍රහණය මිනිස්සුන්ගේ කලකිරීම නිසා ලැබුණු ජයග්‍රහණයක් තමයි. මේ රට ගොඩනඟයි කියා අවුරුදු 76ක් තිස්සේ ජනතාව තම ඡන්දය ඒ වෙනුවෙන් පාවිච්චි කළත්, මේ රට බංකොලොත්භාවයට පත් කරපු, මේ රට විනාශයට පත් කරපු, මේ රට එකම බේදවාචකයක් බවට පත් කරපු ඒ දේශපාලන ක්‍රමය පිළිබඳව ඇති වුණු කලකිරීම නිසා ජනතාව අපට ලබා දීපු ජයග්‍රහණයක්, එය. ඒ විතරක් නොවෙයි, මේ රට විනාශ කළ ඒ ප්‍රභූ පාලන තන්ත්‍රය පිළිබඳව ඇති වුණු කලකිරීම නිසා ලබා දීපු ජයග්‍රහණයක්, ඒක. එම ජයග්‍රහණය මේ රටේ ජනතාව කලකිරීම නිසා ලබා දීපු ජයග්‍රහණයක් විතරක්ම නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ ජයග්‍රහණය නව බලාපොරොත්තු දල්වාගෙන, මේ රට බංකොලොත්භාවයෙන් මුදා ගන්න, මේ රටේ මේ බේදවාචකය අවසන් කිරීමේ බලාපොරොත්තුව සහිතව ලබා දීපු ජයග්‍රහණයක්. ඒ වාගේම, ඒ ජයග්‍රහණය සම්බන්ධයෙන් විවේචන කරන, ඒ

ජයග්‍රහණය හැල්ලුවට ලක් කරන්න උත්සාහ කරන අයට ජාතික ජන බලවේගය හැටියට අපි කියන්න කැමැතියි, මේ ජයග්‍රහණයේ වටිනාකම, ඒ අර්ථය හොඳින් තේරුම් අරගෙන තමයි අපි කටයුතු කරන්නේ කියන එක. අපි ඒ ජයග්‍රහණය නිසා ඔළුව උදුම්මා ගන්නා දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි. ඒ වාගේම ඒ ජයග්‍රහණය සම්බන්ධයෙන් උදන් අනමින්, පුරාජේරු දොඩමින් ඉන්න සූදානම් දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි. ඒ ජයග්‍රහණයට නිසි වටිනාකම ගෙන දෙන්න, ඒ ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්න තමයි අපි මේ රටේ පාලන බලය ලබාගෙන තිබෙන්නේ කියන පැහැදිලි කිරීම කරන්න කැමැතියි. ඒ ජයග්‍රහණය විසින් අපට ලබා දෙන පණිවුඩය කුමක්ද? ඒ ජයග්‍රහණය විසින් අපට ලබා දෙන පණිවුඩය තමයි, අවුරුදු 76ක් පුරා මේ රට විනාශයට පත් කරපු ඒ ප්‍රභූ පාලන තන්ත්‍රය ප්‍රතික්ෂේප කළාය කියන පණිවුඩය. ඒ විතරක් නොවෙයි, ඒ ප්‍රභූ පාලන තන්ත්‍රයට තවදුරටත් මේ රට විනාශ කරන්න, බේදවාචකයක් බවට පත් කරලා තිබෙන මේ රට තවදුරටත් පාලනය කරන්න ඉඩ දෙන්නේ නැහැ කියන පණිවුඩය තමයි ඒක ඇතුළේ ගැබ් වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. ඒ ජයග්‍රහණය ඇතුළේ තිබෙන අනෙක් පණිවුඩය තමයි, මේ රටේ ජනතාව මේ විනාශයට පත් කරපු රට ගොඩනැඟීම වෙනුවෙන් ජාතික ජන බලවේගය මත බලාපොරොත්තු තබා තිබෙනවා කියන එක. මේ රටේ දූ දරුවන්ගේ අනාගතය හා මේ රටේ අනාගතය නැවත ගොඩනැඟීම සඳහා බලාපොරොත්තුසහගතව ඒ කාර්යභාරය ජාතික ජන බලවේගය විධියට අප වෙත පවරා තිබෙනවා කියන අදහස තමයි ඒ තුළ ගැබ් වෙලා තිබෙන්නේ. එම නිසා ඒ වගකීම, අපි මත තබා තිබෙන බලාපොරොත්තුවේ ගැඹුර අපිට දැනෙනවා. අපි ඒක දන්නවා. ඒ නිසා මේ ලබා දුන් ජන වරම සමඟ සෙල්ලම් කරන්න අපි සූදානම් නැහැ. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන් කලබල වෙලා ඉන්නවා. අපේ පාලනය පත් වෙලා, මේ පාර්ලිමේන්තුව රැස් වෙලා තවම මාසයක්වත් ගත වුණේ නැහැ. හැබැයි, මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් කලබල වෙලා ඉන්නවා. ඒ ගොල්ලන් අපෙන් අහනවා, "කෝ, වැඩ පිළිවෙළ?" කියලා. අපි ඔවුන්ට කියනවා, අපි සූදානම්, අපි වගකීම්සහගත දේශපාලන ව්‍යාපාරයක් කියන එක. අපි ඉදිරිපත් කරපු, ඒ වාගේම ජනතාව අප මත තබා තිබෙන බලාපොරොත්තු ඉෂ්ට කරන්න අපි සූදානම්. අපි ඉතා වගකීමෙන් කියනවා, අපි ඒ භාරදූර කාර්යය භාරගෙන තිබෙන බව. අපි අනිවාර්යයෙන්ම ඒක ඉෂ්ට කරනවා, ඒ ගැන කිසිදු සැකයක් තබා ගන්න එපා කියන පණිවුඩයත් අප කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම වසර 76ක් තිස්සේ මේ රට පාලනය කරපු ඒ ප්‍රභූ පාලන තන්ත්‍රය මේ රටේ ජන ජීවිත, මේ රටේ සම්පත් විතරක් නොවෙයි, මේ රටේ පරිසරයත් විනාශ කරලා දැම්මා. දැන් මේ රටේ නව පාලනය හැටියට අපට වගකීමක් පැවරී තිබෙනවා. අපේ රටේ කඩා වට්ටපු ආර්ථිකයත්, ජන ජීවිතත්, ඒ වාගේම විනාශ කරපු පරිසර පද්ධතියත් නැවත ගොඩනැඟීමේ වගකීම අපට පැවරී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඉතිහාසයේ එතෙක් තිබුණු විශාලතම පරිසර හානිය සිදු කරනු ලැබුවේ, ඒ යටත් විජිත පාලකයන් විසින්. ඔවුන් මේ රටට ඇවිල්ලා වතු වගාව සඳහා මේ රටේ වන ගහනය ඉතා දැවැන්ත විධියට විනාශ කළා. ඒ වාගේම මං මාවත් වැනි යටිතල පහසුකම් ලබා ගැනීම සඳහා අපේ රටේ වන ගහනය විනාශ කළා. ඒක තමයි එතෙක් මේ රටේ පරිසර පද්ධතියට වෙච්ච විශාලතම හානිය.

නමුත්, ඊට පසුව, නිදහසින් පසුව පසුගිය අවුරුදු 76ක කාලය තුළ ඒ යටත් විජිත පාලකයින් අපේ රටේ පරිසරයට කළ හානියට වඩා දැවැන්ත හානියක් සිදු කරලා තිබෙනවා. ඒ යටත් විජිත පාලකයින්ට මේ පරිසරය විනාශ කරන්න ශත වර්ෂයකට වැඩි කාලයක් ගත වුණා. හැබැයි, ශත වර්ෂයකට වඩා අඩු කාලයක් තුළදී මේ රට පාලනය කරපු පාලකයෝ අපේ රටේ පරිසරය ඊට වඩා විනාශයකට ලක් කරලා තිබෙනවා. එක පැත්තකින් අපේ රටේ පරිසරය විනාශයට පත් කරලා තිබෙනවා. ඒ යටත් විජිත පාලකයින් අපේ රටේ වන ගහනය විනාශ කිරීම තුළ ඇති වෙච්ච අතුරු ඵල හැටියට තමයි පරිසරය විනාශ වුණේ. නමුත්, පසුගිය කාලයේ අපේ රටේ සමස්ත පරිසර පද්ධතියම ඉතා අවදානමකට ලක් වෙන තත්ත්වයකට පත් කරලා තිබෙනවා. වනසතුන්, ගහ කොළ, වායුව, ජලය මේ සියල්ල අද විනාශයේ අභිමුඛයට ගෙනැල්ලා දාලා තිබෙනවා.

අපිට මතකයි, එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ සිද්ධිය. ඒ හරහා සමුද්‍රීය පරිසරය විනාශ කරලා තිබෙනවා. ඒ වාගේම මේ රට තුළ අලි-මිනිස් ගැටුම් නිර්මාණය කරලා තිබෙනවා. අපේ රටේ ජලය දූෂණයට ලක් කරලා තිබෙනවා. මේ සියල්ල පරිසර විනාශයන් හැටියට අද අප අභිමුඛයේ තිබෙනවා. ඒ නිසා මෙන්න මේ සියල්ලට විසඳුම් සොයන්නට බල කෙරුණු තත්ත්වයක් තමයි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පරිසර විනාශය නැවැත්වීමටත්, මේ වෙලා තිබෙන විනාශය ආපසු හැරවීමටත්, ඒ වාගේම පරිසරය ආරක්ෂා කර ගැනීමටත්, මිනිසා සහ පරිසරය අතර නැති වෙලා තිබෙන සමතුලිතතාව නැවත ඇති කර ගැනීමටත් කටයුතු කිරීම අපට පැවරිලා තිබෙන වගකීමක්. අපි දන්නවා ඒක මොන තරම් අභියෝගාත්මක කාර්යභාරයක් ද කියලා. මිනිසා සහ පරිසරය අතර නැති වෙලා තිබෙන සමතුලිතභාවය නැවත ඇති කරලා මේ රටේ පරිසර පද්ධතිය ආරක්ෂා කරලා මේ රටේ වනජීවීන්ට, මිනිසාට, ඒ වාගේම සියලු පරිසර පද්ධතියට සමතුලිත පරිසරයක් හැදීම කියන එක ඉතාම අභියෝගාත්මක කාර්යයක්. නමුත්, කොතරම් අභියෝගයක් වුණත්, කොතරම් අභියෝගාත්මක කාර්යභාරයක් වුවත් මේ රටේ ජනතාව අපට ලබා දුන්න ඒ ජනවරමට ගරු කරමින් ඒ අභියෝගය ජය ගන්න ජාතික ජනබලවේගය හැටියට අපි සූදානම් කියන පණිවුඩය අපි මේ අවස්ථාවේදී ලබා දෙන්න ඕනෑ.

ඒ වාගේම අපේ රටේ පරිසරය ආරක්ෂා කරමින් ජන ජීවිතය හා පරිසරය අතර ගැටුම සමතුලිතතාවට ගෙන ඒමේ වගකීම තිබෙන්නේ අපේ රටේ පරිසර අමාත්‍යාංශයට. ඒත් පසුගිය කාලය මුළුල්ලේ මොකක්ද සිද්ධ වුණේ? අපේ රටේ පරිසර අමාත්‍යාංශය ඒ මුඛ්‍ය අරමුණෙන් එළියට අරගෙන ගිහිල්ලා, ඒ ප්‍රධාන අරමුණෙන් බැහැරව අරගෙන ගිහිල්ලා එතැන මිනිස්සුන්ට ලාභ උපයන්න පුළුවන්, පාලකයන්ට ලාභ උපයන්න පුළුවන් ජාවාරම්කාරී තැනක් බවට පරිවර්තනය කරන්න මේ පාලකයෝ උත්සාහ කළා. පරිසරය රැක ගැනීමේදී අපි විශ්වාස කරනවා ඒ පරිසරයට අදාළ ආයතන එක තැනක එක පද්ධතියක් හැටියට ක්‍රියාත්මක වෙන්න ඕනෑ බව. හැබැයි, පසුගිය කාලයේ මේ පාලකයෝ මොකක්ද කළේ? ඒගොල්ලන්ගේ ජාවාරම්කාර වුවමනාවන් වෙනුවෙන් පරිසර අමාත්‍යාංශය යටතේ එකට තිබිය යුතු, එක පද්ධතියක් හැටියට ක්‍රියා කළ යුතු ආයතන සී සී කඩ කරලා පරිසර අමාත්‍යාංශයත්, පරිසරයත් ඒ ගොල්ලන්ගේ පටු ජාවාරම්කාරී වුවමනා වෙනුවෙන් පාවිච්චි කරන තැනක් බවට පත් කරලා තිබුණා.

ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ඇවිල්ලා ගත්ත පළමුවෙනි පියවර තමයි පරිසර අමාත්‍යාංශය හැටියට ඒ සී සී කඩ කර තිබූ, විසිරිලා තිබුණු ඒ ආයතන, එක පද්ධතියක් ඇතුළේ ක්‍රියාත්මක විය යුතු ඒ ආයතන නැවත පරිසර අමාත්‍යාංශය යටතට අරගැනීම. දැන් අපි සූදානම්, අපේ රටේ ඒ විනාශ කර දාලා තිබෙන පරිසරය නැවත එක තැනකින් මෙහෙය වීමේ; මේ පරිසරය ආරක්ෂා කිරීමේ; වනසතුන් සහ මිනිසා අතර සමතුලිතතාව ගොඩනැඟීමේ කටයුතු භාර ගන්න.

[ගරු දම්මික පටබැඳි මහතා]

ඒ වාගේම දැන් විපක්ෂයේ මන්ත්‍රීවරු හඬ නැඟුවා, "කෝ, ජාතික ජන බලවේගය පත්වෙලා ඇවිල්ලා ඉතිහාසය ගැන කථා කරනවා විතරයි, වෙච්ච වැරදි ගැන කථා කරනවා විතරයි, 76 අවුරුද්ද ගැන කථා කරනවා විතරයි, කරන වැඩ ගැන කියන්නේ නැහැ" කියලා. විපක්ෂයේ මන්ත්‍රීවරුනි, මේ පාර්ලිමේන්තුව පත් වෙලා තවම මාසයකටත් වඩා අඩු කාලයක් ගතවෙලා තිබෙන්නේ. හැබැයි, ජාතික ජන බලවේගයට ලබා දුන් ජන වරම තුළ මේ විනාශය ආපසු හැරවීමේ වගකීම ඉෂ්ට කරන්න අපි වැඩ පටන් අරගෙන තිබෙනවා. පරිසර අමාත්‍යාංශය හැටියට අපි ගත් පළමු ක්‍රියාමාර්ගය තමයි, විසිරිලා තිබුණු; සී සී කඩ කර දමා තිබුණු, පරිසර අමාත්‍යාංශය යටතේ එකට එක්ව කටයුතු කළ යුතුව තිබුණු ආයතන ටික එකම පද්ධතියක් තුළට අරගෙන ආපු එක. ඔබතුමන්ලාට පෙනිලා නැත්නම් බලන්න, මෙන්න අපි වැඩ පටන් අරගෙන තිබෙනවා, මේ විනාශය ආපසු හැරවීමේ කටයුත්ත අපි පටන් අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ජාතික ජන බලවේගය හැටියට අපි "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන වැඩ පිළිවෙළ ඉදිරිපත් කළා. අපේ පරිසර ප්‍රතිපත්තිය පිළිබඳව එම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 48 සිට 56 දක්වා සඳහන් වෙනවා. මෙන්න මේ වැඩ පිළිවෙළ සඳහා තමයි අපට ජන වරමක් ලැබී තිබෙන්නේ. ඒ වාගේම ජාතික ජන බලවේගයේ වැඩ පිළිවෙළේ අපි මූලික ක්‍රියාමාර්ග තුනක් හඳුනාගෙන තිබෙනවා. එයින් එකක් තමයි, ග්‍රාමීය දුප්පත්භාවය දුරලීම. ඊළඟට, digitalization ක්‍රියාවලිය. ඒ වාගේම තමයි "Clean Sri Lanka" කියන වැඩසටහන. මේ ප්‍රධාන වැඩසටහන් තුනෙන් දෙකක්ම, ඒ කියන්නේ digitalization සහ "Clean Sri Lanka" කියන වැඩසටහන් දෙකම පරිසරය හා සම්බන්ධ වැඩසටහන් දෙකක්. එම නිසා ජාතික ජන බලවේගය හැටියට අපි මේ රටේ පරිසරය යථාවත් කරන්න, සමුද්‍රය, ජලය, පස, වනසතුන්, ඒ වාගේම වායුගෝලය ඇතුළු සමස්ත පද්ධතියම යථාවත් කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

අපට ලැබී තිබෙන ජන වරම විශිෂ්ට ජන වරමක් කියන එක මම නැවත වතාවක් ඔබට සහතික කරන්න කැමැතියි. ඒ ජන වරම ඇතුළේ තිබෙන්නේ මේ රටේ සුවහසක් ජනතාවගේ හෘදය සාක්ෂියයි. අපි ඒ හෘදය සාක්ෂිය සමඟ සෙල්ලම් කරන්න සූදානම් නැහැ. ඒ නිසා අපි නැවත වතාවක් සහතික කරලා කියනවා, විනාශ කර තිබෙන මේ රට අපි ආපසු හරවනවා, විනාශ කර තිබෙන අපේ රටේ පරිසරය අපි නැවත ගොඩනඟනවා කියන එක. මේ රට ජීවත් වෙන්න පහසු, ඒ වාගේම ලස්සන ජීවිතයක් ගතකරන්න පුළුවන් තැනක් බවට පත් කරනවා කියන ඒ සහතිකය දෙමින්, මේ දසවැනි පාර්ලිමේන්තුවේ සභාව ඇමතීමට මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් නැවත වතාවක් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு பிரதி அமைச்சர்)

(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ මට විශේෂ ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මම ඊයේත් මේ ගැටලුව පිළිබඳව කථා කළා. මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන ආර්ථික වශයෙන් ප්‍රධාන මධ්‍යස්ථාන දෙකක් තමයි පැල්වත්ත සීනි සමාගම සහ සෙවනගල සීනි සමාගම. එම සමාගම් දෙකම ලංකා සීනි සමාගමට අයත් සමාගම් දෙකක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ ගරු ඇමතිතුමාත් සභාවේ සිටින නිසා විශේෂයෙන් මෙන්න මේ කාරණය ගැන දැන ගන්න කැමැතියි. පැල්වත්ත සීනි සමාගමේ මේ වෙනකොට විකුණා ගන්න බැරි සීනි මෙට්‍රික් ටොන් 23,000කුත්, ඒ වාගේම නිෂ්පාදනය කරලා ස්ථාවර තත්ත්වයට පත් කර ගබඩා කර තිබෙන එතනෝල් ලීටර් මිලියනයකට වැඩි ප්‍රමාණයකුත්, ඒ වාගේම සෙවනගල සමාගම සතුව යම් ප්‍රමාණයකුත් තිබෙනවා. මේවා නිසා දැන් පැල්වත්ත, සෙවනගල යන සමාගම් දෙකම අර්බුදයකට ගිහිල්ලා, ගැටලු ගණනාවක් මතුවෙලා, ඊයේ දවසේ උද්ඝෝෂණ පවා ක්‍රියාත්මක වුණා. එම නිසා අද වෙනකොට ඒ සම්බන්ධයෙන් තීන්දු තීරණ අරගෙන තිබෙනවාද කියලා මම විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Sunil Handunnetti -Minister of Industry and Entrepreneurship Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මොහොතක් දෙන්න ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න. මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ කාරණය මතු කිරීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම එතැන තිබෙන ප්‍රශ්නය මෙකයි. දැන් අපට ඒ කර්මාන්තශාලා කටයුතු පවත්වාගෙන යන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. හේතුව තමයි, ලංකාවට ගෙන්වන සුදු සීනිවලින් VAT එක අය කරන්නේ නැහැ. නමුත් ලංකාවේ නිෂ්පාදනය කරන දුඹුරු සීනිවලට VAT එක සියයට 18ක් අය කරනවා. ඒ VAT එකට තවත් සියයට 2.5කුත් එකතු වෙනවා. එතකොට සියයට 20ක් පමණ එකතු කරලා තමයි අපට වෙළෙඳ පොළට දුඹුරු සීනි නිකුත් කරන්න සිදු වෙන්නේ. දැන් කර්මාන්තශාලාවෙන් එළියට එනකොටම දුඹුරු සීනි කිලෝවක් රුපියල් 300යි. හැබැයි, වෙළෙඳ පොළේ සුදු සීනි කිලෝවක් රුපියල් 220යි. සාමාන්‍ය ජනතාව අතර මතයක් තිබෙනවා, සුදු සීනි හොඳයි, දුඹුරු සීනි නරකයි කියලා. නමුත්, ඇත්ත ඒකේ අනෙක් පැත්ත. ඒ නිසා ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ලබන සතියේ කැබිනට් මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම මඟින් ඉල්ලීමක් කරන්න මම බලාපොරොත්තු වෙනවා, දුඹුරු සීනිවලින් අය කරන VAT එක ඉවත් කර දෙන්න කියලා. දුඹුරු සීනිවලට පනවා තිබෙන VAT එක ඉවත් කරලා දුන්නොත් අපට එක මට්ටමින් තරග කරන්න පුළුවන්. එවිට මිලෙහි වෙනසක් ඇති වෙන්නේ නැහැ. එතකොට සාධාරණ මිලට දුඹුරු සීනි විකුණන්න අපට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ලංකාවේ සීනි අවශ්‍යතාව වන්නේ, මෙට්‍රික් ටොන් 130,000යි. අපට දැනට තිබෙන සීනි සමාගම් තුනෙන්ම සීනි නිෂ්පාදනය කරන්න පුළුවන් මෙට්‍රික් ටොන් 70,000ක්. ඊට අමතර ප්‍රමාණය තමයි අප පිටරටින් ගෙන්වා ගන්න ඕනෑ. නමුත්, දැන් එහි අනෙක් පැත්ත වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය මෙකයි. දුඹුරු සීනි අත්‍යවශ්‍ය නොවන භාණ්ඩයක් බවට වර්ගීකරණය කරලා ලංකාවට ගෙන්වන සුදු සීනි අත්‍යවශ්‍ය භාණ්ඩයක් කරලා තිබෙනවා. ලංකාවේ නිෂ්පාදනය කරන එක අත්‍යවශ්‍ය නොවන භාණ්ඩයක් කරලා තිබෙනවා; ලංකාවට ගෙන්වන එක අත්‍යවශ්‍ය භාණ්ඩයක් කරලා තිබෙනවා. විශේෂ වරප්‍රසාද දීලා තිබෙන්නේ අර සීනි බදු වංචා කරපු කට්ටියට. ඒ කට්ටියටයි සහන දීලා තිබෙන්නේ. ඒක තමයි මේ සිදු වෙලා තිබෙන්නේ. ඉතින්, මේක නිවැරදි කරන්න ඕනෑ. මේක නිවැරදි කරන කල් මේ ගැටලුව

විසඳෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒ සඳහා ඔබතුමාත් මැදිහත් වෙන්න කියා මම ඉල්ලා සිටිනවා. අපි ඒ සේවකයන්ගේ ප්‍රශ්නය ඉතා ඉක්මනින් විසඳනවා. ඒ ප්‍රශ්නය විසඳන්න කලින් අපි තිබෙන ඒ තොගය අවසන් කරන්න ඕනෑ. අපේ stocks දැන් හිර වෙලා තිබෙන්නේ. වෙළෙඳ පොළට ඒ තොගය නිකුත් කර ගන්න නම් අනිවාර්යයෙන් අපට මේ කියපු VAT සහනය කැබිනට් මණ්ඩලයට දාලා අනුමත කර ගන්න වෙනවා. අපි එය කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ ප්‍රශ්නය ආණ්ඩුව අභ්‍යන්තරයේ විසඳා ගන්න ඕනෑ ප්‍රශ්නයක්. මේක පාර්ලිමේන්තුවේ අහන්න ඕනෑ කාරණයක් නොවෙයි. කෙසේ වෙතත් ඒ කාරණය මතු කිරීම ගැන අපි ස්තුතිවන්ත වෙනවා. දුඹුරු සීනි අපේ රටේ නිෂ්පාදනය කර ගන්න ඕනෑ තරම් හැකියාව තිබෙනවා. පසුගිය කාලයේ මේ ප්‍රශ්නය විසඳිලා තිබිලායි දැන් නැවත මතු වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලාම කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ගෙනැල්ලා මේ ප්‍රශ්නය අවසන් කර ගන්න. මොකද, මේවා පාර්ලිමේන්තුව ඇතුළේ කථා කරන ඒවා නොවෙයි. අතැන ඉඳන් නියෝජ්‍ය ඇමතිතුමා කථා කරනවා. ඒ පැත්තේම ඉඳන් ඇමතිතුමා උත්තර දෙනවා. මට නම් තේරෙන්නේ නැහැ ඇයි මේවා මේ සභාව ඇතුළේ කථා කරන්නේ කියලා. මේ කාරණය එළියට කියා ගන්න ඕනෑ නම් ඒක වෙනම කාරණයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමායි කැබිනට් ඇමතිතුමා. කැබිනට් ඇමතිතුමා හැටියට එතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි ඒ ආයතන ටික තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාට කරන්න තිබෙන්නේ VAT එක අයින් කරන යෝජනාව වහාම කැබිනට් මණ්ඩලයට දාලා අනුමත කර ගන්නා එකයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔබතුමා නැඟිටලා ඒකට ලකුණු දාගන්න හදන්නේ මොකද කියලායි මම බැලුවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒ කාරණාව ගැන මෙතැන කථා කරලා වැඩක් නැහැ. එල්-බෝඩ් සම්බන්ධ ප්‍රශ්නයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.56]

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ දසවැනි පාර්ලිමේන්තුවේ මංගල කථාව කරන්න මට අවස්ථාව ලැබීම පිළිබඳව මම බෙහෙවින්ම සතුටු වෙනවා. විශේෂයෙන් කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව මා කෙරෙහි බලාපොරොත්තු තැබීම, මා කෙරෙහි විශ්වාසය තැබීම පිළිබඳව මට ලොකු සතුටක් ඇති වෙනවා. ආණ්ඩු පක්ෂය ඉතා ශක්තිමත් වුණා. මොකද, ඔබතුමන්ලා ජනගත කළා, 225දෙනාම වංචනිකයෝ; 225දෙනාම සමාජ දූෂකයෝ කියලා. ඒ කථාව ජනතාව පිළිගත්තා. ඒකේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි අද ආණ්ඩු පක්ෂයේ ඔබතුමන්ලාට තුනෙන් දෙකකටත් එහා ගිය බලයක් ලැබිලා තිබෙන්නේ. අපි සුනාමියකට අහු වුණා වාගේ.

මම දේශපාලනයට අලුත් නැහැ. මම ප්‍රාදේශීය සභාවේ අවුරුදු 10ක්, පළාත් සභාවේ අවුරුදු 5ක් සේවය කරලා තිබෙනවා. මම පාර්ලිමේන්තුවට තරග කළ තුන්වැනි වතාව මේක. අපි උඩුගම් බලා පීනුවේ. හැබැයි, මම තෝරා ගත්තු මාවත නිවැරදියි කියලා තේරුණේ මේ මැතිවරණ ප්‍රතිඵලයෙන් පසුවයි.

මම හැම දාම තෝරා ගත්තේ ප්‍රජා සේවාවයි. මට පෞද්ගලිකව කරන්න පුළුවන් දේවල් මම දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් කළා. එහි ප්‍රතිඵලය වුණේ කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව මාව මෙවර පාර්ලිමේන්තුවට ඉතා ඉහළින් තෝරා පත් කිරීමයි. ඒ සම්බන්ධයෙන් මා විශේෂයෙන් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ ජනතාවගේ -ඒ සිංහල, මුස්ලිම්, දෙමළ සියලු ජනතාවගේ- පොදු අපේක්ෂකයා බවට මාව පත් වුණාදෝ කියලා මට හිතෙනවා. ද්‍රවිඩ, මුස්ලිම් ජනතාව 150,000ක්, සිංහල ජනතාව 1,250,000ක් අතරින් එකම පොදු අපේක්ෂකයා විධියට තමයි මාව තේරී පත් වුණේ. "සුළු ජාතීන්" කිව්වාට ඒ අය එහෙම වර්ග කරන්න ඕනෑ නැහැ. ඒ අය සුළු ජාතීන් නොවෙයි. ඒ දෙමළ ජාතිකයන් සහ මුස්ලිම් ජාතිකයන් මාව විශ්වාස කළා; සිංහල ජාතිකයන් මාව විශ්වාස කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි මෙවර අභියෝගය පිළිගෙන මා පාර්ලිමේන්තුවට පැමිණියේ.

මම විශේෂයෙන් ආණ්ඩු පක්ෂයට කියනවා, ඔබතුමන්ලා ගන්නා තීන්දු තීරණවලට එකඟ වෙන්න පුළුවන් වෙලාවට මම එකඟ වෙන බව. අපේ විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ඉතා හොඳ යෝජනාවක් කළා. ඒ යෝජනාව ගැන ආණ්ඩු පක්ෂයේ ප්‍රබලයෝ කිසිම අදහසක් දැක්වූයේ නැති බව මම අද ඇස් දෙකෙන්ම දැක්කා. මොකක්ද, එතුමා කරපු යෝජනාව? "අපි IMF මර උගුලින් මිදෙමු, අපි මේක කල් දමා ගනිමු, එහෙම නැත්නම් අපි මේකට අඩු පොලියක් ඉල්ලලා grace period එක වැඩි කරවා ගනිමු, මේ ණය මුදල ගෙවන එක අපි 2033 වර්ෂය වනකල් කල් දමා ගනිමු" කියලායි කිව්වේ. එතුමා එහෙම කිව්වාට පසුව ආණ්ඩු පක්ෂයේ එක් කෙනෙක්වත් ඒ ගැන අදහස් ප්‍රකාශ කළේ නැහැ.

මම දන්නවා, තමුන්නාන්සේලාත් අපිත් සියලුදෙනාම ලොකු අභියෝගයක් භාරගෙනයි ඉන්නේ කියලා. මේ රටේ පොදු සතුරා අපි නොවෙයි, තමුන්නාන්සේලාත් නොවෙයි. අපි මේ රටේ පොදු සතුරා තෝරාගෙන ඉවරයි. මේ රටේ බංකොලොත් බව තමයි පොදු සතුරා. මේ රටේ පොදු සතුරා කඩා වැටුණු ආර්ථිකයයි කියලා හඳුන්වන්න අපට පුළුවන්. අපි මේ මර උගුලෙන් බේරෙන්න ඕනෑ. අනෙක් පැත්තෙන් අපි පොදු රකුසාටත් හසු වෙලා ඉවරයි. කවුද, පොදු රකුසා? IMF එක. IMF එක අපව දවසින් දවස කට ඇරලා කට ඇතුළට දාගන්න හදන වෙලාවේ අපි සියලුදෙනාම එකතු වෙන්න ඕනෑ. එකතු වෙන්න ඕනෑ කියන්නේ වරප්‍රසාද ගන්න නොවෙයි.

මම දැක්කා, ඊයේ ජනාධිපතිතුමා හොඳ ප්‍රකාශයක් කළා. හැබැයි ඒවා ක්‍රියාවෙන් ඔප්පු කරන්න ඕනෑ. මීට පෙර ඇමතිවරුන්ට දුන් සුඛෝපභෝගී නිල නිවාස, කුලියට ගත්තු ගොඩනැඟිලිවල පවත්වාගෙන යන දෙපාර්තමේන්තුවලට, ආයතනවලට භාර දෙනවා, එහෙම නැත්නම් සංචාරක කලාප බවට පත් කරනවා, ජනාධිපති මන්දිර සංචාරක බංගලා බවට පත් කරනවා; ඇමතිවරු ඒ කැප කිරීම කරලා මාදිවෙල මන්ත්‍රී නිවාසවලට යනවා කිව්වා. ඒවා කළොත් ඉතාම හොඳයි. අපි එය

[ගරු ජගත් විතාන මහතා]

අත්පොළසන් දීලා පිළිගන්නවා. ලියාගන්න මගේ නම, මම කවදාවත් මාලිමාව ආණ්ඩුවකට එන්නේ නැහැ. ඒ කියන්නේ ජනතා විමුක්ති පෙරමුණත් එක්ක එකතු වෙන්න අපි කැමැති නැහැ. මොකද, ඔය මාලිමාව කියන්නේ එදා ජනතා විමුක්ති පෙරමුණම තමයි. ලියාගන්න උඩින්ම මගේ නම. ඔබතුමන්ලා කරන කැප කිරීම්වලට සියලුම ආකාරයෙන් කැප කිරීම් කරන්න මම සූදානම්. මොකද, මම ජීවිතය ජයග්‍රහණය කරපු මිනිහෙක්. මට ලබා ගන්න ඉලක්ක නැහැ. තරහා වෙන්න එපා මෙහෙම කිව්වාට. පෞද්ගලිකව මම ලබාගත්තු ජයග්‍රහණ ගොඩක් තිබෙනවා. ඒ ජයග්‍රහණ එක්ක මට ඉතුරු වෙලා තිබෙන්නේ මැරෙන එක විතරයි. මැරෙන්න ඉස්සර වෙලා මේ යුතුකම කරන්න ඕනෑ මේ රට වෙනුවෙන්. ඒකයි මම තුන් වතාවක් උත්සාහ කරලා මේ වතාවේ පාර්ලිමේන්තුවට ආවේ. අපට පවුල්වාදයක් තිබුණේ නැහැ. අපට පවුල් දේශපාලනයක් තිබුණේ නැහැ. පරම්පරාවෙන් පරම්පරාවට එන දේශපාලනයක් අපට උරුම වෙලා තිබුණේ නැහැ. මම කොහෙන් හෝ මතු වෙලා ඇවිත් දක්ෂකමෙන් එළියට ආපු ජනතා නියෝජිතයෙක්. ඒ නිසා මම තමුන්නාන්සේලාට කියනවා, තමුන්නාන්සේලා කරන හොඳ වැඩවලදී අපව දායක කර ගන්න කියලා. මොකද, මේ වෙලාවේ මම සතුටු වෙනවා මේ ප්‍රතිඵලය පිළිබඳව. මීට ඉස්සෙල්ලා පාර්ලිමේන්තුවල අපි දැක්කා, මේ පුටුවේ ඉඳලා අනෙක් පැත්තට රුපියල් කෝටි ගණනකට මාරු වෙනවා, මේ පුටුවේ ඉඳලා අනෙක් පැත්තට වරප්‍රසාදවලට මාරු වෙනවා. දැන් ඔබතුමන්ලාට ඒවා ඕනෑ නැහැ. දැන් ජනතාව හරිම බුද්ධිමත්. ජනතාව ඔබතුමන්ලාට දීලා තිබෙනවා සෑහෙන වරමක්. ආයෙත් කිසිම කෙනෙක් ගන්න ඕනෑ නැහැ; සැලුන් දොර අරින්න ඕනෑ නැහැ. අපට තිබෙන්නේ ඔබතුමන්ලා එක්ක එකතු වෙලා කටයුතු කරගෙන යන්නයි. ඔය පැත්තේ කෙනෙකු ප්‍රකාශ කරනවා මම දැක්කා, අපි අවුරුදු දෙකකින් ආණ්ඩුව ගන්න හදනවා කියලා. අපට තුන් හිතකවත් එහෙම සිතුවිල්ලක් නැහැ. අපට ඕනෑ මේ රට බේරා ගන්නයි. අපි පොදු සතුරාගෙන් මිදෙන්න ඕනෑ, පොදු රකුසාගෙන් මිදෙන්න ඕනෑ. අන්න ඒක තේරුම් අරගෙන අපි වැඩ ටික කරමු.

ඊයේ, පෙරේදා මම දැකපු දෙයක් කියන්න ඕනෑ. මට එපා වුණා. මම ගෙදර ගිහිල්ලාත් කල්පනා කළා. අන්න අර පැත්තේ අසුන් ගෙන ඉන්න ලස්සන නෝනා කෙනෙක් -මන්ත්‍රීවරියක්- විපක්ෂයට ඇති වෙන්න බැන්නා. මම බැලුවා, මොකද මේ කියලා. ඔයගොල්ලන්ට ඇති වෙන්න බලයක් දීලා තිබෙනවා. අපට බණින්න එපා. අපි අලුත් ගමනක් යමු. මම එතුමියගේ නම දන්නේ නැහැ. ඊයේ තමයි එතුමිය කථා කළේ. ඕනෑ නම් මම නම හොයලා කියන්නම්. එහෙම කථා කරන්න එපා. "ලස්සන නෝනා කෙනෙක්" කිව්වාම, හිතා ගන්නකෝ. TV එකෙන් දැක්කාට පසුව මට තේරුණා ලස්සන නෝනා කෙනෙක් නේද කියලා. අපට එහෙම බණින්න එපා.

මට වෙන් කළ කාලය අවසාන නිසා මම මූලාසනයට එකඟ වෙනවා. මතක තබා ගන්න, ඔයගොල්ලන්ගේ ලැයිස්තුවේ උඩින් ලියා තබාගන්න, වරප්‍රසාද කිසි දෙයක් නොඉල්ලන මන්ත්‍රීවරයෙක් ඉන්නවා කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.02]

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම, ජාතික ජන බලවේගයට විශාල ජනවරමක් ලබා දීපු මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හා මැලේ කියන සියලු ජනතාවට අපේ ප්‍රණාමය පුද කරනවා. විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට අපේ ප්‍රණාමය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ නව රජයට පැහැදිලි ප්‍රතිපත්තියක් තිබෙනවා. පැහැදිලි වැඩ පිළිවෙළක් තිබෙනවා. අපි වැඩ පිළිවෙළක් නැතුව, ප්‍රතිපත්තියක් නැතුව ඉබාගාතේ යන ගමනක් නොවෙයි, මේක. කවුරු හරි හිතනවා නම් කණාෂොට්වලින් තමයි ආණ්ඩුව ගෙන යන්නේ කියලා, එහෙම නොවෙයි. අපි ඉතා පැහැදිලි ප්‍රතිපත්තියක් සම්පාදනය කර ගත්තා. එම ප්‍රතිපත්තිය අපි ජනතාව වෙත ඉදිරිපත් කළා. මේ රටේ සාතිශය බහුතර ජනතාවක් ඒ ප්‍රතිපත්තිය අනුමත කළා. ඒ අනුව තමයි පසුගිය ජනාධිපතිවරණයේදී අපේ පක්ෂයේ නායක අනුර කුමාර දිසානායක මේ රටේ ජනාධිපතිවරයා බවට පත් කළේ.

ඊට පසුව අපි තුන්දෙනෙකුන්ගෙන් යුක්ත අමාත්‍ය මණ්ඩලයක් මගින් රට මෙහෙයවුවා. ලංකා ඉතිහාසයේ පළමු වතාවට පුංචිම කැබිනට් මණ්ඩලයකින් රටක් පාලනය කළා. ඒ කාලය තුළ මේ රටේ ජනතාවට අප කෙරෙහි තිබූ විශ්වාසය තවත් වැඩි වුණා. ඒ කෙටි කාලය තුළ අපි රටේ දේශපාලන සංස්කෘතිය තුළ ඇති කරපු වෙනස්කම්, ආර්ථිකය තුළ අපි ඇති කරන්න පටන් ගත්ත වෙනස්කම් පිළිබඳව මේ රටේ ජනතාවගේ විශ්වාසය තවත් වැඩි වුණා; තවත් තහවුරු වුණා. ඒ අනුව තමයි ජනාධිපතිවරණයටත් වඩා වැඩි ජනවරමක් පාර්ලිමේන්තු මැතිවරණයේදී අපට ලබා දුන්නේ.

අපි දිගු කාලීන උපාය මාර්ගික ප්‍රතිපත්තියක්, වැඩ පිළිවෙළක් අනුව තමයි රට පාලනය කරන්න භාර ගත්තේ. අපට විශාල වගකීමක් තිබෙනවා. එම වගකීම ඒ බරින්ම ඉටු කරන්න අපි කවුරුත් බැඳිලා ඉන්නවා. අපේ දිගු කාලීන ආර්ථික, දේශපාලන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරද්දී ඒ සඳහා අවශ්‍ය නෛතික රාමුව අපි සකස් කර ගන්න ඕනෑ. ඒ නෛතික රාමුව සකස් කර ගන්න තමයි පාර්ලිමේන්තු ක්‍රියාදාමය තුළ යම් යම් කෙටි කාලීන ක්‍රියා මාර්ග ගන්නේ. ඒකේ පළමු පියවර තමයි ඊයේ දවස තුළ ඉදිරිපත් කරපු අතුරු සම්මත ගිණුම. අතුරු සම්මත ගිණුමක අවශ්‍යතාව පැන නගින්නේ, අපි කවුරුත් දන්නා විධියට ඉදිරි වසර සඳහා වූ අය වැය යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැති නිසාත්, එවැනි අය වැයක් සම්මත වෙලා නැති නිසාත්. අය වැයක් සම්මත කර ගන්න පුළුවන් කාල රාමුවක් අපට තිබුණේ නැහැ. ඒ නිසා තමයි දෛනික වියදම් පවත්වාගෙන යෑම සඳහා වන අතුරු සම්මත ගිණුම කෙටි කාලයක් සඳහා අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ අතුරු සම්මත ගිණුමේ දිගු කාලීන උපාය මාර්ගික ක්‍රියා මාර්ග නැහැ. ඒක ඇත්ත. එහෙම ඇතුළත් වෙන්නෙත් නැහැ. මීට කලින් අවස්ථා ගණනාවකදී අතුරු සම්මත ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ කිසිවක එහෙම තිබුණේ නැහැ. එහෙම තිබෙන්නත් බැහැ. ලබන වසර සඳහා අපි ඉදිරිපත් කරන අය වැයේදී අපේ දිගු කාලීන ආර්ථික උපාය මාර්ගයේ පළමු වසර සඳහා වෙච්ච වැඩ පිළිවෙළ අපි අනිවාර්යයෙන් ඉදිරිපත් කරනවා. මේ රටේ ජනතාවට අපි එදා ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනය මත පදනම් වෙච්ච පළමු අය

වැය ප්‍රකාශනය ලබන අවුරුද්ද ආරම්භයේදී ඉදිරිපත් කරලා, පාර්ලිමේන්තුවේ සම්මත කරගෙන, ඒ නෛතික රාමුව නිවැරදිව ඉටු කර ගත්තාට පස්සේ අපි ඉදිරියට යනවා.

මේ දිගු කාලීන වැඩ පිළිවෙළට අදාළව ගමන යද්දී කෙටි කාලීන ක්‍රියා මාර්ග කිහිපයක් තිබෙනවා. ඒ වාගේම මේ වනකොට ගත්ත ක්‍රියා මාර්ග කිහිපයකුත් තිබෙනවා. ඉන් එකක් තමයි IMF වැඩසටහන. අපි කැමැති වුණත්, අකමැති වුණත් IMF වැඩසටහන දැන් යම්තාක් දුරට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අපි බලය ගන්න අවස්ථාවේදීත් IMF වැඩසටහන යම් දුරකට ක්‍රියාත්මකව තිබුණා. ඉන් යෝජනා කර තිබුණු ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යම් දුරකට ක්‍රියාත්මක වෙලා තිබුණා. විශේෂයෙන්ම අද උදේ මතු කරපු, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ බොහෝ කටයුතු අවසන් වෙලා තිබුණේ. අපි භාර ගන්නකොට එහි අවසන් අදියරට ඇවිත් තිබුණේ. නමුත් එහි යම් යම් අඩු පාඩු තිබෙන්න පුළුවන්. ඊට විකල්ප වශයෙන් වෙනත් යෝජනා තිබෙන්න පුළුවන්.

ඊට විකල්ප වෙච්ච යෝජනා නැවත සාකච්ඡා කරලා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡාව තවත් දිග් ගස්සන්න අපට හැකියාවක් නැහැ. එහෙම වුණොත් මේ ක්‍රියාවලිය තවත් පස්සට යනවා. IMF වැඩසටහන තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ රටක් විධියට මුහුණ දීපු මේ ආර්ථික අර්බුදය කළමනාකරණය කර ගන්නයි. ඒ කළමනාකරණ ක්‍රියාවලිය තමයි මේකෙන් ඇත්තටම සිද්ධ වෙන්නේ. දිගු කාලීනව ආර්ථිකය ගොඩනගන්න නම්, නිෂ්පාදනය මත පදනම් වෙච්ච ආර්ථික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි. අපි ඒ දැක්මේ ඉන්නවා. අපට ඒක හොඳට තේරෙනවා. IMF වැඩසටහන තුළ පුළුවන් වෙන්නේ මුහුණ දීලා තිබෙන මේ crisis එක manage කර ගන්න පමණයි. ඒ crisis එක manage කර ගන්න අපි ඒ අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා. එතැනදී විපක්ෂයෙන් යෝජනා කරනවා, 12වෙනි දා අත්සන් කිරීමට නියමිත ඒ ගිවිසුම අත්සන් කිරීමට පෙරාතුව නැවත එය සංශෝධනය කරන්න කියලා. නැහැ, එහෙම දෙයක් කරන්න හැකියාවක් නැහැ. වගකීමෙන් කියනවා, දැන් ඊකට කාලය ප්‍රමාණවත් නැහැ. ඒ නිසා එහෙම දෙයක් කරන්න ඉඩප්‍රස්තාවක් නැහැ. මේ ඇති වෙච්ච එකඟතාවට අනුව ඒ ISB restructuring programme එක ඒ නියමිත දින වකවානුවලදී අවසන් කරන්න අපේ ඉලක්කය තිබෙනවා. කැබිනට් මණ්ඩලය ඒක සම්මත කරලා තිබෙනවා. ඒ අනුව අපි ඉදිරියට යනවා. මොකද, ඒක තවත් දිග් ගස්සන්න බැහැ. අපි ලබන වසරේ බලාපොරොත්තු වෙනවා අය වැය ඉදිරිපත් කරන්න. ඒ අය වැය යෝජනා එක්ක යම් යම් ඉලක්ක තිබෙනවා. එතැන අපේ GDP එකේ අපි යන්න ඕනෑ ඉලක්ක තිබෙනවා. අපේ ආර්ථික වර්ධන වේගයේ අපි ලබාගත යුතු ඉලක්ක තිබෙනවා. ඉතින් ඒ ඉලක්ක ජයග්‍රහණය කරන්න නම්, මේ කාල රාමුව තුළ මේ කටයුත්ත අවසන් කළ යුතුයි. ඒ නිසා නැවත මේක දිග් ගස්සන්න හැකියාවක් නැහැයි කියන එක අපි අවධාරණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රතිපත්තියට, වැඩ පිළිවෙළට අනුව දිගුකාලීන නිෂ්පාදනය මත පදනම් වෙච්ච ආර්ථික ක්‍රියාවලිය ක්‍රියාවට නඟනකොට යම් කාලයක් යනවා. අපට අවශ්‍යයි මේ මොහොතේ රට මුහුණ දීලා තිබෙන ආර්ථික අර්බුදයෙන් ඉක්මනින් ගොඩ ඒමේ ක්ෂණික ක්‍රියාමාර්ග. ඒ සඳහා තමයි අපි ඉක්මනින් විදේශ විනිමය ලබාගත හැකි ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරලා තිබෙන්නේ. අපට ඉක්මනින් විදේශ විනිමය සොයා ගන්න පුළුවන් ප්‍රධාන ක්ෂේත්‍රයක් තමයි සංචාරක කර්මාන්තය. ඒ සඳහා තමයි අපි ලබන වසරේ සංචාරකයන්ගේ පැමිණීම පිළිබඳ ඉලක්ක තියලා, පැමිණෙන සංචාරකයන්ට ලබා දෙන පහසුකම් පිළිබඳව, ගුණාත්මක පහසුකම් වැඩිකිරීමේ, යටිතල පහසුකම් වැඩි කිරීමේ ඉලක්ක සහිතව අපි මේ ගමන ආරම්භ කරලා තිබෙන්නේ. නිෂ්පාදනය මත ආර්ථිකයේ ප්‍රතිලාභ ගන්න යම් කාලයක් යනවා. නමුත් අපට ක්ෂණිකව විදේශ විනිමය සොයා ගන්න පුළුවන් ක්ෂේත්‍රයක් වන සංචාරක කර්මාන්තයට අපි වැඩි බරක් තියලා තිබෙනවා.

ඒ වාගේම තමයි දැනටමත් ක්‍රියාත්මක වෙන විදේශ රැකියා සඳහා ලාංකිකයන් යැම. අපේ රටට වැඩිපුර foreign remittances එන්නේ මේ විදේශ රැකියා කරන අයගෙන්. එතකොට ඒ ප්‍රේෂණ ලබා ගන්න විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා වෙච්ච ක්ෂණික මෙහෙයුමක් අපි ක්‍රියාත්මක කරනවා. එතැනදී මම කියන්න ඕනෑ, කාලයක් තිස්සේ මේ කටයුතුවල තිබිච්ච වැරදි ක්‍රම තිබෙන බව. ඒ ක්‍රම හරහා විවිධ අය, විවිධ අයගේ නම් පාවිච්චි කරලා මුදල් ගරනවා; වංචා කරනවා. ඒවා තවත් නටබුන් විධියට තැන් තැන්වලින් අපට ආරංචි වෙනවා. අපි රටේ ජනතාවගෙන් ඉල්ලනවා කිසි කෙනෙකුට, කිසිකෙනෙකුගේ වංචාවලට අහු වෙන්න එපා කියලා. පසුගිය කාලයේ එහෙම සිදුවීමක් වුණා. ඒ තමයි කවුරුත් දන්න, E-8 visa ලබාදීම පිළිබඳ සිද්ධිය. E-8 visa ලබා දුන්නේ, තාවකාලික පදනම මත - මාස හයක වාගේ කාලයක් සඳහා - කෘෂිකාර්මික කටයුතු, ධීවර කටයුතු සඳහා දකුණු කොරියාවට අපේ ලාංකිකයන් යැවීම පිළිබඳ වෙච්ච ගිවිසුමක් මත. ඒ ගිවිසුම කිසිදු ආකාරයක නීත්‍යානුකූල ගිවිසුමක් නොවෙයි. ලංකාව සහ දකුණු කොරියාව හෝ වෙනත් රටක් එක්ක විදේශ රැකියා පිළිබඳ ගිවිසුමක් අත්සන් කරනවා නම්, රජයන් දෙක අතර ගිවිසුම් අත්සන් කරන්න අපේ ලංකාවේ කැබිනට් මණ්ඩලයෙන් පූර්ව අනුමැතියක් ලබා ගත යුතුයි. විදේශ කටයුතු අමාත්‍යාංශයත්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ත කාර්යාංශයත් ඒ අත්සන් කරන MoU එක පිළිබඳ කැබිනට් මණ්ඩලය දැනුවත් කරලා, කැබිනට් මණ්ඩලය අනුමත කරලා තමයි ඒ කටයුත්ත වෙන්න ඕනෑ. නමුත් කියන්න කනගාටුයි, හිටපු කම්කරු ඇමතිවරයා පෞද්ගලිකව කොරියාවේ ප්‍රාන්තයක් එක්ක ගිවිසුමක් අත්සන් කරලා තිබෙනවා. ඒ ගිවිසුමේ කොපියක්වත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිල වශයෙන් නැහැ. හැබැයි ඒක පෞද්ගලික ඒජන්සිකරුවන් අතේ තිබෙනවා. එතකොට, ඒක කිසිදු ආකාරයේ නීත්‍යානුකූල එකක් නොවෙයි.

වගකිවයුතු ඇමතිවරයෙක් විධියට ඒ අත්සන් කරපු MoU එක කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන, විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන, කොරියාව සහ ශ්‍රී ලංකාව අතර වන අවබෝධතා ගිවිසුම නිල වශයෙන් අත්සන් කරන්න එදා ඒ ඇමතිවරයාට වගකීමක් තිබුණා. නමුත් එහෙම එකක් සිද්ධ වෙලා නැහැ. අවසානයේ අහිංසක තරුණ තරුණියන් ඒකේ ගොදුරු බවට පත් වුණා. මේ කිසි දෙයක් දන්නේ නැතිව ඒ අය එක් එක් ඒජන්සිවල ලියාපදිංචි වෙලා කොරියාවට යන්න ඉල්ලුම් කර තිබුණා. කොරියානු තානාපති කාර්යාලයෙන් වීසා ලබා දීලා තිබුණා. කොරියාවට ඒක ප්‍රශ්නයක් නැහැ. මොකද, කොරියාවේ නීතිය අනුව කොරියානු ප්‍රාන්තයකට පුළුවන්, එහෙම ගිවිසුම් අත්සන් කරන්න. හැබැයි, අපේ රටේ නීතිය අනුව එහෙම කරන්න බැහැ. පළාත් සභාවකට එහෙම වෙනම ගිවිසුම් අත්සන් කරන්න බැහැ. මධ්‍යම ආණ්ඩුවට තමයි ඒ බලය තිබෙන්නේ. මේ අනීතික ක්‍රියාවලිය නිසා තමයි E-8 visaවලින් විශාල ප්‍රමාණයක් පීඩාවට පත් වුණේ. ඒ නිසා රටේ ජනතාවට අපි කියා සිටිනවා, ඒ ක්‍රමවේදය නීත්‍යානුකූල කරන්න අපි මැදිහත් වෙනවා, ඒ ක්‍රමවේදය නීත්‍යානුකූල කළාට පස්සේ ඔබට නීත්‍යානුකූලව විදේශ රැකියා සඳහා අවස්ථාව ලබා දෙනවා කියලා. ඒ මැදිහත්වීම අපි දැන් කරමින් සිටිනවා.

අපේ රටේ තිබෙන මේ ප්‍රශ්නයත් එක්ක බොහෝ පිරිස් විදේශ රැකියා සඳහා ගිහිල්ලා විවිධ අක්‍රමිකතාවලට ගොදුරු වනවා. ඉන් තවත් එකක් තමයි මියන්මාරයේ සයිබර් අවකාශය තුළ විවිධ

[ගරු විජිත හේරත් මහතා]

රැකියාවලට සම්බන්ධ වී වැඩ කිරීම. ඇත්තටම මීට පෙර හිටපු විදේශ ඇමතිවරුත්, විපක්ෂයේ යම් යම් මන්ත්‍රීවරුන්ගේත් මැදිහත්වීම හරහා ලංකාවට එන්න බැරිව මියන්මාරයේ අතරමං වෙලා හිටපු බොහෝ ප්‍රමාණයක් නිදහස් කර ගත්තා. හැබැයි, මේක නතර වෙලා නැහැ. දිගින් දිගටම විවිධ ක්‍රම හරහා අපේ රටේ රැකියා නැති අය මියන්මාරයේ රැකියා ලබා ගන්න යනවා. මියන්මාරය තුළ මියන්මාර ආණ්ඩුව පාලනය කරන්නෙත් නැති, තායිලන්ත ආණ්ඩුව පාලනය කරන්නෙත් නැති යම් කලාපයන් තිබෙනවා. ඇත්තටම ගත්තොත්, ඒ කලාපයන් නිල හමුදාව විසින් නොවෙයි පාලනය කරන්නේ. නිල නොවන හමුදාව විසින් පාලනය කරන ප්‍රදේශයක් තිබෙන්නේ. තායිලන්ත බෝඩරයත්, මියන්මාර බෝඩරයත් අතර තිබෙන මේ කලාපය තුළ තමයි මේ රැකියා අවස්ථා පවත්වාගෙන යන්නේ.

මෑත කාලීනව විශේෂයෙන්ම මාළිගාවිල අස්සජී හාමුදුරුවන්ගේ මැදිහත්වීමත්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ මැදිහත්වීමත් හරහා ඒ රැකියාවල නියුක්ත අයගෙන් තිස්දෙදෙනෙක් නැවත ලංකාවට ගෙන්වා ගැනීමට මැදිහත් වෙන්න අපට පුළුවන්කම ලැබුණා. දැනට ඒ අය තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා ලංකාවට ගෙන්වා ගන්න මැදිහත් වෙනවා. පස්දෙනෙකුට විතරක් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ පස්දෙනා කැමැත්තෙන් එහාට ගියා කියලා කට උත්තර දීලා තිබෙනවා. ඒ නිසා යම් යම් නීතිමය අවහිරතා ඇති වෙලා තිබෙනවා. තවත් 14දෙනෙකු ඒ ස්ථානවල සිටින බවට තොරතුරු තිබෙනවා. දෙදෙනෙක් අද දවස තුළත් ලංකාවට ගෙන්වා ගන්න මැදිහත් වෙලා තිබෙනවා. තව 12දෙනෙකු පිළිබඳ තොරතුරු තිබෙනවා. ඒ නිසා මේ රටේ ජනතාවගෙන් අපි ඉල්ලා සිටිනවා, - මියන්මාරය තුළ වෙන්නත් පුළුවන්, හෙට දවසේ වෙනත් තැනක වෙන්නත් පුළුවන් - නීති විරෝධී ආකාරයට මෙවැනි ජාවාරම්කරුවන්ට අහු වෙලා තමන්ගේ ජීවිතය අනතුරකට පත් කර ගන්න එපා කියලා. තමන් විදේශ රැකියාවකට යනවා නම්, ඒ යන්නේ කොහේද, කොහේටද තමන්ව අරගෙන යන්නේ කියන එක ප්‍රශ්න කරලා දැනගෙන යන්න. විශේෂයෙන්ම තායිලන්තය හරහා මියන්මාර දේශසීමාවට ඔබ්බෙන් තිබෙන ප්‍රදේශවලට අරගෙන යන එකෙන් වළකින්න තම තමන් මැදිහත් වෙන්න.

එහි සිටින තිස්දෙදෙනාගෙන් පස්දෙනෙකු ගැන මම කිව්වා. ඒ පස්දෙනා කාලයක් තිස්සේ තායිලන්තයේ රැකියා කරලා, තමන් දැනුවත්ව තමයි මියන්මාරයට ගිහිල්ලා තිබෙන්නේ. එතකොට දැනුවත්ව තමයි මේ අනතුරට ලක් වෙන්නේ. මීට පෙර අවස්ථාවල හිටපු විදේශ ඇමතිවරු මේ පිළිබඳව මේ සභාව දැනුවත් කළා. මා නැවත අවධාරණයෙන් මතක් කරනවා, එවැනි දේවල්වලට අහු වෙන්න එපා කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
**(மாண்புமிகு தயாசிறி ஜயசேகர)**
**(The Hon. Dayasiri Jayasekara)**

ගරු ඇමතිතුමනි, ඔබතුමා විෂයභාර ඇමතිතුමා නිසායි මම විශේෂයෙන්ම මේ කාරණය මතක් කරන්නේ. රුසියාව සම්බන්ධ ප්‍රශ්නය ඔබතුමා දන්නවා. අපි දිගින් දිගටම මේ ගැන කථා කළා. උතුරේත්, දකුණේත් විශාල පිරිසක් මේ විධියට ගිහිල්ලා තිබෙනවා. මේ පිළිබඳ විශාල අර්බුදයක් තිබෙනවා. මම හිතන විධියට ඔබතුමා මේකට මැදිහත් වනවා නම් හොඳයි. මොකද, අපි දිගටම මේ ගැන පාර්ලිමේන්තුවේ මතු කළා. නමුත්, තවම මේ ප්‍රශ්නය අවසන් වෙලා නැහැ. වන්දි ගෙවීම අවසන් වෙලාත් නැහැ. තුවාල වෙලා විශාල සංඛ්‍යාවක් ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා මේකට මැදිහත් වුණොත් හොඳයි. ඒ ඉල්ලීම මම කරනවා.

**ගරු විජිත හේරත් මහතා**
**(மாண்புமிகு விஜித ஹேரத்)**
**(The Hon. Vijitha Herath)**

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

අපේ ලාංකිකයන්, විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවල සේවය කරපු අය රුසියාවටත්, යුක්‍රේනයටත් ගිහිල්ලා, ඒ රටවල යුද සේවයට බැඳිලා ජීවිත අනතුරට ලක් වෙලා තිබෙනවා. සමහර අය තුවාල වෙලා තිබෙනවා. සමහර අය දුරකථනවලින් රුසියාවේ රෝහල්වල ඉඳලා මටත් කථා කරලා තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය පිළිබඳව අපට අවබෝධයක් තිබෙනවා. ඒ වාගේම ඒ අය නිදහස් කර ගැනීමට මැදිහත්වීමේ වුවමනාවකුත් අපට තිබෙනවා. අපි යම් යම් ක්‍රියා මාර්ග ගන්න ලෑස්ති වෙලා තිබෙනවා. යම් යම් දුෂ්කරතා මතු වෙලා තිබෙනවා. කොහොම වුණත් ඒ අයව නැවත ලංකාවට ගෙන්වා ගන්නත්, විවිධ ආපදාවන්ට ලක් වෙච්ච අය සම්බන්ධයෙන් මැදිහත් වෙන්නත් අපි කටයුතු කරන බව මම මේ ගරු සභාවට කියන්න කැමැතියි. ඒකට අවශ්‍ය කරන ක්‍රියා මාර්ග ගන්න ඉදිරියේදී කටයුතු කරන බවත් මම මේ සභාවට කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. බොහෝ අය කියන්න හදනවා, රනිල් වික්‍රමසිංහගේ වැඩ පිළිවෙළ අපි ඉස්සරහට අරගෙන යනවා කියලා. රනිල් වික්‍රමසිංහ කියන්නේ කවුද කියන එක ඔබතුමන්ලාට වඩා අපි හොඳට දන්නවා. ඔබතුමන්ලා රනිල් වික්‍රමසිංහගේ පෞද්ගලික ජීවිතය දන්නවා ඇති. හැබැයි, අපි එතුමාගේ ප්‍රතිපත්තිය හොඳට දන්නවා. ඒ නිසා තමයි 2002දී "යළි පුබුදමු ශ්‍රී ලංකා" - "Regaining Sri Lanka" - වැඩසටහන එනකොට අපි එදා ඉතා පැහැදිලිව ඒකට විරුද්ධව කටයුතු කළේ. එදා විතරක් නොවෙයි. එදා සිට අද දක්වාම ඒ ප්‍රතිපත්තියට එරෙහිව අපි කටයුතු කළා. රනිල් වික්‍රමසිංහ මහත්මයා ගෙනියන්න හදපු ඒ ප්‍රතිපත්තිය මේ රටේ ජනතාවට හතුරු ප්‍රතිපත්තියක්. ඒ ප්‍රතිපත්තියේ අපි නැහැ. ඒ නිසා IMF වැඩසටහනට අපි සම්බන්ධ වෙනවා කියන්නේ, ඒක රනිල් වික්‍රමසිංහගේ වැඩසටහනක් නොවෙයි. IMF වැඩසටහන ඇත්තටම පටන් ගත්තේ බැසිල් රාජපක්ෂ. ඒක ඔබතුමන්ලාට මතක ඇති. බැසිල් රාජපක්ෂ එදා IMF එකත් එක්ක ගිවිසුම් අත්සන් කරනවා කිව්වාම, එවකට විපක්ෂයේ හිටපු රනිල් වික්‍රමසිංහ මන්ත්‍රීවරයා මොකක්ද කිව්වේ? ඒ අත්සන් කරපු මූලික ලියවිල්ල පෙන්නුවේ නැහැ, ඒක ඉදිරිපත් කරන්නේ නැද්ද කියලා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා සාකච්ඡාවක් කැඳවපු වෙලාවේ ඇහුවේ කවුද? රනිල් වික්‍රමසිංහ මන්ත්‍රීවරයා. බැසිල් රාජපක්ෂ තමයි ඒක කරලා තිබුණේ. ඒ නිසා මේක රනිල්ගේ වැඩසටහනක් නොවෙයි. වරද්දා ගන්න එපා. රටේ නායකයා විධියට ඉන්නේ රනිල් ද, කවුද කියන එක IMF එකට අදාළ නැහැ. IMF එක මූල්‍ය ආයතනයක් විධියට ලෝකයේ රටවල් එක්ක කටයුතු කරනවා. ඒ කටයුත්ත තමයි අපි කරගෙන යන්නේ. ඒ නිසා රනිල් වික්‍රමසිංහගේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නඟන්න අපි මැදිහත් වෙලා නැහැ. මේ මොහොතේ මුහුණ දී තිබෙන ආර්ථික අර්බුදය කළමනාකරණය කර ගැනීම සඳහා රටේ ජනතාව වෙනුවෙන් අපි ඕනෑම සංවිධානයක් එක්ක ගනුදෙනු කරනවා. රටට හිතකර විධියට, ජනතාවට හිතවාදී විධියට අන්න ඒ ප්‍රතිපත්තියේ ඉඳලා තමයි අපි IMF ක්‍රියාවලිය හරහා ඉස්සරහට යන්නේ. දිගුකාලීනව ආර්ථිකය ගොඩනඟන, නිෂ්පාදනය මත පදනම් වෙච්ච අපේ වැඩ පිළිවෙළ ලබන අය වැයේ දී ඉදිරිපත් කිරීමෙන් පස්සේ අපි දිගු කාලීනව ආර්ථිකය ගොඩ නඟන අපේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න මැදිහත් වෙනවා. ඒ ගැන අපි මේ රටේ ජනතාවට සහතික වෙනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.21]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

අද දවසේ රජය විසින් ඉදිරිපත් කරපු අතුරු සම්මත ගිණුම පිළිබඳ විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම ගැන මම අතිශයින්ම සතුටු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ප්‍රථමයෙන්ම මේ 10වැනි පාර්ලිමේන්තුවට අඛණ්ඩව 7වැනි වරටත්, ඒ වාගේම අවසන් මැතිවරණ 4ක දීම අපේ කණ්ඩායමේ ප්‍රථමයා ලෙසත් මාව තෝරා පත් කර එවූ බෙන්තර-ඇල්පිටිය ඇතුළු ගාල්ල දිස්ත්‍රික්කයේ ආදරණීය ජනතාවට මගේ ගෞරවනීය ප්‍රණාමය පුද කරන්නට මම පළමුවෙන්ම මෙය අවස්ථාවක් කර ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයකු ලෙස මම ගත කරපු දශක දෙකහමාරකට ආසන්න කාලය තුළ මට ඉගෙන ගන්න ලැබුණු ලොකුම පාඩම තමයි, අටලෝ දහම පිළිබඳ පාඩම. මේ කාලය පුරාවටම මම දැක්කා, දැවැන්ත ජනවරමක් අරගෙන අසහාය නායකයෝ බිහි වුණු හැටි.

ඒ නායකයන්ගේ බිඳ වැටීමත් අපි දැකලා තිබෙනවා. ඒ වාගේම අලුත් නායකයෝ බිහිවෙන හැටිත් අපි දැකලා තිබෙනවා. බලාගෙන ඉන්දෙද්දී දේශපාලන මතවාද වෙනස් වෙන හැටි, සීගිරි ගල වාගේ ශක්තිමත් යැයි කියපු ආණ්ඩු බටර් තල්ලියක් වාගේ දිය වෙලා යන හැටි ඇතුළු මේ ඔක්කෝම අපි පහුගිය අවුරුදු විසි ගණන තුළ දැකලා තිබෙනවා. දේශපාලන රැලි එන හැටිත්, ඒ රැලි යට කරගෙන අලුත් රැලි මතු වෙන හැටිත් මම මේ සභාව තුළ අනන්ත වාරයක් දැකලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ ආණ්ඩු බලය කියන එක හරියට ඔන්චිල්ලාවක් වාගේ තමයි අපි පහුගිය කාලය පුරාම දැක්කේ. ඒක එක පැත්තකට ගියොත්, ආයෙත් මේ පැත්තට එනවා. මේ පැත්තට ආවාට, ආපහු අනෙක් පැත්තටත් යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන රජයට අතිවිශාල ජන වරමක් හිමිව තිබෙන බව කිසිම දේශපාලන කුහකකමකින් තොරව අපි ඉතාම නිහතමානීව පිළිගන්නවා. ඒ ජන වරම කොතෙක්ද කියන එක මේ සභාවේ ඉදිරිපස බලනකොටත්, පිටුපස හැරිලා බලනකොටත්, දෙපැත්ත බලනකොටත්, විශේෂයෙන්ම දවල්ට භෝජනාගාරයට ගිය විටත් ඕනෑම කෙනෙකුට හොඳට පේන්න තිබෙනවා. තුනෙන් දෙකකටත් එහා ගිය ඒ සුවිශේෂී ජන වරම යොදාගෙන දීර්ඝ කාලීනව කරනවා කියපු කිසිවක් ගැන මම අද කථා කරන්න යන්නේ නැහැ. නමුත් ජනාධිපතිතුමාත්, මේ හැම කෙනෙක්ම වාගේත් මැතිවරණයට පෙර ප්‍රසිද්ධියේ කියපු, දේශපාලන වේදිකාවල නිතරම මන්තරයක් වාගේ ජප කරපු, බලයට පත් වුණු වහාම කරනවා කියපු, ඒ කරන විධියත් පැහැදිලිවම කථා කරපු තමුන්නාන්සේලාට අවංක වුවමනාවක් තිබෙනවා නම් ඇත්ත වශයෙන්ම ක්ෂණිකව ඉටු කළ හැකි ප්‍රධාන කරුණු තුනක් ගැන පමණක් කථා කරන්න මම අදහස් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, රටක සංවර්ධනයේදීත්, ජනතාවගේ එදිනෙදා ජීවිතවලත් රුධිරය වාගේ තිබෙන දෙයක් තමයි, ඉන්ධන සහ විදුලිය කියන්නේ. මට මතක් වෙනවා, තමුන්නාන්සේලා ශාපයක් ලෙස දැකපු 76 වසරක කාලය තුළ ඩඩ්ලි සේනානායක රජයෙන් බිහි කරපු ආසියාවේ පළමුවැනි තෙල් පිරිපහදුව 1967දී මුල්ගල තියලා ඩඩ්ලි සේනානායක හිටපු අගමැතිතුමා 1969දී විවෘත කළ බව. සපුගස්කන්දේ තෙල් පිරිපහදුව ආරම්භ කරනකොට ඒකේ ධාරිතාව තිබුණේ දිනකට බැරල් 25,000-35,000 අතර ප්‍රමාණයක් විතරයි. අපේම හිටපු නායකයෙක් වෙච්ච ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඒ රජය යටතේ 1983දී ඒක පුළුල් කළා, දවසකට බැරල් 60,000ක ධාරිතාවක් දක්වා. මේ තෙල් පිරිපහදුවේ තමයි අදටත් අපේ රටට අවශ්‍ය භූමිතෙල් සියයට 100ක්ම නිෂ්පාදනය කරන්නේ. තමුන්නාන්සේලා මැතිවරණ කාලයේ අසීමිතව මිල අඩු කරනවා කියපු, එහෙම නිපදවන භූමිතෙල්වල මිල තමයි අහිංසක වතු කම්කරුවන්ට, අඩු ආදායම්ලාභී පවුල්වලට, ධීවරයන්ට, ගොවීන්ට බලපාන විධියට පසුගිය දවසක රුපියල් 5කින් වැඩි කළේ. තමුන්නාන්සේලාගේ දේශපාලන වේදිකාවේ තමයි මේ ඉන්ධන මිල ගැන වැඩිපුරම කථා කළේ. ජනාධිපතිතුමා ජනාධිපති වෙන්න පෙරත්, මහ මැතිවරණයට පෙරත් ඉන්ධන මිල වැඩි වෙලා තිබෙන හේතුවත්, බලයට ඇවිත් ඒක අඩු කරලා දෙන හැටිත් බොහොම ආකර්ෂණීය විධියට කිව්වා. තෙල් ටික වරායෙන් බාපු මොහොතේ ඉඳලා ජනතාව මිලට ගන්න තුරු ගජමිතුරු මිල සූත්‍රයටත්, ගසාකන බදු සූත්‍රයටත්, ඇමතිගේ කොමිස් සූත්‍රයටත් යට වෙලා තිබෙන නිසායි ජනතාවට මෙච්චර අසීමිත මිලකට පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් මිලදී ගන්න සිදුවී තිබෙන්නේ කියන එකත් හොඳට කිව්වා. හැම තෙල් ලීටරයකටම දූෂිත හොර බද්දක් අය කරන නිසා රුපියල් 50ක් ජනතාවගෙන් ගසාකන බවත් ජනාධිපතිතුමා ප්‍රකාශ කරපු හැටි අපි දැක්කා. ඒ වාගේම වර්තමාන කර්මාන්ත ඇමතිතුමා එදා කිව්වා, බදු ඉවත් කරලා තෙල් මිල අඩු කරන හැටි. නමුත්, අදටත් තෙල් ලීටරයකින් රුපියල් 100කට වැඩි ප්‍රමාණයක බද්දක් ගහනවා.

අදත් තෙල් ගේන්නේ එදා ගෙන්වපු සමාගම්වලින්ම වීම නිසාත්, එදා දූෂිත යැයි කියපු මිල සූත්‍රයම අදටත් පවත්වා ගෙන යෑම නිසාත් අපි අහනවා, එදා තිබුණු කොමිස් සූත්‍රයයි ගසා කන බදු සූත්‍රයයි තවමත් එහෙම තිබෙන්නේ ඇයි කියලා. බලය ලැබුණු ගමන් රුපියල් එකසිය ගණන්වලින් තෙල් මිල අඩු කරනවා කියලා ජනතාව තුළ අසීමිත බලාපොරොත්තු ඇති කරලා පසුගිය සතියේ තමුන්නාන්සේලා මොකක්ද කළේ? රුපියල් සිය ගණනකින් අඩු කරනවා කියපු පෙට්‍රල් ලීටරය ශත 200කින් අඩු කරලා, ඩීසල්වලත්, භූමිතෙල්වලත් මිල වැඩි කළා.

තමුන්නාන්සේලා 76 වසරක ශාපයක් ලෙස දකින අපේ කාලවල සිද්ධ වෙච්ච තවත් සංවර්ධන කටයුත්තක් තමයි, ජලවිදුලි බලාගාර ඉදිකිරීම. එම ජලවිදුලි බලාගාර ආශ්‍රිත පෝෂක ජලාශ පසුගිය දිනවලත් පිරිලා ඉතිරිලා වාන් දමන හැටි අපි දැක්කා. 1948දී නිදහස දිනාගෙන 1950දී අපට පුළුවන් වුණා, සර් ජෝන් කොතලාවල අගමැතිතුමා යටතේ ලක්ෂපාන විදුලි බලාගාරය හදලා මෙරට පළමුවෙනි විදුලි බල්බය දැල්වීමට. එදා එතුමා එය දල්වා පෙන්වූවා. ඒ වාගේම කඩිනම් මහවැලි යෝජනා ක්‍රමය යටතේ පංච මහා ජලාශ ඉදිවුණේත් තමුන්නාන්සේලාට ශාපයක් වෙච්ච ඒ අවුරුදු 76ක සංවර්ධන යුගයේදීයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව විනාඩි 5ක් මගේ කථාවට යොදා ගන්නවා.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ජනාධිපතිතුමා එදා මැතිවරණ වේදිකාවේදී කිව්වා, විදුලි බිල අඩු කරන විධිය ගැන. අපට ඒක හොඳට මතකයි. රුපියල් 3,000ක බිල රුපියල් 1,000කින් අඩු කරන්න පුළුවන් කිව්වා. රුපියල් 6,000ක බිල රුපියල් 3,000 කරන හැටි කිව්වා. මේ වන විට විදුලි පාරිභෝගිකයන් 68 ලක්ෂයක් අපේ රට තුළ ඉන්නවා. ඒ අතර දස ලක්ෂයකගේ පමණ විදුලි සම්බන්ධතා විසන්ධි කර තිබෙනවා, බිල ගෙවා ගන්න බැරිවීම නිසා. සමගි ජන බලවේගය හැටියට අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේම සඳහන් කළා, ඒ විසන්ධි වෙච්ච විදුලි සම්බන්ධතා නැවත ලබා දීම සඳහා උදව් කරන බවට. ඒ සඳහා හිඟ විදුලි බිල වාරික ක්‍රමයකට පොලී රහිතව ගෙවීමේ අවස්ථාව ලබා දෙන බව අපි කිව්වා. නමුත්, ජනතාව අපි කිව්ව දේ පිළිගත්තේ නැහැ. තමුන්නාන්සේලා කියපු විධියට විදුලි බිල අසීමිතව අඩු කිරීම ගැන තමයි ජනතාව විශ්වාසය තැබුවේ. විදුලිබල මණ්ඩලයේ සිටින තමුන්නාන්සේලාගේ වෘත්තීය සමිති නායකයා රංජන් ජයලාල් මහතා ... ඊයේ-පෙරේදා මාධ්‍යයට ඇවිල්ලා වගකීමෙන් යුතුව යම්කිසි ප්‍රකාශයක් කළා. වර්තමානයේ සම්පූර්ණයෙන්ම විදුලිය නිපදවන්නේ ජල විදුලියෙන් බව එතුමා එහිදී ප්‍රකාශ කළා. පංච මහා ජලාශ අපේ රජයන් විසින් ආරම්භ කළේ තමුන්නාන්සේලා ශාපයක් හැටියට දැකපු 76 වසරක කාලයේදීය කියන එකත් ඒවා අහනකොට අපට මතක් වෙනවා. ඒ ආකාරයට විදුලිබල මණ්ඩලය ජල විදුලිය නිපදවීම නිසා වර්තමානයේ අසීමිත ලාභයක් ලබන හැටිත් එතුමා ප්‍රකාශ කළා. එතුමා පැවසුවා, පසුගිය වසරේදී විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 62ක ලාභයකුත්, මේ වසරේ නොවැම්බර් වනකොට රුපියල් බිලියන 142ක ලාභයකුත් ලබපු බව. දෙසැම්බර් 10වන විට විදුලිබල මණ්ඩලයේ සේවකයින් ප්‍රසාද දීමනා ලබාගන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. අපි කියනවා, ප්‍රසාද දීමනා දෙනවා වාගේම මැතිවරණයට පෙර පෙන්වා දුන් ආකාරයට විදුලි බිල අඩු කරලා ජනතාවට සහනයක් දෙන එක ගැනත් කල්පනා කරන්න කියලා. ඔක්තෝබර් පළමුවැනි දාට අඩු කරන්න නියමිතව තිබුණු විදුලි බිල අඩු කරන්නත් ඔබතුමන්ලාට තවම බැරි වුණා. විදුලි බිල අඩු කිරීමට රජයට සැබෑ වුවමනාවක් තිබෙනවා නම්, ඒ සඳහා ඕනෑ තරම් ක්‍රම තිබෙන බවත් අපි හොඳටම දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 15කට වඩා ලාභ උපයනවා නම් විදුලි බිල අඩු කිරීමේ තීරණය මණ්ඩලයටම ගත හැකි බව 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත ප්‍රකාරව පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. දැන් ලාභය රුපියල් බිලියන 200ක් ඉක්මවා තිබෙද්දී පොරොන්දු වූ පරිදි විදුලි බිල අඩු නොකරන්නේ මන්ද කියා ජනතාව බොහොම විමසිල්ලෙන් බලාගෙන ඉන්නවා.

අවසාන වශයෙන් මම කැමැතියි, දේශපාලන වේදිකාවේ තමුන්නාන්සේලා නිතරම කථා කරපු තවත් කාරණයක් ගැන කථා කරන්න. ඒ තමයි, අතීතයේ පටන් ආණ්ඩු පෙරළීමට සහ බලයට ගෙන ඒමට ඉවහල් වෙච්ච හාල් සම්බන්ධයෙන් තිබෙන වර්තමාන තත්ත්වය. දේශපාලන වේදිකාවල හැමදාම වාගේ හාල් ගැන කථා වුණා. 1965දී ඩඩ්ලි සේනානායක මහත්තයා නොමිලයේ හාල් සේරුවක් ලබා දෙනවා කියලා ඒක ලබා දුන්නා. 1970දී බණ්ඩාරනායක මැතිනියට ඕනෑ වුණා, නැවත බලය ගන්න. එතුමිය මැයි දිනය දවසක කැම්බල් පිට්ටනියේදී කිව්වා, "මට දෙන්න ජන වරමක්, මම හාල් සේරු දෙකක් නොමිලේ දෙනවා" කියලා.

එතකොට ජේ.ආර්. ජයවර්ධන මහත්තයා ඇහුවා, "මැතිනිය කොහොමද ඒක කරන්නේ?" කියලා. එතකොට මැතිනිය කිව්වා, "ජේ.ආර්. මොනවා කිව්වත් මම හඳෙන් හරි හාල් ගෙනැල්ලා දෙනවා" කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවිය පෙළපාළි ගියා, "අපේ අම්මා ළඟ එනවා - හාල් සේරු දෙක දෙනවා" කියලා. ඒ වාගේ එදාත් හාල් සේරුව, හාල් කිලෝව ගැන දේශපාලන වේදිකාවේ බොහෝ කථා වුණා. තමුන්නාන්සේලා බලයට ආවේ, හාල් මාෆියාව නැති කරනවාය කියලා. අන්තිමට මාෆියාව නැති වුණේ නැහැ, හාල් නැති වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසුගිය දා ජනාධිපතිතුමා ප්‍රසිද්ධ නාළිකාවක වැඩසටහනකට ඇවිල්ලා කිව්වා, රට තුළ මේ වනවිට තිබෙන වී තොගය පිළිබඳව අපි සියලු විස්තර අරගෙන තිබෙනවා, අතිරික්ත වී ප්‍රමාණයකුත් තිබෙනවා, මෝල් හිමියන් සමඟත් සාකච්ඡා කළාය කියලා. පාලන මිලට දෙන්නේ නැත්නම්, නීත්‍යනුකූලව කටයුතු කරන හැටි ගැන ලොකුවට කිව්වා. ඒ සියලු තොරතුරු තියාගෙන, තුනෙන් දෙකක බලයකුත් තියාගෙන මේක කරන්න අද එතුමාට බැරි වෙලා තිබෙනවා. හාල් මාෆියාව නැති කරන්න අපට බලය දෙන්න කියපු අය අද ඇමති මණ්ඩලය තියාගෙනත් මේ ප්‍රශ්නයට උත්තර නොදී ඉන්නවා. එය රටේ ජනතාවට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. එක හාල් ඇටයක්වත් රටින් ගෙන්වන්නේ නැහැ කියපු අය දැන් පිට රටින් හාල් ටොන් ගණන් ගෙන්වන්න හදන හැටි අපට වාර්තා වෙනවා. මේ වනවිට තමුන්නාන්සේලා එක දෙයක් කරලා තිබෙනවා. දුප්පත් මිනිසුන්ගේ ආහාර වේලට සුඛෝපභෝගීභාවයක් එකතු කරලා තිබෙනවා. පොල් සම්බලුයි, බතුයි කාපු මිනිසුන්ගේ ආහාර වේල අද සුඛෝපභෝගී එකක් බවට තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පත් කරලා ඉවරයි. ඉස්සර අපේ ගම්වල තරුණ ජෝඩු හඳපානේ පැනලා ගිය සිරිතක් තිබුණා. එහෙම පැනලා යනකොට කියන්නේ, "පොල් සම්බලුයි බතුයි කාලා ඉඳීමු රත්තරන්" කියලා. අද ඒක කියන්න ගියොත් ලෝක ලෙඩක් වෙනවා. අද එහෙම කියන්න පුළුවන්කම තිබෙන්නේ, අනුන්ගෙන් කාලා ඇඳලා ඉන්න කෙනෙකුට විතරයි.

මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම අද දීර්ඝ කාලීනව කරන්න පුළුවන් ඒවා එකක්වත් ගැන කථා කළේ නැහැ. බැංකුවලින් පොලී රහිත ණය ලබා දීම ගැන මම අහන්න යන්නේ නැහැ. ඒකට තවම කල් වැඩියි. ඒ වාගේම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලට පනවා තිබෙන වැට් එක බින්දුවට බස්සනවාය කියපු ඒවා ගැන මම අහන්න යන්නේ නැහැ, බලයට පත් වෙලා තවම දින 60යි නේ. හැබැයි, මේ මම කියපු තෙල් ප්‍රශ්නයට, විදුලි බිලේ ප්‍රශ්නයට, හාල් ප්‍රශ්නයට තමුන්නාන්සේලාට ක්ෂණිකව උත්තර දෙන්න පුළුවන්කමක් තිබෙනවා. තමුන්නාන්සේලා කියපු ගසා කන තෙල් මිල සූත්‍රය ගැන, විදුලි බිල සම්බන්ධ කථා ගැන, හාල් මාෆියාව නැති කරන්න ගිහිල්ලා අද හාල් නැති කරපු එක ගැන රටේ ජනතාවට ලොකු ප්‍රශ්නයක් තිබෙන්නේ. අපි අහනවා, ඒ කියපු දේවල් අමතක කරලාද කියලා. මේ ටික කරන්න බැරි නම්, තුනෙන් දෙකක ජන වරමක් ලබා ගත්තේ මොන එහෙකටද කියන එක තමයි අපට අහන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාල වේලාව මදි නිසා මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. දීර්ඝ කාලීනව දීපු පොරොන්දු ගැන ජනතාව අසීමිත

බලාපොරොත්තුවක් තියාගෙන ඉන්නවා. මේ ආණ්ඩුවට අසීමිත ජන වරමක් ලැබිලා තිබෙනවා. කිසිම දවසක අපි ඒක අවතක්සේරු කරන්නේ නැහැ. ඒක තමුන්නාන්සේලා ලබපු විශිෂ්ට ජයග්‍රහණයක්. ඒ දීපු පොරොන්දු ඉෂ්ට කරන්න, ජනතා අභිලාෂ ඉටු කරන්න විරුද්ධ පක්ෂය හැටියට අපි ඔබතුමන්ලාට සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා; කිසිම කුහකත්වයකින් තොරව උදවු කරනවා. හැබැයි, විදුලිය ගැන කියපු ටික ක්ෂණිකව කරන්න පුළුවන් එකක්; එක පැන් පහරින් කරන්න පුළුවන් එකක්. ඒ වාගේම තෙල් මිල අඩු කරන එක තමුන්නාන්සේලාට කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම මේ හාල් ප්‍රශ්නය ඉතා ඉක්මනින් විසඳීමත්, පොල් ගෙඩියක මිල අසීමිත ලෙස වැඩි කිරීමත් පිළිබඳව ක්ෂණිකව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින්, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩි නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. මා මිත්‍ර විදේශ කටයුතු, විදේශ රැකියා ඇමතිතුමා කිව්වා, IMF Agreement එක අත්සන් කළේ බැසිල් රාජපක්ෂය කියලා. ඒක එහෙම නොවෙයි. ඒක අත්සන් කළේ රනිල් වික්‍රමසිංහ සහ නන්දලාල් වීරසිංහ, 2023 මාර්තු මාසයේ 06වැනි දා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මම කිව්වේ ගිවිසුම අත්සන් කළා කියන එක නොවෙයි, මූලික ලියවිල්ලට අත්සන් කළ එක ගැන. රනිල් වික්‍රමසිංහ විපක්ෂයේ මන්ත්‍රීවරයා විධියට draft එක ඉදිරිපත් කරන්න කිව්වේ, මතකද? මුහුණ රතු වෙලා පෙන්නුවේ? අන්න ඒ ගැනයි කිව්වේ. ඒක ගිවිසුම නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.37]

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயகொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ඉන්දියන් සාගරයේ මුතු ඇටය" ලෙස විරුදාවලිය ලත් නමුත් සත්‍ය වශයෙන්ම "ඉන්දියන් සාගරයේ කඳුළු බින්දුව" ලෙස බෞතීස්ම ලැබූ අපේ ආදරණීය මාතෘ භූමියේ, දසවැනි පාර්ලිමේන්තුවේ නවක මන්ත්‍රීවරයෙකු ලෙස ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මේ සභාව ආමන්ත්‍රණය කරන්නට මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මිනුවන්ගොඩ ආසනයෙන් වැඩිම මනාප ප්‍රතිශතයක් මට ලබා දුන්නු අපගේ ඒ ආදරණීය ජනතාවත්, ජාතික ජන බලවේගය විධියට අපට ඡන්දය ලබා දුන්නු ගම්පහ දිස්ත්‍රික්කයේ මා හිතවත් අපේ ආදරණීය ජනතාවත්, මගේ වෘත්තීය වන මිනින්දෝරු වෘත්තියට අදාළව මිනින්දෝරු ක්ෂේත්‍රයේ සිටින සියලුදෙනාමත් මේ අවස්ථාවේදී ඉතා සහෝදරාත්මකව මම මතක් කරනවා.

අපි අනිවාර්යයෙන්ම මේ කාරණය ගැන මතක් කළ යුතුයි. අවුරුදු 60ක ඉතිහාසය තුළ අපි සියලුදෙනා බලාපොරොත්තු වුණේ මොකක්ද? මේ රටේ මිනිස්සුන්ට ජීවත් වෙන්න පුළුවන් ඉතා හොඳ මට්ටමේ, සාධාරණ, යුක්තිගරුක සමාජයක් බිහි කිරීම. ඒ සඳහා මේ රටේ මිනිස්සු විශාල ප්‍රමාණයක් මහන්සි වෙලා වැඩ කළා; ඒ සම්බන්ධයෙන් කටයුතු කළා. ඒ වාගේම මගේ විශ්වවිද්‍යාල මිතුරන් විශාල ප්‍රමාණයක් ඒ වෙනුවෙන් මහන්සි වෙලා කටයුතු කළා; ඒ වෙනුවෙන් තම ජීවිතය පවා පූජා කළා. ඒ අනුව අපට කියන්න පුළුවන්, මේ රට වෙනස් කිරීම සඳහා මේ රටේ මිනිස්සු විශාල ප්‍රමාණයක් දායක වෙලා වැඩ කටයුතු කරලා තිබෙනවාය කියා.

වෘත්තියවේදීන් විධියට ජාතික විද්වත් සංවිධානය හරහා මේ රටේ වෘත්තීයවේදීන් විශාල ප්‍රමාණයක් සම්බන්ධ වෙලා වැඩ කටයුතු කළා. ඒ වාගේම, ඔබතුමන්ලා දන්නවා තරුණ ප්‍රජාව, කාන්තාවන් මේ ක්‍රම වෙනස වෙනුවෙන් මහන්සි වෙලා වැඩ කටයුතු කළ බව. ඒ අතරතුර අපේ ජාතික විද්වත් සංවිධානය විධියට වෘත්තීයවේදීන් විශාල ප්‍රමාණයක් මේ ක්‍රම වෙනස වෙනුවෙන් දායක වෙලා වැඩ කටයුතු කළා. ගුරුවරු, ඉංජිනේරුවරු, වෛද්‍යවරු, අපේ ක්ෂේත්‍රය, කෘෂි ක්ෂේත්‍රයේ නිලධාරින්, මූල්‍ය ක්ෂේත්‍රයේ නිලධාරින්, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරින් වැනි වෘත්තීයවේදීන් ලංකාව පුරාම සංවිධානය වෙලා මේ ක්‍රම වෙනස වෙනුවෙන්, මේ වෙනස කිරීම සඳහා දායක වෙලා වැඩ කටයුතු සිද්ධ කළා.

පසුගිය දවස් දෙකේ නවක මන්ත්‍රීවරයෙක් විධියට මේ සභාවේ වැඩ කටයුතු කරද්දී මම දැක්ක දෙයක් තිබුණා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු අපට කිව්වා, අපි උද්දාමයට පත් වුණා කියලා. ඇත්තටම අපි උද්දාමයට පත් වුණා. ඒක ඇත්ත. ඇයි, අපි එහෙම කියන්නේ? අපි දන්නවා අවුරුදු ගාණක් තිස්සේ අපි විශ්වාස කළ ඒ ක්‍රම වෙනස වෙනුවෙන් වැඩ කළ මිනිස්සු විශාල ප්‍රමාණයක් හිටපු බව. අවුරුදු 76ක් තිස්සේ විපක්ෂය විධියට හිටපු, වෙනත් දේශපාලන ධාරාවලින් කෙනෙහිලිකම් ලබපු මේ රටේ ජනතාව, මේ රට විනාශ කිරීම සඳහා දායක වුණු ඒ සියලුදෙනාගෙන් රට මුදා ගන්නා ක්‍රම වෙනස ඇතිවීම නිසා උද්දාමයට පත් වෙලා සිටින්නේ. මේ රට නැවත හොඳ මට්ටමකට ආපු නිසා තමයි අපි සියලුදෙනා උද්දාමයට පත් වෙලා සිටින්නේ. මොකද, වංචාව, දූෂණය පැතිරුණු කාලයක ඒ ක්‍රමය වෙනස් කරලා, අලුත් රටක් නිර්මාණය කිරීමට දායකවීම තමයි ඇත්තටම අපි උද්දාමයට පත්වීමට හේතුව. එහෙම වුණත් අපි උඩඟු වෙලා නැහැ. ඒ ක්‍රම වෙනස වෙනුවෙන් සියලුදෙනාම එකතුවීම තමයි අපි බලාපොරොත්තු වුණේ; ඒ සම්බන්ධයෙන් තමයි වැඩ කටයුතු කළේ.

විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අපි මේ රටට ප්‍රතිපත්ති මාලාවක් ඉදිරිපත් කළත් තවම ඒ ප්‍රතිපත්ති මාලාව යථාර්ථයක් බවට පත් කරලා නැහැ, තවම කිසි දෙයක් ඉටු කළේ නැහැයි කියන අදහසක් මේ සභාවේදී ප්‍රකාශ කරනවා නවක මන්ත්‍රීවරු විධියට අපි අහගෙන හිටියා.

හැබැයි, අපි පැහැදිලිවම කියන්න කැමැතියි, අපේ ප්‍රතිපත්ති මාලාවේ තිබෙන මූලිකම කරුණක් වන දේශපාලන සංස්කෘතික වෙනස ගැන තමයි අපි මූලික වශයෙන් හිතුවේ කියන එක. අපි

[ගරු රුවන්තිලක ජයකොඩි මහතා]

ජනාධිපතිවරණය ජයග්‍රහණය කළාට පසුව අපි ඒ දේශපාලන සංස්කෘතික වෙනස මේ සමාජය තුළ ඇති කළා. ඊට පසුව මහ මැතිවරණයේදීත් අපි ඒ දේශපාලන සංස්කෘතික වෙනස ඇති කළා. ඔබ සියලු දෙනාම ඒක දැක්කා; අත් වින්දා. ඔබ දන්නවා, මීට පෙර වෙනත් දේශපාලන පක්ෂ ජයග්‍රහණය කළාම, මොකක්ද ඇති වුණු තත්ත්වය කියා. මම මීනුවන්ගොඩ ප්‍රදේශයේ සිටින්නේ. අපි දන්නවා, ඒ කාලයේ වෙනත් දේශපාලන පක්ෂ ජයග්‍රහණය කළාම ඇති වුණු තත්ත්වය. විශේෂයෙන්ම විරුද්ධ පාක්ෂිකයන්ගෙන් පළිගත්තා; ගෙවල් ගිනි තිබ්බා. එහෙම වාතාවරණයක් තිබුණේ. නමුත් මෙවර ඔබ දකින්න ඇති, ලංකාවේ කිසිම ප්‍රදේශයක එහෙම වෙනසක් නැතුව, සියලු දෙනාටම කිසිම ගැටලුවක් නැතුව ජීවත් වීමේ පහසුකම ලැබුණු බව. එතැන දේශපාලන ක්‍රමයේ වෙනසක් තිබුණා.

ඒ වාගේම ඔබ දන්නවා, අපට උතුරු පළාතේ ඡන්ද ලැබුණු බව. ඒ වාගේම ඔබ දන්නවා, අපට කඳුකර ජනතාවගේ ඡන්දය ලැබුණු බව. ඒ වාගේම ඔබ දන්නවා, විශේෂයෙන්ම මීනුවන්ගොඩ ප්‍රදේශය ගත්තාම, මීනුවන්ගොඩ ප්‍රදේශයෙන් අප සමඟ ඡන්දයට ඉදිරිපත් වුණු නියෝජ්‍ය ඇමති, ගරු මුනීර් සහෝදරයාටත් කිසිම ජාති භේදයකින් තොරව 25,000කට අධික මනාප ප්‍රමාණයක් ලබා දුන් බව. ඒකෙන් අපට හැඟෙන්නේ මොකක්ද? ඒකෙන් හැඟී යන්නේ අනිවාර්යයෙන්ම සියලු ප්‍රදේශවල මිනිස්සු ජාතිවාදය ප්‍රතික්ෂේප කළ බවයි. ඒක තමයි අපිට පැහැදිලිව පෙනෙන්නේ. ඒ නිසා ඉතිහාසයේ අපිට කෙතරම් අවාසි වුණත්, අනිවාර්යයෙන්ම අපට පෙනෙන්න තිබෙන, අපට ලැබුණු දේ තමයි, මෙය. අපි විශ්වාස කළා, ජාතිවාදය පෝෂණය කළ යුතු නැහැ, ජාතිවාදයෙන් තොරව මේ රට පවත්වා ගෙන යා යුතුයි කියන කාරණය. ඒක අපිට පැහැදිලි වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපිට සතුටු වෙන්න පුළුවන්; උද්දාමයට පත් වෙන්න පුළුවන්. මොකද, අපි මේ රට වෙනස් මාවතකට ගෙනැවිත් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි සියලු දෙනාටම සතුටුයි. අපි "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති මාලාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග හෙට දවසේ ගන්නවා. ඒ වෙනුවෙන් අපි සියලු දෙනා කැප වී වැඩ කරනවා කියන එකත් මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරන්න කැමැතියි.

අපි දන්නවා, අපේ ප්‍රතිපත්ති මාලාව තුළ තිබෙන තවත් මූලික කරුණක් තමයි ජීවන බර අඩු කරනවා කියන එක. එය, එහි ප්‍රධාන කාරණයක් විධියට තිබෙනවා. අපි දන්නවා, අපට අද ජීවත් වෙන්න අමාරුයි. ඒ, ජීවන බර අඩු කරන්න අවශ්‍යයි. අපිට ආහාර මිලට ගැනීමේ ප්‍රශ්නයක් තිබෙනවා. අපේ දරුවන්ට අවශ්‍ය පාසල් පොත් සහ උපකරණවල මිල වැඩියි, නමුත් අපි ඒවා මිලට ගන්න ඕනෑ. ඒ වාගේම සෞඛ්‍ය අංශය ගත්තාම, ඇතැම් උපකරණවල, බෙහෙත්වල මිල වැඩියි. නමුත් අපි පැහැදිලිවම ප්‍රකාශ කරනවා, - දැනුත් ඔබට බලන්න පුළුවන්, අත්විඳින්න පුළුවන්- සමහර ක්ෂේත්‍රවල සමහර දේවල්වල යම් මට්ටමක මිල අඩුවීමක් වෙලා තිබෙන බව. හැබැයි, සමහර දේවල් සම්බන්ධයෙන් එහෙම වෙලා නැහැ. අපි ලබන අවුරුද්ද මුලදී ඉදිරිපත් කරන අපේ අය වැය යෝජනා තුළින් ඔබතුමන්ලාට බලාගන්න පුළුවන් වෙයි, මෙන්න මේ ක්‍රම වෙනස වෙනුවෙන් අපි පොරොන්දු වුණු පරිදි යම් යම් ක්‍රියාමාර්ග ගන්නා බව. ඒක අපිට කරන්න පුළුවන්. එහෙම රටාවක් තමයි අපි දිගටම අරගෙන යන්නේ.

අපි දන්නවා, ඉතිහාසයේ ඉඳලාම මිනිස්සු උත්සාහ කළේ මේ රට හොඳ මට්ටමකට, හොඳ රටාවකට අරගෙන හොඳින් ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් ඇති කරන්නයි. නමුත් මේ රට අවුරුදු ගණනක් තිස්සේ පාලනය කළ ඒ සම්බන්ධ අත්දැකීම් බහුලව තිබෙන අද විපක්ෂයේ සිටින අය අපට පෙන්නුම් කළේ මොකක්ද? අද පවතින ආර්ථික අර්බුදයට මූලිකවම හේතු වුණේ අද විපක්ෂයේ සිටින අය විසින් එදා ගත් සමහර ක්‍රියාමාර්ගයි. ඒ නිසා තමයි මේ රටේ මිනිස්සු විශාල බලයක් අපට ලබා දුන්නේ. අපි ඒ ගැන අවබෝධයෙන් ඉන්නේ. සමහර අය පසුගිය දවස්වල කිව්වා, "ඔබ උද්දාමයට පත් වෙන්න එපා. මොකද, ගෝඨාභය රාජපක්ෂ ඇවිල්ලා අවුරුදු දෙකහමාරෙන් අනිවාර්යයෙන්ම ගෙදර යන්න වුණා, ඔහු වැඩ කළ විධිය අනුව. ඒ නිසා ඔයගොල්ලන්ටත් ඒ වාගේ මට්ටමක් එන්න පුළුවන්" කියලා. ඒ විධියේ මතයක් සමාජගත කරන්න හැදුවා. හැබැයි, මම කියන්න කැමැතියි, ගෝඨාභය රාජපක්ෂට මෙහෙම team එකක් තිබුණේ නැති බව. ඔහු පමණයි සිටියේ. ඔහු වටා සිටියේ ඔහුගේ පවුලේ අය සහ ඒ අදාළ පුද්ගලයන් පමණයි. ඔහු වටා විශේෂ දාමයක් තිබුණේ නැහැ. ඔහුගේ කටවචනය තමයි නීතිය විධියට ක්‍රියාත්මක කළේ.

අපේ ක්‍රියාදාමය තුළ විශාල සංවිධාන ජාලයක් තිබෙනවා. අපේ ක්‍රියාදාමය තුළ ලංකාව පුරාම වෘත්තීයවේදීන්, ඒ වාගේම අපේ තරුණ බලකාය හා කාන්තාවන් යන මේ සියලුදෙනා සංවිධානය වෙලා, දැනුවත් වෙලා team එකක් විධියට තමයි මේ රට ඉදිරියට ගෙනියන්නේ. ඒ නිසා ඒ ගැන විපක්ෂයේ අය කලබල විය යුතු නැහැ. අපි අනිවාර්යයෙන්ම මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු, අපේ ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද වැඩ පිළිවෙළ අනුව, වැඩ කටයුතු කරනවා කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

ඉතිහාසයේ අවුරුදු 76ක් තිස්සේ මේ රටේ අනුගමනය කරපු, විපක්ෂයේ දේශපාලන පක්ෂ සහ ඒ කාලයේ පාර්ලිමේන්තුවේ හිටපු සියලු දේශපාලන ක්‍රියාධරයන් විසින් මේ රට පාලනය කිරීමට ගත්ත ක්‍රියා මාර්ග නිසා තමයි, මේ රට අද ඉතා දරුණු අර්බුදයකට ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා මම විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා. ඔබ සියලුදෙනා ඉතිහාසය අමතක කරලා, හෙට දවසේ මේ රට හොඳ මට්ටමකට ගෙනියන්න අපිත් එක්ක එකතු වෙන්න. එම ආරාධනය කරමින්, මගේ කථාව අවසන් කරනවා. මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[ප.ව. 3.49]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, என்னை மக்கள் பிரதிநிதியாகத் தெரிவுசெய்த மட்டக்களப்பு வாழ் தமிழ் பேசும் மக்களுக்கும் இறைவனுக்கும் எனது கட்சிக்கும் நன்றியைத் தெரிவித்துக்கொண்டு, காலங்காலமாக அடக்குமுறைகளுக்கு எதிராகக் குரல்கொடுத்து, தமிழ் மக்களுக்காகப் போராடிய எமது உறவுகளுக்கும் தமிழ்த் தேசியத் தலைவருக்கும் எனது அஞ்சலியையும் செலுத்திக் கொள்கின்றேன். மாற்றத்தைக் கொண்டுவந்து, இனவாதமற்ற, ஊழலற்ற நேர்மையான ஆட்சியையும் சுபிட்சமான நாட்டையும் உருவாக்குவதாக வாக்குறுதி அளித்திருக்கும் மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் பெரும்பான்மைப் பலத்தைப் பெற்றிருக்கும் அவரது அரசாங்கத்துக்கும் வாழ்த்துகளைத் தெரிவித்துக்கொண்டு எனது உரையை ஆரம்பிக்கின்றேன்.

இலங்கை தீவானது ஓர் அழகிய நாடு! இந்த நாடு சுதந்திரமடைந்து 75 ஆண்டுகளுக்குப் பின்னர், ஏன் இவ்வாறான நிலையை எட்டியது? இந்த நாட்டை மாறி, மாறி ஆட்சி செய்தவர்கள் தங்கள் அரசியல் சுயலாபங்களுக்காகவும் ஆட்சிபீடம் ஏறுவதற்காகவும் இனவாதத்தைத் தீனிபோட்டு வளர்த்தார்கள். தமிழ் மக்களுக்கு எதிரான அடக்குமுறைகளும் ஒடுக்குமுறைகளும் மொழி உரிமைப் பறிப்புகளும் நில அபகரிப்புகளும் காலங்காலமாக நடந்தேறி வந்தன. அந்த நிலையிலே, காலத்துக்குக் காலம் தமிழ் பேசும் மக்கள் தங்கள் உரிமைகளுக்காகவும் வாழ்வுக்காகவும் போராடவேண்டிய நிலை ஏற்பட்டது. ஆரம்ப காலத்தில் அஹிம்சை முறையில், பேச்சுவார்த்தை ரீதியில் போராடிய மக்கள் - தலைவர்கள் - தாங்கள் ஏமாற்றப்பட்டுள்ளதை அறிந்ததை அடுத்தே ஆயுதப் போராட்டம் வெடித்தது. இன்று அந்தப் போராட்டம் மௌனிக்கப்பட்டு இருக்கிறது. அந்தப் போராட்டத்தின் முடிவில் தமிழ் மக்கள் சொல்லொணாத் துன்பங்களையும் வேதனைகளையும் அனுபவித்தார்கள். அதுமாத்திரமன்றி, நாடும் சீரழிந்து, சிதைந்து போனது. பொருளாதார ரீதியாகவும் வீழ்ந்தது. இவ்வாறான சூழலில் என்ன செய்ய வேண்டுமென்ற மிக முக்கியமான நிலைப்பாட்டிலே நாம் இருக்கின்றோம்.

நடந்து முடிந்த கொடிய யுத்தத்தால் தமிழ் மக்கள் சொல்லொணாத் துன்பங்களை அனுபவித்தார்கள். இன, மொழி, நில விடயங்களில் அவர்கள் வேறுபடுத்தப்பட்டார்கள். அவர்களுக்கான அடிப்படை உரிமைகள் மறுக்கப்பட்டன. இந்தப் புதிய அரசாங்கம் நம்பிக்கை அளிக்கக்கூடிய வார்த்தைகளைக் கூறியிருக்கிறது. மாண்புமிகு சனாதிபதி அவர்கள் சிம்மாசன உரையில் இன, மொழி பேதமற்ற, ஊழலற்ற, வன்முறையற்ற ஆட்சியை உருவாக்குவதாக உறுதியளித்து இருக்கின்றார். அதற்காக நாங்கள் அவருக்கு நன்றி தெரிவிக்கின்றோம். ஆனாலும், அவர் எங்களுடைய எதிர்கால அரசியல் சம்பந்தமாக காத்திரமான கருத்துகளைத் தெரிவிக்கவில்லை என்பதையிட்டு நாம் கவலை யடைகின்றோம். எத்தனையோ இழப்புகளைச் சந்தித்து, வாழ்வாதாரத்தை இழந்திருக்கின்ற எமது சமூகத்தில் போரின் பின்னர் எத்தனையோ பெண் தலைமைதாங்கும் குடும்பங்கள் உருவாகி இருக்கின்றன; எத்தனையோ பேர் மாற்றுத்திறனாளி களாக மாறி இருக்கின்றார்கள். அவர்களுக்கான அடிப்படைக் கட்டமைப்பு உருவாக்கப்பட வேண்டும் என்பது எமது எதிர்பார்ப்பாகும்.

நான் மட்டக்களப்பு மாவட்ட மக்களின் பிரதிநிதியாகவே இங்கு வந்திருக்கின்றேன். அம்மாவட்டத்தில் பல வளங்கள் இருக்கின்றன. குறிப்பாக, கடல் வளம் இருக்கின்றது; வயல் இருக்கின்றது; கால்நடைகள் இருக்கின்றன. ஆனாலும், அந்த மாவட்டம் பொருளாதார ரீதியாகப் பின்னடைந்த நிலையிலே இருக்கின்றது. எனவே, அம்மாவட்டத்தைக் கட்டியெழுப்பு வதற்கென சிறந்ததொரு கட்டமைப்பு உருவாக்கப்பட வேண்டும். மட்டக்களப்பு மாவட்டத்தில் வாவியால் பிரிக்கப் பட்டிருக்கின்ற படுவான்கரைப் பிரதேசமானது, கட்டமைப்பு அற்ற, வலுவான உட்கட்டமைப்பு வசதிகள் அற்ற நிலையிலே இருக்கின்றது. எனவே, அவற்றை அப்பிரதேசத்தில் மேற் கொள்வதற்கான செயற்றிட்டங்கள் எதிர்காலத்தில் உருவாக்கப்பட வேண்டும் என்பது எங்களுடைய முக்கிய தேவையாக இருக்கின்றது.

கடந்த காலங்களில்போல் அல்லாமல், செயற்றிட்டங்கள் பாரபட்சமற்ற முறையில் உருவாக்கப்பட வேண்டும். தமிழ் மக்களுக்கு தமிழ்த் தேசியம் சார்ந்த, சுய நிர்ணயம் சார்ந்த உரிமைகள் வழங்கப்பட வேண்டும். அவர்களின் மொழி உரிமைகள் மதிக்கப்பட வேண்டும். அவர்களின் நில உரிமைகள் பாதுகாக்கப்பட வேண்டும். இவ்வாறான ஒரு நிலையிலே நாம் எதிர்காலத்தில் எமது நாட்டைக் கட்டியெழுப்புவதற்காக உங்களுடன் சேர்ந்து பயணிக்க முடியும். நாம், எங்கள் மீதான அடக்குமுறைகளுக்கு எதிராகக் குரல்கொடுப்பதோ, எங்கள் மண் மீதான ஆக்கிரமிப்பு தொடர்பில் கேள்வி கேட்பதோ, எங்கள் மொழி உரிமையைப் பாதுகாப்பதோ, எங்களுக்கான நீதியைக் கேட்பதோ இனவாதமல்ல! அது எங்களுக்கான சுதந்திரமான குரல்! இந்த விடயத்தில் எதிர்காலத்தில் மிகுந்த கரிசனையுடன் அரசாங்கம் செயற்பட வேண்டும்.

நாம் சிங்கள சகோதரர்களுக்கு எதிரானவர்கள் அல்லர்; இந்த நாட்டுக்கு எதிரானவர்கள் அல்லர். ஆனால், நாம் ஒடுக்குமுறைக்கு எதிரானவர்கள்; பாரபட்சமான முறைகளுக்கு எதிரானவர்கள்; வன்முறைகளுக்கு எதிரானவர்கள்; ஊழலுக்கு எதிரானவர்கள். இந்த விடயத்தில் புதிய அரசாங்கத்தின் செயற்பாடுகள் மற்றும் அவர்களின் வாக்குறுதிகள் நம்பிக்கை அளிப்பதாக இருக்கின்றன. எதிர்காலத்தில் அந்த நம்பிக்கை பாதுகாக்கப்பட வேண்டும். தமிழ் மக்களுக்கான அரசியல் சுயநிர்ணய உரிமை வழங்கப்பட வேண்டும். அவர்களின் மொழி உரிமைகள் பாதுகாக்கப்பட வேண்டும். அவர்களின் நில உரிமைகள் பாதுகாக்கப்பட வேண்டும்.

கடந்த காலத்தில் மிக முக்கியமாக மட்டக்களப்பு மாவட்டத்தின் மயிலத்தமடு - மாதவனை பிரதேசத்தில் பல்லாயிரக் கணக்கான ஏக்கர் நிலங்கள் ஆக்கிரமிக்கப்பட்டன; சுரண்டப்பட்டன. அவற்றைத் தடுப்பதற்கான உறுதிப்பாடுகள் இன்னும் வழங்கப்படவில்லை. மட்டக்களப்பு மாவட்டத்தின் வாகரைப் பிரதேசத்திலுள்ள இல்மனைட் வளமானது திட்டமிட்ட முறையில் ஒரு நிகழ்ச்சிநிரலின் அடிப்படையில் சூறையாடப்பட இருக்கின்றது. இந்த நிலைமைகளை மாற்றியமைப்பதற்கான உறுதிப்பாடுகள் எமக்கு வழங்கப்பட வேண்டும்.

சுபிட்சமான நாட்டைக் கட்டியெழுப்புவதற்காக தமிழ் மக்கள் என்றும் தயாராக இருக்கிறார்கள். வடக்கு, கிழக்கிலுள்ள தமிழ் மக்கள் தமது உரிமைகளைப் பெற்றுக் கொள்வதற்காக இலங்கை தமிழரசுக் கட்சிக்கு வாக்களித்து, எம்மை இப்பாராளுமன்றத்துக்கு அனுப்பி வைத்திருக்கிறார்கள். அவர்களின் உரிமைகளைப் பாதுகாக்கின்ற வகையில் இந்த அரசாங்கம் செயற்பட வேண்டும்; அதற்குரிய செயற்றிட்டங்களை முன்னெடுக்க வேண்டும். ஊழலற்ற, வன்முறையற்ற செயற்றிட்டங்களை முன்னெடுக்க வேண்டும் என்பதில் இந்த அரசாங்கம் எவ்வாறு ஆர்வம் காட்டுகின்றதோ, அதேபோன்று தமிழ் மக்களுக்கான நிரந்தர அரசியல் தீர்வைக் காண்பதிலும், அவர்களுடைய மொழி உரிமையைப் பாதுகாப்பதிலும் ஆர்வம் காட்ட வேண்டும் என்பது எமது எதிர்பார்ப்பாகும். எதிர்காலத்தில் இந்த நாட்டைக் கட்டியெழுப்புகின்ற செயற்பாட்டின்போது நாங்களும் உங்களுடன் சேர்ந்து பயணிப்பதற்குத் தயாராக இருக்கின்றோம். அதற்கான உங்களுடைய தெளிவான சமிக்ஞையை நீங்கள் காட்ட வேண்டுமெனக் கேட்டு, இந்தச் சபையில் எனக்கு உரையாற்றுவதற்குச் சந்தர்ப்பமளித்த உங்களுக்கு நன்றிகூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.56]

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஹங்சக விஜேமுணி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් අවසරයි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දසවැනි සභා වාරය නියෝජනය කරමින් මේ ගරු සභාව අමතන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතියි. ඒ වාගේම, පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ටත් ස්තුතියි. මම මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් තමයි මෙම පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ. මහනුවර දිස්ත්‍රික්කයෙන් මාව පත් කර ගත්, විශේෂයෙන්ම යටිනුවර, උඩුනුවර, සෙංකඩගල, මහනුවර ඇතුළුව මහනුවර දිස්ත්‍රික්කයේ සියලු ආසනවල ජනතාවටත් බොහොම ස්තුතියි.

අපි මෙවර මහ මැතිවරණයට ඉදිරිපත් වුණේ බලවේගයක් විධියට. මහ මැතිවරණයේදී අපේක්ෂකයෙකු විධියට වාගේම මහ මැතිවරණයෙන් පසුවත් මා නියෝජනය කරන්නේ ඒ බලවේගයයි. මා මෙහි පැමිණියේ ඒ මිනිසුන්ගේ බලාපොරොත්තු, ඒ මිනිසුන්ගේ අපේක්ෂාවන්, ඒ මිනිසුන්ගේ සිහින රැගෙනයි. "මා" කියන්නේ එක් පුද්ගලයෙක් නොවෙයි. මම හිතනවා, මා දහස් ගණනක් වූ එම පුද්ගලයන්ගේ වගකීම රැගෙන ආ පුද්ගලයෙක් කියලා.

මා වෘත්තියෙන් වෛද්‍යවරයෙක්. වෛද්‍යවරයෙකු වශයෙන් මා මේ රටට සේවය කළ කාලය අවුරුදු 25ක්. නමුත්, මේ රටට අත් වෙලා තිබෙන ඉරණම හමුවේ මමත් තවත් වෛද්‍යවරු 18කට ආසන්න පිරිසක් තීරණය කළා එක් එක් රෝගියාට ප්‍රතිකාර කරනවාට වඩා මේ මොහොතේ අපේ රටට දේශපාලනික ප්‍රතිකාරයක් අවශ්‍යයි කියලා.

අපි වෛද්‍යවරු විධියට දිවුරුමක් - oath එකක් - දීලා තිබෙනවා. මා හිතනවා ඒ දිවුරුමේ සඳහන් කාරණා දේශපාලනඥයෙකු විධියටත් අපට බෙහෙවින් වැදගත් වෙනවා කියලා. මා දේශපාලනයට අලුත් පුද්ගයෙක් නොවෙයි. මගේ දේශපාලන ජීවිතය අවුරුදු 30කට වඩා ඈතට දිව යන එකක්. අපට දේශපාලනය කියා දුන් මේ රටේ ශිෂ්‍ය ව්‍යාපාරයට, විශේෂයෙන්ම මේ රටේ නිදහස වෙනුවෙන්, මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් තමන්ගේ ජීවිතය පසෙක ලා සටන් කළ ත්‍රිමා, වෙනුර, නිෂ්මී වාගේ ආදරණීය සහෝදරයන්ට මම මගේ ආචාරය මේ අවස්ථාවේදී පිරිනමනවා. අප වාගේ පුද්ගලයන්ට වෛද්‍යවරුන් වෙන්න, ඊට පසු කාලීනව මන්ත්‍රීවරයන් වෙන්න, ඇමතිවරයන් වෙන්න ඉඩ සැදූ මේ රටේ නිදහස් අධ්‍යාපන අවස්ථාව ලබා දුන් සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාට ද මාගේ ප්‍රණාමය මම මේ අවස්ථාවේ පුද කරනවා.

අප මේ මොහොතේ ලබා ගත් ජයග්‍රහණය අප කිහිප දෙනෙකුගේ පෞද්ගලික උත්සාහයක් පමණක් නොවෙයි. ගලක් බිඳෙන්න සියවෙනි කුළු පහර වාගේම පළමුවෙනි කුළු පහරත් ඉතාම වැදගත් කියලා මම විශ්වාස කරනවා. මේ රටේ මේ වෙනස වෙනුවෙන් තමන්ගේ ජීවිත කැප කළ, ඒ වාගේම බොහෝ කැපකිරීම් කළ සියලු වීරෝදාර පුද්ගලයන්ට, වීරෝදාර වීරයන්ට මම මාගේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ජීවත් වන්නේ ඉතාම හොඳ තත්ත්වයක තිබෙන රටක නොවෙයි.

මේ රටේ දේශපාලනය තුළින් මේ රටේ මිනිසුන්ට අවශ්‍ය මූලික කාරණා ඉෂ්ට කිරීමට අපොහොසත් වූ රටක අපි ජීවත් වෙන්නේ. අපි අද මේ කථා කරන මොහොතේත් මේ රටේ බොහෝ මිනිසුන්, බොහෝ පවුල්, බොහෝ ළමුන් අද රෑ තමන්ගේ ආහාරය සොයා ගන්නේ කොහොමද කියන ප්‍රශ්නය නහමින් ඉන්නවා. ඒ වාගේම, අපේ රටේ බොහෝ පළාත්වල බොහෝ මිනිසුන්ට පිරිසිදු වතුර වීදුරුවක් බොනවා කියන එක සිහිනයක්. ඒ වාගේම, රෝගී වුණාම තිබෙන ප්‍රතිකාරයත්, රෝගියාත් අතර මහ විශාල දුරක් තිබෙනවා. මා වෛද්‍යවරයකු විධියට අවුරුදු 25ක් වැඩ කළා. ඒ අවුරුදු 25 තුළ මා දැකලා තිබෙනවා, මේ රටේ රෝගීන් තමන්ගේ ජීවිතය වෙනුවෙන් කොයිතරම් දුරට අසරණ වෙලා ඉන්නවාද කියන එක. ඔබ පසුගිය දවස්වල දකින්න ඇති, ගෑස් පෝලිම්. ඔබ දකින්න ඇති, පෙට්‍රල් පෝලිම්. ඒ පෙට්‍රල් පෝලිම්වල, ගෑස් පෝලිම්වල ඉඳලා අපි දින කිහිපයක් ගිහිල්ලා හරි කොයි වෙලාවක හරි පෙට්‍රල් ටික, ගෑස් ටික ලබා ගත්තා. නමුත්, අතිශයින්ම භයානක පෝලිම් තිබෙන්නේ අපේ රටේ රෝහල්වල. ඒ රෝහල්වල පෝලිම්වල ඉන්න මිනිසුන්ට කවදාවත් ඔවුන් හිතන දේ ලැබෙන්නේ නැහැ. ඔවුන්ට අතේ පොතක් තබා ගෙන, ඒ පොතේ නොම්බරයක් තබා ගෙන, එහෙම නැත්නම් දිනයක් තබා ගෙන තමන්ගේ ජීවිතවලින් සමුගන්න සිද්ධ වෙලා තිබෙනවා. මොකක්ද අපි මේ හදපු රට? අපි මොකක්ද ලබා ගත්ත ජයග්‍රහණ? මිනිස්සුන්ට තමන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් අහිමි වූ සමාජයක තමයි අපි ජීවත් වෙන්නේ. ඒ නිසා අපට ලොකු වගකීමක් තිබෙනවා.

මා මේ විවාදය දවස් දෙකක් අහගෙන හිටියා. අපි අවම වශයෙන් මේ ජනවරමේ ස්වරූපය තේරුම් ගත යුතුව තිබෙනවා. අවම වශයෙන් මේ ජනවරමේ ස්වරූපය අපි තේරුම් නොගත්තොත්, ඒක ලොකු ප්‍රශ්නයක්. මොකද, ඒ ජනවරමේ ස්වරූපය තේරුම් ගත්ත බවක් මට පෙනුණේ නැහැ. මේ ජනවරම අපට ලැබෙන්නේ, මෙච්චර කල් අපේ රටේ හිටපු ඡන්ද දායකයන් ලොකු වෙනස්වීමකට භාජන වූ නිසා. අපි ඒක තේරුම් ගත යුතුයි. මෙච්චර කල් නිකම්ම නිකම් ඡන්ද දායකයන් වෙලා හිටපු අපේ රටේ ජනතාව, පුරවැසි වගකීම හඳුනාගත් පුරවැසියන් බවට පත් වෙනවා. අන්න ඒ පුරවැසියන් ලබා දුන් තීරණය තමයි මේ පාර්ලිමේන්තුව.

අපි ඒක තේරුම්ගත යුතුයි. පුරවැසි වගකීම හඳුනා ගත් පුරවැසියන් සමඟ දේශපාලනය කරන බලවේග මින් ඉදිරියට ඔවුන්ගේ අභිලාෂය තේරුම්ගත යුතුයි. ඒ අභිලාෂය තේරුම් නොගන්නා තරමටම, ඒ බලවේගවලට මේ රටේ දේශපාලනය කිරීමේ හැකියාව නොලැබී යනවා. ඒක තමයි සත්‍යය.

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් ජනාධිපතිතුමා ඇතුළු මේ රජයෙන් මා පත් කරලා තිබෙනවා. මා හිතනවා, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය සම්බන්ධයෙන් වූ මගේ වගකීම ඉෂ්ට කරන්න මට ලොකු හැකියාවක් තිබෙනවා කියලා. විශේෂයෙන්ම සෞඛ්‍ය අංශය ගත්තාම අපට බොහෝ දේවල් කිරීමට තිබෙනවා. එහිදී මා කලින් කිව්වා වාගේ, ප්‍රතිකාර සහ රෝගියා අතර තිබෙන පරතරය අපි අඩු කළ යුතුව තිබෙනවා. ඒ වාගේම රෝග වැළැක්වීමේ අංශයෙන් අපට කළ හැකි, කළ යුතු බොහෝ දේ තිබෙනවා. ඒ සමහර දේවල් අපට ලොකු මුදලක් වියදම් නොවන කාරණා. අදත්, මේ මොහොතේත් අපේ රටේ බොහෝ රෝගීන් ඉන්නේ ඇඳන් යට. එහෙම නැත්නම් බිම. රෝහල්වල bed occupancy rate එක ගත්තාම සියයට 60කට වඩා අඩු ප්‍රමාණයක් තමයි බොහෝ රෝහල්වල තිබෙන්නේ. ඒ අනුව මේවායේ කළමනාකාරණයේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම දේශපාලන නායකත්වය ඒ පිළිබඳව සොයා බලා කටයුතු කිරීමේ ලොකු අඩුවක් තිබෙනවා.

අපේ රටේ ඖෂධ හිඟයක් පිළිබඳව විපක්ෂ නායකතුමා ඊයේ කථා කළා. ඔව්, ඖෂධ හිඟයක් තිබෙනවා. ඒකට හේතු තිබෙනවා. ඒ සමහර ආයතනවල පරිපාලනමය ප්‍රශ්න තිබෙනවා, ඒවාට නොයෙකුත් බාධක තිබෙනවා. ඒ වාගේම දූෂණ තිබෙනවා; වංචා තිබෙනවා. ඒ සියල්ලටම අපේ රජය මැදිහත් වෙනවා. මැදිහත් වෙලා, ඒ ඖෂධ හිඟය හැකිතාක් දුරට අවම කිරීම සඳහා වූ සියලු ක්‍රියාමාර්ග අපි රජයක් විධියට ගන්නවා. ඇත්තටම අද උදේ මේ පාර්ලිමේන්තුව තුළ මට ඉන්න බැරි වුණා. ඊයේත් මට මේ පාර්ලිමේන්තුව තුළ යම් කාලයක් ඉන්න බැරි වුණා. ඒකට හේතුව ඖෂධ සම්බන්ධයෙන් වූ කටයුත්තේ නියැළෙන්න මට සිද්ධ වීමයි. පැය 24ම වැඩ කරලා හෝ ඖෂධ සම්බන්ධයෙන් වන ගැටලුවට හොඳ පිළිතුරක් ලබා දෙන්න රජයක් විධියට අපි අනිවාර්යයෙන්ම කටයුතු කරනවා. අපි ජනතාවට තිබෙන ජීවත් වීමේ අයිතියට සුරක්ෂිතභාවයක් අනිවාර්යයෙන්ම ලබා දෙනවාය කියන පොරොන්දුව දෙනවා.

ඒ වාගේමයි primordial prevention කියන කාරණය. ලෙඩක් හැදෙන්න ඉස්සෙල්ලා ඒ ලෙඩේ වළක්වා ගැනීම කියන කාරණය අපේ රටේ බොහොම දුර්වල මට්ටමක තිබෙන්නේ. විශේෂයෙන්ම ආහාර සම්බන්ධයෙන් වූ සුරක්ෂිතභාවයක් අපේ රටේ අද නැහැ. මම කලින් කිව්වා වාගේ, බොහෝ මිනිසුන්ට පෝෂ්‍යදායී ආහාර නොලැබී යනවා වාගේම, ආහාර ලබා ගන්නා බොහෝ දෙනෙක් තමන් කන්නේ වහද නැද්ද කියලා දන්නේ නැහැ. ඒක නිසා ජනතාව ලබා ගන්නා ආහාරවල සුරක්ෂිතභාවය ලබාදීම රජයක වගකීමක් විධියට අපි සලකනවා.

විශේෂයෙන්ම අවුරුදු 12ට අඩු ළමුන් වෙළෙඳ ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගැනීම අපි ජනවාරි 1වැනි දා සිට නවත්වනවා. ඒ සඳහා වූ ගැසට් පත්‍රය බලාත්මක කිරීමට අවශ්‍ය සියලු කටයුතු අපි යොදලා ඉවරයි. මොකද, පසුගිය රජයයන් විසින් අවුරුදු හත අටක් තිස්සේ ඔය කාරණය පසුපසට දමමින් සිටියා. අපි ගිය සතියේ තීරණයක් ගත්තා, "නැහැ, අපි ඒක පස්සට දමන්නේ නැහැ, ජනවාරි 1වැනි දා ඉඳලා ඒක ක්‍රියාත්මක කරනවා" කියලා. ඒ වාගේම ගුණාත්මක තත්ත්වයේ ඖෂධ - quality drugs - නියම වෙලාවට, නියම ප්‍රමාණවලින්, දරාගත හැකි මිලකට ලබා දීම අපි අනිවාර්යයෙන්ම සහතික කරනවා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙච්චරයි. විශේෂයෙන්ම ජනමාධ්‍ය සම්බන්ධයෙන් වූ කාරණය ගත්තාම, අපි ජනමාධ්‍යවේදීන්ට ජනමාධ්‍යවේදීන් විධියට ජීවත්වීමට අවශ්‍ය පහසුකම් හා අධ්‍යාපනය සඳහා අවශ්‍ය පහසුකම් ළඟා කර දීමට අවශ්‍ය මූලික අඩිතාලම දැන් දමමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.09]

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சதுர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උත්තරීතර දසවැනි පාර්ලිමේන්තුවට මා වැඩිම මනාපයෙන් තෝරා පත් කර ගැනීම වෙනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ ජනතාවටත්, විශේෂයෙන් සමගි ජන බලවේගයට ඡන්දය දුන් සියලුම ජනතාවටත්, මා කෙරෙහි විශ්වාසය පළ කළ සියලු ආදරණීය ජනතාවටත් මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. එමෙන්ම මාතර දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් අවුරුදු 30කට වැඩි කාලයක් තමන්ගේ කාලය, ශ්‍රමය හා ධනය වැය කරමින් විසිහතර පැයේම දේශපාලනය කරපු, මට හැමදාමත් ශක්තියක් වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හිටපු පළාත් සභා අමාත්‍ය දිවංගත ගරු ජස්ටින් ගලප්පත්ති මන්ත්‍රීතුමා - මගේ ආදරණීය පියා - සහ මාගේ පියාගේ මාමා වන හිටපු ධීවර රාජ්‍ය අමාත්‍යවරයකු වූ පී.එස්.එල්. ගලප්පත්ති මැතිතුමාවත් මේ අවස්ථාවේ මා ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා.

මෘදුකාංග ඉංජිනේරුවෙකු විධියට කටයුතු කළ මා පසුව එම වෘත්තියෙන් ඉවත්ව පූර්ණ කාලීනව ක්‍රියාකාරී දේශපාලනයට පිවිසියා. විශේෂයෙන් 2012 වර්ෂයේ මාතර මහ නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයකු ලෙසත්, 2014 වර්ෂයේ වැඩිම මනාපයෙන් තේරී පත් වූ පළාත් සභා මන්ත්‍රීවරයකු ලෙසත් කටයුතු කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් දක්වා ආ ගමන් මඟ තුළ මාහට ශක්තියක් වූ මාගේ ආදරණීය මෑණියන්, බිරිඳ, දරු දෙදෙනා, සොහොයුරිය ඇතුළු පවුලේ ඥාති හිතවතුන්, පාසල් මිත්‍රයින්, දිස්ත්‍රික්කයේ මාගේ ජයග්‍රහණය වෙනුවෙන් පූර්ණ කාලීනව කැපවුණු සියලු ක්‍රියාකාරී හිතවතුන් ද මේ අවස්ථාවේ මා සිහිපත් කරනවා. ඒ වාගේම මාහට අධ්‍යාපනය ලබා දුන් මාතර සුදර්ශන ආදර්ශ විද්‍යාලයේ, මාතර රාහුල විද්‍යාලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යාපන ආයතනයේ ගුරු භවතුන් ඇතුළු ආචාර්ය මණ්ඩලවල සියලු දෙනා මේ අවස්ථාවේ මා ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනය අද දවසෙත් සාකච්ඡාවට භාජන වුණා. අතුරු සම්මත ගිණුම පිළිබඳ විවාද කරන මේ මොහොතේ බොහෝ කාරණා ඉදිරිපත් කරන්න බලාපොරොත්තුව හිටියත්, මට ලැබී තිබෙන කෙටි කාලය තුළ එක කාරණාවක් සාකච්ඡාවට ලක් කරන්න මම බලාපොරොත්තු වෙනවා. අපි මේ රටේ තිබෙන ප්‍රශ්න ටික ප්‍රමුඛතාව අනුව එකේ සිට පහළට පෙළ ගැස්සුවොත්, හොරකම, දූෂණය, වංචාව අවම කිරීමත්, රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීමත් කියන කාරණා දෙක තමයි ප්‍රධානම කාරණා විධියට මම දකින්නේ. මේ ප්‍රශ්න දෙකට විසඳුම් ලබා දුන්නොත් මේ රටේ ප්‍රශ්නවලින් භාගයකට වඩා විසඳෙනවා කියන එක තමයි මගේ පෞද්ගලික හැඟීම. මේ සඳහා මම දකින හොඳම සහ එකම විසඳුම තමයි ඩිජිටල්කරණය. ලෝකයේ ඩිජිටල්කරණය පිළිබඳව සාකච්ඡාවට ලක් වෙන්නේ 2001 වර්ෂයෙන් පසුවයි. ලෝකයේ සමහර රටවල හිටපු නායකයින් ඩිජිටල්කරණයත් එක්ක ගිය නිසා ඒ රටවල් ශීඝ්‍රයෙන් දියුණු වුණු ආකාරය අපි දැක්කා. ලංකාව ගත්තොත්, 2001 වර්ෂයේ එවකට පැවැති රජයේ ඉරාන් වික්‍රමරත්න මැතිතුමාට තමයි ලංකාවේ තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් ආයතනයක් පිහිටුවීම සඳහා උපදෙස් දෙන්නේ. එතුමා එදා වෘත්තිකයෙකු විධියට ICTA ආයතනය නිර්මාණය කිරීම සඳහා ලංකාවේ ඒ සම්බන්ධව දැනුම තිබුණු Prof. V. K. Samaranayake මැතිතුමා - අපේ විශ්වවිද්‍යාලයේ ආචාර්යතුමා - ඇතුළු දක්ෂ කණ්ඩායමකට වගකීම භාර දෙනවා. මෙහි ආරම්භයක් විධියට ICTA ආයතනය නිර්මාණය කළත්, ඊට පසුව බලයට පත් වුණු පාලකයින්, පැවැති රජයන් තොරතුරු තාක්ෂණ විෂයයට සහ ඩිජිටල්කරණයට වැඩි ඇල්මක් දැක්වූවේ නැති නිසා, වැඩි අවධානයක් යොමු නොකළ නිසා එහි ප්‍රතිඵලයක් විධියට තමයි මේ රටේ ප්‍රශ්න ගණනාවක් මතු වෙලා තිබෙන්නේ.

පසුගිය රජයන් විවිධ අවස්ථාවල ඩිජිටල්කරණය සම්බන්ධයෙන් යම් යම් තීන්දු තීරණ ගන්න උත්සාහ ගෙන තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා තොරතුරු තාක්ෂණය

[ගරු චතුර ගලප්පත්ති මහතා]

විෂය සම්බන්ධයෙන් වැඩි ඇල්මක් දක්වපු නායකයකු නිසා එතුමා බලයට පත් වුණාට පස්සේ දක්ෂ කණ්ඩායමකට වගකීමක් භාර දුන්නා. ඒ දක්ෂ කණ්ඩායම system එක change කරන්න ආවත් අන්තිමට system එක විසින් ඒ කණ්ඩායම change කරනවා දැක්ක නිසා එදා ඒ ආයතනයේ අධ්‍යක්ෂවරයා විධියට කටයුතු කළ Dr. Sanjiva Weerawarana වාගේ දක්ෂයින් එතැනින් එළියට ගියා. පසුගිය රජය ICTA ආයතනයේ කාර්යභාරය හරියාකාරව තේරුම් නොගෙන එම ආයතනය වසා දමන්න තීන්දුවක් අරගෙන තිබෙනවා කියලා මට ආරංචියක් ලැබුණා.

මම හිතන විධියට ඒවා ඒ විෂය සම්බන්ධයෙන් දැනුමක් නොමැතිකම තුළ ගත්ත තීන්දු තීරණ. වර්තමාන ජනාධිපතිතුමා මේ විෂය සම්බන්ධයෙන් යම් ඇල්මක් දක්වනවා කියලා අපට පෙනෙන්න තිබෙනවා, ඒ සම්බන්ධව දක්ෂ කණ්ඩායමක් ආශ්‍රය කරනවා කියලා අපට පෙනෙනවා. තරුණ මන්ත්‍රීවරයකු විධියට වර්තමාන ජනාධිපතිතුමාට මා ශුභාශිංසන එක් කරනවා. ඒ වාගේම, අද මේ රජය නියෝජනය කරන පිරිස තුළ තොරතුරු තාක්ෂණ විෂය සම්බන්ධයෙන් දැනුම තිබෙන කණ්ඩායමක් පත් වෙලා තිබෙනවා. අනෙකුත් පාර්ලිමේන්තු වාරවලට වඩා මේක සුවිශේෂී අවස්ථාවක් කියලා මම හිතනවා. මා කලින් කිව්වා වාගේ, මේ රටේ හොරකම, දූෂණය, වංචාව නවත්වන්නත්, රාජ්‍ය සේවය කාර්යක්ෂම කරන්නත් තිබෙන එකම සහ සුදුසුම පියවර ඩිජිටල්කරණය බව මම විශ්වාස කරනවා. ඒ සම්බන්ධයෙන් වර්තමාන ජනාධිපතිතුමාත්, රජයත් මේ වන විට නිවැරදි තීන්දු තීරණ ගන්නවා කියන එක විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු විධියට මට පෙනෙන්න තිබෙනවා. විපක්ෂයේ සිටියත් ඒ වෙනුවෙන් දිය හැකි උපරිම සහයෝගය සහ දායකත්වය ලබා දෙන්න මා සූදානම්.

මේ වෙලාවේ විශේෂයෙන් මා සිහිපත් කළ යුතු කාරණයක් තිබෙනවා. පසුගිය ආණ්ඩුව කාලයේ දීත් විපක්ෂයේ ඉඳගෙන අපි කල්පනා කරපු දෙයක් තමයි මේ රට වෙනස් කරන්න නම් ඩිජිටල්කරණයට මූලිකත්වය දෙන්න ඕනෑ කියන එක. ඒ අනුව අපට කළ හැකි දේ පිළිබඳව අපේ ගරු විපක්ෂ නායකතුමාගේ මූලිකත්වය යටතේ අපි කල්පනා කළා. මොකද, විපක්ෂයේ ඉඳගෙන අපට ලොකු දෙයක් කරන්න බැහැ. හැබැයි, මේ රට ඩිජිටල්කරණය කරන්න කලින් මේ සමාජය තොරතුරු තාක්ෂණයෙන් සන්නද්ධ කරන්න ඕනෑ; අපේ තරුණ පරම්පරාව තොරතුරු තාක්ෂණයෙන් සන්නද්ධ කරන්න ඕනෑ කියලා අපි කල්පනා කළා. අන්න ඒකට පියවරක් විධියට විපක්ෂයේ ඉඳගෙන අපි කල්පනා කළා පාසල් පද්ධතිය තුළ තොරතුරු තාක්ෂණ විෂය ඉහළ නංවන්න. ඒ වෙනුවෙන් සුළු පියවරක් විධියට සුහුරු පන්ති කාමර ලබා දීමේ ව්‍යාපෘතිය අපි ආරම්භ කළා. බොහෝ දෙනෙක් ඒ සම්බන්ධව විහිළු-තහළු කළා. නමුත් අපේ පරමාර්ථය වුණේ වෙන දෙයක් නොවෙයි. අද වෙනකොට සමස්ත සමාජයම සුහුරු පන්ති කාමර ගැන කථාබහ කරන තැනකට පත් වෙලා තිබෙනවා. හැබැයි, ඒක එදා හිටපු රජය විසින් නොවෙයි කළේ. එදා විපක්ෂය විධියටයි අපි ඒ කටයුත්ත කළේ. අපි එසේ සුහුරු පන්ති කාමර ලබා දීමේ ප්‍රධාන අරමුණු කිහිපයක් තිබුණා. ඒක බොහෝ දෙනෙක් දැක්කේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சதுர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
ඇත්තම කාරණාව ගත්තොත්, එදා බොහෝ දෙනෙක් දැක්කේ මේක පරිත්‍යාගයක් විධියට විතරයි. හැබැයි, අපි එතැනින් එහාට ගිහින් විදුහල්පතිවරයා, තොරතුරු තාක්ෂණ විෂය උගන්වන ගුරුවරයා යන සියලුදෙනාම එකතු කරලා ඔවුන් දැනුවත් කළා. මොකද, පාසල් අධ්‍යාපනයට පරිබාහිරව ව්‍යවසායකයන් විධියට ඔවුන් ගොඩනඟන්නේ කොහොමද කියන එක ගැනත් අපි හිතුවා. පාසල් කාලය තුළ පාසල් විෂයයට අමතරව ව්‍යවසායකයින් විධියට ඔවුන් ගොඩනැඟීමට අවශ්‍ය අමතර දැනුම ලබා දීම සඳහාත් අපි මේ සුහුරු පන්ති කාමරය පාවිච්චි කළා. ඒ විතරක් නොවෙයි. අද සමාජය තුළ සාමාන්‍ය පෙළ කරපු ළමයි ඉන්නවා, උසස් පෙළ කරපු ළමයි ඉන්නවා, ඒ වාගේම උපාධි තබාගෙන ගෙවල්වලට වෙලා ඉන්න ළමයි ඉන්නවා. ඔවුන්ට අනාගතයක් නැතිව ගෙදරට වෙලා සිටිනකොට විපක්ෂයක් විධියට අපි දැකපු දේ තමයි ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමට යමක් කළ යුතුයි කියන එක. අන්න ඒ සඳහා පාසල් වියේ සිටම ඔවුන්ට තොරතුරු තාක්ෂණ දැනුම ලබා දෙන්න ඕනෑ කියලා අපි කල්පනා කළා. ලෝකයේ තිබෙන නවීන තාක්ෂණය පිළිබඳ දැනුම ගම්වල සිටින අහිංසක දරුවන්ට ලබා දීලා, ඔවුන්ට දෙපයින් සිටගැනීමට පුළුවන් පරිසරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් තමයි එදා අපි සුහුරු පන්ති කාමර ලබාදෙන්න කටයුතු කළේ.

විශේෂයෙන්ම මට ලැබුණු මේ කෙටි කාලය තුළ මා නැවතත් වර්තමාන ජනාධිපතිතුමාටත්, එම රජයටත් මගේ ශුභාශිංසන එක් කරනවා. පසුගිය දවස් කිහිපය තුළ මේ සභාවේ මතුවෙච්ච කාරණා දිහා බලනකොට විපක්ෂයේ මන්ත්‍රීවරයකු විධියට හිතට කනගාටුවක් දැනෙන කාරණාවකුත් තිබෙනවා. මොකද, ගොඩක් සාකච්ඡාවලදී අවුරුදු 74ක සාපයක් ගැන නිතර නිතර කථා කරන්න ගත්තා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சதுர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න, හැම තිස්සේම "ඔයගොල්ලන්ගේ කාලයේ, ඔයගොල්ලන්ගේ කාලයේ" කියලා ඉස්සරහ දෙසට තමයි ඇඟිල්ල දිගු වුණේ. අපි පාරම්පරික එක්සත් ජාතික පක්ෂයෙන් ආවත්, පිරිසිදු බලවේගයක් විධියට සමගි ජන බලවේගය ගොඩනඟා ගත්තේ 2020 වර්ෂයේයි. දැන් මෙතුමන්ලා අවුරුදු 74ක සාපයක් ගැන කියනවා. විශේෂයෙන්ම 1948ට කලින් මේ රට වැඩවසම් ක්‍රමයක් තිබුණු, දුගී ජනතාව වැඩියෙන් හිටපු රටක්. හැබැයි, 1948න් පසුව 1994 දක්වා එනකොට දකුණු ආසියාවේ ශීඝ්‍රයෙන්ම දියුණු වන රට බවට පත් වුණේ ලංකාවයි. ඒ වාගේ තත්ත්වයකදී අවුරුදු 74ක සාපයක් ගැන කියන එක වැරදියි කියන එක තමයි මගේ මතය. ඒ වාගේම 1994න් පසුව 2024 දක්වා වාමාංශික දේශපාලන කඳවුරක් තමයි වැඩි කාලයක් බලයේ සිටියේ. අපට අවස්ථා කිහිපයකදී බලය ලැබුණත්, රාජ්‍ය නායකයා වුණේ ඇත්තටම අපේ පක්ෂයේ කෙනෙක් නොවෙයි. 2001දී වුණත්, 2005දී වුණත් ඇත්තටම මේ රටේ නායකයා බවට පත් වුණේ වෙනත් පක්ෂයක කෙනෙක්. ඒ නිසා ඔය අවුරුදු 74ක සාපයට අපිව අදාළ කරගන්න එපා කියන කාරණාවත් සිහිපත් කරන ගමන්, මට අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.19]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஸ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විශේෂයෙන්ම සතුටු වනවා, ඔබතුමා මූලසුනේ ඉන්න වෙලාවේ මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සමාජ පරිවර්තන කාර්යයකට මුල පිරීමක් හැටියට කොළඹ දිස්ත්‍රික්කය ඇතුළු රටේ සමස්ත ජනතාව අපට ඡන්දය දුන්නා. ඒ සියලුදෙනාට මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරනවා. හැබැයි, විශේෂයෙන්ම විපක්ෂයේ ඉන්න අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ පරිවර්තනය තේරුම් අරගෙනද ඉන්නේ කියන ප්‍රශ්නය මට තිබෙනවා. අපි දන්නවා, මේ දක්වා පාර්ලිමේන්තුවේ සිදු වුණේ, ආණ්ඩුව පැත්තෙන් විපක්ෂය පැත්තට බලය යන එකයි, ඒ කට්ටිය පැරදිලා ආපහු අනික් පැත්තට බලය යන එකයි කියලා. අවුරුදු පහෙන් පහට පැති මාරු වනවා. ආණ්ඩුව පැත්තේ ඉඳන් විපක්ෂය පැත්තට ගියාට පසුව, ආණ්ඩුව තිබෙන පැත්තට චෝදනා කරනවා. නමුත්, මේ සිද්ධ වෙලා තිබෙන්නේ ඒක නොවෙයි. මේ සිද්ධ වෙලා තිබෙන්නේ, ඒ පැත්තට, මේ පැත්තට ඒමක් නොවෙයි; මේ පැත්තේ ඉඳන් පිරිසක් එහා පැත්තට යැමකුත් නොවෙයි. මේ අලුත් පිරිසක්. මේ අලුත් පිරිසකට තමයි මෙතුමන්ලා මේ සියල්ලම කියන්නේ. ඒක නිසා මම හිතන්නේ, විපක්ෂය මේ වෙනස තේරුම් අරගෙන නැහැයි කියලායි.

අපි පළමු වතාවට පාලන බලය අරගෙන, පළමු වතාවටයි මේ ආණ්ඩුවක් කරන්නේ. හැබැයි, විපක්ෂය ඒ තත්ත්වය තේරුම් අරන් නැහැ. එහෙම නැත්නම් අපෙන් පොල් ඉල්ලන්නේ නැහැ නේ. හැබැයි, අපෙන් පොල් ඉල්ලනවා. පොල් ඉල්ලුවාට කමක් නැහැ. පොල් දෙන්නත් වෙනවා. මොකද, අපි දැන් ආණ්ඩුව කරනවා නේ. හැබැයි, දැන් අපට හම්බ වෙලා තිබෙන්නේ මොකක්ද? අපි පොල්වලින්ම උදාහරණය ගනිමුකෝ. දැන් අපට කණාටු වෙච්ච, විනාශයට ගිය පොල් වත්තක් හම්බ වෙලා තිබෙනවා. අපට සරුසාර පොල් වත්තක් හම්බ වුණා නම්, ඔබතුමන්ලාට කියන්න තිබෙන්නේ, "ඇයි පොල් ටික කඩන්නේ නැත්තේ?, පොල් ටික කඩලා දෙන්න" කියලායි. නමුත්, තිබුණේ කණාටු වෙච්ච පොල් ඉඩමක්. ඒ පොල් ඉඩම අපි ගත්තා. ඒක අරගෙනත් දවස් 14යි. මේ දවස් 14 ඇතුළත අපෙන් පොල් ඉල්ලනවා. ඇත්තෙන්ම කිව්වොත්, මෙන්න මේක තමයි මේ දවස් හතරේම මෙතැන සිද්ධ වෙච්ච ලොකුම දේ. මට හිතෙනවා, එක්කෝ මේ අය මේක වුවමනාවෙන් තේරුම් අරගෙන නැහැ. එහෙම නැත්නම්, තේරුම් ගන්න කැමැති නැහැ. එක්කෝ තේරුම් නොගත් විධියට බොරුවට ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අතුරු සම්මත ගිණුමක් කියන්නේ මොකක්ද? අපට අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන්න ඕනෑ වුණේ ඇයි? අපේ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමාත් මේ ගැන කිව්වා. නමුත්, කොච්චර කිව්වත් මේ ගැන නිතරම අහනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම උදාහරණයක් කියන්නම්. ක්‍රිකට් ක්‍රීඩාවේ ඉන්නවා nightwatchman කියලා කෙනෙක්. Nightwatchman කියන්නේ කවුද? Nightwatchman කියන්නේ, එදා දවසේ තරගය අවසන් වෙන්න පැය භාගයක් විතර තිබෙද්දී එතෙක් ක්‍රීඩා කළ පිතිකරුවෙකු දැවී ගියාට පස්සේ එවනවා, පිතිකරුවෙක් නොවන පිතිකරුවෙක්. අන්න ඔහුට තමයි nightwatchman කියන්නේ. අතුරු සම්මත ගිණුම කියන්නේත් ඒ වාගේ දෙයක්. මෙය, අය වැයක් නොවන අය වැයක්. මේකේ තිබෙන්නේ, වැය. ඇයි, එය වුවමනා වෙලා තිබෙන්නේ? අපේ රටේ රාජ්‍ය පාලනයේ ප්‍රධාන කුලුනු 3ක් තිබෙනවා. ඒ, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය. රටක මේ දේවල් පවත්වාගෙන යන්න ඕනෑ. හැබැයි සිද්ධ වෙච්ච දේ තමයි, මැතිවරණවලින් පස්සේ ආණ්ඩුව භාරගත් කාල සීමාවත් එක්ක ජනවාරි 01වැනි දායින් පටන් ගන්න ඊළඟ මුදල් වර්ෂයට අය වැයක් ඉදිරිපත් කරන්න කාලයක් නොමැති වීම. ඒ නිසා මේ ආණ්ඩුව කරලා තිබෙන්නේ, එතෙක් අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන එක. අපි නොවෙයි, කවුරු බලයේ හිටියත් කරන්න වෙන්නේ මේකයි. ඒක තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. අතුරු සම්මත ගිණුමකින් විශාල දෙයක් කරන්න බැහැ. මේ රට, මේ ආණ්ඩුව පවත්වාගෙන යැමේ කටයුත්ත තමයි අපට මේකෙන් කරන්න වෙලා තිබෙන්නේ. ඒ දේ තේරුම් නොගෙන මේ සාකච්ඡාව සිදු වුණාය කියන එක තමයි මන්ත්‍රීවරයෙකු හැටියට මට කියන්න තිබෙන්නේ.

අභියෝග තිබෙන බව අපි දන්නවා. අපි අභියෝග භාර ගන්න ඕනෑ. ඇත්තටම අපට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද?

දැන් තමුන්නාන්සේලා කියනවා, තමුන්නාන්සේලාගේ කාලයේ අවුරුදු 76ක් ගැන අපි චෝදනා කරනවා කියලා. චෝදනා නොකර කොහොමද? ඇයි මම එහෙම කියන්නේ? අපට සිද්ධ වෙලා තිබෙනවා, නගරයේ තිබෙන වැසිකිළිය හදන්නත්, ගුවන් තොටුපොළේ මගී පර්යන්තය හදන්නත්. ඇත්තටම බලාගෙන යනකොට අවුරුදු 76ක කාලය ඇතුළත අඩුම ගානේ නගරයේ තිබෙන වැසිකිළියවත් හදලා නැහැ නේ. අඩුම ගානේ වැසිකිළියවත් හදලා තිබුණා නම්, ඒ ටික සම්පූර්ණ කරලා තිබුණා නම්, මේ රටේ ජනතාවට සාමාන්‍ය ජීවන රටාව අරගෙන යන්න ඒ අවශ්‍ය යටිතල පහසුකම් හදලා තිබුණා නම්, මේ රට එහෙම තිබුණු තත්ත්වයක රටක් නම්, ඇත්තටම කිසිම ගැටලුවක් ඇති වෙන්නේ නැහැ. හැබැයි, අපට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? අපට සිද්ධ වෙලා තිබෙනවා, නගර ටිකේ වැසිකිළි ටික හදන්නත්; ඒ වාගේම ගුවන් තොටුපොළේ මගී පර්යන්තය හදන්නත්. ඒ දෙකම කරන්නට අපට සිද්ධ වෙලා තිබෙනවා. ඉතින් මම විශ්වාස කරනවා, විශේෂයෙන්ම පළපුරුදුයි කියන මේ රටේ ආණ්ඩු කරපු මේ දෙපැත්තේම අයට මේ ගැන හිතන්න වෙලා තිබෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය කියන්න හිටියේ නැහැ. නමුත්, මේක කියන්න වෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් අපේ ආදරණීය, සදාදරණීය නායක රෝහණ විජේවීර සහෝදරයාත් මේකට පටලවාගෙන ඒ මැරිච්ච ජීවිත වෙනුවෙන් රුපියල් ලක්ෂ 50ක් වන්දි ගෙවන්න කියලා කියනවා. ඔස්කාර් වයිල්ඩ් කියන දාර්ශනිකයා කියලා තිබෙනවා, "ඕනෑම දෙයක මිල දන්නා නමුත්, වටිනාකම නොදන්නා නරුමයෙකි" කියලා. සියලු දේ මිල මුදලින් අගය කරනවා, හැබැයි වටිනාකමක් දන්නේ නැහැ. ඒ ගරු මන්ත්‍රීතුමා රුපියල් ලක්ෂ 50කට මිල කරනවා, ජීවිතයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලිනුත් මම පාර්ලිමේන්තුවේ හිටියා නේ. එතකොට එතුමන්ලා ආණ්ඩුවේ හිටියා; ආණ්ඩුවල හිටියා. හැබැයි, කවදාවත් අපි ඒ ජීවිත මිල කරලා වන්දි ඉල්ලුවේ නැහැ. අපට පුළුවන්කම තිබුණා නම්, අපි ඒ පාලකයන්ගෙන් ඉල්ලනවා, රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු ඒ ආදරණීය සහෝදරයන්ගේ ජීවිත නැවත දෙන්න කියලා. හැබැයි අපි දන්නවා, ඔවුන්ට ඒ ජීවිත නැවත දෙන්න බැහැ කියලා. ඒ නිසා අපට ඒ ආදරණීය සහෝදර සහෝදරියන් වෙනුවෙන් වන්දි ඉල්ලන්න බැහැ. අපි ඉල්ලන්නේත් නැහැ. හැබැයි බලන්න, මේ මන්ත්‍රීවරුන් මොන තත්ත්වයකද ඉන්නේ කියලා. අර මම කියපු ඔස්කාර් වයිල්ඩ් කියන දාර්ශනිකයා කියන කථාව හරි. නරුම විධියට මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරනවා. මම දන්නේ නැහැ, ඒක කොයි විධියට කියනවාද කියලා. මෙන්න මේක තමයි ඇත්ත තත්ත්වය. මේ අය මෙතෙක් ආණ්ඩු කළේ මේ විධියට තමයි.

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ගෙනෙන මේ අතුරු සම්මත ගිණුමෙන් පසුව අපි මේ රට හදන්න, මේ රට ගොඩනඟන්න අය වැයක් ඉදිරිපත් කරනවා. ඒකට පෙර ගෙන එන අතුරු සම්මත ගිණුමයි මේ. ඒ අය වැයේදී අපි බලාපොරොත්තු වෙනවා, විශේෂයෙන්ම ජනාධිපතිවරයා ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන දේවල් ඇතුළේ මේ රට හදන්න; මේ රට ගොඩනඟන්න; නිෂ්පාදන ආර්ථිකයකට යන්න. ඒ අනුව මේ රටේ නිෂ්පාදන ආර්ථිකයකට අවශ්‍ය පදනම දමන්න අපි කටයුතු කරනවා. ඒක අනිවාර්යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ මම Facebook එක බලනකොට මට එහි තිබූ නිසඳැසක් හම්බ වුණා. ඉතින් මට හිතුණා, ඒක හොඳයි කියලා මේ පාර්ලිමේන්තුවේ කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஸ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විනාඩි දෙක මට ඇති, ඒ නිසඳැස කියන්න. ඒ නිසඳැසේ මාතෘකාව තමයි, "තෙමෙන තැන්" කියන එක. එහි මෙහෙම කියනවා, "එක පාරටම මහ හයියෙන් වහින්න පටන් ගත්තා කරදර නම් තමයි, ඒත් මම තෙමෙන තැන් දැනගත්තා" කියලා. මම මේ පාර්ලිමේන්තුවේ තෙමෙන තැන් දැනගත්තේ ස්ථාවර නියෝග අත්හිටුවන්න එදා මුල්ම දවසේ අපි ගත්ත තීරණය සම්බන්ධව කලබල වෙච්ච තරමෙනුයි; ඒ මහ වැස්සෙනුයි. මම කියන්නේ නැහැ, මේ ඔක්කෝම අය කියලා. හැබැයි මේ පාර්ලිමේන්තුවේ විපක්ෂය පැත්තේ ඉස්සරහ තෙමෙන තැන් ටිකක් තිබෙනවා. ඒ පැත්තේ එහා කෙළවරේත් එක තෙමෙන තැනක් තිබෙනවා. ඔය තැන්වලින් හැමදාම තෙමෙන්න ගන්නවා. ඒක අනිවාර්යයි. හැබැයි, අපට ගැටලුවක් නැහැ. මොකද, අපට මන්ත්‍රීවරුන් 159දෙනෙක් ඉන්නවා. සමහර විට මේ 159ට උදවු කරන්න විපක්ෂයෙන් තව මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුත් හෘදය සාක්ෂියට අනුව කටයුතු කරාවි කියා මං විශ්වාස කරනවා. මොකද, එහෙම අය අනිවාර්යයෙන්ම ඉන්නවා. නමුත් කවදාවත් අපට ඔය තියෙන තෙමෙන තැන් වහන්න වෙන්නේ නැහැ. ඒ නිසා අපට තිබෙන්නේ මේ රට ගොඩනැඟීම වෙනුවෙන් ඒවා නොසලකා ඉදිරියට යන්නයි.

හැමදාම උදේට පාර්ලිමේන්තුව පටන් ගන්නකොට මහ හයියෙන් වහිනවා වාගේ ඔය තැන්වලින් තෙමෙන්න ගනීවි. නමුත්, ඒක නොසලකා අපට මේ රට හදන්න, මේ රට ගොඩනඟන්න සිද්ධ වෙනවා. මේ රට ගොඩනැඟීම වෙනුවෙන් අපි ඒ කාර්යභාරය කරන්න සූදානම්. එ් කාර්යභාරය කරන බව මේ පාර්ලිමේන්තුවේ මගේ පළමු කථාවේදී ප්‍රකාශ කරමින් මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. KITNAN SELVARAJ left the Chair and THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES took the Chair.*

[අ.භා. 4.30]

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. මෙය මා මෙම උත්තරීතර පාර්ලිමේන්තුව අමතන ප්‍රථම අවස්ථාව නිසා මා කැමැතියි, අප ලැබූ ජයග්‍රහණය සම්බන්ධයෙන් අපට ඡන්දය ලබා දුන් ජනතාවට ස්තුති කරන්නට. ශ්‍රී ලංකාව තුළ ජනතාව දශක ගණනාවක්, පරම්පරා ගණනාවක් තමන්ව අයුක්තියට, අසාධාරණයට, පීඩාවට පත් කිරීමට එරෙහිව අරගළ කරමින් සිටිනවා. දහස් ගණනක් ඒ සඳහා නොයෙකුත් කැප කිරීම්, පරිත්‍යාග කිරීම් කර තිබෙනවා. පසුගිය ජනාධිපතිවරණයේදීත්, පාර්ලිමේන්තු මැතිවරණයේදීත් අප ජයග්‍රහණය ලැබුවේ, ඒ දහසකුත් එකක් කැප කිරීම් කළ සියලු සහෘදයන්ගේ අප්‍රතිහත ධෛර්යය නිසාම බව මා ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒ වාගේම වසර ගණනාවක් දැඩි කැපවීමෙන් යුතුව, උත්සාහය අත් නොහැර, සත්‍යය වෙනුවෙන් පෙනී සිටි මිනිසුන්ගේ, ගැහැනුන්ගේ උදාරතර අධිෂ්ඨානය වෙනුවෙන් ඔවුන්ට මගේ ප්‍රණාමය පළ කර සිටිනවා. එලෙසින්ම පසුගිය මැතිවරණයේදී අපගේ ජයග්‍රහණය වෙනුවෙන් ඡන්දය පාවිච්චි කළ, නොයෙක් ආකාරයෙන් ඒ සඳහා දායක වුණු සහෝදර සහෝදරියන්ට විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ආසනයේ ඡන්ද දායකයන්ට මගේ හෘදයංගම ස්තුතිය පළ කර සිටිනවා. කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව මෙවර මන්ත්‍රී ධුර 8ක් අපට -ජාතික ජන බලවේගයට- හිමි කර දුන්නා.

අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා පසුගිය දින කිහිපයේ විවිධ කරුණු පිළිබඳව සාකච්ඡා කළා. අද අපි සාකච්ඡා කරමින් සිටින්නේ අතුරු සම්මත ගිණුම පිළිබඳවයි. ඒ පිළිබඳව පවත්වන විවාදයටයි මේ එක් වී සිටින්නේ. පළමුවෙන්ම මා කියන්න කැමැතියි, ජාතික ජන බලවේගයේ කණ්ඩායමක් තමයි අද මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ කියන එක. පරිණත සමහර මන්ත්‍රීවරු පසුගිය දින කිහිපය තුළ මේ පාර්ලිමේන්තුවේදී නොයෙක් ආකාරයේ ප්‍රකාශ නිකුත් කළා; විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳව. හැබැයි, ඒගොල්ලන් අතුරු සම්මත ගිණුම ගැන පළ කළ අදහස් ඉතාම සීමිතයි.

අතුරු සම්මත ගිණුම ගැන අදහස් පළ කරනකොට ප්‍රකාශ කරන්න තිබුණේ, මීට පෙර ඉදිරිපත් කළ අතුරු සම්මත ගිණුම්වල තිබුණු සාධනීය කරුණු මොනවාද, මේ අතුරු සම්මත ගිණුමේ යම්කිසි අඩුපාඩුවක් තිබෙනවාද, එහෙමත් නැත්නම් වඩා හොඳින් මේ වියදම් වාර්තාව අපි සකස් කර ගන්නේ කොහොමද, මොනවාද අඩු පාඩු කියන කාරණා පිළිබඳවයි. නමුත්, මේ පරිණත මන්ත්‍රීවරු ජනතා විමුක්ති පෙරමුණ ගැන පසුගිය දිනවල ළඳරු ප්‍රකාශ නිකුත් කළා.

ඇත්තටම අවුරුදු ගණනක් තිස්සේ මේ රටේ දේශපාලනයට සම්බන්ධ වෙච්ච පුද්ගලයෙක් මම. ශිෂ්‍යයෙක් හැටියට තමයි මම මේ දේශපාලනයට අත් පොත් තබන්නේ. අවුරුදු ගණනක් තිස්සේ මම මේ රටේ දේශපාලනය පිළිබඳව අවදියෙන් සිටියා. එලෙස අවදියෙන් සිටීම නිසාම තමයි, මීට අවුරුදු 7කට පෙර අපි ජාතික ජන බලවේගය වැනි මහජන ව්‍යාපාරයක් ගොඩනගාගෙන, මේ රටේ සමාජ පරිවර්තනයක් වෙනුවෙන් ඉදිරිපත් වෙන්නේ.

ජනතා විමුක්ති පෙරමුණ තමයි අපේ දේශපාලන ව්‍යාපාරයට නායකත්වය සපයමින් දේශපාලන මහ පෙන්වීම සැපයුවේ. ඒ වාගේම, මේ ව්‍යාපාරය ගොඩනඟන්න විවිධ සංවිධාන අපිත් එක්ක එකතු වුණා. ජාතික විද්වත් සංවිධානය, වෘත්තිකයින් මේ ව්‍යාපාරය ගොඩනඟන්න පසුගිය අවුරුදු අටක කාලය තුළ විශාල කැපවීමක් කළා. ඒ වාගේම, ජනතා විමුක්ති පෙරමුණ මේ ව්‍යාපාරයේ න්‍යෂ්ටිය හැටියට අපට අවශ්‍ය දේශපාලන මහ පෙන්වීම කළා. ඒ වාගේම තමයි, එක්සත් වාමාංශික බලවේගය. ලංකා සමසමාජ පක්ෂයෙන් වෙන් වුණු එක්සත් වාමාංශික බලවේගය, ජාතික ජන බලවේගය තුළ දේශපාලන කටයුතුවල යෙදුණා. ඒ වාගේම, ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයෙන් වෙන් වුණු විකල්ප කණ්ඩායමත් ජාතික ජන බලවේගයේ දේශපාලන ක්‍රියාදාමය තුළ විශේෂ කාර්යයක් කළා. ඒ වාගේම, අපේ ගරු අගමැතිනිය, හරිනි අමරසූරිය සහෝදරියගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වුණු ප්‍රගතිශීලී ස්ත්‍රී සාමූහිකය ජාතික ජන බලවේගය තුළ ක්‍රියාත්මක වුණා. ඒ වාගේම, "ජන උදානය" වැනි සිවිල් ව්‍යාපාරත් මේ තුළ ක්‍රියාත්මක වුණා. මේ සියලුදෙනාගේ කැපවීම, මැදිහත්වීම නිසා තමයි අපි මේ විශාල ජයග්‍රහණය ලබා ගන්නේ. මන්ත්‍රීවරු 159ක් නියෝජනය වෙන මට්ටමට ඇවිල්ලා, මේ රටේ ජනාධිපතිවරයා ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා ලෙස පත් කර ගැනීමට හැකි මහජන ව්‍යාපාරයක් ලෙස ගොඩනඟා ගන්නේ මීට අවුරුදු 7කට පෙරයි. එම නිසා අපි විශ්වාස කරනවා, මේ ජයග්‍රහණය අපි රැක ගත යුතුයි කියලා. ඒ ජයග්‍රහණය රැක ගැනීමට තමයි අපි මේ කටයුතු කරමින් ඉන්නේ. මේ අතුරු සම්මත ගිණුම අපට වැදගත් වෙන්නේ ඊළඟ අවුරුද්දේ මුල් මාස 4 තුළ අපට අවශ්‍ය කරන අත්‍යවශ්‍ය වියදම් කරන්නයි. ඒ සඳහා තමයි අපි මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරලා තිබෙන්නේ. අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහනය, භාණ්ඩ හා සේවා ආනයනය, අධිකරණය, ආරක්ෂක අංශ වාගේ විශේෂ සේවා ක්‍රියාත්මක කරන්න තමයි අපට මේ මුදල් අවශ්‍ය වෙන්නේ. ඒ වාගේම ඔබ දන්නවා, ඖෂධ, ඉන්ධන, ගෑස්, කිරිපිටි වැනි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය අපට ආනයනය කිරීමට සිදු වෙන බව.

රටේ එදිනෙදා කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යන්න තමයි අපි මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ වාගේම, ජාතික ජන බලවේගය වැඩ පිළිවෙළේ තේමාව වන "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන එක අපි මේ මැතිවරණ ව්‍යාපාරය පුරාම ඉදිරිපත් කළා. අනුර කුමාර දිසානායක සහෝදරයා ජනාධිපතිවරණයට පෙනී ඉන්නකොට ඉදිරිපත් කළ ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අඩංගු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න තමයි අපි මේ සූදානම් වෙමින් ඉන්නේ. ඒ වාගේම, මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න රාජ්‍ය සේවයේ විවිධ නිලධාරින්, සේවකයන් මේකට මැදිහත් වෙනවා. ඒ අය තෘප්තිමත්භාවයකින් මේ රාජ්‍ය සේවය කරගෙන යන්න අවශ්‍ය කරන කටයුතු සම්පාදනය කරන්න තමයි අපට විශේෂයෙන්ම මේ මුදල් වෙන් කිරීම් අවශ්‍ය වෙන්නේ.

ඒ වාගේම ඔබ දන්නවා, සෞඛ්‍ය සේවාව වැනි අත්‍යවශ්‍ය සේවාවල ඇතිවෙලා තිබෙන විවිධ අර්බුදකාරී තත්ත්වයන්ට මේ වෙනකොට අපි රටක් විදියට මුහුණ දෙමින් සිටින බව. ඒ තත්ත්වය මහ හරවා ගන්නට අපට මේ මුදල් වෙන් කිරීම අවශ්‍ය වෙනවා. අපි විශ්වාස කරනවා, සෞඛ්‍ය කියන්නේ මේ ආර්ථිකයට බලපාන ඉතාම වැදගත් අංශයක් කියලා. නිරෝගී, ශක්තිමත්, බුද්ධිමත් පිරිමි, ගැහැනු අපේ රටේ ආර්ථිකයට ශක්තියක්, සම්පතක්. ඒ වාගේම තමයි, දුර්වල, නිතර රෝගී වන, බෙලහීන පිරිමි, ගැහැනු අපේ රටේ ආර්ථිකයට බරක්. ඔවුන්ගෙන් රටට ලැබෙන ඵලදායකත්වය අඩුයි. ඔවුන්ගේ දායකත්වය අඩු වෙනවා. ඒ නිසාම තමයි මේ වාගේ කාර්යයන් සඳහා මුදල් වෙන් කරන්න ඕනෑ. අපි මේ කාර්යය කරගෙන යන්න ඕනෑ, මේ රටේ ජනතාවට බරක් නොවන ආකාරයටයි. ඒ සඳහා තමයි මේ අතුරු සම්මත ගිණුමෙන් අවශ්‍ය කරන මුදල් වෙන් කිරීම් කර ගන්න අපි සූදානම් වෙන්නේ.

ඔබතුමන්ලා දන්නවා, අපේ රටේ සෞඛ්‍ය සේවය බරපතළ අර්බුද ගණනාවකට මුහුණ දී සිටින බව. මේ වෙනකොට සමහර ඖෂධවල හිඟ තත්ත්වයක් තිබෙන බව අපි දන්නවා. ඒ වාගේම අපි දන්නවා, ඒ ඖෂධ පිළිබඳව තිබෙන තොරතුරුත් සමහර විට ප්‍රමාණවත් නැහැ කියලා. ආයතන කිහිපයක් මේ පිළිබඳව වග වෙනවා. ජාතික ඖෂධ නියාමන අධිකාරිය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ඖෂධ නිෂ්පාදන ආයතන ඒවාට මැදිහත් වෙනවා. ඉදිරි කාල සීමාව තුළ ඒ ආයතන ක්‍රියාත්මක කරවීම තමයි අපට අවශ්‍ය වෙන්නේ. එහෙම නොවුණොත්, ජනතාවගේ මූලික අවශ්‍යතා අපට ඉෂ්ට කරන්න බැරි වෙනවා. මොකද, අපි දන්නවා, අපේ රටේ ජනතාව තමන් බදු ගෙව්වාට පස්සේ, ඒ කියන්නේ out-of-pocket expenditure හැටියට විශාල වියදමක් දරන බව, සෞඛ්‍ය සේවය ලබා ගන්න. ඒක තවදුරටත් ජනතාවට දරා ගන්න බැරි නිසා තමයි අපට අවශ්‍ය වෙන්නේ අපේ වැඩ පිළිවෙළ ඉක්මනින් ක්‍රියාත්මක කරලා ඒ අයට අවශ්‍ය කරන මූලික අවශ්‍යතා සපයලා ඒ ජනතාව සුවපත් කරන්න අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගන්න. ජනතාව සෞඛ්‍ය සඳහා වියදම් කරන මුදල ආදායමෙන් සියයට 10කට වඩා වැඩි කර ගත්තොත්, ලෝක සෞඛ්‍ය සංවිධානය කියනවා, catastrophic health expenditure කියලා. ඒ කියන්නේ, ඒ ගොල්ලන්ගේ ජීවිතය පවත්වාගෙන යාමට බැරි වෙන තරමට සෞඛ්‍ය සඳහා ඒ අයට වියදම් කරන්න වෙනවා කියන එකයි. එතකොට ආහාරවලට, ඇඳුම්-පැළඳුම්වලට, අධ්‍යාපනයට ඒ ගොල්ලන්ට වියදම් කරන්න තිබෙන මුදල් සෞඛ්‍ය සඳහා වැය කරන්න වෙනවා. ඒ නිසා තමයි අපි ඉක්මනින් මේ සඳහා මැදිහත් වෙන්න ඕනෑ. අපට මේ කාරණා කල් දාන්න බැහැ. එහෙම වුණොත් ඒ ජීවිත අඩාළ වෙනවා. ඒ නිසා තමයි විශේෂයෙන් මේ වාගේ අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරලා, ඒක සම්මත කරගෙන, මේ රටේ ජනතාවගේ ජීවිතය යහපත් කරන්න අවශ්‍ය කරන ඒ ක්‍රියාමාර්ග ගන්න එක වැදගත් වෙන්නේ.

අපි දන්නවා, ජනතාව රෝගවලට ගොදුරු වුණොත් සංකූලතා ඇති වෙන බව; රෝග උත්සන්න වෙන බව; ඒ ගොල්ලන්ගේ ඵලදායිතාව අඩු වෙන බව. ඒගොල්ලන්ගේ රැකියා කිරීමේ හැකියාව අඩු වෙලා ඒගොල්ලන්ගේ ආදායම තවත් අඩු වෙනවා. අපි දන්නවා, සෞඛ්‍ය සේවයේ බරපතළ ගැටලු කිහිපයක් තිබෙනවා කියලා. වසරකට හදිසි අනතුරු නිසාම පමණක් රෝහල්ගත වීම් මිලියන 1.2ක් සිදු වෙනවා. ඒ වාගේම මරණ 10,000කට වැඩි ප්‍රමාණයක් සිදු වෙනවා. ඒ නිසා සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම ඉතා වැදගත්. ජාතික ජන බලවේග රජය හැටියට අපි විශ්වාස කරනවා, මේ වාගේ වැදගත් සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමට අපට මේ අතුරු සම්මත ගිණුම ඉවහල් වේවි කියලා.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්. සාලි නලීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

**ගරු මොහමඩ් සාලි නලීම් මහතා**
(மாண்புமிகு மொஹமட் சாலி நழீம்)
(The Hon. Mohamed Sali Naleem)
මට විනාඩි 12ක කාලයක් තිබුණා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට විනාඩි නවයයි වෙන් කරලා තිබෙන්නේ.

[பி.ப. 4.43]

**ගරු මොහමඩ් සාලි නලීම් මහතා**
(மாண்புமிகு மொஹமட் சாலி நழீம்)
(The Hon. Mohamed Sali Naleem)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இவ்வுயர் சபையில் எனது கன்னியுரையை ஆற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கிய எல்லாம் வல்ல ஏக இறைவனைப் புகழ்ந்தவனாக, அண்ணலார் முஹம்மது நபி (ஸல்) அவர்கள்மீது ஸலவாத்துக் கூறியவனாக எனது உரையை ஆரம்பிக்கின்றேன்.

என்னை இந்த நாட்டின் நற்பிரஜையாகப் பெற்று வளர்த்த, சமூகத்தின் கனதியான பொறுப்பை சுமந்து நிற்கும் மக்கள் பிரதிநிதிகளில் ஒருவனாக ஆளாக்கிய எனது அன்புத் தந்தை முஹம்மது சாலி அவர்களுக்கும், பாசமிகு தாய் சுபைதா உம்மா அவர்களுக்கும், எனது மனைவி, பிள்ளைகள், சகோதர, சகோதரிகள், குடும்ப உறவினர்கள் மற்றும் நண்பர்களுக்கும், அன்று தொடக்கம் இன்றுவரை அரசியல் பயணத்தில் ஈடுபட எனக்குத் தன்னம்பிக்கையையும் தைரியத்தையும் தந்த அனைவருக்கும் எனது இதயபூர்வமான நன்றிகளை காணிக்கை ஆக்கிக்கொள்கின்றேன். எனக்கான அரசியல் அடையாளத்தையும் தேசிய ரீதியில் அங்கீகாரத்தையும் தந்த, நான் என்றும் கௌரவமாக மதிக்கின்ற மரியாதைக்குரிய முஸ்லிம் சமூகத்தின் உரிமைக் குரலும் எமது பேரியக்கமுமான ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் தேசியத் தலைவரும் முன்னாள் அமைச்சரும் சட்டமுதுமாணியுமான கௌரவ றவுப் ஹகீம் அவர்களுக்கும், எங்களுடைய கட்சியின் செயலாளர் சனாதிபதி சட்டத்தரணி நிஸாம் காரியப்பர் அவர்களுக்கும், கட்சியின் தவிசாளர் அப்துல் மஜீத் அவர்களுக்கும், உச்சபீட உறுப்பினர்கள், மாவட்ட மற்றும் பிரதேச அமைப்பாளர்கள், முன்னாள் பாராளுமன்ற உறுப்பினர்கள், முன்னாள் நகர சபை உறுப்பினர்கள், முன்னாள் பிரதேச சபை உறுப்பினர்கள் மற்றும் கட்சியின் செயற்பாட்டாளர்கள் என அனைவருக்கும் எனது நன்றிகளைத் தெரிவித்துக்கொள்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்தில் எமது கட்சியின் வெற்றிக்காக அயராது பாடுபட்ட கௌரவ பாராளுமன்ற உறுப்பினர் (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களுக்கும், கல்குடா தேர்தல் தொகுதி அமைப்பாளரும் சகோதர வேட்பாளருமான சட்டத்தரணி ஹபீபுர் ரிபான் அவர்களுக்கும், என்மீது நம்பிக்கைகொண்டு எனக்கு ஆதரவு வழங்கிய காத்தான்குடி, ஏறாவூர், கல்குடா வாக்காளர் நெஞ்சங்களுக்கும், என்மீது நட்புறவுகொண்ட அடிப்படையில் வாக்களித்த சகோதர இனத் தமிழ் உறவுகளுக்கும் நான் இவ்விடத்தில் நன்றி கூறக் கடமைப்பட்டுள்ளேன்.

இந்தத் தேசத்தில் ஊழலற்ற நல்லாட்சியை ஏற்படுத்தும் வகையில், ஒட்டுமொத்த மக்களும் ஒரு மாற்றத்தை எதிர்பார்த்து நின்ற வேளையில், எங்களுடைய அநுர குமார திஸாநாயக்க அவர்கள் அனைத்து இன மக்களினதும் ஆதரவைப் பெற்று சனாதிபதியானார். சனாதிபதி அவர்களுக்கும் இந்த உயரிய சபையில் 159 ஆசனங்களைப் பெற்று ஆட்சி அமைத்திருக்கின்ற ஆளும் கட்சிக்கும் நான் இந்த இடத்தில் வாழ்த்துகளைத் தெரிவித்துக்கொள்கின்றேன். இவர்கள் மக்களுக்குச் சேவை செய்வதாக வாக்குறுதி யளித்ததன் அடிப்படையில் தொடர்ந்தும் பணியாற்ற வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக்கொள்கின்றேன்.

"மக்களின் வரிப் பணம் மக்களுக்கே!" என்ற அடிப்படையில் செயற்பட்ட நான், 2018ஆம் ஆண்டு ஏறாவூர் ஓட்டுப்பள்ளி வட்டாரத்தில் நகர சபை உறுப்பினராகத் தெரிவுசெய்யப்பட்டேன். அதன்பிறகு, ஏறாவூர் நகர சபையின் தவிசாளராகச் செயற்பட்டேன். அக்காலப்பகுதியில் தவிசாளருக்கு வழங்கிய எந்தவிதச் சலுகையையும் பெறாமலே நான் சேவையாற்றினேன். அதாவது, சம்பளம், வரப்பிரசாதங்கள் எதையும் பெறாமல் சேவையாற்றினேன். எனக்கு வழங்கப்பட்ட சம்பளத்தைக்கூட நான் என்னுடைய மக்களுக்காகக் கொடுத்தேன். அதுமாத்திரமல்ல, என்னுடைய சொந்த வாகனத்தையே நான் கடமையின்போதும் பாவித்தேன். இந்த உயரிய சபையின் உறுப்பினர் என்ற அடிப்படையில் எனக்குக் கிடைக்கின்ற கொடுப்பனவுகளை நான் என்னுடைய மக்களுக்காகப் பகிர்ந்தளிப்பேனே தவிர, ஒரு ரூபாயைக்கூட என்னுடைய சொந்தச் செலவுக்காகப் பெறமாட்டேன் என நான் இந்த உயரிய சபையில் உறுதியளிக்கிறேன்.

கடந்த வாரம் ஏற்பட்ட வெள்ளப்பெருக்கு காரணமாக எமது மட்டக்களப்பு மாவட்டம் பல்வேறு பாதிப்புகளைச் சந்தித்தது. இதனால் 23,651 குடும்பங்களைச் சேர்ந்த 73,532 பேர் பாதிக்கப்பட்டார்கள். வெள்ளத்தால் பாதிக்கப்பட்ட மக்கள் தங்குவதற்கென அங்கு தற்காலிக முகாம்கள் அமைக்கப்பட்டபோதிலும், முஸ்லிம் பகுதிகளிலும் தமிழ் பகுதிகளிலும் இருந்த சிலர் தங்களுடைய சகோதரர்களின் வீடுகளிலேயே தங்கியிருந்தார்கள். இதனைக் கருத்திற் கொண்டு அவர்களையும் கணக்கிலெடுத்து, நிதி உதவி களையும் நிவாரணங்களையும் இந்த அரசாங்கம் வழங்க வேண்டுமென நான் இந்த உயரிய சபையில் வேண்டிக்கொள்கின்றேன்.

அடுத்து, எங்களுடைய மாவட்டத்திலுள்ள ஏறாவூர் தள வைத்தியசாலை சம்பந்தமாகச் சில விடயங்களைப் பேசலாமென நினைக்கின்றேன். மட்டக்களப்பு மாவட்டத்தில் சுகாதாரத் துறையில் நிவர்த்தி செய்யப்படவேண்டிய பல விடயங்கள் காணப்படுகின்றன. மட்டக்களப்பு மாவட்டத்தில் அதிகமான மக்கள் கஷ்டப்படுபவர்களாகவும், அன்றாடம் பல்வேறு துன்பங்களைத் தாங்கியவர்களாகவும், அன்றாட வாழ்க்கையைக் கொண்டுநடாத்துவதற்குக்கூட வழியற்றவர் களாகவும் காணப்படுகின்றார்கள். எனவே, அவர்களுக்கான சுகாதார சேவையைப் பெற்றுக்கொடுக்க வேண்டுமென நான் கௌரவ சுகாதார அமைச்சர் அவர்களை வேண்டிக் கொள்கின்றேன்.

ஏறாவூர் தள வைத்தியசாலையில் சீன அரசாங்கத்தின் நிதி உதவியின்கீழ் கட்டப்பட்ட 4 மாடி கட்டிடத்தொகுதி திறந்து வைக்கப்பட்டுள்ள போதிலும், அதில் போதியளவு அடிப்படை வசதிகள் இல்லை. அது ஒரு தள வைத்தியசாலையாக இருந்தும்கூட, அங்கு வைத்தியர்களுக்கான, துறைசார்ந்த நிபுணர்களுக்கான, மருந்துக்கான பற்றாக்குறை காணப் படுகின்றது. அந்தப் பற்றாக்குறைகளை நிவர்த்திசெய்து தருமாறு நான் சம்பந்தப்பட்ட அமைச்சர் அவர்களை வேண்டிக்கொள்கின்றேன். அதுமட்டுமல்ல, அங்கு இடப்

பற்றாக்குறையும் காணப்படுகின்றது. அதனை நிவர்த்தி செய்யும் வகையில் அங்கு போதியளவு கட்டிடங்களை அமைப்பதற்குக்கூட நிலம் இல்லாமல் இருக்கிறது. இதனைக் கருத்திற்கொண்டு தற்காலிக பொதுச் சந்தை அமைந்திருக்கின்ற இடத்தை அந்த வைத்தியசாலைக்குப் பெற்றுத்தருமாறு நான் சம்பந்தப்பட்ட அமைச்சர் அவர்களை வேண்டிக்கொள்கின்றேன்.

1912ஆம் ஆண்டு அலிகார் தேசிய பாடசாலைக்கென சுவீகரிக்கப்பட்ட காணியின் ஒரு பகுதி இன்று பொலிஸாரின் வசம் இருக்கின்றது. அப்பாடசாலை மாணவர்களுடைய நலன்கருதி, அவர்களுக்கென நிரந்தரக் கட்டிடத்தைப் பெற்றுக்கொடுத்து, அந்தக் காணியை விடுவித்து, அதை அப்பாடசாலைக்குப் பெற்றுத்தருமாறு நான் சம்பந்தப்பட்ட அமைச்சர் அவர்களை வேண்டிக் கொள்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எங்களுடைய மீராகேணி, மிச்நகர், ஐயங்கேணி போன்ற பிரதேசங்களின் காணி அதிகாரம் ஏறாவூர் பற்றுப் பிரதேச செயலகத்திடம் கொடுக்கப்பட்டு இருக்கின்றது. ஆனால், அவற்றின் நிருவாக அதிகாரம் ஏறாவூர் நகர சபையிடம் கொடுக்கப்பட்டு இருக்கின்றது. இப்பிரதேச மக்கள் சுமார் 30 வருட காலமாக காணி உறுதியற்றவர்களாகக் காணப்படுகின்றார்கள். ஆனால், கடந்த ஆட்சிக் காலத்தில் 'உறுமய' திட்டத்தின்கீழ் 5-6 வருடங்கள் குடியிருந்தவர் களுக்குக்கூட காணி உறுதிகள் வழங்கப்பட்டன. சுமார் 30 வருட காலமாகியும் எங்களுடைய மீராகேணி, மிச்நகர், ஐயங்கேணி பிரதேச மக்களுக்கு ஏறாவூர் பற்றுப் பிரதேச செயலாளர் காணி உறுதிகளை வழங்காமல் இருக்கின்ற துர்ப்பாக்கியமானதொரு நிலைமை காணப்படுகின்றது. இதனைக் கருத்திற்கொண்டு, அப்பிரதேசங்களின் காணி அதிகாரத்தை ஏறாவூர் நகரப் பிரதேச செயலகத்துக்கு வழங்குமாறு நான் இந்தச் சபையில் வேண்டிக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මොහමඩ් සාලි නලීම් මහතා**
(மாண்புமிகு மொஹமட் சாலி நழீம்)
(The Hon. Mohamed Sali Naleem)
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

எமது பிரதேசத்திலுள்ள பொதுச் சந்தைக் கட்டிடம் உடைக்கப்பட்டு, அதில் புனரமைப்பு வேலைகள் நடக்கின்ற போதும்கூட, சுமார் 9 வருட காலமாக அப்பணிகள் முடிக்கப்படாத ஒரு துர்ப்பாக்கிய நிலைமை காணப்படு கின்றது. ஆகவே, போதியளவு நிதி ஒதுக்கீட்டைச் செய்து கொடுத்து, அந்தப் பொதுச் சந்தையின் புனரமைப்புப் பணிகளை முடிவுறுத்தித் தருமாறு நான் இந்த உயரிய சபையில் வேண்டிக்கொள்கின்றேன். அதுமாத்திரமன்றி, எங்களுடைய பிரதேசத்திலுள்ள மீராகேணி வீதி, குடியிருப்பு வீதி போன்ற வீதிகளைப் புனரமைக்கும் பணி உலக வங்கித் திட்டத்தின்கீழ் ஒப்பந்த அடிப்படையில் கொடுக்கப்பட்டது. எனினும், சம்பந்தப்பட்ட ஒப்பந்தக்காரர்கள் அப்பணியை முடிவுறுத்தாத ஒரு துர்ப்பாக்கிய நிலைமை காணப்படுகின்றது. நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.52]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayathissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා විසින් උදෑසන මතු කරන ලද ප්‍රශ්නයකට පිළිතුරු ලබා දෙමින්ම මගේ කථාව ආරම්භ කරන්න කැමැතියි.

'ලංකාදීප' පුවත්පත උපුටා දක්වමින් එතුමා කිව්වා, "බාල බෙහෙත් 500ක් රටපුරා රෝහල්වල" කියලා. කවුද එහෙම කියලා තිබෙන්නේ කියලා මා ඇහුවාම, කොළඹ ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කරන වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන කිව්වා කියලා තමයි එතුමා මේ ගරු සභාවට කිව්වේ. මම මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශයෙන් වාර්තාවක් කැඳෙව්වා. ඒ වාර්තාව මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

මට කලින් අග්‍රාමාත්‍ය ගරු හරිනි අමරසූරිය මැතිනිය සෞඛ්‍ය අමාත්‍යාංශයේ කටයුතු කළා, පොඩි කාලයක්; මාස දෙකහමාරක පමණ කාලයක්. මා එම අමාත්‍යාංශයට ඇවිත් සති දෙකක් විතර තමයි වෙන්නේ.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය ඇතුළු ආයතනවල බරපතළ ප්‍රශ්න තිබුණා කියන එක අපි දන්නවා. හැබැයි "බාල බෙහෙත් 500ක් රටපුරා රෝහල්වල" කියන මේ පුවත සත්‍යය විකෘති කරලා පළ කරපු ඉතාම සාවද්‍ය පුවතක් බව මම කියන්න කැමැතියි. එය පදනම් විරහිතයි. රජයේ රෝහල්වලට ලබා දෙන්නේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් අනුමත කරන ලද ඖෂධ පමණයි. අපි ඒ ක්‍රියාවලිය ශක්තිමත් කරමිනුයි යන්නේ.

යම් තැනක පිහිටි රෝහලක ඖෂධ හිඟයක් ඇති වුණොත් ඒ අයට පුළුවන් ප්‍රාදේශීය මිල දී ගැනීම් - local purchasing - කරන්න. එහෙත් යම් ක්‍රමවේදයක් සහිතවයි. ඒ සඳහා තිබෙනවා, තාක්ෂණික ඇගයීම් කමිටුවක්. ටෙන්ඩර් කිරීමක් කළ යුතුයි. ඒ ආදි ක්‍රියාවලියක් හරහා තමයි එක්කෝ රජයේ ඔසුසල්වලින්, එහෙම නැත්නම් නියෝජිත ආයතනවලින් ඒ ඖෂධ ලබා ගත හැකි වන්නේ. එම නිසා බාල බෙහෙත් ඒ ප්‍රාදේශීය රෝහල්වල හෝ වෙනත් රෝහල්වල තිබෙනවා කියන පුවත අසත්‍යයි. එහෙම වාර්තාවක් MSD එකට හෝ NMRA එකට ලැබිලා නැහැ. බාල බෙහෙත් කියලා කියන්න පුළුවන්කම ලැබෙන්නේ යම් රෝහලකින් එවැනි ඖෂධයක් පිළිබඳව පරීක්ෂා කරන්න ඒ අදාළ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ආයතනවලට යවලා, පරීක්ෂා කරලා එහි ගුණාත්මක තත්ත්වයෙහි අඩුවක් තිබුණා කියා වාර්තා වුණාට පසුවයි. මොන ඖෂධ ද කියලා මෙහි සඳහන් කරලාත් නැති නිසා තමන් භාවිත කරන ඖෂධ සම්බන්ධයෙන් ජනතාව තුළ යම් සැකයක් ඇති වෙන්නට පුළුවන්. මේ ප්‍රවෘත්තියෙන් විය හැකි දේ එයයි. ඒ නිසා මම හිතනවා, කරුණු හරිහැටි හැදෑරීමකින් තොරව වෙනත් යම් අරමුණු සහිතව මෙවැනි දේ කිීම සුදුසු නැහැ කියලා. යම් යම් ඖෂධවල හිඟයන් යම් යම් කාලවල ඇති විය හැකියි. අපි ඒ ක්‍රියාවලිය-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
පත්තරේ තිබුණේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඒක තමයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කළේ කවුරු හරි කියපු දෙයක් උපුටා දැක්වීමක්. ඒකයි මම කිව්වේ, ඔබතුමා එය ඉදිරිපත් කළාට වඩා- *[බාධා කිරීමක්]* මම ඇහුවා නේ, කවුද කිව්වේ කියලාත්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමියත් දන්නවා, අප මේ ආණ්ඩුව ආරම්භ කරලා කටයුතු කරගෙන යන කොට රාජ්‍ය ආදායම් එකතු කර ගැනීම සඳහාත් විශාල මැදිහත්වීමක් කරමින් ඉන්නවා කියන එක. ජනාධිපතිවරයා මුදල් ඇමතිවරයා හැටියට ඒ සම්බන්ධයෙන් නිරන්තරව කටයුතු කරමින් ඉන්නවා. අපට දැන් පුළුවන්කම ලැබිලා තිබෙනවා එම කටයුත්ත කරගෙන යන්න. මේ රටේ ජනතාව මත්පැන් පානය කරන කොට මේ වන විටත් ගෙවලා තිබෙන බදු මුදලක් තිබෙනවා. මේක මේ මත්පැන් නිෂ්පාදනය කරන සමාගම්වලින් අය කර ගන්නා බද්දක් නොවෙයි; ඒ කියන්නේ ඍජු බද්දක් නොවෙයි; ආදායම් බදුවලට අයිති එකක් නොවෙයි. ජනතාව මත්පැන් පරිභෝජනයේදී මේ වන විටත් ගෙවලා තිබෙන බද්දක් තිබෙනවා. ඒ බද්ද නොගෙවා ඉන්න සමාගම් තිබෙනවා.

මම දැන් ඒ එකින් එක කියන්නම්. අප ඒ අය සම්බන්ධයෙන් ගත්තු ක්‍රියා මාර්ග මොනවාද කියලාත් කියන්නම්. එක සමාගමක් තමයි, ඩබ්ලිව්.එම්. මෙන්ඩිස් සහ සමාගම. ඒ ගොල්ලන්ට තිබෙනවා, සමාගම් තුනක්. එක සමාගමක් 2022ට පෙර නොගෙවූ බදු තිබෙනවා. එක සමාගමක් 2023 බදු ගෙවලා නැහැ. එක සමාගමක් 2024 බදු ගෙවලා නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා, ඩබ්ලිව්.එම්. මෙන්ඩිස් සහ සමාගමේ අයිතිකරු ඇලෝසියස් බව. මේ නොගෙවූ බදුත් එක්ක; හිඟ බදු සහ අධිභාරයත් එක්ක මේ අය රුපියල් මිලියන 5,800කට -රුපියල් බිලියන 5.8කට- ආසන්න ප්‍රමාණයක් ගෙවිය යුතුයි.

මේවා අය කර ගන්න පසුගිය රජයන් කටයුතු කළේ නැහැ. මේවා, 2022, 2023, 2024 කියන අවුරුදුවල රජයට අය විය යුතු බදු. නමුත්, අපි මොකක්ද කරලා තිබෙන්නේ? ඒ හිඟ බදු මුදල් නොගෙවීම හේතුවෙන් ඒ සමාගම්වල බලපත්‍ර මේ වන විටත් අත්හිටුවලායි තිබෙන්නේ. ඒ නිසා කිසිදු ආකාරයක ගනුදෙනු නැහැ; සමාවක් නැහැ. ඒ බලපත්‍ර අහෝසි කරලා තිබෙනවා. පනතින් බලය දී තිබෙන්නේ බලපත්‍ර අත්හිටුවන්න විතරයි. හැබැයි, ඒ පනතින් බලය දී තිබුණා නම් දේපළ පවරාගෙන ඒ මුදල් අය කර ගන්න, අපි ඒ දේත් සිදු කරනවා. මොකද, මේ රටේ ජනතාව විසින් මත්පැන් පානය කරන කොට ගෙවපු බද්ද පවා ඒ සමාගම් රජයට දීලා නැහැ. ඉතින් අපට තේරුම් ගන්න පුළුවන්, 2022, 2023, 2024 කාලය තුළ ඒ අය බදු නොගෙවන කොට ඒ ගැන මේ පාර්ලිමේන්තුවේ ලොකු සංවාදයක්, කථා බහක් ඇති වුණේ නැත්තේ ඇයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමියටත් මතක ඇති, ඇලෝසියස්ගෙන් මුදල් ගත්තු අය ගැන පසු ගිය කාලයේ පුවත්පත්වල වාර්තා වුණ බව. ඒ අයට දුරකථන ඇමතුම් ගත්තු ඒවා, ඒ අයට WhatsApp messages යවපු ඒවා, SMS යවපු ඒවා, CID වාර්තා එහෙම මෙහි සභාගත කළා. ඇලෝසියස්ගෙන් සල්ලි ගත්තු අය කිහිප දෙනෙක් මේ සභාවේත් අප ඉස්සරහ -<u>එහා</u> පැත්තේ- ඉන්නවා.

මා ඉහතින් කිව්වේ එක සමාගමක් ගැන. ඊළඟට, වයඹ ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම සහ මැකලම් බෲවරි පුද්ගලික සමාගම. ඒ සමාගම් දෙකත් ගෙවිය යුතු බදු තිබෙනවා. හැබැයි, රජය විසින් ඒ බදු අය කර ගන්න යනකොට ඒ අය ඒ හිඟ බදු සහ අධිභාර සම්බන්ධයෙන් සුරාබදු දෙපාර්තමේන්තුවට එරෙහිව නඩු පවරා තිබෙනවා. ඒ නඩු කටයුත්ත දැන් දිගත් වෙමින් පවතිනවා.

ඊළඟට, ග්ලෝබ් බ්ලෙන්ඩර්ස් ඇන්ඩ් බොට්ලර්ස් ලංකා පුද්ගලික සමාගම, කළුතර සමුපකාර සමිතිය, වයඹ හෝල්සේල්ස් ස්ප්‍රීට් ස්ටෝරේජ් කම්ප්ලෙක්සස් පුද්ගලික සමාගම කියන මේ සමාගම් තුනේත් හිඟ බදු තිබෙනවා. මම ඒ ගැන විස්තර කියන්නම්. වයඹ ඩිස්ටිලරීස් පුද්ගලික සමාගමේ තිබෙනවා, 2004 - 2005 කාලයේ හිඟ බදු. ඈත කාලයේ ඒවා තිබෙන්නේ. මැකලම් බෲවරි පුද්ගලික සමාගමේ තිබෙනවා, 2004 හිඟ බදු. ග්ලෝබ් බ්ලෙන්ඩර්ස් ඇන්ඩ් බොට්ලර්ස් ලංකා පුද්ගලික සමාගමේ තිබෙනවා, 2004 - 2005 කාලයේ හිඟ බදු. කළුතර සමුපකාර සමිතියේ තිබෙනවා, 2008 ඉඳන් 2019 වන කල් හිඟ බදු. වයඹ හෝල්සේල්ස් ස්ප්‍රීට් ස්ටෝරේජ් කම්ප්ලෙක්සස් පුද්ගලික සමාගමේ තිබෙනවා, 2004 හිඟ බදු. මම අවසානයට කියපු <u>ව</u>යඹ හෝල්සේල්ස් ස්ප්‍රීට් එකේයි, කළුතර සමුපකාර සමිතියේයි, ග්ලෝබ් බ්ලෙන්ඩර්ස් කියන සමාගමේයි හිඟ බදු අය කර ගැනීමට අදාළ නෛතික ක්‍රියා මාර්ග ගන්න ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නවා. දැනට ඒ ආයතන ක්‍රියාත්මක වන්නේ නැති නමුත් ආණ්ඩුව ඒ කටයුතු කරමින් ඉන්නවා. ඒ හිඟ බදු උපරිම වශයෙන් අය කර ගන්න නෛතික ක්‍රියා මාර්ගවලට අපි අවතීර්ණ වෙලායි ඉන්නේ. අපි ඒ කටයුත්ත කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම පසුගිය කාලයේ මොකක්ද කරලා තිබෙන්නේ? එක පැත්තකින්, බාර් ලයිසන් බෙදලා තිබෙනවා. ඒවායේ නම් දැන් එකින් එක එළිදරව් වෙනවා. අනෙක් පැත්තෙන්, ඒ බාර්වල විකුණපු අරක්කුවලට අය විය යුතු බදු මුදල් එකතු කරගෙන නැහැ. ඒවා තමන්ගේ හිතවතුන් අතරේ බෙදා හැරලා තියලා තිබෙනවා. සමහර ඡන්දවලට මිටි පිටින් අරගෙන තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන එක මන්ත්‍රීවරයෙක් -ඔබතුමන්ලාගේ පක්ෂයේ- අන්න කියලා තිබෙනවා, ඇලෝසියස්ලාගෙන් සල්ලි ගත්තු හැටි. එතුමා මෙහි සිටියා නම් හොඳයි. මලු පිටින් සිරිකොතින් ඡන්දයට සල්ලි ගෙනාවෙ කොහොමද කියලා කියා තිබෙනවා. එයා දැන් මේ පාර්ලිමේන්තුවේ සජබ මන්ත්‍රී කෙනෙක්. මේ ගොල්ලන් එක්ක එහෙම සම්බන්ධයක් තිබෙනවා.

මම මේ වෙලාවේදී විශේෂයෙන්ම තවත් කාරණයක් කියන්න කැමැතියි. ඊයේ දවසේ කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වා, වර්තමාන ජනාධිපති අපේ අනුර කුමාර දිසානායක සහෝදරයාට වෙන් කරලා තිබෙන මුදලයි, රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමාට වෙන් කරපු මුදලයි එක හා සමානයි, කොහොමද එහෙම

වෙන්නේ, වියදම් කප්පාදු කළා නම් එහෙම වෙන්න බැහැ නේ කියලා. ඕක උපුටා දක්වන්න ගිහිල්ලා කවින්ද ජයවර්ධනට අන්තිමේදී ගලේ පහරපු බළලාට වෙච්ච වැඩේ වාගේ දෙයක් වුණා. එහෙමයි කිව යුතු වන්නේ. එහෙම වැඩක් වුණා මේ පාර්ලිමේන්තුවේදී. අපි ඒක දැක්කා, ඊයේ හවස 4.45ට විතර. බොහොම පැහැදිලිව තිබෙනවා, ඒ වියදම් අඩු වෙලා තිබෙන්නේ කොහොමද කියලා. මේ තිබෙන්නේ මේ අතුරු සම්මත ගිණුමෙන් ඊළඟ මාස හතරට අප වෙන් කරගෙන තිබෙන මුදල. හැබැයි, මේකත් එලෙසම වියදම් වෙන්නේ නැහැ. මම කැට තියලා කියන්නම්, මේ වෙන් කරලා තිබෙන මුදලිනුත් සැලකිය යුතු ප්‍රමාණයක් වියදම් කරන්නේ නැහැ, එය ඉතුරු කරලා යළි රජයට භාර දෙනවා කියලා. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. අපි ඒ වියදම් කප්පාදුව කරනවා.

රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා විසින් 2025 වසරේ පළමුවැනි මාස හතරට වෙන් කරපු මුදලට වඩා සැලකිය යුතු ප්‍රමාණයක් අඩුවෙන් තමයි අප මේ අතුරු සම්මත ගිණුමෙන් වෙන් කරගෙන තිබෙන්නේ. උදාහරණයක් හැටියට කිව්වොත්, ජනාධිපතිවරයා වෙනුවෙන් -ජනාධිපතිවරයාගේ කටයුතු සඳහා- රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයා 2025 පළමුවැනි මාස හතර සඳහා වෙන් කර ගැනීමට නියමිතව තිබුණු මුදලට වඩා රුපියල් කෝටි 14.46ක් අඩුවෙන් තමයි මේ ජනාධිපතිවරයා වෙන් කරගෙන තිබෙන්නේ. මෙහි එකම එක ශීර්ෂයක් තිබෙනවා මුදල් වැඩියෙන් වෙන් කරපු. එහි විතරක් අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා වෙනුවෙන් වෙන් කර තිබෙන මුදල වැඩියි, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා හිටියා නම් වෙන් කර ගන්නා මුදලට වඩා. එහි රුපියල් මිලියන 6.21කින් වැඩිපුර වෙන් කිරීමක් කරලා තිබෙනවා. ඒක වෙන් කරලා තිබෙන්නේ වෙන කාටවත් නොවෙයි. ඒක වෙන් කරලා තිබෙන්නේ, හිටපු ජනාධිපතිවරුන්ට පහසුකම් සපයන්න.

ඒ මුදල වැඩි වෙන්නේ වෙන මොකුත් නිසා නොවෙයි, රනිල් වික්‍රමසිංහ කියන හිටපු ජනාධිපති කෙනෙක් අලුතින් ඒකට එකතු වුණ නිසා. එතුමා එකතු වුණේ නැත්නම් අර ගණනම තියා ගන්න තිබුණා. ඒ වාගේම මේ Vote එක වැඩිකල් තිබෙන්නේ නැහැ. මේ අයට තිබෙන වරප්‍රසාදත් මාස කිහිපයක් යනකොට අපි අනිවාර්යයෙන් කප්පාදු කරනවා. ඒවාත් ජනතාවට ඉතුරු වෙන දේවල්. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා මේ මාස 4 තුළ හිටියා නම් සාමාන්‍යයෙන් ජනාධිපති කාර්යාලයේ පරිපාලන කටයුතු වෙනුවෙන් එතුමා වෙන් කරන්න බලාපොරොත්තු වෙන මුදලට වඩා සියයට 16.3ක් මෙවර අඩුවෙන් වෙන් කරලා තිබෙන්නේ. ඒකට PSD එකට පහසුකම් සැපයීම ඇතුළු සියලු දේවල් සම්බන්ධයි. ඒ නිසා මම කියන්න කැමැතියි බොහොම පැහැදිලිව, මේ Vote on Account එකෙන් අපට වෙන් කරගෙන තිබෙන මුදල රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයා වෙන් කර ගත් මුදලට වඩා සැලකිය මට්ටමකට අඩුයි කියලා. අඩුයි විතරක් නොවෙයි, ඒ මුදල අනිවාර්ය වශයෙන්ම අපි ඉතිරි කරලාත් දෙනවා.

ඒ එක්කම, විටින් විට කථා බහක් ආවා අපේ උපදේශකවරු සම්බන්ධයෙන්. අපි ජනාධිපති උපදේශකවරු කිහිප දෙනෙක් පත් කරගෙන තිබෙනවා, ඒ ඒ විෂයයන්වලට අදාළව. ඇත්තටම කිව්වොත් ඒ අය ස්වේච්ඡාවෙන් කටයුතු කරන උදවිය. උදාහරණයක් හැටියට කිව්වොත්, මහාචාර්ය ගෝමික උඩුගමසූරිය මහත්මයා. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ මූලික උපාධිය හදාරලා, පශ්චාත් උපාධියත් අරගෙන, ඊට පස්සේ ඇමෙරිකාවේ හූස්ටන් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සම්බන්ධයෙන් කීර්තියක් උසුලන කෙනෙක්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තව විනාඩි 2ක් දෙන්න.

ඔහු ස්වේච්ඡාවෙන් මේ කටයුතු කරනවා. ඒ වාගේම අපේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශකවරයකු හැටියට කටයුතු කරන ජ්‍යෙෂ්ඨ නීතිඥ ජේ.එම්. විජේබණ්ඩාර මහත්මයා ස්වේච්ඡාවෙන් ඒ නීති උපදේශක කටයුතු කරනවා. හාන්ස් විජයසූරිය මහත්මයා ස්වේච්ඡාවෙන් අපේ රටේ ඩිජිටල්කරණ ව්‍යාපෘතියට දායක වෙමින් ඉන්නවා. දුමින්ද හුලංගමුව මහත්මයා මේ රටේ ප්‍රකට ව්‍යාපාරිකයෙක්. ඔහු Ceylon Chamber of Commerceහි සැලකිය යුතු වගකීම්, තනතුරු දරන කෙනෙක්. ඔහු ස්වේච්ඡාවෙන් ජනාධිපතිවරයාගේ ආර්ථික උපදේශකවරයකු හැටියට කටයුතු කරනවා. ඒ අය රට වෙනුවෙන් ස්වේච්ඡාවෙන් කටයුතු කරමින් ඉන්න අය. එතකොට ඒ අය සංසන්දනය කරන්න පුළුවන්ද රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ උපදේශකයොත් එක්ක? එතුමාට කවුද හිටියේ? මේ තමයි ඒ අය. අකිල විරාජ් කාරියවසම්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක විමධ්‍යගත පරිපාලන; රුවන් විජේවර්ධන, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක, දේශගුණික විපර්යාස; වඩිවේල් සුරේෂ්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක; දිනේෂ් වීරක්කොඩි, භාණ්ඩාගාර කටයුතු උපදේශක; ආශු මාරසිංහ, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ජනාධිපති උපදේශක; රෝසි සේනානායක, ජනාධිපති උපදේශක - පළාත් සභා; ජෝන් අමරතුංග, ජනාධිපති විශේෂ සහායක; ආනන්ද කුලරත්න, ජනාධිපති විශේෂ සහායක; චම්පිකා ප්‍රේමදාස, ජනාධිපති විශේෂ සහායක. ඊළඟට, කරුණාසේන කොඩිතුවක්කු. එයාත් සහායක. මේ ලේඛනය තුළ උපදේශකයන්ගේ නම් විසි ගණනක් විතර තිබෙනවා. මේ ඔක්කොම වාහනද, තෙල්ද, දුරකථනද, කාර්යාලද, වැටුප්ද කියන වරප්‍රසාද සියල්ලම පාවිච්චි කරමින් හිටපු අය. ඒ වාගේම තවත් අයගේ නම් මෙතැන තිබෙනවා. ගාමිණී රාජපක්ෂ, ජනාධිපති උපදේශක. ඊළඟට, හර්ෂ කුමාර නවරත්න. මනූෂ නානායක්කාර. මේ තිබෙන්නේ. ජනාධිපති උපදේශකයෙක් වෙලා අන්තිම වෙලාවේ. ඊළඟට, හරින් ප්‍රනාන්දු, ජනාධිපති උපදේශක. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මන්ත්‍රීකමත් නැති කළාට පස්සේ පත් කළා, ඒ අමාත්‍යාංශයේම ජනාධිපති උපදේශක හැටියට. ඉතින් මෙහෙම තමයි මේ රටේ මේ දේවල් තිබුණේ. ඒ වෙනුවට අපේ රටේ අධ්‍යාපනය ලබාගෙන ලෝකයටම දැනුම අරගෙන යන, ස්වේච්ඡාවෙන් වැඩ කරන වෘත්තිකයන් මේ ජනාධිපතිවරයා වෙනුවෙන් සහ මේ රජය වෙනුවෙන්, රට වෙනුවෙන් කටයුතු කරමින් ඉන්නවා. ඒ අයට එක එක චෝදනා එල්ල කරමින් විපක්ෂයේ සමහර අය කථා කළා. මම දන්නේ නැහැ ඒවා දැනුවත්වද නොදැනුවත්වද කිව්වේ කියලා. ඒ අය රට වෙනුවෙන් ලොකු වගකීමක් කරන අය. තමුන්නාන්සේලාගේ කාලයේ හිටපු උපදේශකයන් සමඟ ඒ අය සංසන්දනය කරන්න එපා කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආරියවංශ බාසුරියගේ මන්ත්‍රීතුමා. විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.06]

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பீ. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු අග්‍රාමාත්‍යතුමියනි, ගරු සභානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු සියලු ගරු ඇමතිවරුනි, ගරු මන්ත්‍රීවරුනි.

දසවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වශයෙන් මා තෝරා පත් කර එවූ ජනතාවට මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. කොලොන්න ප්‍රදේශයෙන් දේශපාලනයට ඇවිල්ලා කොලොන්න ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙකු වශයෙන්ද, විපක්ෂ නායකවරයෙකු වශයෙන්ද, සබරගමු පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු වශයෙන්ද මම කටයුතු කළා. මම මුලින්ම කොලොන්න ආසනයේ සංවිධායකවරයා ලෙස කටයුතු කළා. රක්වාන ආසනයේ සමගි ජන බලවේගයේ සංවිධායකවරයා වශයෙන් සිටින මා මෙවර රුවන්පුරයෙන් පාර්ලිමේන්තුවට තෝරා පත් කර ගන්න කටයුතු කරපු, විශේෂයෙන්ම රක්වාන ආසනය, කොලොන්න ආසනය ප්‍රමුඛ රත්නපුර දිස්ත්‍රික්කයේ සමගි ජන බලවේගය පක්ෂයේ සියලු ජනතාවටත් මා ස්තුතිවන්ත වෙනවා.

පක්ෂ, පාට භේදයකින් තොරව ඒ ජනතාව පසුගිය මැතිවරණයේදී මට සහයෝගය දුන්නා. විශේෂයෙන්ම ජාතික ජන බලවේගයේ අනුර කුමාර දිසානායක මැතිතුමාට ජනාධිපතිවරණයේදී සහයෝගය ලබා දුන් කොලොන්න ප්‍රදේශයේ විශාල පිරිසක් මාගේ ජයග්‍රහණය වෙනුවෙන් සහයෝගය ලබා දුන්නා. ඒ සියලුදෙනාටත්, ඒ වාගේම වෙනත් පක්ෂ -ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ- නියෝජනය කරන සියලුදෙනාටත් මා මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් රත්නපුර දිස්ත්‍රික්කයෙන් මා තෝරා පත්කර එවීම පිළිබඳව.

1994දී තමයි මම දේශපාලනයට ආවේ එක්සත් ජාතික පක්ෂයෙන්. එක්සත් ජාතික පක්ෂය තුළ 1994 වසරේ ඉඳලා අපි දිගටම කටයුතු කළේ විපක්ෂයේ. යම් යම් අවස්ථාවල අවුරුද්දක්-දෙකක් අපට ආණ්ඩු බලය තිබුණත් ඒවා ක්ෂණිකව වෙනස් වෙලා ගියා. අපේ පක්ෂයෙන් ජනාධිපතිවරයෙක් බිහි කර ගන්න අපට බැරි වුණා. 2015 වර්ෂයේදී අපි මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මේ රටේ ජනාධිපති ධුරයට පත් කරන්න කටයුතු කළත්, ඒ අවස්ථාවේදීත් විපක්ෂයේ ඉන්නවාට වඩා වෙනසක් අපට දැනුණේ නැහැ. ඒ නිසා අපි බලාපොරොත්තු වුණේ සජිත් ප්‍රේමදාස මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා බවට පත් කරලා ඒ තුළින් අපේ රටේ තිබෙන ප්‍රශ්න විසඳන්න අපට අවස්ථාව ලැබෙයි කියලා. ඒ අනුව 2019දීත් එතුමා ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණු වෙලාවේ අපි බොහොම වෙහෙස මහන්සි වෙලා වැඩ කළා. ඒත් අපට ඒ අවස්ථාව ලබා ගන්න බැරි වුණා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. එතුමාත් අවුරුදු 25ක් තිස්සේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පක්ෂ නායකවරයෙකු වශයෙන් විපක්ෂයේ තමයි කටයුතු කළේ. නමුත් 2024 වර්ෂයේදීත් එතුමාට අවස්ථාවක් ලැබුණේ නැහැ මේ රටේ ජනතාවට සේවය කරන්න. ඒත් එතුමා විපක්ෂයේ ඉඳගෙන, එතුමාට ලැබෙන සෑම මුදලකින්ම මේ රටේ ජනතාව වෙනුවෙන් වැඩ කළා. "සක්වල" වැඩසටහන තුළින් මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළා. ඒ වාගේම "හුස්ම" වැඩසටහන තුළින් එතුමා විශාල වැඩ කොටසක් කළා. ඊළඟට, "ජනසුවය", "සසුනට අරුණ" වාගේ වැඩසටහන් ක්‍රියාත්මක කරලා විපක්ෂයේ ඉඳගෙන විශාල වැඩකොටසක් කළා. විපක්ෂයේ ඉඳගෙන දේශපාලනය කරනවා වාගේම, රටේ ජනතාවටත් සේවය කරගෙන ආපු නායකයෙක්, එතුමා. එතුමාගේ සේවය අපි දැක්කා. මේ රටේ තිබෙන පාසල් පද්ධතිය තුළ සිටින දරුවන්ට සුහුරු පන්ති කාමර ලබා දීම නිසා ඒ දරුවන් සතුටු කඳුළු හෙළපු ආකාරය ඒ පාසල්වලට යනකොට අපි දැක්කා. ඒ දරුවන්ට අවශ්‍ය පහසුකම් ග්‍රාමීය මට්ටමේ ඒ පාසල්වල නැහැ. ඒ වාගේම පාසල්වලට බස් රථ ලබා දෙනකොට ඒ පාසල්වල දරුවන්, දරුවන්ගේ දෙමව්පියන් සතුටු කඳුළු හෙළුවා. ඉතින් ඒ වාගේ විශාල වැඩ කොටසක් එතුමා පාසල් වෙනුවෙන් කළා. ඒ නිසා ජාතික ජන බලවේගය ආණ්ඩු පක්ෂය වශයෙන් කටයුතු කරන මේ මොහොතේ විපක්ෂයේ සියලුදෙනාට ඇඟිල්ල දිගු කිරීමේ අයිතියක් නැහැ, මේ රට බංකොලොත් කළා, මේ රට විනාශ කළා කියලා. අපි දන්නවා, නාස්තිය, දූෂණය නිසා මේ රට විනාශ වුණා, බංකොලොත් වුණා කියලා. ඒ කටයුතු කරපු පිරිසක් මේ රටේ ඉන්නවා. පසුගිය මැතිවරණයේදී ජනතාව හොඳ උත්තරයක් ලබා දීලා ඒ අය ගෙදර නවත්වලා තිබෙනවා. ඒ නිසා විපක්ෂයේ සියලුදෙනාට ඇඟිල්ල දිගු කරලා පසුගිය කාලයේ රට බංකොලොත් කරන්න කටයුතු කළාය කියලා කියන්න බැහැ. අපිත් කැමැතියි, මේ රටේ ජනතාවට වැඩ කරන්න. අපේ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට ප්‍රශ්න රාශියක් තිබෙනවා. හොඳ මාර්ග පද්ධතියක් නැහැ. ලීයක් බැඳපු පුටුවක ලෙඩා ඉන්දලා, දෙපැත්තෙන් දෙදෙනෙක් කර තියාගෙන යන මට්ටමේ පාරවල් තිබෙන ප්‍රදේශ තවම තිබෙනවා. විශේෂයෙන්ම වතුකරයේ එක නිවසේ, එක කාමරයේ-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பீ. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
මට විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

රෝහලකට අරගෙන යන්න ත්‍රීවීලරයකට හෝ වෙනත් වාහනයකට දමන්න කදේ තමයි රෝගියා අරගෙන එන්නේ. ඒ වාගේ ඉතා දුෂ්කර ප්‍රදේශ තිබෙනවා.

ඒ වාගේම ගොවි ජනතාවගේ ප්‍රශ්න ගැටලු තිබෙනවා. මම මේ අවස්ථාවේදී කෘෂිකර්ම අමාත්‍යාංශයට යෝජනා කරනවා, ඉදිරි අය වැය ඉදිරිපත් කිරීමේදී කෙසෙල් ගොවියා කෙරෙහි අවධානය යොමු කරන්න කියලා. කෙසෙල් ගොවියා මේ වනවිට අසරණ වෙලා ඉන්නේ.

කෙසෙල් කිලෝ එකක් රුපියල් 30ට බැහැලා තිබෙනවා, කෝලිකුට්ටු කිලෝ එක රුපියල් 100ට අඩු වෙලා තිබෙනවා. ඒ නිසා, දැන් වෙනත් භෝග සඳහා පොහොර සහනාධාරයක් ලබා දෙනවා වාගේ අනාගතයේදී කෙසෙල් ගොවියා වෙනුවෙනුත් පොහොර සහනාධාරයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මේ අවස්ථාවේ අපි යෝජනා කරනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, පිළිතුරු කථාව ගරු හර්ෂණ සූරියප්පෙරුම ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.13]

**ගරු හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අවසරයි. ආයුබෝවන්! வணக்கம்! அஸ்ஸலாமு அலைக்கும்! Good evening! කියලා පළමුවෙන් සියලුදෙනාම ආදරයෙන් පිළිගන්නවා. ඒ වාගේම මේ සා විශාල ජයග්‍රහණයක් අපට ලබා දීමේ එම භාරදූර කාර්යය ඉෂ්ට කළ රටේ සියලු පළාත්වල, සියලු ප්‍රදේශවල ජනතාවට අපි හිස නමා ආචාර කරනවා.

Madam, this may be just the Vote on Account that we are debating and concluding in Parliament today, but in the eyes of many people, this is the hope of rebuilding the nation. The youth are hopeful; women are hopeful; the SME sector is hopeful; large businesses are hopeful; high-net-worth investors are hopeful and even foreign investors who are going to invest in this country are hopeful of that. But, Hon. Members, there is an even greater message encapsulated in this political victory.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SPEAKER took the Chair.*

**ගරු හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. Harshana Suriyapperuma)

Hon. Speaker, I was mentioning that there is a greater message encapsulated in this political victory. That is, the people in the North are hopeful; the people in the East are hopeful; the people in the South are hopeful, the people in the estate sector are hopeful, the people who are trying to migrate from Sri Lanka are hopeful, the Sri Lankans living abroad, for the first time, are hopeful and most importantly, the law-abiding citizens of this nation are hopeful that as one nation, as Sri Lankans, we are going to rise once again and take this country to the next level bringing back the dignity we have lost.

මේ යන ගමනේ විශාල ආර්ථික පිම්මක් පනින්නට අපට සිදු වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි, කඩා වට්ටලා තිබෙන මේ ආර්ථිකය නැවත වතාවක් ඉහළට ගැනීමේ කාර්යය සම්ප්‍රදායික ක්‍රමවේදය තුළින් විතරක් කරන්න අපහසු වීම. ඒ සඳහා පර්යේෂණ හා සංවර්ධනය - research and development - සම්බන්ධ කරගෙන ශ්‍රී ලංකාවේ ආර්ථිකය නව තලයකට ගෙන යන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් අපි යෝජනා කරලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමා එදා කළ ඒ කථාව අනුව එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරවීම සඳහා විදේශ ආයෝජකයන් සහ දේශීය ආයෝජකයන් සැහෙන පිරිසක් මේ වෙනකොටත් අපව සම්බන්ධ කරගෙන තිබෙනවා. ඒ අදාළ ආයතන ව්‍යුහය හරහා විනිවිදභාවයකින් යුතු වැඩ පිළිවෙළක් තුළින් ඒ වැඩ කටයුත්ත ඉදිරියට ගෙනයාමටත්, ඒ සඳහා ආයෝජකයන් කැඳවීමත්, අගය එකතු කරන නිෂ්පාදන - value-added productions - කිරීම සඳහා නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කර ඒ තුළින් ඩොලර් උපයන ආර්ථිකයක්, රටින් එළියට යන ඩොලර් ඉතුරු කරන ආර්ථිකයක් සූදානම් කරන්නටත්, සවිමත් කරන්නටත් වැඩ පිළිවෙළක් සූදානම් කරලා තිබෙනවා. ඒ තුළින් ආර්ථිකය ඉහළට ගෙන යන්නට තමයි මේ research and development sector එක මීට වඩා ශක්තිමත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සූදානම් කරලා තිබෙන්නේ.

මේ අතුරු සම්මත ගිණුම පිළිබඳ විවාදය පැවැත්වූ දවස් දෙක තුළ විශේෂ විචාරයක් - constructive criticism එකක් - දකින්නට ලැබුණේ නැහැ. ඒකට හේතු දෙකක් තිබෙනවා. එක පැත්තකින්, සම්ප්‍රදායික පරණ කථාම කිය කියා බාධා කරනවා මිස, අන්තර්ගතයේ තිබෙන දේ පිළිබඳව සාධාරණ විචාරයක් නොලැබුණු බවයි මගේ පෞද්ගලික හැඟීම. නමුත් මේ අතුරු සම්මත ගිණුමේ අන්තර්ගත කරුණු දිහා බලනකොට, ඉදිරිපත් කරලා තිබෙන කරුණු කාරණා දිහා බලනකොට පෙනෙනවා, මේක තමයි ලබන මූල්‍ය වර්ෂය ආරම්භයට stepping stone එකක් විධියට, සමස්ත අය වැයක් ඉදිරිපත් කරනතුරු රජයේ වියදම් පියවා ගන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ විධියට ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා, ගරු කථානායකතුමනි. පුනරාවර්තන වියදම් සඳහාත්, රජයේ සේවකයන්ගේ පඩිනඩි ගෙවාගෙන යාම සඳහාත්, රෝහල්වලට අවශ්‍ය බෙහෙත් හේත් සහ අවශ්‍ය පහසුකම් සැපයීම සඳහාත්, - දැනට කරගෙන යන ප්‍රාග්ධන වියදම් තිබෙනවා. ඒවා අතරමැද නවතා දමන්න බැහැ, ඒ වැඩ කටයුතු සාර්ථකව ඉදිරියට කරගෙන යාම සඳහාත් - ඒ වාගේම අපේ ණය සේවාකරණය සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ ඉදිරියට පවත්වාගෙන යාම සඳහාත් වැනි වැදගත් කරුණු සඳහා තමයි මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරලා තිබෙන්නේ.

අපි දැක්කා බොහෝ වෙලාවල විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් පටලවා ගෙන හිටියා, රුපියල් බිලියන 3,000ක ණයක් අලුතින් ගන්න උත්සාහ කරනවාය කියලා. මම තව වතාවක් පොඩ්ඩක් එය පැහැදිලි කරන්නම්. කිහිප වතාවක් අපේ ගරු මන්ත්‍රීවරුන් ඒ පිළිබඳව පැහැදිලි කිරීම් කළා. මේකෙන් අදහස් කරන්නේ අලුතින් ණය ගන්නවා කියන එක නොවෙයි. පැවති රජයන් විසින් අරගෙන තිබුණු ඒ ණය කන්ද, මේ රට යට කර තිබුණු ඒ ණය කන්ද, ඉපදෙන්න ඉන්න පරම්පරා පවා ණය කර තිබුණු ඒ ණය කන්ද ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යනකොට, දැනට පවතින ණය ගිවිසුම් - existing debt instruments - cancel කරලා අලුතින් ණය ගිවිසුම් ඉදිරිපත් කරනවා වෙනුවට තමයි මේ අවශ්‍ය ප්‍රතිපාදන සූදානම් කර තිබෙන්නේ. ඒ නිසා මේක කිසිසේත්ම අලුතින් ගන්න ණයක් නොවෙයි. මේ රජය බොහොම කල්පනාකාරීව වැඩකටයුතු කරගෙන යනවා, බොහොම හොඳින් කළමනාකරණය කරගෙන යනවා. එම වැඩ පිළිවෙළේ සාර්ථක බව මම පෙන්වන්නම්, පොඩි උදාහරණ කිහිපයක් අරගෙන. අලුත් team එකක් තමයි ආණ්ඩු පක්ෂයෙන් වැඩට ඇවිත් තිබෙන්නේ, ආණ්ඩුව කරවීම සඳහා. නමුත් ආණ්ඩුව කරවීම සඳහා ඇවිත් තිබෙන ඒ අලුත් team එකේ ඉන්නවා, කලින් පාර්ලිමේන්තුවලත් හිටපු මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් ඇතුළු තනතුරු හොබවපු පිරිසක්. ඒ වාගේම කළපුරුද්ද තිබෙන, පළපුරුද්ද තිබෙන විද්වත්, උගත් පිරිසක් වන වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගුරුවරුන්, ආචාර්යවරුන්, මහාචාර්යවරුන්, සමාජ ක්‍රියාකාරීන් වාගේම විශේෂයෙන්ම කාන්තා නියෝජිතයින් සහ තරුණ නියෝජිතයින් ද මේ කාර්යයට සම්බන්ධ වෙලා තිබෙනවා.

[ගරු හර්ෂණ සූරියප්පෙරුම මහතා]

ගරු කථානායකතුමනි, මම මේ කියපු අලුත් පිරිස ආණ්ඩුව භාර ගෙන මාස දෙකහමාරක් වැනි මේ කෙටි කාලය තුළ මොකක්ද කළේ? මම උදාහරණ කිහිපයක් දෙන්නම්. අපේ රටේ තිබුණු විනිමය අනුපාතය අපි ස්ථාවර මට්ටමකට ගෙනැල්ලා තිබෙනවා. රුපියල් තුන්සියවිසි ගණන්වලට ගිහින් තිබුණු ඩොලරයේ අගය දෙසියඅනූවක පමණ මට්ටමට ගෙනැල්ලා දැන් රුපියල ස්ථාවර වෙලා තිබෙනවා. ඒ වාගේම අවුරුද්ද මුලදී සියයට 12ක වාගේ මට්ටමක තිබුණු අපේ රටේ පොලී අනුපාතය මේ වෙනකොට සියයට 9 මට්ටමට ඇවිත් තිබෙනවා, කෙමෙන් කෙමෙන් පහළට ඇවිත්. ඒ වාගේම අපේ banking sector එකට අදාළ Overnight Policy Rate එක සියයට 8 දක්වා පහළට ඇවිත් තිබෙනවා. අපේ රටේ විදේශ සංචිත ප්‍රමාණය - external reserve position එක - ඩොලර් බිලියන 6.4කට පමණ ගෙනැල්ලා තිබෙනවා. එම ප්‍රමාණය තව ඉහළට ගෙනියන්න ඕනෑ. ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සූදානම් කර තිබෙනවා. අපේ රටේ උද්ධමනය - inflation එක - මේ වෙනකොට ජනතාවට ටිකක් හෝ දරාගන්න පුළුවන් මට්ටමකට ටිකෙන් ටික-ටිකෙන් ටික පහළට එමින් පවතිනවා. දැන් තිබෙන මේ මිල මට්ටම පිළිබඳව අපි සතුටු වෙන්නේ නැහැ. අපි හැකි උපරිම උත්සාහය දරනවා, මේ රටේ පාරිභෝගික ජනතාවට දරාගන්න පුළුවන් මට්ටමකට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවල මිල තවත් අඩු කිරීම සඳහා.

ඊළඟට, ASPI එක, එහෙම නැත්නම් කොළඹ කොටස් වෙළෙඳ පොළ මිල දර්ශකය ඉතිහාසයේ පළමු වතාවට ඉහළම අගයට පැමිණුනා, පසුගිය දවස් කිහිපය තුළදී. ආර්ථිකය කඩා වැටෙයි කිව්වා, කොළඹ කොටස් වෙළෙඳ පොළ කඩා වැටෙයි කිව්වා. නමුත් රට තුළ සිටින ආයෝජකයෝ ඒ කිසි කථාවක් පිළිගත්තේ නැතුව පෙන්නුම් කළේ මොකක්ද? මේ නව ආණ්ඩුව කෙරෙහි තිබෙන විශ්වාසයයි. ඒ මිල දර්ශකය දැන් ටිකෙන් ටික-ටිකෙන් ටික ඉහළට ඇවිල්ලා තිබෙනවා. ඒ තුළින් ශ්‍රී ලාංකික ආයෝජකයෝ පෙන්නුම් කර දුන්නා, මේ රට යන ගමන, මේ නව ආණ්ඩුව කරගෙන යන වැඩ පිළිවෙළ පිළිබඳව හොඳ විශ්වාසයක් තිබෙන බව.

ඒ විතරක් නොවෙයි. අපේ රටට පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය මේ වෙනකොට ටිකෙන් ටික වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව මේ වසර අවසාන වෙනකොට අපේ රටට පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය මිලියන 2 පසු කරන බව අදාළ රාජ්‍ය ආයතනවලින් දැනගන්න ලැබී තිබෙනවා. ඒ වාගේම තමයි අපට ලැබෙන foreign remittances බොහොම ස්ථිර වූ ලෙස ටිකෙන් ටික-ටිකෙන් ටික, කෙමෙන්-කෙමෙන් ඉහළට යන මට්ටමක් දකින්නට ලැබෙනවා. මේ කිව්වේ මොකක්ද? එහෙම නැත්නම් අපේ ආර්ථික ප්‍රතිපත්තිය ඉදිරිපත් කරන වෙලාවේ කියා දීපු ඒ සාර්ව ආර්ථික ස්ථායීකරණ වැඩ පිළිවෙළ - macroeconomic stabilization - ඉතාම සාර්ථක ලෙස කරගෙන යනවා කියන එකයි මේකෙන් පසක් වෙන්නේ. නමුත් විපක්ෂය උපදෙස් දෙන්න හදනවා, මේ පාරේ යන්න එපා කියලා.

අපි කියන්න කැමැතියි, විපක්ෂයේ ඔයතරම් හැකියාව තිබුණු පිරිසක් හිටියා නම්, අද මේ රට මේ වාගේ ආර්ථික ප්‍රපාතයකට කඩා වැටෙන්න හේතුවක් නැති බව. ඒ නිසා මේ ආර්ථිකය ඉදිරියට ගෙනියන්නේ කොහොමද කියලා අපට කියන්න එන්න එපා. ඒකට සුදුසු පිරිසක් දැන් ඒ වැඩ භාර ගෙන තිබෙනවා. ඒ වාගේම මේ ගමන යනකොට බොරු චිත්‍ර මවලා, ගෑස් නැති වෙයි කියපු පිරිසට අන්තිමට ගෑස් සිලින්ඩරයත් නැති වෙලා තිබෙන තත්ත්වයක් තමයි අපට පෙනෙන්නට තිබෙන්නේ. මේ ගමන ඉදිරියට ගෙන යන වැඩ පිළිවෙළ අපි සැප්තැම්බර් 22වෙනි දා ජනාධිපතිතුමාගේ ජයග්‍රහණයෙන් පස්සේ පටන් ගත්තේ නැහැ. මේ ක්‍රියාවලියට දශක ගණනාවක් තිස්සේ කැප වෙලා වැඩ කරපු පිරිසක් හිටියා. මේ කාර්යයට උර දුන් පිරිසක් හිටියා. ඒ වාගේම පසුගිය අවුරුදු කිහිපය තුළ මේවාට සම්බන්ධ වෙලා, අපි IMF එකත් එක්ක සාකච්ඡා කරගෙන ගියා. ISB ණය හිමියන් සමඟ අපි අවුරුද්දකට වැඩි කාලයක් සාකච්ඡා කරගෙන ගියා. අනෙක් පාර්ශ්වකරුවන් සමඟ බොහොම ඵලදායී සාකච්ඡා අපි පැවැත්වූවා. ඒ වැඩ පිළිවෙළේ ප්‍රතිඵලයක් විධියට, මේ teamwork එකේ result එකක් විධියට තමයි, මම කලින් කිව්ව ආර්ථික ස්ථායීකරණ වැඩ පිළිවෙළ සාර්ථකව කර ගන්න අපට හැකි වෙලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

මේ වන විට මේ පාර්ලිමේන්තුවට පත් වෙලා සිටින 159ක් වන ආණ්ඩුවේ ගරු මන්ත්‍රීවරුන් පිරිසට හොඳ දේශපාලන කියැවීමක් තිබෙනවා. පාර්ලිමේන්තුවට අලුත් වුණාට දේශපාලනයට මේ පිරිස අලුත් නැහැ. රාජ්‍ය ව්‍යුහය ක්‍රියාත්මක කරන ක්‍රමවේදයට මේ පිරිස අලුත් නැහැ. ඒ නිසා ඒ සඳහා අවශ්‍ය කරන වැඩ පිළිවෙළ, ආයතන ව්‍යුහය, පුද්ගලයින් සම්බන්ධ කරගෙන මේ වන විට අපි ඉතාම සාර්ථකව කරගෙන යන බව මේ රටට පෙන්වා තිබෙනවා. නමුත්, විපක්ෂයේ ඉන්න තමුන්නාන්සේලාට නම් අපේ දේශපාලන සංස්කෘතිය අලුත් වෙන්නට පුළුවන්. වංචාවෙන් තොරව, දේශපාලන අත පෙවීම්වලින් තොරව මේ යන ගමන තමුන්නාන්සේලාට සමහර විට අලුත් දෙයක් වෙන්න පුළුවන්. Sir, the approach we are taking is based on zero tolerance for corruption, with transparency and accountability in governance as the cornerstone in this process. This is a journey and to this journey, we will provide political leadership. We have the political will to take this country forward and put an end to the menace of corruption in this country. But, we need to do it together; we need to join government institutions, large enterprises, the SME sector and work together with the citizens.

මේ ගමන ඉදිරියට ගෙනියන්නට අපට දේශපාලන අධිෂ්ඨානය තිබෙනවා. අපි ඒකට දේශපාලන නායකත්වය දෙනවා. නමුත්, මේ ගමන යන එක තනිව කරන්න පුළුවන් දෙයක් නොවෙයි. රාජ්‍ය ආයතන සහභාගි කරගෙන, විශාල ව්‍යාපාරිකයන් සහභාගි කරගෙන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් එකතු කරගෙන, ඒ වාගේම විශේෂයෙන් රටේ පුරවැසියන් සම්බන්ධ කරගෙන යන ගමනක් තමයි අපි සූදානම් කරගෙන තිබෙන්නේ. මේ Vote on Account එකේ අඩිතාලම - foundation එක - විධියට මේ රටේ ආර්ථිකයේ නව පරිච්ඡේදයක් - new chapter එකක් - ආරම්භ කරන්නට සූදානම් වන අවස්ථාවක්, මේක. In this journey, we want to connect Sri Lanka to the global economy; we want to connect the next generation to global opportunities. We want to create that through a digital platform and by converting our economy into a digital economy and connecting it with the global digital economy. මේ වැඩ පිළිවෙළ සාර්ථකව කරගෙන යන්නට, we have started strong, we have shown a steady progress so far and we are determined to move forward towards our final goalpost. බොහොම ආඩම්බර විධියට මේ ගමන සඳහා අපි සාර්ථක ආරම්භයක් අරගෙන තිබෙනවා. මම මුලින් කියපු ආර්ථික දර්ශකවලින් පෙනෙන හැටියට, ඒ වැඩ පිළිවෙළේ බොහොම සාර්ථක ප්‍රගතියක් මේ වෙනකොටත් පෙන්නුම් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි දන්නවා, මේ දෙසැම්බර් මාසයේ 15වැනි දා වෙනකොට පරාටේ නීතිය ක්‍රියාත්මකවීම අත්හිටුවීමේ කාලසීමාව අවසාන වන බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! අද දිනට නියමිත කටයුතු අවසන් වන තෙක් වැඩිපුර කාලය ලබා දීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. Harshana Suriyapperuma)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

පරාටේ නීතිය අවසන් වන කාල සීමාවට තව දවස් කිහිපයක් තිබෙන නිසා මේ පිළිබඳව ඉවට තීරණ ගන්නවා වෙනුවට, අපි මේ ගැන හොඳින් සොයා බලා, මහ බැංකුව සම්බන්ධ කරගෙන අවශ්‍ය දත්ත කැඳවීම් කරලා, ඒ debt stock එක analyse කරලා බැලුවා, කොච්චර ණය ප්‍රමාණයක් තිබෙනවාද, මොන වාගේ ව්‍යාපාරිකයින්ද මේ තුළින් අපහසුතාවට පත් වෙලා ඉන්නේ කියලා. ඒ දත්ත analyze කරලා බලනකොට අපිට පෙනුණා, 2019 පාස්කු ප්‍රහාරයට කලින් ගත්ත ණය විශාල ප්‍රමාණයකුත් ඒ තුළ ඉන්නවාය කියලා. ඒ වාගේම ඊට පසුව ණය අරගෙන අපහසුතාවට පත් වෙච්ච සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෝ විශාල පිරිසක් ඉන්නවා. ඒ ව්‍යාපාරිකයන්ගේ ප්‍රාග්ධනය කොච්චර outstanding තිබෙනවාද, පොලිය කොච්චර outstanding තිබෙනවාද කියලා - interest outstanding component එක - බලලා ඒ ඒ වටිනාකම්වල ප්‍රමාණයන්, සීමාවන් analyze කර බලලා, මේ සියලු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට - විශේෂයෙන්ම වැඩිම පිරිසකට - වැඩිම සහනයක් ලබා දෙන, වැඩිම කාලයක් ලබා දෙන්නට පුළුවන් ක්‍රමවේදයක් අපි මේ වෙනකොට සූදානම් කරගෙන යනවා. තව නොබෝ දිනකින් ඒක කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, එහි අනුමැතියත් සමඟ එය ක්‍රියාත්මක කරවන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සූදානම් කරලා තිබෙනවා. මේ තුළින් ව්‍යාපාරිකයන් වැඩි පිරිසකට -සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට- සහනයක් ලබා දෙන්නට සූදානම් වෙන බව මම මේ අවස්ථාවේදී ගරු සභාවට කියන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න සූදානම් කරලා තිබෙන්නේ participatory economic structure එකක් ඇතුළතයි. සමාන අවස්ථාවන් තුළින් level playing field එකක් මේ ආර්ථිකය තුළ ඇති කිරීම මඟින් අපනයනය වෙනුවෙන් යොමු වෙච්ච - export-oriented - ආර්ථිකයකට අපේ ව්‍යාපාරිකයන් හසුරුවන, ඔවුන්ව යොමු කරවන ක්‍රමවේදයක් වාගේම මේ ආර්ථිකය ප්‍රසාරණය කරන ගමන් ගමට ආර්ථිකය තල්ලු කරන්න සූදානම් කරන වැඩ පිළිවෙළක් තමයි මේ ආරම්භක අවස්ථාවේදී අපේ මේ අතුරු සම්මත ගිණුමෙන් - Vote on Account එකෙන් - යෝජනා කෙරෙන්නේ. අපේ ප්‍රධාන අය වැය ඉදිරිපත් කරනකොට මීට වඩා වැඩි දේවල් යෝජනා වෙනවා. නමුත්, මේ අවස්ථාවේදී තිබෙන්නේ ගමනේ ඉතිරි කොටසට අවශ්‍ය ඒ පදනම සූදානම් කරන එකයි. ඒ වාගේම, මේකට සම්බන්ධ වෙච්ච සියලුදෙනාගේම සහයෝගයත් අරගෙන, මේ පිළිබඳව තිබෙන වැඩ කටයුතුවලට අවශ්‍ය කරන ඒ ප්‍රතිපාදනයනුත් ලබා ගනිමින්, රාජ්‍ය ආයතනත් ඒකට සම්බන්ධ කරගෙන මේ වැඩ පිළිවෙළ සාර්ථකව ඉදිරියට ගෙන යන්නට අපි මේ වෙනකොට වැඩ පිළිවෙළක් සූදානම් කරලා තිබෙනවා.

මම මුලින් කිව්වා වාගේ, මේ ආර්ථිකය ඉදිරියට ගෙනියන්නට සියලු කොටස් මේකට සම්බන්ධ කර ගන්නට අවශ්‍ය වෙනවා. එක කොටසක් අත්හැර දාලා යනවා වෙනුවට, දේශපාලකයින්ට සම්බන්ධ පිරිසකට අවශ්‍ය වාසිය දෙනවා වෙනුවට, සියලුදෙනාට මේ ආර්ථික අවස්ථා උදා වෙන වැඩ පිළිවෙළක් සකස් කරන්න මේ තුළින් කටයුතු කර තිබෙනවා. මේ නව දේශපාලන සංස්කෘතිය තුළ ආරම්භ කර තිබෙන වැඩ පිළිවෙළ තුළින් රජයේ වියදම් සංස්කෘතිය අපි වෙනස් කරලා තිබෙනවා. අනවශ්‍ය වියදම්වලට වැය වෙන ඒවා අඩු කරලා, මේ රටේ මහ ජනතාව ගෙවන බදු මුදල් ටික ආරක්ෂා කර ගන්න වැඩ පිළිවෙළක් සූදානම් කරලා තිබෙනවා. ඒ වියදම් කපා හරින වැඩ පිළිවෙළ අපි දැක්කා, ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයට යොදාගෙන තිබෙන මුදල්වලින්. ජනාධිපතිතුමාගේ උපදේශකයන් වෙනුවෙන් යොදන වැය ප්‍රමාණය සියයට 64ක ප්‍රමාණයක් දක්වා කපා හැරලා තිබෙනවා, මේ අතුරු සම්මත ගිණුමේ දක්වා තිබෙන ප්‍රමාණයට අනුව.

සමහර අය කියන්නට ඇති, මේ ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයේ තිබෙන රුපියල් බිලියන 1,300ක මුදල කලින් වසරේ තිබුණු මුදලට සාපේක්ෂව අතිවිශාල වැඩිවීමක් කියලා. නමුත්, මම මේ ගරු සභාවට කියන්න කැමතියි, ඒ මුදල වෙන් කරලා තිබෙන්නේ මේ රටේ අපහසුතාවට පත් වෙච්ච පිරිසට බව. දුප්පත්කමින් බොහොම අපහසුතාවට පත් වෙලා, එදා වේල හොයා ගන්න බැරිව දවසට එක වේලක් කන අතිවිශාල පවුල් ප්‍රමාණයක් මේ රටේ ඉන්නවා. අන්න ඒ ප්‍රජාවට අවශ්‍ය සහනය සලසන්නට තමයි මේ මුදල වෙන් කරලා තිබෙන්නේ. ඒකෙන්ම පෙනෙනවා, ගරු ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන ඒ ගමනට අපි කොපමණ උත්සාහයක් යොදලා, කල්පනාකාරීව ඒ මුදල් වෙන් කරලා, යොමු කරලා තිබෙනවාද කියන එක. ඒ වාගේම මම මුලින් කියන්නට යෙදුණා වාගේ, මේ අතුරු සම්මත ගිණුම තුළ තිබෙන රුපියල් බිලියන 1,600ක් පමණ වන රාජ්‍ය ආදායම උපදවා ගැනීමේදී මේ ආයතනවලට තිබෙන දේශපාලන බලපෑම් ඉවත් කරලා තිබෙනවා. අපේ ගරු ඇමතිතුමා කථා කරනකොට සඳහන් කළා වාගේ, මේ රාජ්‍ය ආයතනවලට තිබෙන දේශපාලන බලපෑම අවම කරලා, ඒ ආයතන හරහා උපයා ගන්නට පුළුවන් බදු ප්‍රමාණය උපරිමයට එකතු කර ගන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ මේ වෙනකොටත් ක්‍රියාත්මක කර තිබෙනවා.

උදාහරණයක් විධියට, මේ මාස දෙකහමාරක කාලය තුළ මෙම වැඩ පිළිවෙළ හරහා සුරා බදු ලෙස රුපියල් බිලියන 8ක මුදලක් අය කර ගැනීමට නියමිතව තිබුණා. ඒ රුපියල් බිලියන 8 තුළ වසර 10කට වැඩි කාලයක් එකතු කිරීමට තිබුණු බදු ප්‍රමාණයකුත් තිබුණා. කියන්න සතුටුයි, මේ මාස දෙකහමාර තුළ එම මුදලින් රුපියල් බිලියනයකට වැඩි ප්‍රමාණයක් එකතු කරගෙන තිබෙනවා. මම කලිනුත් සඳහන් කළා වාගේ මේ ගරු සභාව දැනුවත් කරන්න කැමැතියි, උපදේශක සේවාවන්වලට සම්බන්ධ වෙලා සිටින ගරු උපදේශක පිරිස කිසිම අය කිරීමකින් තොරව තමයි අපට සම්බන්ධ වෙලා තිබෙන්නේ කියන එක. ඒ සඳහා සම්බන්ධව සිටින ගරු ජනාධිපතිතුමාගේ කාර්ය මණ්ඩලයට අයත් පිරිසගේ ඒ වියදම්වල සියයට 64ක ප්‍රමාණයක අඩුවීමක් කරලායි තිබෙන්නේ.

ඒ වාගේම රේගුවට - Sri Lanka Customs එකට - විශාල හැකියාවක්; opportunity එකක් තිබෙනවා, එතැනින් ලැබෙන ආදායම තවත් වැඩි කර ගන්නට. මම මේ විග්‍රහ කරන්නේ, මේ අතුරු සම්මත ගිණුමෙහි තිබෙන රුපියල් බිලියන 1,600ක ආදායම පිළිබඳවයි. ඒ වාගේම, අපේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - IRD එක - කාර්යක්ෂම කරලා, එහි වැඩ පිළිවෙළ තවත් ශක්තිමත් කරලා, එම දෙපාර්තමේන්තුවට අවශ්‍ය

[ගරු හර්ෂණ සූරියප්පෙරුම මහතා]

උපදේශක සේවාවන් ලබා දීලා මේ ගමන තවත් සාර්ථකව ඉදිරියට කරගෙන යන්නට අපි මේ තුළින් බලාපොරොත්තු වෙනවා. මේ අතුරු සම්මත ගිණුමෙහි ඇති වියදම්වලින් කියන්නේ, මේ මුදල අනිවාර්යයෙන් වියදම් කරනවාය කියන එක නොවෙයි. ලබන වසරේ පළමුවැනි මාස 4 තුළ රජයට අත්‍යවශ්‍ය වියදම් කරගෙන යෑම සඳහා ප්‍රතිපාදන සූදානම් කරලා තිබෙනවා කියන එක තමයි මේකෙන් කියන්නේ. පුහු ආටෝපවලින් පිරුණු දේශපාලන සංස්කෘතිය වෙනුවට වියදම් නිසි ලෙස කළමනාකරණය කරගෙන මේ වැඩ කටයුත්ත බොහොම කල්පනාකාරීව ඉදිරියට ගෙන යන්න තමයි සූදානම් කරලා තිබෙන්නේ. රටක් විධියට අපට බාහිරින් එන අවහිරතාවලින් - external shocksවලින් - ගැටලු පැනනඟින්නට පුළුවන්. ස්වාභාවික ආපදා හරහා ගැටලු මතු වෙන්නට පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට තව කොපමණ කාලයක් අවශ්‍යද?

**ගරු හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. Harshana Suriyapperuma)
මට තව විනාඩි දෙකක කාලයක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

**ගරු හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. Harshana Suriyapperuma)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

මේ වැඩ පිළිවෙළ සාර්ථකව ඉදිරියට ගෙන යන්නට, ආදායම් උපයන සීමාව උපරිම මට්ටමට ගෙන යන්නට සුදුසු වැඩ පිළිවෙළක් මේ මඟින් සූදානම් කරලා තිබෙනවා. චිත්‍රයක කොටස් එකතු කරලා හරිගස්සනවා වාගේ මේ සියලු කොටස් එකින් එක, එකින් එක එකතු කරලා මේ වැඩ පිළිවෙළ සාර්ථකව කරගෙන යන්නට මේ වෙලාවේ විශාල පිරිසක් කැපවෙලා ඉන්නවා. රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් දිරිගන්වමින්, එම ආයතනවල අකාර්යක්ෂමතාවලින් පිරුණු කොටස් තිබෙනවා නම් ඒවාට සුදුසු විසඳුම් ලබා දෙමින් මේ වැඩ පිළිවෙළ සාර්ථකව ඉදිරියට කරගෙන යන්නට මේ වෙනකොටත් සූදානම් වෙලා තිබෙනවා. KPI-oriented culture එකක් සූදානම් කරගෙන, results-driven programme එකකට යන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි මේ තුළ සූදානම් කරලා තිබෙනවා.

මේ ගමන යනකොට අපට IMF programme එකත් එක්ක යන්න සිදුවෙලා තිබෙනවා. අපේ choice එකට අනුව යන්න අපට වෙනත් මාර්ග තිබුණත්, මේ රට ඇද දමා තිබෙන ප්‍රපාතයට අනුව ඒ වෙලාවේ හිටපු ආණ්ඩු තෝරාගෙන තිබුණු මාර්ගයේ යන්න අපට සිදුවෙලා තිබෙනවා. එම මාර්ගය අත්හැර වෙනත් මාර්ගයකට යොමු වෙන්න තිබෙන කලබැගෑනිය ඉතාම හොඳින් විමර්ශනය කරලා ගත් තීරණයක් තමයි මේ තීරණය. එම තීරණය තුළ වුවත් අපි IMF එකත් එක්ක සාකච්ඡා කරලා, IMF රාමුව තුළ රටට, රටේ ජනතාවට ලබා ගන්නට පුළුවන් උපරිම සහන ලබා ගන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ සූදානම් කරලා තිබෙනවා. අපි හැමෝම දන්නවා, මේ ගමන සාර්ථකව ඉදිරියට අරගෙන යන්නට නම්, rating agencies, එහෙම නැත්නම් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් කරනු ලබන ශ්‍රේණිගත කිරීම් - ratings - තුළින් මේ රටට ලොකු අවස්ථාවක් ලැබෙන බව. විශේෂයෙන්ම විදේශ ආයෝජකයින් රට තුළට ආයෝජන ගෙන ඒමේදී මේ ණය ශ්‍රේණිගත කිරීම් ඉදිරියට යයි කියලා බලාපොරොත්තු වෙනවා. අපට ලොකු බලාපොරොත්තුවක් තිබෙනවා, මේ කරගෙන යන වැඩ පිළිවෙළ සාර්ථකව ඉදිරියට යන නිසාත්, IMF programme එකේ ලබා තිබෙන ප්‍රගතිය අනුවත්, ISB creditorsලා, ඒ ණය හිමියන් පිළිබඳව කරගෙන යන වැඩ පිළිවෙළ සාර්ථකව කරගෙන යෑම එක්කත් මේ අවුරුද්ද අවසානයේදී, නැත්නම් උපරිම වශයෙන් ලබන වසර මුලදී ණය ශ්‍රේණිගත කිරීම්වල හොඳ ස්ථාවර තැනකට අපට යන්න පුළුවන් වෙයි කියලා.

සියලුදෙනාගේ මැදිහත්වීමෙන්, සහයෝගයෙන් අපි මේ ගමන සාර්ථකව ඉදිරියට යමු කියන ආරාධනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 241 - වැඩසටහන 01
## குறைநிரப்புத் தொகை: தலைப்பு 241 - நிகழ்ச்சித்திட்டம் 01
### SUPPLEMENTARY SUM: HEAD 241 - PROGRAMME 01

*කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.*
*ඊට අදාළ ප්‍රශ්නය - [2024 දෙසැම්බර් 05]*
*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [2024 டிசம்பர் 05]*
*Order read for resuming Adjourned Debate on Question - [05th December, 2024]*

"2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් බිලියන එකසිය තිහක් (රු. 130,000,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 241 | - | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | |
| වැඩසටහන | 01 | - | මෙහෙයුම් වැඩසටහන | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 130,000,000,000 |
| | | | මුළු වියදම | රු. 130,000,000,000" |

(ගරු බිමල් රත්නායක මහතා)

*ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 249 - වැඩසටහන 01
## குறைநிரப்புத் தொகை: தலைப்பு 249 - நிகழ்ச்சித்திட்டம் 01
SUPPLEMENTARY SUM: HEAD 249 - PROGRAMME 01

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***

*ඊට අදාළ ප්‍රශ්නය - [2024 දෙසැම්බර් 05]*

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [2024 டிசம்பர் 05]*

*Order read for resuming Adjourned Debate on Question - [05th December, 2024]*

"2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් බිලියන දහ අටක් (රු. 18,000,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 249 - | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | |
| වැඩසටහන | 01 - | මෙහෙයුම් වැඩසටහන | |
| | | පුනරාවර්තන වියදම් | රු. 18,000,000,000 |
| | | මුළු වියදම | **රු. 18,000,000,000"** |

(ගරු බිමල් රත්නායක මහතා)

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Question again proposed.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 243 - වැඩසටහන 01
## குறைநிரப்புத் தொகை: தலைப்பு 243 - நிகழ்ச்சித்திட்டம் 01
SUPPLEMENTARY SUM: HEAD 243 - PROGRAMME 01

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***

*ඊට අදාළ ප්‍රශ්නය - [2024 දෙසැම්බර් 05]*

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [2024 டிசம்பர் 05]*

*Order read for resuming Adjourned Debate on Question - [05th December,2024]*

" 2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන තිස් දෙදහස් හයසිය හතළිස් එකක් (රු. 32,641,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 243 - | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | |
| වැඩසටහන | 01 - | මෙහෙයුම් වැඩසටහන | |
| | | පුනරාවර්තන වියදම් රු. | 32,641,000,000 |
| | | මුළු වියදම | **රු. 32,641,000,000"** |

**(ගරු බිමල් රත්නායක මහතා)**

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Question again proposed.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 126 - වැඩසටහන 01
## குறைநிரப்புத் தொகை: தலைப்பு 126 - நிகழ்ச்சித்திட்டம் 01
SUPPLEMENTARY SUM: HEAD 126 - PROGRAMME 01

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***

*ඊට අදාළ ප්‍රශ්නය - [2024 දෙසැම්බර් 05]*

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [2024 டிசம்பர் 05]*

*Order read for resuming Adjourned Debate on Question - [05th December,2024]*

"2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන නව දහස් අටසිය විසිනවයක් (රු. 9,829,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 126 - | අධ්‍යාපන අමාත්‍යවරයා | |
| වැඩසටහන | 01 - | මෙහෙයුම් වැඩසටහන | |
| | | පුනරාවර්තන වියදම් | රු. 9,829,000,000 |
| | | මුළු වියදම | **රු. 9,829,000,000"** |

**(ගරු බිමල් රත්නායක මහතා)**

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Question again proposed.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 224 - වැඩසටහන 01
## குறைநிரப்புத் தொகை: தலைப்பு 224- நிகழ்ச்சித்திட்டம் 01
## SUPPLEMENTARY SUM: HEAD 224 - PROGRAMME 01

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***

*ඊට අදාළ ප්‍රශ්නය - **[2024 දෙසැම්බර් 05]***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [2024 டிசம்பர் 05]*

*Order read for resuming Adjourned Debate on Question - [05th December, 2024]*

"2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන අට දහස් තුන්සිය තිස් එකක් (රු. 8,331,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 224 - | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | |
| වැඩසටහන | 01 - | මෙහෙයුම් වැඩසටහන | |
| | | මූලධන වියදම් | රු. 8,331,000,000 |
| | | මුළු වියදම | **රු. 8,331,000,000** " |

**(ගරු බිමල් රත්නායක මහතා)**

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 253 - වැඩසටහන 01
## குறைநிரப்புத் தொகை: தலைப்பு 253- நிகழ்ச்சித்திட்டம் 01
## SUPPLEMENTARY SUM: HEAD 253— PROGRAMME 01

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***

*ඊට අදාළ ප්‍රශ්නය - **[2024 දෙසැම්බර් 05]***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [2024 டிசம்பர் 05]*

*Order read for resuming Adjourned Debate on Question - [05th December, 2024]*

"2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන එක් දහස් හාරසියයක් (රු.1,400,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 253 - | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | |
| වැඩසටහන | 01 - | මෙහෙයුම් වැඩසටහන | |
| | | පුනරාවර්තන වියදම් | රු. 1,400,000,000 |
| | | මුළු වියදම | **රු. 1,400,000,000** " |

**(ගරු බිමල් රත්නායක මහතා)**

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 102 - වැඩසටහන 01
## குறைநிரப்புத் தொகை: தலைப்பு 102 - நிகழ்ச்சித்திட்டம் 01
## SUPPLEMENTARY SUM: HEAD 102 - PROGRAMME 01

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***

*ඊට අදාළ ප්‍රශ්නය - **[2024 දෙසැම්බර් 05]***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [2024 டிசம்பர் 05]*

*Order read for resuming Adjourned Debate on Question - [05th December, 2024]*

"2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන තුන්දහස් දෙසිය දහතුනක් (රු. 3,213,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 102 - | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා | |
| වැඩසටහන | 01 - | මෙහෙයුම් වැඩසටහන | |
| | | පුනරාවර්තන වියදම් | රු. 3,213,000,000 |
| | | මුළු වියදම | **රු. 3,213,000,000"** |

**(ගරු බිමල් රත්නායක මහතා)**

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 151 - වැඩසටහන 02
## குறைநிரப்புத் தொகை: தலைப்பு 151 - நிகழ்ச்சித்திட்டம் 02
## SUPPLEMENTARY SUM: HEAD 151 - PROGRAMME 02

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***

***ඊට අදාළ ප්‍රශ්නය - [2024 දෙසැම්බර් 05]***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [2024 டிசம்பர் 05]*

*Order read for resuming Adjourned Debate on Question - [05th December, 2024]*

"2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන එක්දහස් පන්සිය තිස්තුනක් (රු. 1,533,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 151 - | ධීවර අමාත්‍යවරයා | |
| වැඩසටහන | 02 - | සංවර්ධන වැඩසටහන | |
| | | මූලධන වියදම් | <u>රු. 1,533,000,000</u> |
| | | මුළු වියදම | **රු. 1,533,000,000"** |

**(ගරු බිමල් රත්නායක මහතා)**

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Question again proposed.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 111 - වැඩසටහන 01
## குறைநிரப்புத் தொகை: தலைப்பு 111- நிகழ்ச்சித்திட்டம் 01
## SUPPLEMENTARY SUM: HEAD 111 - PROGRAMME 01

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***

***ඊට අදාළ ප්‍රශ්නය - [2024 දෙසැම්බර් 05]***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [2024 டிசம்பர் 05]*

*Order read for resuming Adjourned Debate on Question - [05th December, 2024]*

"2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන දස දහස් අටසිය විසි හයක් (රු. 10,826,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 111 - | සෞඛ්‍ය අමාත්‍යාංශය | |
| වැඩසටහන | 01 - | මෙහෙයුම් වැඩසටහන | |
| | | පුනරාවර්තන වියදම් | <u>රු. 10,826,000,000</u> |
| | | මුළු වියදම | **රු. 10,826,000,000"** |

**(ගරු බිමල් රත්නායක මහතා)**

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Question again proposed.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 126 - වැඩසටහන 01
## குறைநிரப்புத் தொகை: தலைப்பு 126- நிகழ்ச்சித்திட்டம் 01
## SUPPLEMENTARY SUM: HEAD 126 - PROGRAMME 01

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***

***ඊට අදාළ ප්‍රශ්නය - [2024 දෙසැම්බර් 05]***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [2024 டிசம்பர் 05]*

*Order read for resuming Adjourned Debate on Question - [ 05th December, 2024]*

"2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන එක්දහස් අටසීයක් (රු. 1,800,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 126 - | අධ්‍යාපන අමාත්‍යවරයා | |
| වැඩසටහන | 01 - | මෙහෙයුම් වැඩසටහන | |
| | | පුනරාවර්තන වියදම් | <u>රු. 1,800,000,000</u> |
| | | මුළු වියදම | **රු. 1,800,000,000"** |

**(ගරු බිමල් රත්නායක මහතා)**

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Question again proposed.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 103 - වැඩසටහන 02
## குறைநிரப்புத் தொகை: தலைப்பு 103- நிகழ்ச்சித்திட்டம் 02
## SUPPLEMENTARY SUM: HEAD 103 - PROGRAMME 02

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***

*ඊට අදාළ ප්‍රශ්නය - **[2024 දෙසැම්බර් 05]***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [2024 டிசம்பர் 05]*

*Order read for resuming Adjourned Debate on Question - [05th December, 2024]*

"2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන හාරසීයක් (රු. 400,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 103 - | ආරක්ෂක අමාත්‍යවරයා | |
| වැඩසටහන | 02 - | සංවර්ධන වැඩසටහන | |
| | | මූලධන වියදම් | රු. 400,000,000 |
| | | මුළු වියදම | **රු. 400,000,000"** |

**(ගරු බිමල් රත්නායක මහතා)**

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පරිපූරක මුදල: ශීර්ෂය 232 - වැඩසටහන 01
## குறைநிரப்புத் தொகை: தலைப்பு 232 - நிகழ்ச்சித்திட்டம் 01
## SUPPLEMENTARY SUM: HEAD 232 - PROGRAMME 01

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***

*ඊට අදාළ ප්‍රශ්නය - **[2024 දෙසැම්බර් 05]***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குவதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [2024 டிசம்பர் 05]*

*Order read for resuming Adjourned Debate on Question - [05th December, 2024]*

"2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන එක් දහස් හාරසීයක් (රු. 1,400,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 232 - | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | |
| වැඩසටහන | 01 - | මෙහෙයුම් වැඩසටහන | |
| | | පුනරාවර්තන වියදම් | රු. 1,400,000,000 |
| | | මුළු වියදම | **රු. 1,400,000,000"** |

**(ගරු බිමල් රත්නායක මහතා)**

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ. භා. 5.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 5.40ට, 2024 දෙසැම්බර් 17 වන අඟහරුවාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி. ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி, பி. ப. 5.40க்கு, பாராளுமன்றம் 2024 டிசம்பர் 17, செவ்வாய்க்கிழமை மு. ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.40 p.m. until 9.30 a.m. on Tuesday, 17th December, 2024.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.